# මූලික බයිබල් සමීක්ෂණය- 1

## පරණ ගිවිසුම

### භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, ජේසුස් වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.

මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන්නේ කෙසේද? . . . . . . . . 3

කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා . . . . . . . 4

හැඳින්වීම . . . . . . . . . . . 5

පාඨමාලාවේ අරමුණු . . . . . . . . . 6


## බයිබලය ගැන හැඳින්වීමක්


1. බයිබලය හැඳින්වීම . . . . . . . . 7
2. බයිබලයේ පොත් . . . . . . . . . 18
3. බයිබලයේ අනුවාද . . . . . . . . 37
4. සැකිල්ලක් ලිවීම සඳහා හැඳින්වීමක් . . . . . . 43


## පැරණි ගිවිසුම


ව්‍යවස්ථා පොත්වලට හැඳින්වීමක් . . . . . . . 47

5. උත්පත්ති . . . . . . . . . . 48
6. නික්මයාම . . . . . . . . . . 53
7. ලෙවී ව්‍යවස්ථාව . . . . . . . . . 59
8. ගණන් කථාව . . . . . . . . . . 65
9. ද්විතිය නීති සංග්‍රහය . . . . . . . . 70

ඉතිහාසය පොත් සඳහා හැඳින්වීමක් 74

10. ජෝෂුවා 75
11. විරාවලිය 79
12. රූත් 85
13. 1 සහ 2 සාමුවෙල් 89
14. 1 සහ 2 රාජාවලිය 94
15. 1 සහ 2 වංශාවලිය 100
16. එස්රා 104
17. නෙහෙමියා 108
18. එස්තර් 112

කාව්‍යමය පොත් සඳහා හැඳින්වීමක් . . . . . . . 116

19. ජෝබ් . . . . . . . . . . . 117
20. ගීතාවලිය . . . . . . . . . . 121
21. හිතෝපදේශ . . . . . . . . . . 126
22. ධර්මදේශකයා . . . . . . . . . . 130
23. ප්‍රේම ගී . . . . . . . . . . . 134

දිවැසිවර පොත් සඳහා හැඳින්වීමක් . . . . . . . 138

24. යෙසායා . . . . . . . . . . . 141
25. ජෙරෙමියා . . . . . . . . . . . 146

26. විලාප ගී . . . . . . . . . . 150
27. එසකියෙල් . . . . . . . . . . 154
28. දානියෙල් . . . . . . . . . . 158
29. හොසියා . . . . . . . . . . 163
30. ජෝවෙල් . . . . . . . . . . 167
31. ආමොස් . . . . . . . . . . 171
32. ඔබදියා . . . . . . . . . . 175
33. ජෝනා . . . . . . . . . . 179
34. මීකා . . . . . . . . . . . 183
35. නාහුම් . . . . . . . . . . 187
36. හබක්කුක් . . . . . . . . . 191
37. ශෙපනියා . . . . . . . . . . 195
38. හග්ගයි . . . . . . . . . . 199
39. සෙකරියා . . . . . . . . . . 203
40. මලාකි . . . . . . . . . . 207

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . . . . 211

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සැම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සැම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සැම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

# පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කීපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

# දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**මොඩියුලය** : නියෝජනය කිරීම

**පාඨමාලාව** : මූලික බයිබල් සමීක්ෂණය 1

# පාඨමාලාව හැඳින්වීම

ජේසුස් වහන්සේගේ මොලාව සේවයේදී උන් වහන්සේ පැරණි ගිවිසුම වෙත කරන ලද බොහෝ යොමුවීම්වලින් පෙන්නුම් කෙරෙන්නේ ශුද්ධ ලියවිල්ලේ අන්තර්ගතය පිළිබඳව උන් වහන්සේ දී ඇති වැදගත් තැන වේ. ජේසුස් වහන්සේ උන් වහන්සේ පුහුණු කළ අයට දේව වචනයේ වැදගත්කම අවධාරණය කළ නිසා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය එහි පුහුණු කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස දේව පණිවිඩය තම ජාතින් වෙත ගෙන යෑමට ස්ත්‍රී පුරුෂයන් සන්නද්ධ කිරීමට *"මූලික බයිබල් සමීක්ෂණය"* ඉදිරිපත් කරයි.

*"මූලික බයිබල් සමීක්ෂණය"* බයිබලය හඳුන්වාදෙන අතර එහි පරිවර්තනයන්ද විවිධ අනුවාද ද සාකච්ජා කරයි. එය බයිබල් ඉතිහාසය භූගෝලය හා බයිබල් යුගයේ ජීවිතය පිළිබඳ සමස්තයක් ද ඉදිරිපත් කරයි. මෙම පාඨමාලාව බයිබලයේ සෑම පොතක් පිළිබඳවම සැකිල්ලක් සපයන අතර, මේ සැකිල්ල දේව වචනය වඩාත් විස්තරාත්මකව අධ්‍යයනය කිරීම සඳහා විස්තාරණය කිරීමේ දක්ෂතා උගන්වයි.

සෑම බයිබල් පොතක් පිළිබඳවම සපයා ඇති තොරතුරුවල කර්තෘ ද පොත ලියන ලද්දේ කවුරුන්ට ද පොතේ පරමාර්ථය, ප්‍රධාන පදය, ප්‍රධාන චරිතවල ලයිස්තුවක් හා අන්තර්ගතයේ සැකිල්ලක් ඇතුළත්ව ඇත. සෑම පොතක් සඳහාම ජීවිතයේ හා සේවයේ මූලධර්ම ද සඳහන් කර තිබේ. මෙම මූලධර්ම කිතුනු පරිණතභාවයට හා සේවයට වැදගත් වන මූලික සත්‍යයන් වන අතර ඒවා ඔබගේම ජීවිතයට ඒකාබද්ධ කරගැනීමට ඔබ උත්සාහ කළ යුතුය. මෙම පාඨමාලාවේ, ප්‍රයෝජනවත් විය හැකි  සටහන්, සිතියම්, හා වැදගත් කරුණු කැටි කර පෙන්වන කාල රේඛා ද අන්තර්ගත වේ.

මෙම පාඨමාලාව කොටස් දෙකකට වෙන්කර ඇත.
පළමු කොටස : බයිබලය පිළිබඳ හැඳින්වීමේ කරුණු ද පැරණි ගිවිසුමේ පොත් සඳහා සැකිල්ලක් ද සපයයි.

දෙවන කොටස : නව ගිවිසුමේ පොත් සඳහා සැකිල්ලයක් සපයයි.

*"මූලික බයිබල් සමීක්ෂණය"*, බයිබලය අධ්‍යයනය කිරීමේ විවිධ ක්‍රම උගන්වන *"නිර්මාණාත්මක බයිබල් අධ්‍යයනය ක්‍රම"* පාඨමාලාවේ සහකාරයෙකි. මෙම පාඨමාලා දෙකම සැලසුම් කර ඇත්තේ ඔබට පෞද්ගලිකව දේව වචනය අධ්‍යයනය කිරීමට සහය වීමට වේ.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- බයිබලයේ මූලික බෙදීම් හඳුනාගැනීමට
- බයිබලයේ අනුවාද, පරිවර්තන හා අර්ථෝද්ධාර මුද්‍රණයන් අතර වෙනස දැක්වීමට
- බයිබල් යුගයේ දෛනික ජීවිතය විස්තර කිරීමට
- බයිබලයේ කාලානුක්‍රමය සාරාංශ කිරීමට
- සැකිල්ල නිර්මාණය කිරීමට හා විස්තාරණය කිරීමට
- බයිබලයේ සෑම පොතකම පහත දැක්වෙන දේ සඳහන් කිරීමට
    - කර්තෘ
    - පොත ලියන ලද්දේ කවුරුන්ටද
    - එය ලියන ලද්දේ කවදාදා
    - පොතේ පරමාර්ථය
    - ප්‍රධාන පදය
    - ජීවිතයේ හා සේවයේ මූලධර්ම
- මෙම පාඨමාලාව සම්පූර්ණ කළ පසු දේව වචනය පිළිබඳ වඩාත් විස්තරාත්මක අධ්‍යයනයක් කරගෙන යෑමට

හැකිවනු ඇත.

පළමු කොටස: බයිබලය ගැන හැඳින්වීමක්

# පළමු පරිච්ඡේදය

## බයිබලය හැඳින්වීම

### අරමුණු

මෙම අධ්‍යයනයෙන් පසු ඔබට

- මතකයෙන් ප්‍රධාන පදය ලිවීමට
- "බයිබලය" යන වචනය නිර්වචනය කිරීමට
- "ශුද්ධ ලියවිල්ල" යන වචනය නිර්වචනය කිරීමට
- බයිබලයේ මූලාරම්භය පැහැදිලි කිරීමට
- බයිබලයේ ප්‍රධාන පරමාර්ථ හඳුනාගැනීමට
- බයිබලයේ ප්‍රධාන බෙදීම් දෙක ලෙස පැරණි ගිවිසුම හා නව ගිවිසුම හඳුනාගැනීමට
- පැරණි ගිවිසුමේ පොත්වල බෙදීම් හතර නම් කිරීමට
- නව ගිවිසුමේ පොත්වල බෙදීම් හතර නම් කිරීමට
- බයිබලයේ "ඒකත්වය හා විවිධත්වය" යන්නෙන් අදහස් වන දේ පැහැදිලි කිරීමට
- ගිවිසුම් දෙකෙන්ම හෙළිදරව් වීම කේන්ද්‍රවන්නේ කවර තැනැත්තාදැයි හඳුනාගැනීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල, ඉගැන්වීමට ද දුර්මත දුරු කිරීමට ද හික්මවීමට ද ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි. දෙවියන් වහන්සේට කැප වූ පුද්ගලයා සම්පූර්ණ වශයෙන් පුහුණු වී, ඕනෑම යහපත් සේවයකට සූදානම් ව සිටින්නේ එසේය (2 තිමෝති 3:16-17).**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය, එකම සැබෑ දෙවියන් වහන්සේගේ වචනය වන බයිබලය හඳුන්වා දෙයි. "බයිබලය" යන වචනයේ තේරුම "පොත්" වේ. බයිබලය වෙන් වශයෙන් ඇති පොත් 66 ක එකතුවකි.

දේව වචනය හැඳින්වීමට "ශුද්ධ ලියවිල්ල" යන වචනයද භාවිත කෙරේ. මෙම වචනය "ලිවීම" යන තේරුම ඇති ලතින් වචනයකින් ලැබුණකි. ශුද්ධ ලියවිල්ල යන වචනය ඉංග්‍රීසියෙන් Scripture ලෙස ලියන විට S අකුර කැපිටල්වලින් ඇතිවිට ඉන් අදහස් වන්නේ එය එකම සැබෑ දෙවිඳුන්ගේ ශුද්ධලියවිලි බවය. "බයිබලය" යන වචනය බයිබලයෙහි භාවිත කර නොමැත. එය සම්පූර්ණ දේව වචනය වෙනුවෙන් මිනිසුන් විසින් තෝරාගනු ලැබූ වචනයකි.

## බයිබලයේ මූලාරම්භය

බයිබලය දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය වේ. උන් වහන්සේ බයිබලයේ ඇති වචන දේවානුභාවයෙන් ලබාදුන් අතර උන් වහන්සේගේ වචන ලිවීම සඳහා දළ වශයෙන් විවිධ මනුෂ්‍යයන් 40 දෙනෙකු පමණ යොදාගෙන ඇත. මේ අය අවුරුදු 1500 ක පමණ කාලයක් තුළ ලියූහ. මෙම ලේඛකයන්ගේ පූර්ණ එකඟත්වයෙන් පෙන්නුම් කෙරෙන්නේ ඔවුන් සියලු දෙනාටම එකම කර්තෘ කෙනෙකු මගපෙන්වන්නට ඇති බව වේ. මෙම කර්තෘවරයාණෝ දෙවියන් වහන්සේ වන සේක.
ඇතැම් ලේඛකයෝ දෙවියන් වහන්සේ පැවසූ දේ එලෙසම ලියූහ.

**නුඹ අකුළන පොතක් රැගෙන, ජොෂියාගේ දවස්වල දී මා නුඹට වදාළ දින පටන් අද දවස දක්වා ඉශ්රායෙල්වරුන් ද ජුදාවරුන් ද සියලු ජාතීන් ද ගැන මා නුඹට කී සියලුම වචන එහි ලියන්න (ජෙරමියා 36:2).**

අනෙකුත් ලේඛකයන් ලියුවේ ඔවුන් අත්දුටු දේ හෝ අනාගතය පිළිබඳව දෙවියන් වහන්සේ එළිදරව් කළ දේ හෝ වේ.

**එබැවින් දැන් තිබෙන දේ ද සිදු වන්නට තිබෙන දේ ද යන, ඔබ දකින මේ දේවල් ලියන්න (එළිදරව් 1:19).**

සියලුම ලේඛකයන් දෙවියන් වහන්සේගේ ආනුභාවය යටතේ අප වෙනුවෙන් ඇති උන් වහන්සේගේ පණිවුඩය ලියන ලදී.

## බයිබලයේ පරමාර්ථය

බයිබලයම එහි ප්‍රධාන පරමාර්ථය ලියා ඇත.

**දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල, ඉගැන්වීමට ද දුර්මත දුරු කිරීමට ද හික්මවීමට ද ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි. දෙවියන් වහන්සේට කැප වූ පුද්ගලයා සම්පූර්ණ වශයෙන් පුහුණු වී, ඕනෑම යහපත් සේවයකට සූදානම් ව සිටින්නේ එසේය (2 තිමෝති 3:16-17).**

ශුද්ධ ලියවිල්ල දේව ධර්මය ඉගැන්වීමටද, නපුරට තර්ජනය කිරීමට හා එය නිවැරදි කරගැනීමට ද ධර්මිෂ්ඨකම ඉගැන්වීමට ද යොදා ගනු ලැබේ. ඔබට නිවැරදිව ජීවත්වීමට ද දෙවියන් වහන්සේ වෙනුවෙන් වැඩ කිරීමට අවශ්‍ය දේ සැපයීමට ද එය ඔබට උපකාරී වේ.

## ප්‍රධාන බෙදීම්

බයිබලය පැරණි ගිවිසුම හා නව ගිවිසුම වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. “ගිවිසුම” යනු එකඟවීමකි. පැරණි ගිවිසුම සඳහන් වන්නේ දෙවියන් වහන්සේ මිනිසා සමග ඇතිකරගත් මුල් ගිවිසුම හෙවත් එකඟවීම වේ. නව ගිවිසුමේ සඳහන් වන්නේ දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඇතිකරගත් අලුත් ගිවිසුමයි.

මේ ගිවිසුම් දෙකෙහි විෂය කරුණු මොනවාද? ඒ දෙකෙන්ම සිතා බැලෙන්නේ පාපී මනුෂ්‍යයා, දෙවියන් වහන්සේ සමග නිවැරදි සබඳතාවක් නැවත ඇතිකරගැනීම පිළිබඳවය. පාපයට කමාව දිය හැක්කේ ලේ වැගිරීමෙන් පමණක් බවට නියමයක් දෙවියන් වහන්සේ දී ඇත.

**”...ලේ වැගිරීමක් නැතිව පව් කමාවක් නැත ” (හෙබ්‍රෙව් 9:22)**

පැරණි ගිවිසුමේ, දෙවියන් වහන්සේගේ එකඟතාවට අනුව පාපයෙන් කමාව ලැබීම සඳහා මිනිසා සත්වයන්ගේ ලේ පූජා කළේය. මෙය, දෙවියන් වහන්සේ සමග ඇතිකරගනු ලබන නව එකඟතාවට අනුව ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරන්නාවූ ලේ පූජාවේ සංකේතයකි. ජේසුස් වහන්සේගේ ඉපදීම, ජීවිතය, මරණය හා උත්ථානවීම තුළින් පාපය සඳහා අවසාන පූජාව සිදු කෙරිණි.

**එහෙත් ක්‍රිස්තුස්වහන්සේ දැනට ම ඇති යහපත් දේ පිළිබඳ උත්තම පූජකයාණන් වශයෙන් පැමිණ සිටින සේක. උන් වහන්සේ වඩා උතුම් හා වඩා සම්පූර්ණ, මිනිස් අතින් නොසෑදූ එනම්, මේ භෞතික මැවිල්ලට අයිති නොවන මණ්ඩපයේ පූජකයාණෝ ය.**

**උන් වහන්සේ එළුවන්ගේත්, වස්සන්ගේත්, ලෙයින් නොව, තමන්ගේම ලෙයින් අප උදෙසා සදාතන විමුක්තිය ලබා සඳහටම එක වරක් ශුද්ධස්ථානයට ඇතුළු වූ සේක.**

**මන්ද, වත්පිළිවෙත් අනුව අපවිත්‍ර යයි සලකන අය මත එළුවන්ගේත්, ගොනුන්ගේත් ලේ ද, එළ වැස්සියකගේ අළු ද ඉසීමෙන්, ඔව්හු පාරිශුද්ධිය ලබන්නාහුය.**


**එසේ නම්, ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස ඔබගේ හෘදය සාක්ෂිය නිෂ්ඵල ක්‍රියාවලින් පිරිසිදු කැරනු ලැබීම, සදාතන ආත්මයාණන් මඟින් තමන් ම කැළලක් නැතිව දෙවියන් වහන්සේට පුජා වූ, ක්‍රිස්තුන් වහන්සේගේ ලේ කරණකොටගෙන, ඊටත් ඉතා වැඩියෙන් පිරිසිදු නොවන්නේද?**

**මේ කාරණය නිසා, කැඳවනු ලැබූවන්ට සදාතන උරුමයේ පොරොන්දුව ලැබෙන පිණිස උන් වහන්සේ අලුත් ගිවිසුමක මැදහත් කාරයාණෝ වන සේක. එසේ වන්නේ පළමු වන ගිවිසුමේ කාලයේ දී කළ පාප ක්‍රියාවලින් මුදනු ලැබීම පිණිස මරණයක් සිදු වූ බැවිනි (හෙබ්‍රෙව් 9:11-15).**

ගිවිසුම් දෙකම දෙවියන් වහන්සේගේ වචනය වන අතර දෙවියන් වහන්සේගේ පණිවුඩය අවබෝධ කරගැනීම සඳහා මේ දෙකම අප අධ්‍යයනය කළ යුතුය. “පැරණි” හා “නව” ගිවිසුම යන පද භාවිත කර ඇත්තේ, ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණට පෙර හා පසුව දෙවියන් වහන්සේ මනුෂ්‍යයා සමග කරන ලද ගිවිසුම් අතර වෙනස දැක්වීමටය. පැරණි ගිවිසුම “පැරණි” නිසා අප එය නොසලකා හරින්නේ නැත.

## තවදුරටත් ඇති බෙදීම්

බයිබලය තවදුරටත් පොත් 66 කට බෙදා තිබේ. පැරණි ගිවිසුමේ පොත් 39 ක් ද නව ගිවිසුමේ පොත් 27 ක් ද ඇත. සෑම පොතක්ම පරිච්ජේද හා පදවලට බෙදා ඇත. සෑම පොතකම අන්තර්ගතය දේව වචනය වුවද, පරිච්ජේද හා පදවලට කර ඇති බෙදීම් සුවිශේෂ කොටස් දැක්වීම පහසු වීම සඳහා මිනිසා විසින් කරන ලද්දකි. සියලුම පොත් එක් දිගු ඡේදයක් ලෙස තිබිණි නම්, කොටසක් සොයා ගැනීම ඉතා අසීරු වනු ඇත.




## බයිබලයේ ඒකත්වය

බයිබලයේ ඒකත්වය පිළිබඳව අප කතාකරන විට, ඉන් කරුණු දෙකක් අදහස් වේ.

### 1. බයිබලයේ අන්තර්ගතය එකගතාවයෙන් යුක්ත වේ

බයිබලය ලේඛකයන් බොහෝ දෙනෙක් වසර ගණනාවක් තුළ ලියන ලද්දක් වුවද එහි අන්තර්ගතයේ පරස්පර විරෝධි දේ නොමැත. එක් කර්තෘවරයෙක් වෙනත් කිසිම කර්තෘවරයෙකු හා පරස්පර විරෝධි නොවේ.

බයිබලයේ මතභේදකාරී විෂයයන් (මතභේදකාරී විෂයයන් යනු එකිනෙකට වෙනස් මත ඇති කරන ඒවා වේ) සිය ගණනක් අන්තර්ගය. එහෙත් බයිබල් ලේඛකයන් එම විෂයන් ගැන කතාකර ඇත්තේ, පළමු පොතවන උත්පත්ති සිට අවසාන පොත වන එළිදරව්ව දක්වා, එකඟතාවෙන් යුතුව වේ. ඊට හේතුව එහි සැබෑ කර්තෘවරයාණෝ එක් කෙනෙක් බැවිනි. ඒ දෙවියන් වහන්සේ වන සේක. මේ ලේඛකයන් කර ඇත්තේ උන් වහන්සේගේ මගපෙන්වීම හා ආනුභාවය ඇති පණිවුඩය වාර්තා කිරීම පමණි. මේ හේතුව නිසා බයිබලයේ අන්තර්ගතය එකගතාවයෙන් යුක්ත වේ.

## 2. බයිබලය තේමාවෙන් එකගතාවයෙන් යුක්ත වේ

බයිබලය, විවිධ විෂයන් පිළිබඳ එකිනෙකට වෙනස් පොත් 66 ක එකතුවක් ලෙස සමහරු සිතති. බයිබලය එක් ප්‍රධාන තේමාවකින් එක්සත් කර ඇති බව ඔව්හු නොදනිති. ආරම්භයේ සිට අවසානය දක්වා, එපීස පොතෙහි සැකිල්ල කර දක්වා ඇති පරිදි දෙවියන් වහන්සේගේ විශේෂ පරමාර්ථය බයිබලය එළිදරව් කරයි.

**උන් වහන්සේගේ කැමැත්තේ අබිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන ලද්දේ, තමන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ තුළ, සිය කැමැත්තෙන් නියම කර ගත් ස්වකීය අභිප්‍රාය අනුව ය**

**දෙවියන් වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේ දී ස්වර්ගයෙහි ද පොළොවෙහි ද, එනම් මුළු විශ්වයෙහි ඇති සියල්ල, ක්‍රිස්තුන් වහන්සේ යටතේ එක්සත් කිරීම ය. අපි මෙම ක්‍රිස්තුන් වහන්සේ තුළින් තෝරාගත් සෙනඟක් වෙමු.**

**එසේ වන්නේ, දෙවියන් වහන්සේ පෙර නියම කරගත් සැලැස්ම ලෙස, සියල්ල සිදු කරන ස්වකීය අභිප්‍රාය අනුව ය (එපීස 1:9-11).**

බයිබලය, දෙවියන් වහන්සේගේ සැලැස්මේ අබිරහස වන එක්සත් කිරීමේ තේමාව එළිදරව් කරයි. එය පාපී මනුෂ්‍ය වර්ගයාගේ ගැළවුම්කරු ලෙස ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ එළිදරව් කිරීම වේ. පැරණි ගිවිසම තමන්වහන්සේ කේන්ද්‍රීය කර ගෙන ඇති බව ජේසුස් වහන්සේ පැහැදිලි කළ සේක.

**තවද උන් වහන්සේ කතා කරමින්, "මා පිළිබඳ මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද ගීතාවලියෙහි ද ලියා ඇති හැම දෙය ම ඉෂ්ට විය යුතු යයි මා ඔබ සමග සිටිය දී ඔබට පැවසූ වචනයෙහි තේරුම මේ ය"යි වදාළ සේක (ලූක් 24:44).**

මෙම හැඳින්වීම අනුව ජේසුස් වහන්සේ තවදුරටත් මෙසේ පවසන සේක.

**එවිට උන් වහන්සේ ශුද්ධ ලියවිලි ඔවුන්ට වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, (ලූක් 24:45)**

ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගැනීමට ජේසුස් වහන්සේ ඔවුන්ට දුන් ප්‍රධාන දෙය කුමක්ද? එහි ප්‍රධාන තේමාව තමා වෙත අවධානය යොමු කර ඇති බවය.

**මෙසේ ක්‍රිස්තුන් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මළවුන්ගෙන් නැඟිටින්නටත්,**

**ජෙරුසලමෙන් පටන්ගෙන සකල ලෝකවාසීන්ට මනස්ස්ථාපනය ද පව් කමාව ද, උන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත.**

**ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහුය (ලූක් 24:46-48).**

පැරණි හා නව ගිවිසුම් දෙකම පවසන්නේ ජේසුස් වහන්සේ පිළිබඳ කතාන්දරය වේ. මේ සිදුවීමට පැරණි ගිවිසුම අප සූදානම් කරන අතර එය සිදුවූ ආකාරය නව ගිවිසුම පවසයි. මෙමගින් බයිබලය එක් ප්‍රධාන තේමාවකට එක්සත් කරයි. පැරණි ගිවිසුම යටතේ ජේසුස් වහන්සේ වෙත බලා සිටි සෙනඟ දෙවියන් වහන්සේගේ පොරොන්දුව තුළ ඇති ඇදහිල්ල මගින් ඔවුන්ගේ පාපයෙන් ගැළවීම ලැබූහ. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ එය ඉටුවූවා ලෙස ආපසු හැරී බලන සෑම කෙනෙක්ම ඒ ආකාරයෙන්ම ගැළවීම ලබති. දෙවියන් වහන්සේ පොරොන්දු වූ ආකාරයට ඇදහිල්ල තුළින් එය සිදුවිය.

### බයිබලයේ විවිධත්වය

බයිබලයේ "විවිධත්වය" ගැන අප කතාකරන විට ඉන් අදහස් වන්නේ බයිබලයේ නොයෙකුත් දේ ඇති බවය. දෙවියන් වහන්සේ මිනිසුන් සමග ක්‍රියා කළ විවිධ ආකාරයන් හා මිනිසුන් ඊට ප්‍රතිචාර දැක්වූ විවිධ ආකාරත් එහි වාර්තා කර ඇත.

බයිබලය විවිධ චිත්ත ස්වභාවයන්ගෙන් ලියා ඇත. ඇතැම් කොටස් ප්‍රීතිය ප්‍රකාශ කරන අතර තවත් කොටස් ප්‍රකාශ කරන්නේ කනගාටුව වේ. බයිබලයේ විවිධාකාර ලිවීම් ද ඇත. එහි ඉතිහාසය, කවි, අනාවැකි, හසුන්, නිර්භිත ක්‍රියා, උපමා, හාස්කම් හා ප්‍රේම කතා ආදිය අන්තර්ගතය. එහි විවිධත්වය නිසා එය තවදුරටත් ප්‍රධාන පොතේ කාණ්ඩවලට බෙදා තිබේ.

## පැරණි ගිවිසුමේ බෙදීම්

පැරණි ගිවිසුමේ පොත් ප්‍රධාන කාණ්ඩ හතරකට බෙදා තිබේ. ඒ ව්‍යවස්ථාව , ඉතිහාසය, කාව්‍ය, හා අනාවැකි වශයෙනි.

### ව්‍යවස්ථාව පිළිබඳ පොත්

ව්‍යවස්ථා පොත් පහක් ඇත. මේවා නම් වශයෙන් මෙසේ වේ.

උත්පත්ති
නික්මයාම
ලෙවී ව්‍යවස්ථාව
ගණන් කථාව
ද්විතිය නිති සංග්‍රහය

මේ පොත්වල වාර්තා වී ඇත්තේ දෙවියන් වහන්සේ විසින් මිනිසා හා ලෝකය මවනු ලැබීම හා මිනිසාගේ මුල් ඉතිහාසය වේ. ඒවායින් පැවසෙන්නේ දෙවියන් වහන්සේ තමන් වහන්සේම ලෝකයේ ජාතීන් වෙත එළිදැරව් කිරීමට හැකිවන පිණිස ඉශ්රායෙල් ජාතිය සෙනඟක් ලෙස එසවූ ආකාරය වේ.

මෙම පොත් දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවන් වාර්තා කරයි. මේවා අතුරින් ඉතාමත්ම ප්‍රසිද්ධ කොටස් වන්නේ දස පනත (නික්ම. 20:3-17), ශ්‍රේෂ්ඨතම ආඥාව (ද්වි. 6:5), හා දෙවැනි ශ්‍රේෂ්ඨතම ආඥාව වේ (ලෙවී. 19:18).

ඔබගේ බයිබලය පෙරලා පැරණි ගිවිසුමේ ඇති ව්‍යවස්ථා පොත් සොයා ගන්න. ඉහත සඳහන් පද තුන සොයාගෙන ඒවා කියවන්න. මේවා මේ පොත්වල සඳහන් දෙවියන් වහන්සේගේ ආඥා සඳහන් නිදසුන් වේ.

### ඓතිහාසික පොත්

ඓතිහාසික පොත් 12 ක් පැරණි ගිවිසුමේ තිබේ. මේවා නම්:

ජෝෂුවා
විරාවලිය
රූත්,
1 හා 2 සාමුවෙල්
1 හා 2 රාජාවලිය
1 හා 2 වංශාවලිය
එස්රා
නෙහෙමියා
එස්තර්ය

ඔබගේ බයිබලයේ මේවා සොයාගන්න. මේවා ඇත්තේ ව්‍යවස්ථා පොත්වලට පසුව වේ. ඉතිහාස පොත් දෙවියන් වහන්සේගේ සෙනඟගේ එනම් ඉශ්රායෙල්හි දහස් වසරක ඉතිහාසය ආවරණය කරයි. මේවා සිදුවූ සියල්ල පවසන්නේ නැත. එහෙත් ඒවායේ ප්‍රධාන සිද්ධීන් වාර්තාකර ඇති අතර දෙවියන් වහන්සේගේ නීති අනුගමනය කිරීමේ හා කඩ කිරීමේ ප්‍රතිඵලය පෙන්වයි.

## කාව්‍ය පොත්

කාව්‍ය පොත් පහක් ඇත. මේවා නම්:

ජෝබ්
ගීතාවලිය
හිතෝපදේශ
ධර්මදේශකයා
ප්‍රේම ගී

මේවා දෙවියන් වහන්සේගේ සෙනඟගේ එනම්, ඉශ්රායෙල්හි නමස්කාර පොත් වේ. අද වුවද ඇදහිලිවන්තයන් නමස්කාරය සඳහා මෙම පොත් භාවිත කරති. ගීතාවලිය 23 පෙරලා කියවන්න. මෙය මේ පොත්වල අඩංගු අත්‍යලංකාර නමස්කාරය පද්‍යයක් සඳහා නිදසුනකි.

## අනාවැකි පොත්

පැරණි ගිවිසුමේ දිවැස්වැකි පොත් වූල හා මහා ලෙස කාණ්ඩ දෙකකට බෙදා ඇත. මහා දිවැසිවරුන් වූල දිවැසිවරුන්ට වඩා වැදගත් යයි මින් අදහස් නොවේ. මේ ග්‍රන්ථ නාම භාවිත කර ඇත්තේ මහා දිවැස්වැකි පොත් වූල ඒවාට වඩා දිග බැවිනි. පැරණි ගිවිසුමේ දිවැස්වැකි පොත් 17 ක් ඇත. මේවා නම්:

**මහා දිවැසිවරුන්**

යෙසායා
ජෙරමියා
විලාප ගී
එසකියෙල්,
දානියෙල්

**වූල දිවැසිවරුන්**

හොසියා
ජෝවෙල්
ආමොස්
ඔබදියා
ජෝනා
මීකා
නාහුම්
හබක්කුක්
ශෙපනියා
හග්ගයි
සෙකරියා
මලාකි

මෙම පොත් අනාගත සිදුවීම් පිළිබඳව දෙවියන් වහන්සේ තම සෙනඟට දුන් පණිවුඩ වේ. මේ බොහෝ අනාවැකි දැනටමත් ඉටු වී ඇති අතර තවත් සමහර ඒවා අනාගතයේ දී ඉටුවනු ඇත. මෙම දිවැස්වැකි පොත් ඔබගේ බයිබලයෙන් සොයා ගන්න. ඒවා පැරණි ගිවිසුමේ අවසාන පොත් වේ.

# නව ගිවිසුමේ බෙදීම්

නව ගිවිසුම ද කාණ්ඩ හතරකට බෙදා ඇත. ශුභාරංචිය, ඓතිහාසික, හසුන් හා දිවැස්වැකි පොත් ලෙසය.

## ශුභාරංචි

ශුභාරංචි පොත් හතරක් ඇත. මේවා නම්:

මතෙව්
මාක්
ලූක්
ජොහන්

මෙම පොත් ජේසුස් වහන්සේගේ ජීවිතය, මරණය හා උත්ථානය ගැන පවසයි. මේවායේ පරමාර්ථය වන්නේ උන් වහන්සේ, දේව පුත්‍රයා, ක්‍රිස්තුස්වහන්සේ බවට ඔබට විශ්වාස කිරීමට මගපෙන්වීම සඳහා වේ. ඔබගේ බයිබලයේ මේ පොත් සොයා ගන්න. මේ පරමාර්ථය සඳහන් ජොහන් 20:31 ඉන්පසු කියවන්න.

## ඓතිහාසික ග්‍රන්ථය

නව ගිවිසුමේ ඓතිහාසික පොත් එකක් ඇත. ඒ ක්‍රියා පොත වේ. මෙම පොතෙන් පැවසෙන්නේ සභාව ආරම්භ වූ ආකාරය හා ලොව මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීමේ ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පැවරුම ඉටු කළ ආකාරය වේ. ඔබගේ බයිබලයේ මෙම පොත සොයාගන්න.

## හසුන්

නව ගිවිසුමේ හසුන් 21 ක් ඇත. ඒවා නම්:

| | |
|---|---|
| රෝම | තීතස් |
| 1 හා 2 කොරින්ති | පිලෙමොන් |
| එපීස | හෙබ්‍රෙව් |
| පිලිප්පි | ජාකොබ් |
| කොලොස්සි | 1 හා 2 පේදුරු |
| 1 හා 2 තෙසලෝනික | 1, 2 හා 3 ජොහන් |
| 1 හා 2 තිමෝති | ජුද් |

මෙම ලිපි සියලුම ඇදහිලිවතුන්ට යොමු කර ඇත. ඒවායේ පරමාර්ථය වන්නේ ජීවත්වීමට මගපෙන්වීමට හා ජේසුස් වහන්සේ පැවසූ දේ කිරීමට උපකාර වීම වේ. රෝම 12 ඒවායේ ඉගැන්වීම් පිළිබඳ හොඳ නිදසුනකි. මේ පරිච්ජේදය පෙරලාගෙන කියවන්න. මෙම හසුන් ඇතැම් විට "යැවුම් පත්‍ර" ලෙසද හැඳින්වේ.

## අනාවැකි

අනාවැකි පිළිබඳව නව ගිවිසුමේ ඇති එකම පොත එළිදරව්ව වේ. ජේසුස් වහන්සේගේ හා උන් වහන්සේගේ සෙනඟගේ අවසාන ජයග්‍රහණය ඉන් පවසයි. එහි පරමාර්ථය වන්නේ යුගයේ අවසාන දක්වා කිතුනුවෙකු ජීවත් විය යුතු ආකාරයට ජීවත්වීමට ඔබ දිරිගැන්වීම වේ. එහි පණිවුඩය එළිදරව් 2:10 හි සාරාංශ කර ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න

______________________________

______________________________

______________________________

2. “බයිබලය” යන වචනයෙහි තේරුම කුමක්ද? ______________________________

3. “ශුද්ධ ලියවිල්ල” යන වචනයෙහි තේරුම කුමක්ද? ______________________________

4. බයිබලයේ ප්‍රධාන බෙදීම් දෙක මොනවාද?

______________________________ ______________________________

5. බයිබලයේ පොත් කියක් තිබේද? ______________________________

6. පැරණි ගිවිසුම බෙදා ඇති ප්‍රධාන බෙදීම් හතර නම් කරන්න.

______________________________ ______________________________

______________________________ ______________________________

7. නව ගිවිසුම බෙදා ඇති ප්‍රධාන බෙදීම් හතර නම් කරන්න.

______________________________ ______________________________

______________________________ ______________________________

8. “ගිවිසුම” යන වචනයෙහි තේරුම කුමක්ද?

______________________________

______________________________

9. බයිබලයේ ප්‍රධාන පරමාර්ථ හතර කුමක්ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් යොමුවන් දෙන්න.

______________________________

______________________________

______________________________

______________________________

10. “බයිබලයේ ඒකත්වය” යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

---

11. “බයිබලයේ විවිධත්වය” යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

---

12. සෑම ප්‍රකාශයක්ම කියවන්න. ප්‍රකාශය **සත්‍යයක්** නම් එය ඉදිරියේ ඇති හිස් තැනේ “ස” යන්නද අසත්‍ය නම් “අ” යන්න ද ලියන්න.

**a** _______________ බයිබලය යනු එකම සැබෑ දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය වේ.

**b** _______________ දේවානුභාවයෙන් බයිබලය ලියනු ලැබුවද දෙවියන් වහන්සේ බයිබලය ලිවීමට මිනිසුන් භාවිත කළ සේක.

**c** _______________ වසර ගණනාවක් තුළ බොහෝ ලේඛකයින් විසින් බයිබලය ලියන ලද බැවින් එහි පරස්පර විරෝධි තැන් බෙහෙවින් ඇත.

**d** _______________ බයිබලයේ එක් තේමාවක් නොමැත. එය විවිධ විෂයයන් පිළිබඳ පොත් එකතුවකි.

**e** _______________ පැරණි ගිවිසුමේ මහා දිවැසිවරු, චූල දිවැසිවරුන්ට වඩා වැදගත් වේ.

13. ගිවිසුම් දෙකෙහිම එළිදරව්වීම කේන්ද්‍රගතවන පුද්ගලයා කවරෙක්ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් යොමුවක් දෙන්න.

---

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඊළඟ පිටුවේ ඇති සටහන් (Book Marks) ඔබට බයිබලයේ ප්‍රධාන බෙදීම් ඉගෙනීමට උපකාරී වනු ඇත. ඒවා ඉරි දිගේ කපා, එක් එක් තීරුව බයිබලයේ පිටු අතර තබන්න. ඒවා තැබිය යුතු තැන ගැන ගැටලුවක් ඇත්නම් බයිබලයේ පටුන උපකාර කරගන්න. එහි බයිබලයේ ඇති පොත් අනුපිළිවෙළින් සඳහන් වේ. එමෙන්ම ඒ ඒ පොතේ ආරම්භක පිටු අංකය ද එහි ඇත.

### පැරණි ගිවිසුම

උත්පත්ති පොත ආරම්භයේ සටහන 1 තබන්න.

ජෝෂුවා පොත ආරම්භයේ සටහන 2 තබන්න.

ජෝබ් පොත ආරම්භයේ සටහන 3 තබන්න.

යෙසායා පොත ආරම්භයේ සටහන 4 තබන්න.

### නව ගිවිසුම

මතෙව් පොත ආරම්භයේ සටහන 5 තබන්න

ක්‍රියා පොත ආරම්භයේ සටහන 6 තබන්න

රෝම පොත ආරම්භයේ සටහන 7 තබන්න

එළිදරව්ව පොත ආරම්භයේ සටහන 8 තබන්න

ඔබ දැන් බයිබලයේ ප්‍රධාන බෙදීම් සොයාගෙන තිබේ. මතකයෙන් මෙම බෙදීම් නම් කර ඒවා සොයාගැනීමට හැකිවන තුරු මෙම සටහන් (Book Marks) තබා ගන්න.

| පැරණි ගිවිසුම් නීතිය (1) | පැරණි ගිවිසුම් ඉතිහාසය (2) | පැරණි ගිවිසුම් කාව්‍ය (3) |
|---|---|---|
| උත්පත්ති<br>නික්මයාම<br>ලෙවී ව්‍යවස්ථාව<br>ගණන් කථාව<br>ද්විතිය නීති සංග්‍රහය | ජෝෂුවා<br>විරාවලිය<br>රූත්<br>1 සාමුවෙල්<br>2 සාමුවෙල්<br>1 රාජාවලිය<br>2 රාජාවලිය<br>1 වංශාවලිය<br>2 වංශාවලිය<br>එස්රා<br>නෙහෙමියා<br>එස්තර් | ජෝබ්<br>ගීතාවලිය<br>හිතෝපදේශ<br>ධර්මදේශකයා<br>ප්‍රේම ගී |
| **පැරණි ගිවිසුම් දිවැසි වැකි (4)**<br>ප්‍රධාන දිවැසිවරු<br>යෙසායා<br>ජෙරමියා<br>විලාප ගී<br>එසෙකියෙල්<br>දානියෙල් | **සුළු දිවැසිවරු**<br>හොසියා<br>ජෝවෙල්<br>ආමොස්<br>ඔබදියා<br>ජෝනා<br>මීකා<br>නාහුම්<br>හබක්කුක්<br>ශෙපනියා<br>හග්ගයි<br>සෙකරියා<br>මලාකි | **පැරණි ගිවිසුම්**<br>book marks |
| **නව ගිවිසුම ශුභාරංචි (5)**<br>මතෙව්<br>මාක්<br>ලූක්<br>ජොහන් | **නව ගිවිසුම් ඉතිහාසය (6)**<br>ක්‍රියා පොත | **නව ගිවිසුම් හසුන් (7)**<br>රෝම<br>1 කොරින්ති<br>2 කොරින්ති<br>ගලාති<br>එපීස<br>පිලිප්පි<br>කොලොස්සි<br>1 තෙසලෝනික<br>2 තෙසලෝනික<br>1 තිමෝති<br>2 තිමෝති<br>තීතස්<br>පිලෙමොන්<br>හෙබ්‍රෙව්<br>ජාකොබ්<br>1 පේදුරු<br>2 පේදුරු<br>1 ජොහන්<br>2 ජොහන්<br>3 ජොහන්<br>ජුද් |
| **නව ගිවිසුම් දිවැසිවැකි (8)**<br>එළිදරව්ව | | **නව ගිවිසුම්**<br>book marks |

# දෙවන පරිච්ඡේදය

## බයිබලයේ පොත්

### අරමුණු :

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පැරණි ගිවිසුමේ ඇති පොත් සංඛ්‍යාව හඳුනාගැනීමට
- නව ගිවිසුමේ ඇති පොත් සංඛ්‍යාව හඳුනාගැනීමට
- බයිබලය කියවීම සඳහා ක්‍රමවත් සැලැස්මක් තිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- සාර්ථකව බයිබලය කියවීම සඳහා යෝජනා හතරක් දැනගැනීමට

ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :

**සමිඳුනි, මාගේ මොරගැසීම ඔබ ඉදිරියට පැමිණේවා! ඔබේ පොරොන්දුව අනුව මට නැණනුවණ දුන මැනව (ගීතාවලිය 119:169).**

### හැඳින්වීම

බයිබලය යනු දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය බව පසුගිය පරිච්ඡේදයෙන් අපි ඉගෙන ගතිමු. පැරණි හා නව ගිවිසුම් ලෙස එය කොටස් දෙකකට බෙදා ඇති බවද ඔබ ඉගෙන ගත්තෙහිය. ඔබ පැරණි ගිවිසුමේ පොත්වල බෙදීම් හතර ද ඉගෙන ගත්තෙහිය.

ව්‍යවස්ථාව
ඉතිහාසය
කාව්‍ය
අනාවැකි

නව ගිවිසුමේ බෙදීම් හතර ද ඉගෙන ගත්තෙහිය.

ශුභාරංචි
ඉතිහාසය
හසුන්
අනාවැකි

බයිබලය පිළිබඳව ඔබ මෙතෙක් උගත් දේ පහත දැක්වෙන සටහනින් සංක්ෂේප කෙරේ.

බයිබලය

දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය

පොත් 66 කි

| පැරණි ගිවිසුම් බෙදීම් | නව ගිවිසුම් බෙදීම් |
|---|---|
| ව්‍යවස්ථාව, ඉතිහාසය, කාව්‍ය, අනාවැකි | ශුභාරංචි, ඉතිහාසය, හසුන්, අනාවැකි |

මෙම පරිච්ඡේදයේ අන්තර්ගත වන්නේ, ප්‍රධාන ලෙස පැරණි හා නව ගිවිසුම් ලෙස බෙදා ඇති බයිබලයේ පොත් 66 සෑම පොතකම සාරාංශයකි. එය ගිවිසුම් දෙකෙහිම අන්තර්ගතයට හැඳින්වීමක් සපයයි. බයිබලය සාර්ථකව කියවීම සඳහා යෝජනා හතරක් ද ඇති අතර දේව වචනය කියවීම ආරම්භ කිරීමට ඔබ ක්‍රමවත් සැලැස්මක් තෝරා ගත යුතුය.

## පැරණි ගිවිසුමේ පොත්

(පොත් 39 කි)

### ව්‍යවස්ථාව පිළිබඳ පොත් :

උත්පත්ති : විශ්වයේ, මිනිසාගේ, සබත් දවසේ, විවාහයේ, පාපයේ, පූජාවන්ගේ, ජාතීන්ගේ හා රජයේ ආරම්භය වාර්තා කරන අතර ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් හා ජෝසෙප් වැනි දෙවියන් වහන්සේගේ ප්‍රධාන මනුෂ්‍යයන් ගැන ද වාර්තා කරයි.

නික්මයාම : මෝසෙස් නායකයා වශයෙන් ඉශ්රායෙලය ජාතියක් වූ ආකාරය විස්තර කරයි. මිසරයේ වහල්බවින් ඉශ්රායෙලය මුදාගනු ලබන අතර දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව දෙන ලද සීනයි කන්ද වෙත ගමන් කරයි.

ලෙවී ව්‍යවස්ථාව : මෙම පොත ඉශ්රායෙල්වරුන්ගේ නමස්කාරය සඳහා අත්පොතකි. එය ආගමික නායකයන්ට උපදෙස් සපයන අතර, පාපී මිනිසුන්ට ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු වෙතට යා හැකි ආකාරය පැහැදිලි කරයි. ලෝකයේ පව් දුරුකරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියා වන ජේසුස් වහන්සේගේ පැමිණීමට එය සම්බන්ධ කරයි.

ගණන් කථාව : දෙවියන් වහන්සේට අකීකරුවීමේ ප්‍රතිඵලයක් ලෙස පාළුකරයේ අවුරුදු 40 ක් ඉශ්රායෙල් ගිය ගමන මෙහි වාර්තා වී ඇත. මේ පොතෙහි මාතෘකාව මේ දිගු ගමනේ දී ගත් ගණන් ගැනීම් දෙකක් නිසා වේ (ජනගහන සංගණනයන්).

ද්විතීය නීති සංග්‍රහය : මෝසෙස්ගේ ජීවිතයේ අවසාන දවස් වාර්තා කර ඇති අතර නික්මයාමේ හා ලෙවී ව්‍යවස්ථාවේ දී ඇති නීති පුනරීක්ෂණය කරයි.

### ඓතිහාසික පොත්

ජෝෂුවා : මෝසෙස්ගේ අනුප්‍රාප්තිකයා වූ ජෝෂුවා, ඉශ්රායෙල් සෙනඟ පොරොන්දු දේශය වූ කානාන් වෙත ගිය ආකාරය විස්තර කරයි. මෙහි යුද්ධ ව්‍යාපාර හා සෙනඟ අතර දේශය බෙදූ ආකාරය වාර්තාකර ඇත.

විරාවලිය : ජෝෂුවාගේ මරණයෙන් පසු ඉශ්රායෙලය දෙවියන් වහන්සේ වෙතින් ඈත් විය. ඔවුන් නැවත නැවත කළ පාප පිළිබඳ කනගාටුදායක කතාව හා දෙවියන් වහන්සේ නැගිටවූ වීරයන් සතුරු බලවේගවලින් ඔවුන් මුදාගත් ආකාරය මෙම පොතේ වාර්තා වේ.

රූත්ගේ කථාව : රූත් ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේට සේවය කිරීමට තෝරාගත් මෝවබ් නම් අන්‍ය දේශීය කාන්තාවකි. ඇය දාවිත්ගේ මී මිත්තනිය වූවාය.

1 සාමුවෙල් : මෙම පොත පුද්ගලයන් තිදෙනෙකු පිළිබඳව වේ. ඉශ්රායෙල්හි අවසාන විරවරයා වූ සාමුවෙල්, ඉශ්රායෙල්හි පළමු රජු වූ සාවුල් හා සාවුල්ට පසු රජකමට පත් දාවිත් ඒ අය වේ.

2 සාමුවෙල් : දාවිත් රජුගේ අනර්ඝ 40 අවුරුදු පාලනය මෙම පොතෙහි වාර්තා කර ඇත.

1 රාජාවලිය : මෙම පොතෙහි විෂයන් වන්නේ සලමොන් රජුගේ පාලන සමය හා උතුරෙහි ආහබ් ද දකුණෙහි ජෙහෝෂාපාට් ද වශයෙන් බෙදුනු රාජ්‍යයේ පාලන පිළිබඳව වේ.

2 රාජාවලිය : ඉශ්රායෙල්හි හා ජුදාහි රාජ්‍යයන්ගේ වැටීම ගැන මෙම පොතෙහි සඳහන් වේ. දෙවියන් වහන්සේගේ සෙනඟ බොහෝ සේ පාපයට වැටුනෝය.

1 වංශාවලිය : දාවිත්ගේ පාලන සමය හා දේව මාලිගාව ගොඩනැඟීමේ සූදානම මෙම පොතේ වාර්තා කර ඇත. මෙම පොත ද 2 සාමුවෙල් යුගයම වේ.

2 වංශාවලිය : දකුණු රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කරමින් සලමොන්ගේ පාලන සමයේ ඉතිහාසය තවදුරටත් මෙහි වාර්තා කර ඇත. මෙය අවසන් වන්නේ බබිලෝනියේ සිට යෙරුසලමට පැමිණීමට අවසර දීමේ සයිරස් රජුගේ ප්‍රකාශයෙනි.

එස්රා : ජුදෙව්වරුන් බබිලෝනියේ සිට ආපසු පැමිණීම මෙහි විස්තර කර ඇත.

නෙහෙමියා : නෙහෙමියාගේ මඟපෙන්වීම යටතේ ජෙරුසලමේ පවුර නැවත ගොඩනැඟීම මෙම පොතේ සඳහන් වේ. එස්රා සෙනඟ සමග  ජෙරුසලමට පැමිණීමෙන් වසර 14 කට පමණ පසු මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරුණි.

එස්තර් : මෙම පොතෙහි විෂය වන්නේ එස්තර් හා මොර්දෙකයි මගින් දෙවියන් වහන්සේ ජුදෙව්වන් මුදාගැනීම පිළිබඳව වේ.

## කාව්‍යමය පොත්

ජෝබ්ගේ කථාව : ආබ්‍රහම්ගේ කාලයේ ජීවත් වූ ජෝබ් නැමැත්තෙකු පිළිබඳ කතාව මෙහි වාර්තා වේ. මෙහි තේමාව වන්නේ ධර්මිෂ්ඨ මිනිසුන් දුක්විඳින්නේ මන්ද යන ප්‍රශ්නය වේ.

ගීතාවලිය : බයිබලයේ යාච්ඤා හා ප්‍රශංසා පොතය.

හිතෝපදේශ : දෛනික ජීවිතයේ ප්‍රායෝගික ප්‍රශ්නවලට දිව්‍යමය ප්‍රඥාව.

ධර්මදේශකයා : දෙවියන් වහන්සේගෙන් වෙන්වූ ජීවිතයක නිෂ්ඵලතාව පිළිබඳ සාකච්ඡාවකි.

සලමොන්ගේ ගී (ප්‍රේම ගී) : සලමොන් හා ඔහුගේ මනාලිය අතර ප්‍රේම කතාව මෙහි ඇත. ඉශ්රායෙල් කෙරෙහි දෙවියන් වහන්සේගේත් සභාව කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේත් ප්‍රේමය මෙම කතාවෙන් දැක්වේ.

## අනාවැකි පොත්

මෙම පොතේ බොහොමයක් ලියා ඇත්තේ ඉශ්රායෙලය, ඉශ්රායෙල් හා ජුදා දේශය ලෙස වෙනම රාජ්‍යයන් දෙකකට බෙදුණු පසුව වේ.

යෙසායා : දෙවියන් වහන්සේට විරුද්ධව කෙරෙන පාප නිසා ජුදා දේශයට විරුද්ධව පැමිණෙන විනිශ්චයන් පිළිබඳව අනතුරු ඇඟවීමකි.

ජෙරමියා : ජුදාහි පසුකාලීන පිරිහීම හා වැටීම සිදු වූ කාලයේ ලියන ලද්දකි. පැමිණීමට නියමිත විනිශ්චයයන් පවසා නෙබුකද්නෙශර්ට යටත්වන ලෙස ඉල්ලන ලදී.

විලාප ගී : බබිලෝනිය විසින් ජෙරුසලම විනාශ කිරීම පිළිබඳව ජෙරමියාගේ විලාප ගී (කනගාටුව ප්‍රකාශ කෙරෙන) වේ.

එසකියෙල් : පළමුව ජෙරුසලමේ ඉදිරි වැටීම පිළිබඳව පවසන අතර ඉන්පසු අනාගතයේ දී නැවත ප්‍රකෘතිමත් වන බවට අනාවැකි පල කරයි.

දානියෙල් : ජුදා දේශය වැටලූ මුල් අවදියේ දිවැසිවර දානියෙල් අල්ලා ගෙන බබිලෝනියට ගෙනයන ලදී. බයිබල් අනාවැකි අවබෝධ කරගැනීමට වැදගත් වන ඓතිහාසික හා අනාවැකි පිළිබඳ ඉගැන්වීම් මෙම පොත සපයයි.

හොසියා : මෙම පොතෙහි තේමාව වන්නේ ඉශ්රායෙල්වරුන්ගේ අවිස්වාසකම, ඔවුන් ලද දඬුවම හා දෙවියන් වහන්සේ ඔවුන් නැවත ප්‍රකෘතිමත් කිරීම ගැන වේ.

ජෝවෙල් : අනාගත විනිශ්චයන් පෙන්නුම් කරන සාගතයන් ගැන කියවේ.

ආමොස් : ද්‍රව්‍යමය සමෘද්ධිය තිබුණ ද සදාචාරාත්මක පිරිහීමක් ඇති අවධියේ, ආමොස් ඉශ්රායෙලයටත් අවට ජාතීන්ටත් ඔවුන්ගේ පාප නිසා පැමිණෙන දෙවියන් වහන්සේගේ විනිශ්චය ගැන අනතුරු අඟවයි.

ඔබදියා : මළ මුහුදට දකුණින් පිහිටි දුෂ්ට ජාතියක් වන ඒදොම්ට විරුද්ධ දෙවියන් වහන්සේගේ විනිශ්චය ගැන සඳහන් වේ.

ජෝනා : අසිරියන් අධිරාජ්‍යයේ අගනුවර වූ නිනිවයෙහි දී පශ්චාතාපවීම ගැන දේශනා කළ දිවැසිවර ජෝනා පිළිබඳ කතාව වේ. අන්‍ය ජාතීන් කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා පශ්චාතාපවීමේ සැලැස්ම මෙම පොතෙන් එළිදරව් වේ.

මීකා : ඉශ්රායෙල්හි පාපයට විරුද්ධ තවත් අනාවැකියකි. ජේසුස් වහන්සේ උපදින ස්ථානය ගැන අවුරුදු 700 කට පෙර සඳහන් කරයි.

නාහුම් : ජෝනාගේ දේශනාවන් නිසා අවුරුදු 150 කට පමණ පෙර විනාශයෙන් බේරී තිබූ නිනිවයේ ඉදිරි විනාශය ගැන පවසයි.

හබක්කුක් : පාපී දේශයක් ඊටත් වඩා පාපී දේශයක් මගින් විනාශ කිරීමට ඇති දෙවියන් වහන්සේගේ සැලැස්ම එළිදරව් කරයි. “දැහැමි අය ඇදහිල්ලෙන් ජීවත් වෙති”යි යන්න උගන්වයි.

ශෙපනියා : ජුදා දේශයේ විනිශ්චය හා පුනරුත්ථාපනය

හග්ගයි : සතුරු උවදුරු නිසා දේවමාලිගාව නැවත ගොඩනැඟීම වසර 15 ක් පමණ ප්‍රමාද වී තිබූ බැවින් එය නැවත ආරම්භ කිරීමට ජුදෙව්වන්ගෙන් ඉල්ලා සිටී.

සෙකරියා : දේවමාලිගාව සම්පූර්ණ කරන ලෙස හා ආත්මික කැපවීම අලුත් කරන ලෙස ඉල්ලා සිටී. ජේසුස් වහන්සේගේ පළමු හා දෙවන පැමිණීම පිළිබඳ අනාවැකි පළ කරයි.

මලාකි : ආත්මික නොගැඹුරු බව ගැන අනතුරු අඟවන අතර ස්නාවක ජොහන්ගේ හා ජේසුස් වහන්සේගේ පැමිණීමට ගැන අනාවැකි පවසයි.

# නව ගිවිසුම
(පොත් 27 කි)

## ශුභාරංචි

ශුභාරංචි ලෙස හැඳින්වෙන පොත් හතරෙහි ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය, ජීවිතය, සේවය, ඉගැන්වීම්, මරණය හා උත්ථානය ගැන සඳහන් වේ. එක් එක් පොතෙහි ප්‍රවේශය එකිනෙකට වෙනස් වේ.

මතෙව් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ රජෙකු ලෙස අවධාරණය කෙරෙන අතර විශේෂයෙන්ම ලියා ඇත්තේ ජුදෙව්වන්ටය.

මාක් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන් වහන්සේගේ සේවකයා ලෙස අවධාරණය කෙරෙන අතර විශේෂයෙන්ම ලියා ඇත්තේ රෝමවරුන්ටය.

ලූක් : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ "මනුෂ්‍ය පුත්‍රයා" ලෙසද, උන් වහන්සේ පරිපූර්ණ මනුෂ්‍යයා ලෙස හා අසම්පූර්ණ මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරු ලෙස ඉදිරිපත් කරයි.

ජොහන් : ජේසුස් වහන්සේ දේව පුත්‍රයා ලෙස ඇති උන් වහන්සේගේ තනතුරෙන් ඉදිරිපත් කරයි.

## ඓතිහාසික පොත

ක්‍රියා : නව ගිවිසුමේ එකම ඉතිහාස පොතේ වාර්තා කර ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේ ආපසු ස්වර්ගයට යෑමේ අවස්ථාවේ සිට පාවුලුතුමා රෝමයේ සිරගත වූ අවස්ථාව දක්වා කිතුනු ආගමේ මුල් වර්ධනය වේ. අවුරුදු 33 ක පමණ කාලයක් මින් ආවරණය කෙරන අතර ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාවන් අවධාරණය කරයි.

## හසුන් :

රෝම : ඇදහිල්ල මගින් ගැළවීම ලැබීම අවධාරණය කෙරෙන ලෙස ශුභාරංචිය ඉදිරිපත් කිරීමකි.

1 කොරින්ති : ප්‍රාදේශිය කිතුනු සභාවේ කිතුනු හැසිරීමේ වැරදි නිවැරදි කිරීමට ලියන ලද්දකි.

2 කොරින්ති : ශුභාරංචියේ, ගබඩාකාරිත්වයේ හා පාවුලුතුමාගේ අපොස්තලික ආධිපත්‍යයේ සැබෑ සේවය ගැන කතා කරයි.

ගලාති : ව්‍යවස්ථාව හා ඇදහිල්ල මිශ්‍ර කිරීමේ වරද පිළිබඳව කරුණු දක්වයි. මෙහි තේමාව වන්නේ ඇදහිල්ල පමණක් මගින් ධර්මිෂ්ඨ කිරීම වේ.

එපීස : ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති තම තත්වය ගැන ඇදහිලිවතුන්ව දිරිමත් කරයි.

පිලිප්පි : කිතුනුවන්ගේ එක්සත් බවේ ප්‍රීතිය අවධාරණය කරයි.

කොලොස්සි : ජේසුස් වහන්සේ දේවපුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා බව ප්‍රතික්ෂේප කරන ව්‍යාජ ඉගැන්වීමක් වන "ඥානවාදයේ" වරද පිළිබඳව කටයුතු කරයි. ජේසුස් වහන්සේ සභාවේ ප්‍රධානියා බවද මෙම පොත අවධාරණය කරයි.

1 තෙසලෝනික : කිතුනු දිවි පෙවෙත ගැන උපදෙස් දෙන අතර ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම අවධාරණය කරයි.

2 තෙසලෝනික : ස්වාමීන්වහන්සේගේ නැවත පැමිණීම ගැන තවදුරටත් උපදෙස් සපයන අතර මේ දැනුම එදිනෙදා ජීවිතයට බලපාන අයුරු පවසයි.

1 තිමෝති : නිවැරදි දේව ධර්මයත්, ක්‍රමවත් සභා පාලනයත් හා ඉදිරි වසරවල සභාවට මගපෙන්වීම සඳහා මුලධර්ම පිළිබඳව අවධාරණය කෙරේ.
2 තිමෝති : ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ සේවකයා පිළිබදව විස්තර කරයි. එමෙන්ම දැනටමත් ආරම්භ වී ඇති භක්තිය හැර යාම ගැන ද (ආත්මිකත්වය අඩුවීම) එය අනතුරු අඟවයි. දේව වචනය, සියලු වැරදි නිවැරදි කිරීමේ ක්‍රමයක් ලෙස එය පෙන්වයි.

තිතස් : මෙය ක්‍රීත දූපතේ සේවය කරමින් සිටි තිතස් නමැති තරුණ සේවකයාට පාවුලුතුමා යැවූ හසුනකි. දේවධර්මය හා භක්තිමත් ජීවිතය අවධාරණය කර ඇත.

පිලමොන් : කොලොස්සියේ ධනවත් කිතුනුවකු වෙතින් පලාගිය වහල් දාසයෙකු වෙනුවෙන් පාවුලුතුමාගේ මැදිහත්වීමකි. වරක් පාපයට වහල්ව සිටි ඇදහිලිවතුන් වෙනුවෙන් ජේසුස් වහන්සේගේ මැදිහත්වීම මින් පිළිබිඹු කෙරේ.

හෙබ්‍රෙව් : ජුදා ආගමට වඩා කිතුනු ආගමේ උසස් බව පැහැදිලි කෙරේ. ජේසුස් වහන්සේ ශ්‍රේෂ්ඨ උත්තම පූජකයා ලෙස හා මිනිසා හා දෙවියන් වහන්සේ අතර මැදහත්කරු ලෙස මෙහි ඉදිරිපත් කර ඇත.

ජාකොබ් : ගැළවීම, ඇදහිල්ලෙන් පමණක් වුවද, සැබෑ ඇදහිල්ල ක්‍රියාවන්ගෙන් පෙනෙන බව උගන්වයි.

1 ජේදුරු :විශේෂයෙන්ම සභාවට පිටත සිටින නොඇදහිලිවතුන් මගින් එල්ල කෙරෙන ආත්මික ප්‍රහාරවලින් දුක්විඳින ඇදහිලිවතුන් දිරිමත් කරන ලිපියකි.

2 ජේදුරු : අභ්‍යන්තරයෙන් පැමිණෙන ආත්මික ප්‍රහාරවලට එරෙහි අනතුරු ඇඟවීමකි. නිදසුනක් ලෙස දැනටමත් සභාවට “රිංගා” ඇති ව්‍යාජ ගුරුවරුන්ගෙන් එන ප්‍රහාර පිළිබඳ ලිපියකි.

1 ජොහන් : දේව පුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා ලෙස ක්‍රිස්තුස්වහන්සේට ඇති තැන ලබා නොදෙන ඥානවාදය හා සටන් කිරීමට මෙය ලියා ඇත. මෙම පොත, ඇදහිලිවතුන් අතර සහභාගිකම අවධාරණය කරන අතර සැබෑ ඇදහිලිවතුන්ට සදාතන ජීවනය සහතික කරයි.

2 ජොහන් : දේවධාර්මික වැරදි සමග එකඟතාවකට පැමිණීම ගැන අනතුරු අඟවයි. සත්‍යය, සැබෑ ප්‍රේමයෙන් රැකගත යුතු බවට අවධාරණය කරයි.

3 ජොහන් : සැබෑ ඇදහිලිවතුන් සමග සහභාගිකම ප්‍රතික්ෂේප කරන අයගේ පාපය ගැන අනතුරු අඟවයි.

ජූද් : භක්තිය හැර යෑම හා ව්‍යාජ ධර්මය පිළිබඳ තවත් අනතුරු ඇඟවීමකි. මෙහි තේමාව ජේදුරුගේ තේමාවට සමාන වේ.

## අනාවැකි පිළිබඳ පොත

එළිදරව්ව : ලෝක ඉතිහාසයේ අනාගත සිදුවීම් ගැන මෙම අනාවැකි පොත පවසයි. එය අනාගත සැලැස්මේ තිබූ දේ, දැන් තිබෙන දේ හා තිබෙන්නට යන දේ ගැන පවසයි (එළිදරව් 4:22).

## සාර්ථක බයිබල් කියවීම

බයිබලය අවබෝධ කරගන්නේ හා අර්ථනිරූපණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔබ මෙම පාඩමාලාවෙන් බොහෝ දේ ඉගෙන ගන්නවා ඇත. එපමණක් නොව බයිබල් අධ්‍යයනය පිළිබඳ නිර්මාණාත්මක ක්‍රම ද ඔබ ඉගෙන ගන්නෙහිය. එහෙත් බයිබලය අවබෝධ කරගැනීමේ පළමු පියවර වන්නේ එය කියවීම ආරම්භ කිරීම වේ. දේව වචනය කියවීම ආරම්භ කිරීමට උපකාර කිරීමක් ලෙස අප විවිධ කියවීම් සැලසුම් සැකිල්ලක් දී ඇත. මේවා අතර ආරම්භ කළ අය සඳහා සැලැස්මක් මෙන්ම දේව වචනය අධ්‍යයනය සම්බන්ධව වඩාත් උසස් දැනුමක් ඇති අය සඳහා සැලැස්මක් ද අන්තර්ගත වේ.
පළමුව, සාර්ථක බයිබල් කියවීමක් සඳහා යෝජනා හතරක් පහත දැක්වේ.

## 1. දිනපතාම කියවන්න

**සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේය (ගීතාවලිය 1:2).**

දෙවියන් වහන්සේ ඔබගේ ශරීරය මවා ඇත්තේ, සෞඛ්‍ය සම්පන්නව සිටීම සඳහා, දිනපතාම ආහාර ගත යුතු ලෙසට වේ. මේ ආකාරයෙන්ම ඔබ ආත්මිකව සෞඛ්‍ය සම්පන්නව සිටීම සඳහා ඔබගේ ආත්මයට දිනපතාම දේව වචනය නමැති ආහාරය දිය යුතුය.

**ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය කියා ලියා ඇතැ"යි ඔහුට වදාළ සේක (ලූක් 4:4).**

## 2. තෝරාගෙන කියවන්න

දේව වචනයේ "කිරි" පළමුව කියවන්න. මේවා දේව වචනයේ සරල සත්‍යයන් වේ.

**ඔබ වර්ධනයවී ගැළවීම ලබන පිණිස අලුත උපන් බිළිඳුන් මෙන් පිරිසිදු අධ්‍යාත්මික කිරිවලට බොහෝ සෙයින් ආගා වන්න (1 පේදුරු 2:2).**

පසුව ඔබ ආත්මිකව පරිණත වනවා ඇත. එවිට ඔබට දේව වචනයේ "මාංශ" අනුභව කළ හැකිය. මින් අදහස් වන්නේ ඔබට බයිබලයේ වඩාත් අසීරු ඉගැන්වීම් අවබෝධ කරගත හැකි බව වේ.

**කිරි බීමෙන් ජීවත් වන්නා ළදරුවෙකු බැවින් ඔහුට හරි වැරදි පිළිබඳ හැඟීමක් නැත. එහෙත් දැඩි ආහාර අවශ්‍ය වන්නේ හොඳ නරක විමසා බැලීමට අත්දැකීමෙන් තියුණු වූ ඉඳුරන් ඇති මුහුකුරා ගිය පුද්ගලයන්ටය (හෙබ්‍රෙව් 5:13-14).**

**මම ඔබ දැඩි ආහාරයෙන් නොව කිරෙන් පෝෂණය කළෙමි. එසේ කළේ ඔබට ඒවා දැරීමට නොහැකි වූ බැවිනි. ඒවා දැරීම තවමත් ඔබට බැරිය (1 කොරින්ති 3:2).**

## 3. යාච්ඤාවෙන් යුතුව කියවන්න.

**එස්රා සමිඳුණන් වහන්සේගේ ව්‍යවස්ථාව හදාරන්නන් එය පිළිපදින්නත්, එහි ඇති අණ පණත් ඉශ්රායෙල් සෙනඟට උගන්වන්නත් ඇප කැප වී සිටියේය (එස්රා 7:10).**

කියවීම ආරම්භ කිරීමට පෙර දෙවියන් වහන්සේට යාච්ඤා කර, උන් වහන්සේ උන් වහන්සේගේ ලිඛිත වචනයෙන් ඔබට දී ඇති පණිවුඩය අවබෝධ කරගැනීමට උපකාර අයැදින්න. ඔබගේ යාච්ඤාව දාවිත් ගීතිකාකාරයාගේ මෙන් විය හැකිය.

**ඔබේ ව්‍යවස්ථාවෙහි පුදුම අගයන් දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව (ගීතාවලිය 119:18).**

## 4. ක්‍රමානුකූලව කියවන්න.

ඇතැම් අයට දේව වචනය අවබෝධ නොවන්නේ ඔවුන්ට කියවීම සඳහා ක්‍රමානුකූල සැලැස්මක් නොමැති බැවිනි. ඔවුහු එතැනින්-මෙතැනින් පරිච්ඡේදය බැගින් කියවා ඒවා එකිනෙකට ගැළපෙන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට අසමත් වෙති. මෙය ඖෂධ පිළිබඳ පෙළ පොතකින්, තැන් තැන්වල පිටු කීපය බැගින් කියවා වෛද්‍යවරයෙකු වීමට දරන උත්සාහයක් වැනිය. "ශුද්ධ ලියවිල්ල හදාරන්නයැ"යි (ජොහන් 5:39) බයිබලය පවසයි. මින් අදහස් වන්නේ පරෙස්සමෙන් අධ්‍යයනය කිරීම වේ. බයිබලය පාසලේ භාවිත කරන පෙළ පොතක් වැනිය. එහි අන්තර්ගතය අවබෝධ කරගැනීමට ඔබ එය ක්‍රමානුකූලව කියවිය යුතුය. පහත දැක්වෙන කියවීමේ සැලැස්මක් තෝරාගෙන ඔබගේ බයිබලය කියවීම ආරම්භ කරන්න.

## නවකයින්ට

ඔබ කිසි දිනක බයිබලය කියවා නොමැති නම් අලුත් ගිවිසුමේ ජොහන්ගේ පොතෙන් පටන් ගන්න. මෙම පොත ලියා ඇත්තේ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වන ජොහන් විසිනි. ඔහු ජේසුස් වහන්සේ පිළිබඳ කතාන්දරය තේරුම් ගැනීමට පහසුවන ආකාරයෙන් සරලව ලියා ඇත.
බයිබලයේ සඳහන් අනුපිළිවෙළ අනුව දවසකට එක පරිච්ඡේදය බැගින් ජොහන්ගේ පොත කියවන්න. ඔබ කියවන අතර පහත දැක්වෙන සටහනෙහි ලකුණු කරන්න.

**ජොහන් ශුභාරංචිය**

| | | | | |
|---|---|---|---|---|
| **_________ 1** | **_________ 5** | **_________ 9** | **_________ 13** | **_________ 17** |
| **_________ 2** | **_________ 6** | **_________ 10** | **_________ 14** | **_________ 18** |
| **_________ 3** | **_________ 7** | **_________ 11** | **_________ 15** | **_________ 19** |
| **_________ 4** | **_________ 8** | **_________ 12** | **_________ 19** | **_________ 20** |

## කෙටි සැලැස්ම

බයිබලය කියවීමේ කෙටි සැලැස්මේ සැලසුම් කර ඇත්තේ, ශුද්ධ ලියවිල්ලේ තෝරාගත් කොටස් මගින් බයිබලය පිළිබඳ මූලික දැනුමක් ලබා දීමට වේ. ඒවා ලයිස්තු ගත කර ඇති අනුපිළිවෙළ අනුව තෝරාගත් කොටස් කියවන්න. ඔබ කියවීම අවසන් කරන විට සටහනෙහි එය ලකුණු කරන්න.

### නව ගිවිසුම

______ ජොහන්

______ මාක්

______ ලූක්

______ ක්‍රියා

______ රෝම

______ 1 තෙසලෝනික

______ 1 කොරින්ති

______ රෝම

______ පිලෙමොන්

______ පිලිප්පි

______ එපීස

______ 2 තිමෝති

______ 1 පේදුරු

______ 1 ජොහන්

______ එළිදරව් 1-5, 19:6-22:21

### පැරණි ගිවිසුම

______ උත්පත්ති

______ නික්මයාම 1-20

______ ගණන්කථාව 10:11-21:35

______ ද්විතීය නීති සංග්‍රහය 1-11

______ ජෝෂුවා 1-12, 22-24

______ විරාවලිය 1-3

______ 1 සාමුවෙල් 1-3,9-10,13.15-18,31

______ 2 සාමුවෙල් 1

______ 1 රාජාවලිය 1-11

______ නෙහෙමියා

______ ආමොස්

______ යෙසායා 1-12

______ ජෙරමියා 1-25, 39-33

______ රූත්

______ ජෝනා

______ ගීතාවලිය 1-23

______ ජෝබ් 1-14, 38-42

______ හිතෝපදේශ 1-9

______ දානියෙල් 1-6

## දිගු සැලැස්ම

මෙම කියවීමේ සැලැස්ම කෙටි සැලැස්මට වඩා ගැඹුරින් බයිබලය ආවරණය කරයි. එහෙත් මුළු බයිබලයම ආවරණය නොකරයි.

### නව ගිවිසුම

______ මාර්ක්

______ මතෙව්

______ ජොහන්

______ ලූක්

______ ක්‍රියා

______ 1 තෙසලෝනික

______ 2 තෙසලෝනික

______ 1 කොරින්ති

______ 2 කොරින්ති

______ ගලාති

______ රෝම

______ පිලෙමොන්

______ කොලොස්සි

______ පිලිප්පි

______ එපිස

______ 2 තිමෝති

______ තීතස්

______ 1 තිමෝති

______ 1 පේදුරු

______ හෙබ්‍රෙව්

______ ජාකොබ්

______ 1 ජොහන්

______ 2 ජොහන්

______ 3 ජොහන්

______ ජුද්

______ 2 පේදුරු

______ එළිදරව් 1-5 සහ 19:6-22:21

## පරණ ගිවිසුම

| | |
|---|---|
| ______ උත්පත්ති | ______ ජෙරමියා 1-25 සහ 30-33 |
| ______ නික්මයාම (1-24) | ______ නාහුම් |
| ______ ලෙවී ව්‍යවස්ථාව 1-6:7 | ______ හබක්කුක් |
| ______ ගණන් කථාව 10:11-21:35 | ______ එසකියෙල් 1-24 සහ 33-39 |
| ______ ද්විතිය නීති සංග්‍රහය 1-11 සහ 27-34 | ______ ඔබදියා |
| ______ ජෝෂුවා 1-12 සහ 22-24 | ______ විලාප ගී |
| ______ විරාවලිය 1-16 | ______ යෙසායා 40-66 |
| ______ 1 සාමුවෙල් | ______ සෙකරියා 1-8 |
| ______ 2 සාමුවෙල් | ______ මලාකි |
| ______ 1 රාජාවලිය | ______ ජෝවෙල් |
| ______ 2 රාජාවලිය | ______ රූත් |
| ______ 1 වංශාවලිය | ______ ජෝනා |
| ______ 2 වංශාවලිය | ______ ගීතාවලිය |
| ______ එස්රා | ______ ජෝබ් |
| ______ නෙහෙමියා | ______ හිතෝපදේශ 1-9 |
| ______ ආමොස් | ______ ප්‍රේම ගී |
| ______ හොසියා | ______ ධර්මදේශකයා |
| ______ මීකා | ______ එස්තර් |
| ______ යෙසායා 1-12 | ______ දානියෙල් |
| ______ ශෙපනියා | |

## සම්පූර්ණ සැලැස්ම

සම්පූර්ණ බයිබල් කියවීමේ සැලැස්ම අවුරුද්දක් ඇතුළත මුළු බයිබලයම කියවීමට සැලසුම් කර ඇත.

### ජනවාරි

______1. උත්පත්ති 1-2
______2. උත්පත්ති 3-5
______3. උත්පත්ති 6-9
______4. උත්පත්ති 10-11
______5. උත්පත්ති 12-15
______6. උත්පත්ති 16-19
______7. උත්පත්ති 20-22
______8. උත්පත්ති 23-26
______9. උත්පත්ති 27-29
______10. උත්පත්ති 30-32
______11. උත්පත්ති 33-36
______12. උත්පත්ති 37-39
______13. උත්පත්ති 40-42
______14. උත්පත්ති 43-46
______15. උත්පත්ති 47-50
______16. ජෝබ් 1-4
______17. ජෝබ් 5-7
______18. ජෝබ් 8-10
______19. ජෝබ් 11-13
______20. ජෝබ් 14-17
______21. ජෝබ් 18-20
______22. ජෝබ් 21-24
______23. ජෝබ් 25-27
______24. ජෝබ් 28-31
______25. ජෝබ් 32-34
______26. ජෝබ් 35-37
______27. ජෝබ් 38-42
______28. නික්මයාම 1-4
______29. නික්මයාම 5-7
______30. නික්මයාම 8-10
______31. නික්මයාම 11-13

### පෙබරවාරි

______1. නික්මයාම 14-17
______2. නික්මයාම 18-20
______3. නික්මයාම 21-24
______4. නික්මයාම 25-27
______5. නික්මයාම 28-31
______6. නික්මයාම 32-34
______7. නික්මයාම 35-37
______8. නික්මයාම 38-40
______9. ලෙවී ව්‍යවස්ථාව 1-4
______10. ලෙවී ව්‍යවස්ථාව 5-7
______11. ලෙවී ව්‍යවස්ථාව 8-10
______12. ලෙවී ව්‍යවස්ථාව 11-13
______13. ලෙවී ව්‍යවස්ථාව 14-16
______14. ලෙවී ව්‍යවස්ථාව 17-19
______15. ලෙවී ව්‍යවස්ථාව 20-23
______16. ලෙවී ව්‍යවස්ථාව 24-27
______17. ගණන් කථාව 1-3
______18. ගණන් කථාව 4-6
______19. ගණන් කථාව 7-10
______20. ගණන් කථාව 11-14
______21. ගණන් කථාව 15-17
______22. ගණන් කථාව 18-20
______23. ගණන් කථාව 21-24
______24. ගණන් කථාව 25-27
______25. ගණන් කථාව 28-30
______26. ගණන් කථාව 31-33
______27. ගණන් කථාව 34-36
______28. ද්විතිය නීති සංග්‍රහය 1-3

**මාර්තු**

______1. ද්විතිය නීති සංග්‍රහය 4-6
______2. ද්විතිය නීති සංග්‍රහය 7-9
______3. ද්විතිය නීති සංග්‍රහය 10-12
______4. ද්විතිය නීති සංග්‍රහය 13-16
______5. ද්විතිය නීති සංග්‍රහය 17-19
______6. ද්විතිය නීති සංග්‍රහය 20-22
______7. ද්විතිය නීති සංග්‍රහය 23-25
______8. ද්විතිය නීති සංග්‍රහය 26-28
______9. ද්විතිය නීති සංග්‍රහය 29-31
______10. ද්විතිය නීති සංග්‍රහය 32-34
______11. ජෝෂුවා 1-3
______12. ජෝෂුවා 4-6
______13. ජෝෂුවා 7-9
______14. ජෝෂුවා 10-12
______15. ජෝෂුවා 13-15
______16. ජෝෂුවා 16-18
______17. ජෝෂුවා 19-21
______18. ජෝෂුවා 22-24
______19. වීරාවලිය 1-4
______20. වීරාවලිය 5-8
______21. වීරාවලිය 9-12
______22. වීරාවලිය 13-15
______23. වීරාවලිය 16-18
______24. වීරාවලිය 19-21
______25. රූත් 1-4
______26. 1 සාමුවෙල් 1-3
______27. 1 සාමුවෙල් 4-7
______28. 1 සාමුවෙල් 8-10
______29. 1 සාමුවෙල් 11-13
______30. 1 සාමුවෙල් 14-16
______31. 1 සාමුවෙල් 17-20

**අප්‍රේල්**

______1. 1 සාමුවෙල් 21-24
______2. 1 සාමුවෙල් 25-28
______3. 1 සාමුවෙල් 29-31
______4. 2 සාමුවෙල් 1-4
______5. 2 සාමුවෙල් 5-8
______6. 2 සාමුවෙල් 9-12
______7. 2 සාමුවෙල් 13-15
______8. 2 සාමුවෙල් 16-18
______9. 2 සාමුවෙල් 19-21
______10. 2 සාමුවෙල් 22-24
______11. ගීතාවලිය 1-3
______12. ගීතාවලිය 4-6
______13. ගීතාවලිය 7-9
______14. ගීතාවලිය 10-12
______15. ගීතාවලිය 13-15
______16. ගීතාවලිය 16-18
______17. ගීතාවලිය 19-21
______18. ගීතාවලිය 22-24
______19. ගීතාවලිය 25-27
______20. ගීතාවලිය 28-30
______21. ගීතාවලිය 31-33
______22. ගීතාවලිය 34-36
______23. ගීතාවලිය 37-39
______24. ගීතාවලිය 40-42
______25. ගීතාවලිය 43-45
______26. ගීතාවලිය 46-48
______27. ගීතාවලිය 49-51
______28. ගීතාවලිය 52-54
______29. ගීතාවලිය 55-57
______30. ගීතාවලිය 58-60

**මැයි**

______1. ගීතාවලිය 61-63
______2. ගීතාවලිය 64-66
______3. ගීතාවලිය 67-69
______4. ගීතාවලිය 70-72
______5. ගීතාවලිය 73-75
______6. ගීතාවලිය 76-78
______7. ගීතාවලිය 79-81
______8. ගීතාවලිය 82-84
______9. ගීතාවලිය 85-87
______10. ගීතාවලිය 88-90
______11. ගීතාවලිය 91-93
______12. ගීතාවලිය 94-96
______13. ගීතාවලිය 97-99
______14. ගීතාවලිය 100-102
______15. ගීතාවලිය 103-105
______16. ගීතාවලිය 106-108
______17. ගීතාවලිය 109-111
______18. ගීතාවලිය 112-114
______19. ගීතාවලිය 115-118
______20. ගීතාවලිය 119
______21. ගීතාවලිය 120-123
______22. ගීතාවලිය 124-126
______23. ගීතාවලිය 127-129
______24. ගීතාවලිය 130-132
______25. ගීතාවලිය 133-135
______26. ගීතාවලිය 136-138
______27. ගීතාවලිය 139-141
______28. ගීතාවලිය 142-144
______29. ගීතාවලිය 145-147
______30. ගීතාවලිය 148-150
______31. 1 රාජාවලිය 1-4

**ජුනි**

______1. හිතෝපදේශ 1-3
______2. හිතෝපදේශ 4-7
______3. හිතෝපදේශ 8-11
______4. හිතෝපදේශ 12-14
______5. හිතෝපදේශ 15-18
______6. හිතෝපදේශ 19-21
______7. හිතෝපදේශ 22-24
______8. හිතෝපදේශ 25-28
______9. හිතෝපදේශ 29-31
______10. ධර්මදේශකයා 1-3
______11. ධර්මදේශකයා 4-6
______12. ධර්මදේශකයා 7-9
______13. ධර්මදේශකයා 10-12
______14. ප්‍රේම ගී 1-4
______15. ප්‍රේම ගී 5-8
______16. 1 රාජාවලිය 5-7
______17. 1 රාජාවලිය 8-10
______18. 1 රාජාවලිය 11-13
______19. 1 රාජාවලිය 14-16
______20. 1 රාජාවලිය 17-19
______21. 1 රාජාවලිය 20-22
______22. 2 රාජාවලිය 1-3
______23. 2 රාජාවලිය 4-6
______24. 2 රාජාවලිය 7-10
______25. 2 රාජාවලිය 11-14:20
______26. ජෝවෙල් 1-3
______27. 2 රාජාවලිය 14:21-25, ජෝනා 1-4
______28. 2 රාජාවලිය 14:26-29, ආමොස් 1-3
______29. ආමොස් 4-6
______30. ආමොස් 7-9

## ජුලි

______1. 2 රාජාවලිය 15-17
______2. හොසියා 1-4
______3. හොසියා 5-7
______4. හොසියා 8-10
______5. හොසියා 11-14
______6. 2 රාජාවලිය 18-19
______7. යෙසායා 1-3
______8. යෙසායා 4-6
______9. යෙසායා 7-9
______10. යෙසායා 10-12
______11. යෙසායා 13-15
______12. යෙසායා 16-18
______13. යෙසායා 19-21
______14. යෙසායා 22-24
______15. යෙසායා 25-27
______16. යෙසායා 28-30
______17. යෙසායා 31-33
______18. යෙසායා 34-36
______19. යෙසායා 37-39
______20. යෙසායා 40-42
______21. යෙසායා 43-45
______22. යෙසායා 46-48
______23. යෙසායා 49-51
______24. යෙසායා 52-54
______25. යෙසායා 55-57
______26. යෙසායා 58-60
______27. යෙසායා 61-63
______28. යෙසායා 64-66
______29. මීකා 1-4
______30. මීකා 5-7
______31. නාහුම් 1-3

## අගෝස්තු

______1. 2 රාජාවලිය 20-21
______2. ශෙපනියා 1-3
______3. හබක්කුක් 1-3
______4. 2 රාජාවලිය 22-25
______5. ඔබදියා/ජෙරමියා 1-2
______6. ජෙරමියා 3-5
______7. ජෙරමියා 6-8
______8. ජෙරමියා 9-12
______9. ජෙරමියා 13-16
______10. ජෙරමියා 17-20
______11. ජෙරමියා 21-23
______12. ජෙරමියා 24-26
______13. ජෙරමියා 27-29
______14. ජෙරමියා 30-32
______15. ජෙරමියා 33-36
______16. ජෙරමියා 37-39
______17. ජෙරමියා 40-42
______18. ජෙරමියා 43-46
______19. ජෙරමියා 47-49
______20. ජෙරමියා 50-52
______21. විලාප ගී 1-5
______22. 1 වංශාවලිය 1-3
______23. 1 වාංශාවලිය 4-6
______24. 1 වාංශාවලිය 7-9
______25. 1 වාංශාවලිය 10-13
______26. 1 වාංශාවලිය 14-16
______27. 1 වාංශාවලිය 17-19
______28. 1 වාංශාවලිය 20-23
______29. 1 වාංශාවලිය 24-26
______30. 1 වාංශාවලිය 27-29
______31. 2 වංශාවලිය 1-3

| සැප්තැම්බර් | | ඔක්තෝබර් | |
|---|---|---|---|
| ______1. | 2 වංශාවලිය 4-6 | ______1. | එස්තර් 4-7 |
| ______2. | 2 වංශාවලිය 7-9 | ______2. | එස්තර් 8-10 |
| ______3. | 2 වංශාවලිය 10-13 | ______3. | එස්රා 1-4 |
| ______4. | 2 වංශාවලිය 14-16 | ______4. | හග්ගයි 1-2/සෙකරියා 1-2 |
| ______5. | 2 වංශාවලිය 17-19 | ______5. | සෙකරියා 1-2 |
| ______6. | 2 වංශාවලිය 20-22 | ______6. | සෙකරියා 3-6 |
| ______7. | 2 වංශාවලිය 23-25 | ______7. | සෙකරියා 7-10 |
| ______8. | 2 වංශාවලිය 26-29 | ______8. | එස්රා 5-7 |
| ______9. | 2 වංශාවලිය 30-32 | ______9. | එස්රා 8-10 |
| ______10. | 2 වංශාවලිය 33-36 | ______10. | නෙහෙමියා 1-3 |
| ______11. | එසකියෙල් 1-3 | ______11. | නෙහෙමියා 4-6 |
| ______12. | එසකියෙල් 4-7 | ______12. | නෙහෙමියා 7-9 |
| ______13. | එසකියෙල් 8-11 | ______13. | නෙහෙමියා 10-13 |
| ______14. | එසකියෙල් 12-14 | ______14. | මලාකි 1-4 |
| ______15. | එසකියෙල් 15-18 | ______15. | මතෙව් 1-4 |
| ______16. | එසකියෙල් 19-21 | ______16. | මතෙව් 5-7 |
| ______17. | එසකියෙල් 22-24 | ______17. | මතෙව් 8-11 |
| ______18. | එසකියෙල් 25-27 | ______18. | මතෙව් 12-15 |
| ______19. | එසකියෙල් 28-30 | ______19. | මතෙව් 16-19 |
| ______20. | එසකියෙල් 31-33 | ______20. | මතෙව් 20-22 |
| ______21. | එසකියෙල් 34-36 | ______21. | මතෙව් 23-25 |
| ______22. | එසකියෙල් 37-39 | ______22. | මතෙව් 26-28 |
| ______23. | එසකියෙල් 40-42 | ______23. | මාර්ක් 1-3 |
| ______24. | එසකියෙල් 43-45 | ______24. | මාර්ක් 4-6 |
| ______25. | එසකියෙල් 46-48 | ______25. | මාර්ක් 7-10 |
| ______26. | දානියෙල් 1-3 | ______26. | මාර්ක් 11-13 |
| ______27. | දානියෙල් 4-6 | ______27. | මාර්ක් 14-16 |
| ______28. | දානියෙල් 7-9 | ______28. | ලූක් 1-3 |
| ______29. | දානියෙල් 10-12 | ______29. | ලූක් 4-6 |
| ______30. | එස්තර් 1-3 | ______30. | ලූක් 7-9 |
| | | ______31. | ලූක් 10-13 |

**නොවැම්බර්**

______1. ලූක් 14-17
______2. ලූක් 18-21
______3. ලූක් 22-24
______4. ජොහන් 1-3
______5. ජොහන් 4-6
______6. ජොහන් 7-10
______7. ජොහන් 11-13
______8. ජොහන් 14-17
______9. ජොහන් 18-21
______10. ක්‍රියා 1-2
______11. ක්‍රියා 3-5
______12. ක්‍රියා 6-9
______13. ක්‍රියා 10-12
______14. ක්‍රියා 13-14
______15. ජාකොබ් 1-2
______16. ජාකොබ් 3-5
______17. ගලාති 1-3
______18. ගලාති 4-6
______19. ක්‍රියා 15-18:11
______20. 1 තෙසලෝනික 1-5
______21. 2 තෙසලෝනික 1-3
______22. 1 කොරින්ති 1-4
______23. 1 ජොහන් 3-5
______24. 2 ජොහන්, 3 ජොහන්
______25. එළිදරව් 1-3, ජුද්
______26. එළිදරව් 4-6
______27. එළිදරව් 7-9
______28. එළිදරව් 10-12
______29. එළිදරව් 13-15
______30. එළිදරව් 16-18
______30. එළිදරව් 19-22

**දෙසැම්බර්**

______1. රෝම 5-8
______2. රෝම 9-11
______3. රෝම 12-16
______4. ක්‍රියා 20:3-22
______5. ක්‍රියා 23-25
______6. ක්‍රියා 26-28
______7. එපීස 1-3
______8. එපීස 4-6
______9. පිලිප්පි 1-4
______10. කොලොස්සි 1-4
______11. හෙබ්‍රෙව් 1-4
______12. හෙබ්‍රෙව් 5-7
______13. හෙබ්‍රෙව් 8-10
______14. හෙබ්‍රෙව් 11-13
______15. පිලෙමොන්/1 පේදුරු 1-2
______16. 1 පේදුරු 3-5
______17. 2 පේදුරු 1-3
______18. 1 තිමෝති 1-3
______19. 1 තිමෝති 4-6
______20. තිතස් 1-3
______21. 2 තිමෝති 1-4
______22. 1 ජොහන් 1-2, ක්‍රියා 18:12-19:10
______23. 1 කොරින්ති 5-8
______24. 1 කොරින්ති 9-12
______25. 1 කොරින්ති 13-16
______26. ක්‍රියා 19:11-20, 2 කොරින්ති 1-3
______27. 2 කොරින්ති 4-6
______28. 2 කොරින්ති 7-9
______29. 2 කොරින්ති 10-13
______30. ක්‍රියා 20:2/රෝම 1-4

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පැරණි ගිවිසුමේ ඇති පොත් ගණන කොපමණද?

3. නව ගිවිසුමේ ඇති පොත් ගණන කොපමණද?

4. බයිබලය කියවීම සඳහා ක්‍රමවත් සැලැස්මක් තිබීමට හේතුව කුමක්ද?

5. සාර්ථක බයිබල් කියවීමක් සඳහා දී ඇති යෝජනා හතර කවරක්ද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

- බයිබලයේ සෑම පොතක් සඳහාම, මෙම පරිච්ඡේදයේ දී ඇති විස්තරය නැවත කියවන්න.
- බයිබලයේ සෑම පොතකම නම පහත ලියන්න.
- සෑම පොතකම නම ඇසුරෙන්, එහි අන්තර්ගතය, වචන තුන හතරකින් ලියන්න.
- පළමු දෙක නිදසුන් වශයෙන් ඔබට අනුගමනය කිරීම සඳහා දක්වා ඇත.

(මේ ආකාරයෙන් ඒවා කැටිකර දැක්වීමෙන් මුළු බයිබලයේම අන්තර්ගතය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඔබට ලබාගත හැකිය)

| **පොතේ නම** | **අන්තර්ගතය** |
|---|---|
| උත්පත්ති | පටන් ගැනීම පිළිබඳ පොත |
| නික්මයාම | මිසරයෙන් නික්මයාම |

# තුන්වන පරිච්ඡේදය

## බයිබලයේ අනුවාද

### අරමුණු

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- බයිබලය ලියා තිබූ භාෂා තුන නම් කිරීමට
- "අනුවාදය" යන වචනය නිර්වචනය කිරීමට
- බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස දැක්වීමට

හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**සමිඳාණෝ අණ දුන් සේක. බොහෝ දූතයෝ ආරංචිය පතුරුවා හළහ (ගීතාවලිය 68:11)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය, බයිබලය ලියන ලද මුල් භාෂාවන් හඳුන්වා දෙන අතර ශුද්ධ ලියවිල්ල වෙනත් භාෂාවලට පරිවර්තනය කළ අයුරු විස්තර කරයි. බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස ද ඔබ ඉගෙන ගන්නවා ඇත. බයිබලයේ විවිධ අනුවාද සඳහා උදාහරණ සපයා තිබේ.

### භාෂා තුන

බයිබලය මුලින්ම භාෂා තුනකින් ලියන ලදි. පැරණි ගිවසුමේ බොහෝ කොටස්, දානියෙල් හා නෙහෙමියා පොත්වල ඇතැම් කොටස් හැරුණු විට හෙබ්‍රෙව් භාෂාවෙන් ලියා ඇත. අනෙක් කොටස් ලියන ලද්දේ අරාමිය භාෂාවෙනි. නව ගිවිසුම ග්‍රීක භාෂාවෙන් ලියා තිබිණි.

බයිබලයේ මුල් අත්පිටපත් කිසිවක් දැන් නොපවතී. මුල් ඒවායේ පිටපත් කීපයක් වන හොඳ අත්පිටපත් අද තිබේ. අනුවාද යනු මෙම මුල් අත්පිටපත්වල පරිවර්තන වේ. මුල් අවදියේ සිටම, සෑම කෙනෙකුටම තම භාෂාවෙන් බයිබලය කියවීමට හැකිවන පරිදි බයිබලය පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව පෙණිනි.

කිසිදු භාෂා දෙකක් සෑම අතකින්ම එක සමාන නොමැති බැවින් පරිවර්තන කිසිවක් එකිනෙකට සමාන නොවේ. බයිබලයේ ඇති සමහර වචන බොහෝ භාෂාවල නොපවතී. නිදසුනක් ලෙස දකුණු ඇමරිකාවේ එක්වදෝර්හි අවුකා ඉන්දියානුවන් ලෙස හැඳින්වෙන ගෝත්‍රයක් තිබේ. මිෂනාරිවරුන්ට ඔවුන් මුලින්ම හමුවූ විට මේ ඉන්දියානුවෝ ලියන්නට හෝ කියවන්නට හෝ නොදැන සිටියහ. "ලිවීම" හෝ "පොත" යන්නට ඔවුන්ගේ භාෂාවෙන් වචන නොතිබිණි.

අවුකා ඉන්දියන්වරුන්ට, ඔවුන්ගේ දේපළවල හඳුනාගැනීමේ ලකුණක් කැටයම් කිරීමේ සම්ප්‍රදායක් තිබිණි. ඔවුන්ගේ භාෂාවේ ශුද්ධ ලියවිල්ල, ලිවීම හෝ පොත යන ඒවාට වචන නොතිබූ නිසා, බයිබලය පරිවර්තනය කරන විට මේවා "දෙවියන් වහන්සේගේ කැටයම්" ලෙස හැඳින්විනි. මින් පෙන්නුම් කළේ ඒවා දෙවියන් වහන්සේට අයිති යම් දෙයක් ලෙස වේ. බයිබලය විවිධ භාෂාවලට පරිවර්තනය කිරීමේදී මුහුණ පෑමට සිදුවන අසීරුතාවන් සඳහා මෙය එක් නිදසුනකි.

## පරිවර්තන හා අර්ථෝද්ධාර

බයිබලයේ විවිධ අනුවාද තිබේ. "අනුවාද" යන වචනයෙහි තේරුම, එම බයිබලය ලියා ඇත්තේ, දේව වචනය මුලින් ලියූ භාෂාවට වඩා වෙනස් භාෂාවකින් යන්න වේ. බයිබලයේ අනුවාදවල ප්‍රධාන වර්ග දෙකකි. පරිවර්තන හා අර්ථෝද්ධාර වශයෙනි.

### පරිවර්තන

පරිවර්තනයක් යනු ග්‍රීක්, හෙබ්‍රෙව් හා අරාමිය වචන සැබවින්ම පවසන දෙය ප්‍රකාශ කිරීමට දක්වන වෑයමකි. එය හැකි පමණින් වචනාර්ථයෙන්ම, වචනයක් පාසා වචනයක පරිවර්තනයක් ලබා දෙයි. වැඩිපුර වචන ඇතුළත් කර ඇත්තේ එහි තේරුම පාඨකයාට අවබෝධ කරගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක පමණි.

### අර්ථෝද්ධාර

අර්ථෝද්ධාර වචනයෙන් වචනය පරිවර්තනය කිරීමට උත්සාහ නොකරයි. එය සිතිවිල්ලක් පාසා සිතිවිල්ලක් පරිවර්තනය කරයි. අර්ථෝද්ධාර යනු යම් කොටසක අදහස තම වචනවලින් දැක්වීමකි. මෙවැනි අනුවාදයක් තේරුම් ගැනීමට පහසුය. මන්ද එය ලියා ඇත්තේ වර්තමාන වාග්මාලාවෙන් හා ව්‍යාකරණවලින් බැවිනි. එහෙත් ඒවා දේව වචනයේ සමානම පරිවර්තනයක් නොවේ.

මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා" කොටසෙහි ඔබට සංසන්දනය කිරීම සඳහා ඉංග්‍රිසි අනුවාදවලින් නිදසුන් කිපයක් සපයා ඇත. මේවායින් පරිවර්තනය හා අර්ථෝද්ධාර අතර වෙනස පෙන්නුම් කෙරේ.

## අධ්‍යයනය සඳහා බයිබලයක් තෝරා ගැනීම

මෙම පාඨමාලාවේ හා බයිබල් අධ්‍යයනයේ පරමාර්ථයන් සඳහා බයිබලයේ KJV අනුවාදය අපි අනුමත කරමු. ඒ සඳහා හේතු කිපයක් ඇත.

### පළමුවැන්න

KJV බයිබලය ගැඹුරු අධ්‍යයනය සඳහා ඉතා නිවැරදි, හොඳ පරිවර්තනයක්. අර්ථෝද්ධාර අනුවාදයක් ශුද්ධ ලියවිල්ලේ වචනයක් පාසා වචනයක සමාන පරිවර්තනයක් නොවේ.

### දෙවැන්න

KJV සඳහා අධ්‍යයනය කිරීම සඳහා ආම්පන්න බොහොමයක් ඇත. KJV බයිබලයට ලියන ලද සමපද අකරාදී, ශබ්ද කෝෂ හා විවරණ බොහොමයක් තිබේ.

### තෙවැන්න

වෙනත් කිසිදු අනුවාදයකට වඩා KJV බොහෝ භාෂාවලින් ලබාගත හැකිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලා ලොව මුළුල්ලේම පවත්නා බැවින් අපි බයිබලයේ මෙම අනුවාදය තෝරා ගතිමු. මන්ද එය බොහෝ භාෂාවලින් ඇති බැවිනි. තමාගේම භාෂාවෙන් බයිබලයක් තිබීම වැදගත් වේ. මන්ද ඔබ හිතන්නේ හා ඔබට වඩාත් හොඳින් තේරුම්ගත හැක්කේ ඔබගේම භාෂාවෙන් බැවිනි.

ඔබට බයිබලයේ KJV පිටපතක් නොමැති නම්, American Bible Society, P.O. Box 5601, Grand central Station , New York, 10164, USA යන ලිපිනයට ලියන්න. ඔවුන් ළඟ බයිබලයේ KJV අනුවාදය ඇති සියලුම භාෂාවන් පිළිබඳ ලයිස්තුවක් ඇත. ඔබගේ භාෂාවෙන් KJV අනුවාදයක් නොමැති නම් හෝ බයිබලයක් ලබා ගැනීමේ අපහසුතාවක් ඇත්නම් හෝ United Bible societies, Bible House, P.O. Box 755, Stuttgart 1, Germany යන ලිපිනයට ලියන්න. ඔව්හු "ලෝකයේ ඇති ශුද්ධ ලියවිලි" පිළිබඳ ලයිස්තුවක් පවත්වාගෙන යති. එක් බයිබලයක් හෝ ප්‍රසිද්ධ කර ඇති සියලුම භාෂාවන් ගැන ඔව්හු දනිති.

ඔබට ඉංග්‍රීසි කියවිය හැකිනම්, එහෙත් ඔබට ඇත්තේ සීමිත වාග්මාලාවක් නම් ඔබ "Bible in Basic English" පිටපතක් ලබා ගැනීමට කැමති විය හැකිය. මෙය මුළු පැරණි හා නව ගිවිසුම වන අතර එය ලියා ඇත්තේ මූලික ඉංග්‍රීසි වචන 1000 ක් පමණ භාවිතයෙනි. මේ පිළිබඳව Cambridge University Press, New York, USA ට ලියන්න.

(සිංහල භාෂාවෙන් පැරණි හා නව අනුවාදයන් ඇත)

## රතු අකුරු මුද්‍රණය

බයිබලයේ බොහෝ අනුවාද "රතු අකුරු මුද්‍රණය" යන්නෙන් ලබා ගත හැකිය. මේවායේ ජේසුස් වහන්සේ කතා කළ වචන රතු අකුරින් මුද්‍රණය කර තිබේ. අනෙක් පාඨ මුද්‍රණය කර ඇත්තේ කළු වර්ණයෙනි.

ඔබගේ භාෂාවෙන් රතු අකුරු මුද්‍රණයක් ඇත්නම් එය ලබා ගැනීමට අපි යෝජනා කරමු. ජේසුස් වහන්සේ ඉගැන්වූ දේ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලා පුහුණුවේදී අවධාරණය කරනු ලැබේ. රතු අකුරු මුද්‍රණයෙන් උන් වහන්සේගේ ඉගැන්වීම් අවධාරණය කරයි.

## සාරාංශය

බයිබලයේ විවිධ අනුවාද වර්ධනය වූ ආකාරය පහත දැක්වෙන සටහන සාරාංශ කරයි.

බයිබලය, දේවානුභාවය තිබේ.

|

ශුද්ධවූ මනුෂ්‍යයන්ට එළිදරව් කෙරිනි. ඔව්හු දේව වචනය ග්‍රීක්, හෙබ්‍රෙව්, අරමිය

|

විවිධ භාෂාවලට පරිවර්තනය කෙරිනි. එහි ප්‍රතිඵලය වූයේ
බයිබලයේ නියම පරිවර්තන හා අර්ථෝද්ධාර අනුවාද වේ.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

___

___

___

2. "අනුවාදය" යන වචනයේ තේරුම කුමක්ද?

___

3. බයිබලයේ පරිවර්තනයක් හා අර්ථෝද්ධාර අනුවාදයක් අතර වෙනස කුමක්ද?

___

___

4. මෙම පාඩමාලාවේ භාවිත වන්නේ බයිබලයේ කිනම් අනුවාදයද?

___

5. බයිබලයේ නියම පරිවර්තනයක් නොමැත්තේ මන්ද?

___

___

6. බයිබලය මුලින්ම ලියූ භාෂා තුන කුමක්ද?

___

___

___

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

**ජොහන් 3:16 පදය, විවිධ අනුවාදවලින් පහත දැක්වේ. ඒවා අතර වෙනස ඔබට දැකගත හැකිය.**

We have selected the text of John 3:16 to illustrate the difference between the different versions of the Bible. The versions listed are the most popular English versions of the Bible.

**King James Version:** For God so loved the world that He gave his only begotten Son that whosoever believeth in Him should not perish but have everlasting life.

**New King James Version:** For God so loved the world that He gave His only begotten Son, that whoever believes in Him should not perish but have everlasting life.

**Revised Standard Version:** For God so loved the world that He gave His only Son, that whoever believes in Him should not perish but have eternal life.

**Living Bible:** For God loved the world so much that He gave His only Son so that anyone who believes in Him shall not perish but have eternal life.

**New American Standard Bible:** For God so loved the world, that He gave His only begotten Son, that whoever believes in Him should not perish, but have eternal life.

**New English Bible:** God loved the world so much that He gave His only Son, that everyone who has faith in Him may not die but have eternal life.

**Amplified Version:** For God so greatly loved and dearly prized the world that He (even) gave up His only-begotten (unique) Son, so that whoever believes in (trusts, clings to, relies on) Him shall not perish-come to destruction, be lost-but have eternal (everlasting) life.

**Phillips:** For God loved the world so much that He gave His only Son, so that everyone who believes in Him should not be lost, but should have eternal life.

**Wurst:** For in such a manner did God love the world, insomuch that His Son, the uniquely-begotten One, He gave, in order that everyone who places his trust in Him may not perish but may be having life eternal.

**Moffat:** For God loved the world so dearly that He gave up His only Son, so that everyone who believes in Him may Have eternal life instead of perishing.

# හතරවන පරිච්ඡේදය

## සැකිල්ලක් ලිවීම සඳහා හැඳින්වීමක්

**අරමුණු**
මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "සැකිල්ල" යන්න නිර්වචනය කිරීමට
- සැකිල්ලක් කියවීමට
- සැකිල්ලක් නිර්මාණය කිරීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

> **තවද, උන් වහන්සේ මට කතා කොට, "මනුෂ්‍ය පුත්‍රය, නුඹට කියන මාගේ සියලුම වචනවලට හොඳින් සවන් දී, නුඹේ සිතේ ඒවා නිදන් කරගන්න (එසකියෙල් 3:10).**

*මූලික බයිබල් සමීක්ෂණය I* හි අන්තර්ගත වන්නේ බයිබලයේ පැරණි ගිවිසුමේ සෑම පොතකම සැකිල්ලකි. මෙම සැකිල්ල මගින් දේව වචනයේ සාමාන්‍ය අන්තර්ගතයේ දළ විශ්ලේෂණයක් ලබා දෙයි. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවල වැඩි අවධාරණයක් ශුභාරංචි, ක්‍රියා පොත, හා හසුන් පිළිබඳව ඇති නිසා *මූලික බයිබල් සමීක්ෂණය II* හි එම පොත්වලට වඩාත් විස්තරාත්මක සැකිල්ලක් දී ඇත. ජේසුස් වහන්සේ ඉගැන්වූ දේ හා මුල් සභාවේ උන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රියාවට නැංවූ විට ඇති වූ ප්‍රතිඵල ගැන අප ආයතනය අවධාරණය යොමු කරයි.

මෙම පාඨමාලාවේ සැකිලිවලින් සිදුකෙරෙන්නේ බයිබලයේ සෑම පොතකම සාමාන්‍ය අන්තර්ගතය සාරාංශ කිරීමක් පමණි. මෙම සාමාන්‍ය සමීක්ෂණය අවසන් කළ පසු ඔබ ආපසු සෑම පොතක්ම වඩාත් විස්තර සහිතව අධ්‍යයනය කළ යුතුය. බයිබලයේ සෑම පොතක් සඳහාම වඩාත් විස්තරාත්මක සටහන් නිර්මාණය කර ගැනීමට මෙම සැකිලි ආරම්භයක් පමණි. මේ සඳහා නියමාකාර සැකිල්ලක් නිර්මාණය කරන අයුරු ඔබ දැනගත යුතුවේ.

### සැකිල්ලක් ලිවීම

සැකිල්ලක් ලිවීම යනු අධ්‍යයන සටහන් සංවිධානය කිරීමේ ක්‍රමවේදයකි. එය අනාගත සේවය හා අධ්‍යයනය සඳහා තොරතුරු සාරාංශ ආකාරයෙන් දක්වයි. සැකිල්ලක් ඔබට දේව වචනයට "හොඳින් සවන් දී ... සිතේ ඒවා නිදන් කරගන්න" (එසකියෙල් 3:10) උපකාරී වේ. සැකිල්ලක් තෝරාගත් විෂයයක් වටා කේන්ද්‍රිය වේ. මෙම විෂය සැකිලිවල මාතෘකාව වේ. මෙම පාඩම් මාලාවේ සැකිලිවල මාතෘකාවන් ලෙස අපි බයිබලයේ පොත්වල නම් තෝරා ගන ඇත. ඊට හේතුව ඒවා අධ්‍යයනය කරන විෂයයන් බැවිනි.

සැකිල්ලේ ප්‍රධාන කරුණු විෂය පිළිබඳව යමක් පවසයි. එමෙන්ම ප්‍රධාන කරුණු පිළිබඳව යමක් පවසන උප-කරුණු ද ඇත. "උප" යන උපසර්ගයේ තේරුම ඒවා ප්‍රදාන කරුණුවලට සම්බන්ධ බවය (ප්‍රධාන කරුණ ගැන යමක් පවසයි). ඒවා ප්‍රධාන කරුණ ගැන වඩාත් විස්තරාත්මක තොරතුරු සපයයි.

සැකිල්ලක් ලිවීමට බොහෝ ක්‍රම ඇත. ප්‍රධාන කරුණු සඳහා රෝම ඉලක්කම් භාවිත කරන ක්‍රමයක් අප තෝරාගෙන ඇත. ඔබට රෝම ඉලක්කම් ගැන එතරම්ම දැනීමක් නොමැති නම්, මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටසෙහි හෝඩියේ කැපිටල් අකුරුවලින් දැක්වේ. මේවා යටතේ තවත් කරුණු තිබේ නම් ඒවා සාමාන්‍ය ඉලක්කම්වලින් දක්වා ඇත.

සැකිල්ලක් පිළිබඳ පහත දැක්වෙන නිදසුන අධ්‍යයනය කරන්න.

**මාතෘකාව මෙතැන ඇත**

I. මෙය පළමු ප්‍රධාන කරුණ සඳහා 1 වෙනුවට භාවිත කර ඇති රෝම ඉලක්කම වේ.

A. ප්‍රධාන කරුණට සම්බන්ධ උප කරුණ සඳහා යොදා ඇති ඉලක්කම වේ.
1. මීට සම්බන්ධ තවත් උප කරුණක් ඇත්නම් ඊට 1 ඉලක්කම භාවිත කෙරේ.
2. A උප කරුණට සම්බන්ධ තවත් උප කරුණු ඇත්නම් ඒවාට සංඛ්‍යාත්මක අනුපිළිවෙළට අංක යොදන්න.

B. I ප්‍රධාන කරුණට තවත් උප කරුණු තිබිය හැකිය. ඒවාට පිළිවෙළට ඉංග්‍රිසි කැපිටල් අක්ෂර යොදන්න. මේ සෑම එකක්ම ප්‍රධාන කරුණට සම්බන්ධ විය යුතුය.

II. තවත් කරුණක් ඉදිරිපත් කිරීමට ඊළඟ රෝම ඉලක්කම යොදන්න.

A. සෑම ප්‍රධාන කරුණක් යටතේම උප කරුණු මේ ආකාරයෙන්ම යොදන්න.

**සැකිල්ල විස්තාරණය කිරීම**

මෙම පාඩමාලාවේ පොදු සැකිල්ල විස්තාරණය කළ හැකි ආකාරය දැක්වීමට නිදසුනක් ලෙස අපි රෝම 12:1-2 තෝරා ගත්තෙමු. පළමුව මෙම පද කියවන්න.

**සහෝදරයෙනි, දෙවියන් වහන්සේ ඉමහත් දයාවක් පෙන් වූ බැවින්, ඔබගේ ශරීර දෙවියන් වහන්සේට කැප කළ, උන් වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් කොට ඔප්පු කරන මෙන් ඔබගෙන් උදක් ම ඉල්ලමි. සැබෑ බුද්ධිමය නමස්කාරය එය වේ.**

**ඔබ ලෝක ව්‍යවහාරය අනුව හැඩ නොගැසී, සිත අලුත් කරගැනීමෙන් වෙනස් අය වන්න. එවිට, දෙවියන් වහන්සේගේ කැමැත්ත, එනම්, යහපත් වූ, පිළිගත යුතු වූ, සම්පූර්ණ වූ දේ කුමක්ද කියා ඔබට තේරුම්ගත හැකිය (රෝම 12:1-2).**

පහත දැක්වෙන්නේ මෙම පදවල සැකිල්ල වේ.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා ගැනීමේ පියවර**

I. ඔබගේ ශරීර ජීවමාන යාගයක් කොට ඔප්පු කරන්න.

A. ශුද්ධ වූ

B. දෙවියන්වහන්සේට පිළිගත හැකි.

II. ලෝක ව්‍යවහාරය අනුව හැඩ නොගැසෙන්න.

A. වෙනස් අය වන්න.

1. අප වෙනස් අය වන්නේ සිත අලුත් කරගැනීමෙනි.

III. මෙම පියවර අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා ගැනීමට හෝ ඔප්පු කිරීමට හෝ උපකාරී වේ. ඒවා නම්

A. යහපත්

B. පිළිගත යුතු

C. සම්පූර්ණ වූ දේ වේ.

රෝම 12:1-2 හි දී ඇති දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිබඳ පියවර මෙම සැකිල්ල මගින් පැහැදිලිව සාරාංශ කර ඇති අයුරු ඔබට දැකගත හැකිය.

දෙවියන්වහන්සේගේ වචනය අධ්‍යයනය කිරීමේදී ඔබට කිසි දිනෙක සැකිල්ලක් සම්පූර්ණ කළ නොහැකිය. දේව වචනය පිළිබඳ නව අවබෝධයක් නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට සපයන අතර ඒවා මෙම සැකිල්ලට එක් කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. සැකිල්ලක් යනු කුමක්ද?

3. මෙම අධ්‍යයනයේ උත්පත්ති පොතේ සැකිල්ල බලන්න. මේ ආකාරයේ සැකිල්ලයක දී ඇති තොරතුරු ඔබට කියවා අවබෝධ කරගත හැකිද?

4. සැකිල්ලක ප්‍රධාන කරුණු දක්වා ඇත්තේ කෙසේද?

5. ප්‍රධාන කරුණු යටතේ ඇති උප කරුණු දක්වා ඇත්තේ කෙසේද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම පාඨමාලාවේ දී ඇති සරල සැකිල්ල, ප්‍රසාරණය කිරීම සඳහා විස්තර උප කරුණු යටතේ එක්කරනු ලැබේ. නිදසුනක් ලෙස 156 පිටුවේ දී ඇති දානියෙල් පොතේ සැකිල්ල බලන්න. පළමු ප්‍රධාන කරුණ "හැඳින්වීමේ පසුබිම: දානියෙල්ගේ සමෘද්ධිය සඳහා හේතු" ලෙස නම්කර ඇත. ඉන් පළමුවන පරිච්ඡේදයේ 1-21 පද ආවරණය කෙරේ. මේ පද කියවා ඔහුගේ සාර්ථකත්වයට හේතු හැඳිනගන්න. මේවා ප්‍රධාන කරුණ යටතේ උප කරුණු ලෙස සඳහන් කරන්න.

2. සැකිල්ල නිර්මණය කිරීමේදී හා ප්‍රසාරණය කිරීමේදී පහත දැක්වෙන රෝම ඉලක්කම් ඔබට ප්‍රයෝජන වනු ඇත.

| ඉලක්කම් | රෝම ඉලක්කම් |
|---|---|
| 1 | I |
| 2 | II |
| 3 | III |
| 4 | IV |
| 5 | V |
| 6 | VI |
| 7 | VII |
| 8 | VIII |
| 9 | IX |
| 10 | X |
| 11 | XI |
| 12 | XI |
| 13 | XIII |
| 14 | XIV |
| 15 | XV |
| 16 | XVI |
| 17 | XVII |
| 18 | XVIII |
| 19 | XIX |
| 20 | XX |
| 30 | XXX |
| 40 | XL |
| 50 | L |
| 60 | LX |
| 70 | LXX |
| 80 | LXXX |
| 90 | XC |
| 100 | C |

# පැරණි ගිවිසුම

# ව්‍යවස්ථා පොත්වලට හැඳින්වීමක්

බයිබලය ලිඛිත දේව වචනය බව ඔබ පෙර පරිච්ඡේදයන්ගෙන් දැනගත්තෙහිය. එය නව හා පැරණි ගිවිසුම ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇති බවද ඉගෙන ගත්තෙහිය. පැරණි ගිවිසුමේ පොත්වල බෙදීම් හතර ද ඔබ දන්නෙහිය. ඒවා නම් ව්‍යවස්ථාව, ඉතිහාසය, කාව්‍ය හා අනාවැකි වේ. ඔබ නව ගිවිසුමේ පොත්වල බෙදීම් හතර ද ඉගෙන ගත්තෙහිය. ඒවා ශුභාරංචි, ඉතිහාසය, හසුන් හා අනාවැකිය.

ඔබ උගත් ප්‍රධාන බෙදීම්වලට අයත් පොත්වල මූලික සමීක්ෂණයක් මෙම පාඩමෙන් ආරම්භ වේ. පැරණි ගිවිසුමේ පොත් 39 ක් ඇත. අපි අපගේ සමීක්ෂණය ව්‍යවස්ථා පොත්වලින් අරඹමු.

## ව්‍යවස්ථා පොත්

ව්‍යවස්ථා පොත් ලියන ලද්දේ මෝසෙස් විසිනි. ඒවා අවුරුදු 600 ක කාලයක් තුළ පැතිරේ. ව්‍යවස්ථා පොත් පහකි.

**උත්පත්ති :** විශ්වයේ, මිනිසාගේ, සබත් දවසේ, විවාහයේ, පාපයේ, පූජාවන්ගේ, ජාතීන්ගේ හා රජයේ ආරම්භය වාර්තා කරන අතර ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් හා ජෝසෙප් වැනි දෙවියන්වහන්සේගේ ප්‍රධාන මනුෂ්‍යයන් ගැන ද වාර්තා කරයි.

**නික්මයාම :** මෝසෙස් නායකයා වශයෙන් ඉශ්රායෙලය ජාතියක් වූ ආකාරය විස්තර කරයි. මිසරයේ වහල්බවින් ඉශ්රායෙලය මුදාගනු ලබන අතර දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව දෙන ලද සීනයි කන්ද වෙත ගමන් කරයි.

**ලෙවී ව්‍යවස්ථාව :** මෙම පොත ඉශ්රායෙල්වරුන්ගේ නමස්කාරය සඳහා අත්පොතකි. එය ආගමික නායකයන්ට උපදෙස් සපයන අතර, පාපී මිනිසුන්ට ධර්මිෂ්ඨ දෙවි කෙනෙකු වෙතට යා හැකි ආකාරය පැහැදිලි කරයි. ලෝකයේ පව් දුරුකරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියා වන ජේසුස් වහන්සේගේ පැමිණීමට එය සම්බන්ධ කරයි.

**ගණන් කථාව :** දෙවියන් වහන්සේට අකීකරුවීමේ ප්‍රතිඵලයක් ලෙස පාළුකරයේ අවුරුදු 40 ක් ඉශ්රායෙල් ගිය ගමන මෙහි වාර්තා වී ඇත. මේ පොතෙහි මාතෘකාව මේ දිගු ගමනේ දී ගත් ගණන් ගැනීම් දෙකක් නිසා වේ (ජනගහන සංගණනයන්).

**ද්විතීය නීති සංග්‍රහය :** මෝසෙස්ගේ ජීවිතයේ අවසාන දවස් වාර්තා කර ඇති අතර නික්මයාමේ හා ලෙවී ව්‍යවස්ථාවේ දී ඇති නීති පුනරීක්ෂණය කරයි.

# පස්වන පරිච්ඡේදය

## උත්පත්ති

**අරමුණු :**
මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- උත්පත්ති පොතේ කර්තෘ නම් කිරීමට
- උත්පත්ති පොත ලියන ලද්දේ කවුරුන්ට ද යන්න හැඳින ගැනීමට
- උත්පත්ති පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- උත්පත්ති පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- උත්පත්ති පොත සඳහා ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ:** මෝසෙස්,

**ලියන ලද්දේ කවුරුන්ටද :** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ඉශ්‍රායෙල්හි ඓතිහාසික පසුබිම හා මැවීම. පාපය, මිදීම හා මනුෂ්‍යයා සමග දෙවියන් වහන්සේගේ පළමු කටයුතු පිළිබඳ වාර්තා සුරක්ෂිත කිරීම.

**ප්‍රධාන පදය :** උත්පත්ති 3:15

**ජීවන හා දේව සේවා මූලධර්ම :** ආරම්භයේ සිටම දෙවියන් වහන්සේගේ සැලැස්මෙහි සියලු ජාතීන් ඇතුලත්ව තිබිණි. දෙවියන් වහන්සේ අලුත් දේ මනුෂ්‍යයා සමග ආරම්භ කරන සේක.

**ප්‍රධාන චරිත :** ආදම්, ඒව, කායින්, ආබෙල්, ඒනොක්, ඒසව්, ජාකොබ් (ඉශ්‍රායෙල්), ආබ්‍රහම්, ඊසක්, ජෝසෙප්.

### සැකිල්ල

I. මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසය 1:1-11:26
- A. මැවීම 1:1-2:25
- B. මනුෂ්‍යයාගේ වැටීම 3:1-4:26
  1. ආදම් හා ඒව 3:1-24
  2. කායින් හා ආබෙල් 4:1-26
- C. වැටීමේ සිට ජල ගැල්ම දක්වා පෙළපත 5:1-32
- D. මහා ජලගැල්ම : 6:1 - 9:29
  1. මිනිසාගේ දුෂ්ටකම 6:1-4
  2. දෙවියන් වහන්සේගේ තීරණය 6:5-7
  3. නෝවා 6:8-10
  4. දෙවියන් වහන්සේ නෝවාට කතා කරයි 6:11-21
  5. නෝවාගේ ප්‍රතිචාරය 6:22
  6. දෙවියන් වහන්සේ නෝවාට කතා කරයි 7:1-4
  7. නෝවාගේ ප්‍රතිචාරය 7:5-16
  8. නැවේ ගත කළ ජීවිතය 7:17-24
  9. නැවෙන් පිටවීම 8:1-19
  10. දෙවියන් වහන්සේගේ ගිවිසුම 9:1-17
  11. නෝවාගේ පෙළපත 9:18-19
  12. නෝවාගේ දරුවන්ගේ පාපය 9:20-29

E. ජලගැල්මේ සිට ආබ්‍රහම් දක්වා : 10:1-11:26
   1. නෝවාගේ දරු පරම්පරාව 10:1-32
   2. බාබෙල් කොත 11:1-9
   3. ෂෙම්ගේ පෙළපත 11:10-26
   4. තේරාගේ පෙළපත 11:27-32

II. ඉශ්‍රායෙල්හි කුලදෙටු ඉතිහාසය : 11:27-50:26

A. ආබ්‍රහම් 11:27-25:10
   1. ආබ්‍රහම්ගේ උපත හා මුතුන් මිත්තෝ 11:26-30
   2. ඔහුගේ සංචාර 11:31-13:1
      (a) ඌර් සිට හාරාන් දක්වා 11:31-32
      (b) හාරාන් සිට කානාන් දේශය දක්වා 12:1-9
      (c) මිසරයට යෑම හා ආපසු පැමිණීම 12:10-13:1
   3. ආබ්‍රහම් හා ලොත් 13:2-14:24
      (a) ආරවුල් හා වෙන්වීම 13:2-13
      (b) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු 13:14-18
      (c) පෙරදිග රජවරුන් විසින් ලොත් අල්ලාගනු ලැබීම 14:1-24
   4. ගිවිසුම 15:1-20
   5. ඉෂ්මායෙල් 16:1-16
   6. චර්මඡේදනය 17:1-27
   7. පොරොන්දු පුත්‍රයා 18:1-15
   8. සොදොම් හා ගොමෝරා 18:16-19:38
   9. ආබ්‍රහම්, අබිමෙලෙක් රජ බැහැදැකීම 20:1-18
   9. ඊසාක්ගේ උපත හා ඉෂ්මායෙල් නෙරපාදැමීම 21:1-21
   10. ආබ්‍රහම් අබිමෙලෙක් බැලීමට යෑම 21:22-34
   12. ඊසාක් පූජා කිරීමේ යෝජනාව 22:1-19
   13. සාරාගේ මරණය හා භූමදානය 23:1-20
   14. රෙබෙකා හා ඊසාක් අතර විවාහය 24:1-67
   15. ආබ්‍රහම් හා කෙතුරා 25:1-6
   16. ආබ්‍රහම්ගේ මරණය හා භූමදානය 25:7-10

B. ඊසාක් 25:11-35:29
   1. ඊසාක්ගේ උපමා 21:1-8
   2. රෙබෙකා හා විවාහය 24
   3. ඊසාක් හා ඔහුගේ පුත්‍රයෝ 25:19-35:29
   4. ගිවිසුම අලුත් කිරීම 26:1-5
   5. අබිමෙලෙක්ව රැවටීම 26:6-33
   6. ජුඩිත් හා බාසමෙත් සමග විවාහය 26:34-35
   7. ඊසාක්, ජාකොබ් විසින් රවටනු ලැබීම 27:1-45
   8. ජාකොබ්, හාරාන් වෙත පලා යෑම 27:46-28:5
   9. ඊසාක්ගේ මරණය 35:7-10

C. ජාකොබ් 28:10-36:43
   1. ඔහුගේ උපත 25:19-26
   2. ජාකොබ් හා ඒසව් අතර තරගය 25:27-45
      (a) ජන්ම උරුමය 25:27-34
      (b) ආශිර්වාදය 27:1-45
   3. හාරාන් වෙත පලා යෑම 27:46-29:14
   4. ලෙයා හා රාකෙල් සමග ජාකොබ්ගේ විවාහ 29:15-30
   5. හාරාන්හි ජීවිතය 29:31-30:43
   6. කානාන් දේශයට ආපසු පැමිණීම 31:1-55
   7. ඒසව් හමුවීමට සූදානම්වීම 32:1-23
   8. ජාකොබ්ගේ පොරබැදීම 32:24-32
   9. ඒසව් සමග සමගි වීම 33:1-17

10. ජාකොබ් හා ඔහුගේ පවුලේ අය කානාන් දේශයේ විසීම 33:18-45:28
11. ජාකොබ්ගේ අවසාන දවස් හා මරණය 46:1-50:14

D. ජෝසෙප් 37:1-50:26
1. ජෝසෙප්ගේ ජීවිතයේ මුල් අවදිය 37:1-36
   (a) ඔහුගේ කබාය 37:1-4
   (b) ඔහුගේ සිහින 37:5-11
   (c) වහල්කමට විකුණනු ලැබීම 37:12-26
   (d) ජුදාහි පාපය 38:1-30
2. වහලෙකු වූ ජෝසෙප් 39:1-40:23
   (a) පොතිපර්ගේ නිවසේ 39:1-20
   (b) සිරගෙයි 39:21-40:23
3. අග්‍රාමාත්‍ය ජෝසෙප් 41:1-45:28
   (a) සාගතය සඳහා සූදානම 41:1-57
   (b) ජෝසෙප් සහ ඔහුගේ සහෝදරයෝ 42:1-45:28
   (c) ජෝසෙප් හා ඔහුගේ පවුලේ අය මිසරයේ විසීම 46:1-50:21
   (d) ජෝසෙප්ගේ මරණය 50:22-26

## ස්වයං පරීක්ෂණය

1. උත්පත්ති පොතේ කතුවරයා කවුරුන්ද?

2. උත්පත්ති පොතෙහි පරමාර්ථය දක්වන්න.

3. උත්පත්ති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. උත්පත්ති පොතෙහි ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. උත්පත්ති පොතෙහි ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. "උත්පත්ති" යන්නෙහි තේරුම ආරම්භයන් වේ. මෙම පොතෙහි පහත දැක්වෙන ඒවායේ ආරම්භයන් සඳහන් වේ.
   - ලෝකය 1:1-25,
   - මනුෂ්‍ය වර්ගයා 1:26-2,
   - පාපය 3:1-7,
   - ගැළවීම 3:8-24,
   - පවුල් 4:1-15,
   - ශිෂ්ඨාචාර 4:16-29
   - ජාතීන් 10:1-11:32
   - යුදෙව් ජාතිය 12:50

2. උත්පත්ති පොත ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදා ඇත. 1-11 පරිච්ඡේද ප්‍රධාන සිදුවීම් හතර ආවරණය කරන අතර 12-50 පරිච්ඡේද ප්‍රධාන මනුෂ්‍යයන් හතරදෙනා ආවරණය කරයි.

3. 1-2 පරිච්ඡේද අධ්‍යයනය කර පහත දැක්වෙන වගුව පුරවන්න.

| **දවස** | **දෙවියන්වහන්සේ මැවූ දෙය** |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |

4. 3-9 පරිච්ඡේදවලින් ඔබ පහත දැක්වෙන දේ පිළිබඳව ඉගෙන ගන්නේ කුමක්ද?
   - සතුරාගේ උපක්‍රම (සර්පයා වන . . . සාතන්) : ________________________________
   - ඒව ක්‍රමයෙන් පාපයට වැටීම : ________________________________
   - පාපය ලෝකයට ඇතුළුවීමේ පලවිපාක : ________________________________
   - ජලගැල්ම මගින් දෙවියන් වහන්සේ දුන් විනිශ්චය : ________________________________

5. 12-50 පරිච්ඡේද සඳහා : ප්‍රධාන චරිත හතර හඳුනාගෙන ඔවුන්ගේ ජීවිතය ඔබගේම ජීවිතයට ආත්මික යෙදවීම් ඇඳා ගනිමින්, ගැඹුරින් අධ්‍යයනය කරන්න. එමෙන්ම "ගිවිසුම" යන වචනය ද අධ්‍යයනය කරන්න. එම වචනය මෙම කොටසේ බොහෝ සේ භාවිත කර ඇත.

# හයවන පරිච්ඡේදය

## නික්මයාම

**අරමුණු :**
මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- නික්මයාම පොතේ කර්තෘ නම් කිරීමට
- නික්මයාම පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳිනගැනීමට
- නික්මයාම පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- නික්මයාම පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නික්මයාම පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

**කර්තෘ :** මෝසෙස්

**ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ඉශ්රායෙල් ජාතිය වහල් බවින් මුදා ගැනීම වාර්තා කිරීමට හා ජාතියක් වශයෙන් ඔවුන්ගේ පැවැත්මේ පරමාර්ථය ලේඛනගත කිරීම.

**ප්‍රධාන පදය :** 12:13

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ගැළවීම ලැබෙන්නේ දෙවියන් වහන්සේගේ බැටළු පැටියාගේ, එනම් ජේසුස් වහන්සේගේ ලේවලින් පමණි.

**ප්‍රධාන චරිත :** මෝසෙස්, ආරොන්, පාරාවෝ, මිරියම්, ජෙත්‍රෝ

### සැකිල්ල

1. මිසරයේ වසන ඉශ්‍රායෙල් ජාතිය: 1:1-12:36

   A. මිසරයෙහි වහලුන් වීම: 1:1-22
   B. දෙවියන් වහන්සේ මිදුම්කරුවෙකු : මෝසෙස් සූදානම් කළ සේක 2:1-4:31
   C. පාරාවෝ සමග සංවාදය: 5:1-11:10
   D. පාස්කු මංගල්‍යය: 12:1-30
   E. මිසරයෙන් මිදීම ලැබීම: 12:31-36

11. ඉශ්රායෙලය පාළුකරයේදී: 12:37 - 18:27

   A. නික්මයාම හා මිසර වැසියන් විසින් ලුහු බැඳීම: 12:37-15:21
   B. සීනයි වෙත ගමන: 15:22 - 17:16
   C. ජෙත්‍රෝගේ පැමිණීම: 18:1-27

111. ඉශ්රායෙලය සීනයිහි දී: 19:1 - 40:38

   A. ව්‍යවස්ථාව දෙනු ලැබීම: 19:1-25
   B. සදාචාරාත්මක ජීවිතය පාලනය කරන ආඥා: 19-22

C. සමාජ ජීවිතය පාලනය කරන ආඥා: 22-23

D. ආගමික ජීවිතය පාලනය කරන ආඥා: 24:1-31:18

E. කූඩාරම: 24:12-40:38

1. සැලසුම් කළ කූඩාරම : කූඩාරම හා පූජකවරුන් පිළිබඳ උපදෙස් 24:12-31:18
2. ප්‍රමාද වූ කූඩාරම: රන් වස්සා හා ගිවිසුම අලුත් කිරීම 32:1-34:35
3. සම්පූර්ණ කළ කූඩාරම : කූඩාරම ඉදිකිරීම හා පූජක පදවිය පිහිටුවීම 35:1-40:38

## ස්වයං පරීක්ෂණය

1. නික්මයාම පොතේ කර්තෘ කවුරුන්ද?

2. නික්මයාම පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. නික්මයාම පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. නික්මයාම පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. නික්මයාම පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉශ්‍රායෙල්වරුන් වහල් බවින් නිදහස් කිරීමට පාරාවෝ කැමති කරවා ගැනීම සඳහා දෙවියන් වහන්සේ මිසරය වෙත වසංගත දහයක් එවූ සේක.

   - ලේ 7:14-25:
   - මැඩියෝ උවදුර 8:1-15
   - කිනිතුල්ලෝ 8:16-19
   - මැස්සෝ 8:20-32
   - සත්ව වසංගතය: 9:1-7
   - ගඩු 9:8-12
   - ගල් වර්ෂා 9:13-35
   - පළගැටියෝ 10:1-20
   - ගනඳුර 10:21-29
   - කුලුඳුලන් මැරීම 11:1-10, 12:29-36

2. නික්මයාම 20:1-17 හි ඉතා ප්‍රසිද්ධ පැරණි ගිවිසුම් ව්‍යවස්ථාව, දස පනත සඳහන් වේ.

3. නික්මයාම පොතේ වැදගත් විෂයයක් වනුයේ කූඩාරම සඳහා සැලැස්මය. දෙවියන් වහන්සේ මෝසෙස්ට දුන් නමස්කාරය සඳහා වන මෙම ශුද්ධස්ථානයේ සැලැස්මෙහි රූප සටහනක් පහත දැක්වේ.

   කූඩාරම, ඉශ්‍රායෙල්වරුන් නමස්කාර කරන හා පුද පූජා පවත්වන ස්ථානය වූ බැවින් වැදගත් විය. තවද කූඩාරම ආත්මික තැනක්ද විය. මින් අදහස් වන්නේ කූඩාරමේ සෑම කොටසක්ම වඩාත් ආත්මික තැනක් සඳහා සංකේතයක් බවය.

   කූඩාරම වටා ඇති මළුව අඩි 150 ක් හා අඩි 75 ක් විය. එය ලෝකය සංකේතවත් කරයි. දවන පූජා සඳහා වූ පූජාසනය අඩි 7 1/2 ප්‍රමාණයෙන් හරි හතරැස් වූ අතර අඩි 4 1/2 ක් උස් විය. පූජාවන් මෙහි දවන ලදි. ඉන් සංකේතවත් වූයේ ලෝකයේ පාප සඳහා ජේසුස් වහන්සේගේ පූජාවීම වේ.

   බේසම ඉතා විශාල වූ අතර පූජකවරුන් ශුද්ධස්ථානයට යාමට පෙර තම අත් පා සෝදගත්තේ මෙයින් වේ. එය කිතුනු බව්තීස්මය සඳහා සංකේතයකි.

   ශුද්ධස්ථානය අඩි 30 හා 15 ප්‍රමාණයකි. එය ලෝකයෙන් (මළුවෙන්) වෙන්වූ සභාව සංකේතවත් කරයි. ඊට ඇතුළු වන්නේ ක්‍රිස්තුස් වහන්සේට පූජාවීමෙන් (පූජාසනය) සහ බව්තීස්මයෙන් (බේසම) වේ.

   පිදු රොටි තබන මේසය, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය (හෝ ඇතැම් නිකායයන් හඳුන්වන පරිදි සහභාගිකම) සංකේතවත් කරයි.

   පහන් රුක ශුද්ධස්ථානයට ආලෝකය සැපයිය. එය දේව වචනයේ සංක්තය වේ. ගන්ධ ධූප පූජාසනය, ගන්ධ ධූප දවන ලද ස්ථානය වේ. ඉන් නිකුත් වූ සුවඳ දුම් දෙවියන් වහන්සේ වෙතට, උන් වහන්සේගේ සෙනඟගේ යාච්ඤාව සංකේතවත් කරමින් ඉහළට නැඟිණි.


   තිරය ශුද්ධස්ථානය හා අති ශුද්ධස්ථානය වෙන් කළේය. දෙවියන් වහන්සේ හා මිනිසා අතර වෙන්වීම ඉන් සංකේතවත් කළේය.

   අති ශුද්ධස්ථානයෙහි දිග, පළල හා උස අඩි 15 ක් විය. එහි පරිපූර්ණ ඝන හැඩයෙන් ස්වර්ගය සංකේතවත් කළේය. එය දෙවියන් වහන්සේ වැඩ වසන ස්ථාන වේ.

   ගිවිසුම් කරඬුව, ලීවලින් සාදා රනින් ආවරණය කළ පෙට්ටියකි. ඊට රන් කෙරුබ්වරුන් දෙදෙනෙකුගෙන් සැරසූ පියනක් තිබිණි. කරඬුවෙහි දෙවියන් වහන්සේ රාජ්‍යය සංකේතවත් කරන දස පනතද, දෙවියන් වහන්සේගේ සැපයුම් මතක් කෙරෙන මන්නා තැටියක්ද, දෙවියන් වහන්සේගේ බලය මතක් කෙරෙන ආරොන්ගේ සැරයටියද අන්තර්ගත විය.

වසරකට වරක් උත්තම පූජකයා කරඬුවේ මුදුනට ලේ ඉසීය. එය අප පාපයෙන් පිරිසිදු කරන ක්‍රිස්තුස් වහන්සේගේ ලේ සංකේතවත් කරයි.

## කූඩාරම




1. මණ්ඩපයේ මළුව
2. දවන පූජාව සඳහා පූජාසනය
3. බේසම
4. ශුද්ධස්ථානය
5. පිදූ රොටි තබන මේසය
6. පහන් රුක
7. ගන්ධදූප පූජාසනය
8. ශුද්ධස්ථානය හා අති ශුද්ධස්ථානය අතර තිරය
9. අති ශුද්ධස්ථානය
10. ගිවිසුම් කරඬුව

## ශුද්ධ දවස්

පළමුවන තිරුවේ ඇති නිර්දේශය සටහන සම්පූර්ණ කරන්න. පළමු එක කර ඇත්තේ ඔබට අනුගමනය කිරීම සඳහා උදාහරණයකි. ඉශ්‍රායෙල් දේශයට පැවැත්වීම සඳහා දෙවියන් වහන්සේ විසින් අනුමත කරන ලද ශුද්ධ දවස් පහත දැක්වේ.

| **බයිබල් කොටස** | **ශුද්ධ දවස්** | **දිනය** | **පැවැත්වීමේ පරමාර්ථය** |
|---|---|---|---|
| ලෙවී ව්‍යවස්ථාව 23:3<br>නික්මයාම 20:8-11<br>ද්විතිය නීති සංග්‍රහය 5:12-15 | සබත | සතිපතා 7 දවස | වැඩවලින් විවේකය, නමස්කාරය |
| ලෙවී ව්‍යවස්ථාව 23:5<br>ගණන් කථාව 28:16<br>ද්විතිය නීති සංග්‍රහය 16:1-2 | පාස්කුව | 1/14 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:6-8<br>ගණන් කථාව 28:17-25<br>ද්විතිය නීති සංග්‍රහය 16:3-8 | නුමුහුන් රොටි | 1/15-21 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:9-14<br>නික්මයාම 23:16<br>ගණන් කථාව 28:26-31 | නාඹුල් පල | 1/16 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:15-22<br>නික්මයාම 34:22<br>ද්විතිය නීති සංග්‍රහය 16:9-12 | පෙන්තකොස්ත දින (අස්වැන්න නෙලීම) | 3/6 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:23-25<br>ගණන් කථාව 29:1-6 | හොරණෑ | 7/1 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:26-32<br>ලෙවී ව්‍යවස්ථාව 16<br>ගණන් කථාව 29:7-11 | වන්දි ගෙවීමේ දිනය | 7/10 | |
| ලෙවී ව්‍යවස්ථාව 23:33-44<br>ගණන් කථාව 29:12-40<br>ද්විතිය නීති සංග්‍රහය 16:13-15 | කූඩාරම් මංගල්‍යය | 7/15 - 21 | |
| ලෙවී ව්‍යවස්ථාව 25:1-7<br>නික්මයාම 23:10-11 | සබත් වර්ෂය | හත් වසරකට වරක් | |
| ලෙවී ව්‍යවස්ථාව 25:8-55 | ජුබිලි වර්ෂය | පනස් වසරකට වරක් | |

# හත්වන පරිච්ඡේදය

## ලෙවී ව්‍යවස්ථාව

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ලෙවී පොතේ කර්තෘ නම් කිරීමට
- ලෙවී පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ලෙවී පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ලෙවී පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ලෙවී පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මෝසෙස්

**ලියන ලද්දේ කවුරුන් වෙතද:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියන් වහන්සේ සමඟ සහභාගිත්වය ඇතිව ශුද්ධ වූ ජාතියක් ලෙස ජීවත් වන ආකාරය ඉශ්රායෙලයට පෙන්වීමට හා දෙවියන්වහන්සේගේ මුදා ගැනීමේ සැලැස්ම සියලු ජාතීන් වෙත ගෙන යැමට ඔවුන් සූදානම් කිරීම වේ.

**ප්‍රධාන පදය :**

**"එබැවින් නුඹලා දෙවියන්වහන්සේට කැප වීමෙන් ශුද්ධ වන්න. නුඹලාගේ දෙවි සමිඳාණන්වහන්සේ මම වෙමි." (ලෙවී ව්‍යවස්ථාව 20:7)**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේට තම සෙනඟගේ ශුද්ධවන්ත බව අවශ්‍යය.

**ප්‍රධාන චරිත :** මෝසෙස් සහ ආරොන්

### සැකිල්ල

1. පූජා පිළිබඳ නීති: 1:1-7:38

   A. හැඳින්වීම: 1:1-2
   B. දවන යාග පූජාව: 1:3-17
   C. ආහාර පූජාව: 2:1-16
   D. සාමයේ පූජාව: 3:1-17
   E. පාප පූජාව: 4:1-5:13
   F. වන්දි ගෙවීමේ පූජාව: 5:14-17

11. පූජකවරයන් පිළිබඳ නීති හා සිද්ධීන්: 8-10

A. කැපකිරීම සඳහා නියෝග : 8:1-9:24
B. කඩ කිරීම සඳහා දඬුවම් : 10:1-20

111. පවිත්‍ර කිරීමේ නීති: 11:1-15:33

A. පවිත්‍ර හා අපවිත්‍ර ආහාර : 11:1-47
B. දරු උපතින් පසු පවිත්‍රවීම: 12:1-8
C. චර්ම රෝග : 13:1-14:57
D. ලිංගික අපවිත්‍රකම් හා පවිත්‍රවීම්: 15:1-33

1V. වන්දි ගෙවීමේ දිනය : 16:1-34

A. ආරොන්ගේ සූදානම්වීම: 16:1-10
B. පූජකවරුන් උදෙසා පාප පූජාව: 16:11-14
C. සෙනඟ උදෙසා පාප පූජාව: 16:15-19
D. එළුවා බිලිකොට දීම: 16:20-22
E. පූජාවන් සම්පූර්ණ කිරීම: 16:23-28
F. එම දිනයේ සංසුන් බව: 16:29-34

V. ශුද්ධවන්තකමේ නීති සංග්‍රහය 17:1-27:34

A. තහනම් දේ 17:1-22:33
1. සෙනඟට තිබිය යුතු ශුද්ධවන්තකම 17:1-20:27
2. සෙනඟට තිබිය යුතු ශුද්ධවන්තකම 21:1-22:33

B. ආගමික උත්සව 23:1-44
1. සබත් දවස 23:1-3
2. පාස්කුව සහ නුහුමුන් රොටි මංගල්‍යය 23:4-14
3. අස්වැනන් හෙවත් පෙන්කොස්ත මංගල්‍යයන් 23:15-22
4. හොරණෑ මංගල්‍යය 23:23-25
5. වන්දි ගෙවීමේ දිනය 23:25-32
6. කූඩාරම් මංගල්‍යය 23:33-44

C. ආගමික සංකේත: 24:1-23
D. සබත් වර්ෂය හා ජුබිලිය: 25:1-26:2
E. පොරොන්දු හා අනතුරු ඇඟවීම්: 26:3-46

1. දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව 26:1-2
2. දෙවියන්වහන්සේ හට කීකරු වීමේ ආශිර්වාද 26:1-2
3. අකීකරුකමට දඬුවම 26:14-39
4. දෙවියන්වහන්සේගේ ගිවිසුම් සඳහා ඇති උන්වහන්සේගේ විශ්වාසවන්ත භාවය: 26:40-45
5. ප්‍රකාශවල සාරාංශය 26:46

F. බාරයන් හා දසයෙන් කොටස 27:1-34

1. පුද්ගලයන්ට බාරයන් 27:2-8
2. ඇතිකරන සතුන් පිළිබඳ බාර 27:9-13

3. නිවාස හා කෙත්වතු පිළිබඳ බාර 27:14-25
4. දසයෙන් කොටස 27:30-33
    (a). පළමුව සතුන් අතර 27:26-27
    (b). කැපකළ දේවල් 27:28-29
    (c). දසයෙන් කොටස 27:30-33

## ස්වයං පරීක්ෂණය

1. ලෙවී ව්‍යවස්ථාව පොතේ කතුවරයා කවුරුන්ද?

2. ලෙවී ව්‍යවස්ථා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ලෙවී ව්‍යවස්ථා පොත ලියන ලද්දේ කවරෙකුටද?

4. ලෙවී ව්‍යවස්ථා පොතේ ජීවන හා දේව සේවා මූලධර්මය ලියන්න.

5. ලෙවී ව්‍යවස්ථා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ලෙවී ව්‍යවස්ථා පොතේ සඳහන් “ශුද්ධ” යන වචනය අධ්‍යනය කරන්න. එය 100 වරකට වඩා භාවිත කර ඇත. අනෙකුත් ප්‍රධාන වචන වන “පූජා කිරීම” 42 වාරයක්ද “පූජක” යන්න 189 වරක්ද “ලේ” 86 වරක්ද භාවිතා කර ඇත.

2. ලෙවී ව්‍යවස්ථා පොතේ විස්තර කර ඇති ශුද්ධවන්තකමෙහි ප්‍රමිතිය සිරස් මෙන්ම තිරස්ද වේ. 1-10 පරිච්ඡේදවල පණිවුඩයේ (“මම ශුද්ධවන්ත වෙමි”) සිරස් වන අතර 11-27 පරිච්ඡේදවල පණිවුඩයේ (“ඔබ ශුද්ධවන්ත වන්න”) තිරස් වේ.

මම
ශුද්ධවන්ත
වෙමි
1-10 පරිච්ඡේද

ඔබ ශුද්ධවන්ත
වන්න
11-27 පරිච්ඡේද

3. ලෙවී ව්‍යවස්ථාව එකිනෙකට වෙනස් පූජාවන් පහක් විස්තර කර ඇත. පළමු පූජාවන් තුන ස්ථාපිත කර ඇත්තේ දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වය පවත්වාගෙන යෑම සඳහා වන අතර අවසාන දෙක බිඳුනු සහභාගිත්වය ප්‍රකෘතිමත් කිරීමට වේ.

| **පූජාව** | **එය හඳුන්වා දී ඇති පරිච්ඡේද** | **විස්තර කර ඇති නීති** |
|---|---|---|
| දවන යාග පූජාව | 1 | 6:8-13 |
| ධාන්‍ය පූජා | 2 | 6:14-23 |
| සාමයේ පූජා | 3 | 7:11-34 |
| පාප පූජා | 4 | 6:25-30 |
| වන්දි ගෙවීමේ පූජා | 5:1-6:7 | 7:1-7 |

4. ලෙවී ව්‍යවස්ථා පොතේ අංක 7 ට වැදගත් ස්ථානයක් හිමි වේ.

සෑම 7 වෙනි දවසක්ම සබත් දවස වේ.
ලේ 7 වරක් කුඩාරමේ ඉසින ලදි
සෑම 7 වෙනි වසරම සබත් වර්ෂය වේ.
සෑම 7 වෙනි සබත් වසරට පසුව ජුබිලි වර්ෂය පැමිණේ.
සෑම 7 වෙනි මාසයක්ම විශේෂිතව ශුද්ධය, මංගල්‍ය තුනක් තිබේ.
පාස්කුව හා පෙන්තකොස්ත දිනය අතර සති 7 ක් ඇත.
පාස්කු මංගල්‍යය දවස් 7 ක් පැවැත්වේ.
අපවිත්‍ර අය දින 7 ක් වෙන්කර තිබේ.
කුඩාරම් මංගල්‍යය දවස් 7 ක් පැවැත්වේ.

පාස්කු මංගලයයේදී දිනපතාම බැටළුවන් 14 ක් (2 X 7) පූජා කෙරේ.
පෙන්තකොස්ත දිනයේ බැටළුවන් 7 ක් පූජා කෙරේ.
කූඩාරම් මංගලයයේදී දිනපතාම බැටළුවන් 14 ක් පූජා කෙරේ.

# අට වන පරිච්ඡේදය

## ගණන් කථාව

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ගණන් කථාව පොතේ කර්තෘ නම් කිරීමට
- ගණන් කථාව ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ගණන් කථාව පරමාර්ථය සඳහන් කිරීමට
- ගණන් කථාව ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ගණන් කථාව ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මෝසෙස්

**ලියන ලද්දේ කවුරුන් වෙතද:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** පාළුකර ගමනේ අත්දැකීම් වාර්තා කිරීම. ඒවා පරාජිත කිතුනුවෙකු පෙන්වීම මෙන් වේ.

**ප්‍රධාන පදය :**

**"එහෙත් ඔබ එලෙස නොකරන්නහු නම්, සමිඳුණන්වහන්සේට විරුද්ධව ඔබ හැම පව් කරන්නහුය. ඔබේ පාපය ද ඔබ පිට පැවරෙන බව දැනගන්න." (ගණන් කථාව 32:23)**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේ පූර්ණ කැපවීමකට වඩා අඩු දෙයකට සතුටු නොවන සේක.

**ප්‍රධාන චරිත :** මෝසෙස්, කෝරා, බාලාම්, ආරොන්, මීරියම්, ජොෂුවා, කාලෙබ්.

### සැකිල්ල

1. සීනයි කන්දෙන් නික්ම යාමට සූදානම් වීම: 1:1-10:10

   A. සෙනඟ අංකනය කෙරේ: 1:1-54
   B. කඳවුරු පිළියෙල කෙරේ: 2:1-34
   C. පූජකවරයාට හා ලෙවීවරුන්ට උපදෙස් සැපයේ: 3:1-4 4:49
   D. සෙනඟ ආරක්ෂා කෙරේ: 5:1-31
   E. නාසරීයයන්ගේ බාරය : 6:1-27
   F. පූජා මූලිකයන්ගේ පඬුරු 7:1-89
   G. මණ්ඩපයේ පහන් දැල්වීම 8:1-4
   H. ලෙවීවරුන් පවිත්‍ර කිරීම 8:5-26
   I. පාස්කුව පැවැත්වීම 9:1-14
   J. කඳවුරු ගැන මඟපෙන්වීම් 9:15-23

F.. රැස්වීමක් කැඳවා කඳවුර ගෙන යෑම 10:1-10

11. සීනයි කන්දේ සිට කාදෙෂ්-බර්නේය වෙත ගමන 10:11-12:15

A. ගමන සඳහා රැස්කිරීම: 10:11-28
B. හොබාබ් සේවය කිරීමට ප්‍රතික්ෂේප කිරීම: 10:29-32
C. වලාකුළ තවදුරටත් ගමන් කිරීම: 10:34-36
D. ගින්නෙන් දුන් විනිශ්චය: 11:1-3
E. කොඳුරන සමූහයක්: 11:4-9
F. කුපිතවූ දිවැසිවරයෙක්: 11:10-15
G. මරණීය ආහාරයක්: 11:31-34
H. දුක් විඳින සහෝදරියක් :12:1-15

111. කාදේෂ්-බර්නේයා වේදී ඉශ්රායෙල්වරු: 13:1-14:45

A. භූමිය ගැන ඔත්තු බැලීම: 13:1-25
B. වාර්තා හා ඊට දැක්වූ ප්‍රතිචාර: 13:26-14:10
C. දෙවියන්වහන්සේගේ විනිශ්චය: 14:11-34

1V. පාළුකරයේ ගමනේදී සිදුවූ සිදුවීම්: 20:1-35:34

A. සබත කඩ කළ තැනැත්තාට ගල් ගැසීම: 15:32-36
B. කෝරාගේ කැරැල්ල : 16:1-32
C. ආරොන්ගේ සැරයටිය දළු ලෑම: 17:1-13
D. ආරොන් ලද උපදෙස්: 18:1-19:22
E. මිරියම් මරණයට පත් වීම: 20:1
F. මෝසෙස්ගේ පාපය: 20:1-13
G. ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම: 20:14-22
H. ආරොන්ගේ මරණය: 20:23-29
I. සෙනඟ අතර සර්පයයන්: 21:5-9
J. කාමවිකෘති දිවැසිවරයෙක්: 22:1-24:25
K. දේශප්‍රේමී පූජකයෙක්: 25:1-18
L. විවිධ උපදෙස්: 26:1-31:54
M. නැගෙනහිර ජොර්දාන් දේශය බෙදීම: 32:1-42
N. මිසරයේ සිට ගමන් විස්තරය: 33:1-56
O. කානාන් දේශයට ඇතුළුවීමට පෙර දුන් උපදෙස්: 34:1-36:13

## ස්වයං පරීක්ෂණය

1. ගණන් කථාව පොතේ කතුවරයා කවුරුන්ද?

2. ගණන් කථාව පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ගණන් කථාව පොත ලියන ලද්දේ කවුරුන්ද?

4. ගණන් කථාව පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ගණන් කථාව පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉශ්‍රායෙල්හි නායකත්වයේ වෙනස්වීම් ගණන් කථාවේ ඇත. මෝසෙස් වෙනුවට ජෝෂුවා දේශපාලන නායකයා වන අතර ආගමික නායකයා ලෙස ආරොන් වෙනුවට එලෙයාසර් පත්වේ. ගණන් කථාව 27:15-23 හා 20:23-29 බලන්න.


2. ජේසුස්වහන්සේගේ මරණය හා උත්ථානය ගණන් කථාව පොතේ සර්පයෙකුගෙන් හා සැරයටියකින් පෙන්නුම් කෙරේ. 21:5-9፡ 17:8.

3. පහත දැක්වෙන සටහනින් පෙන්නුම් කෙරෙන්නේ "අංකනය කිරීම" හෙවත් සංගණනවල ප්‍රතිඵල වේ.

| ගෝත්‍රය | පළමු සංගණනය | දෙවන සංගණනය |
|---|---|---|
| රූබන් | 46,500 | 43,730 |
| සිමියොන් | 59,300 | 22,200 |
| ගාද් | 45,650 | 40,500 |
| ජුදා | 74,600 | 76,500 |
| ඉස්සාකර් | 54,400 | 64,300 |
| සාබුලොන් | 57,400 | 60,500 |
| ඒප්‍රායිම් | 40,500 | 32,500 |
| මනස්සේ | 32,200 | 52,700 |
| බෙන්ජමින් | 35,400 | 45,600 |
| දාන් | 62,700 | 64,400 |
| අෂේර් | 41,500 | 53,400 |
| නප්තලි | 53,400 | 45,400 |
| මුළු ගණන | 603,550 | 601,730 |

4. මෙම රූප සටහනින් පෙන්නුම් කෙරෙන්නේ කූඩාරමට අදාළව ඉශ්‍රායෙල්හි ගෝත්‍රවල කඳවුරු පිහිටා තිබූ ආකාරය වේ.

**උතුර**


ආෂේර්
දුන්
නප්තලි
බෙන්ජමින්
ඉස්සාකර්
මෙරාරි
ගෙර්ෂොන්
මෝසෙස්
ආරොන්
පූජකවරු
එප්‍රායිම්
ජුදා
කූඩාරම
කොහොත්වරු
මනස්සේ
සාබුලොන්
ගාද්
රූබන්
සිමියොන්

**දකුණ**

# නවවන පරිච්ඡේදය

## ද්විතිය නීති සංග්‍රය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ද්විතිය නීති සංග්‍රහය පොතේ කර්තෘ නම් කිරීමට
- ද්විතිය නීති සංග්‍රහය පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ද්විතිය නීති සංග්‍රහය පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ද්විතිය නීති සංග්‍රහය පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ද්විතිය නීති සංග්‍රහය පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මෝසෙස්

**ලියන ලද්දේ කවුරුන් වෙතද:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** සිනයි කන්දෙන් පසු ඉපදුනු ඉශ්රායෙල්වරුන්ගේ ඊළඟ පරම්පරාවට ව්‍යවස්ථාව නැවත සඳහන් කිරීම.

**ප්‍රධාන පදය :**

> **"ඉශ්රායෙල්වරුනි, සවන් දෙන්න, අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳාණන් වහන්සේය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතුය." (ද්විතිය නීති සංග්‍රය 6:4-5)**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** කීකරුකම ආශිර්වාද ගෙන එයි. අකීකරුකම විනිශ්චය ගෙන එයි.

**ප්‍රධාන චරිත :** මෝසෙස්, ජෝෂුවා, බාලාම්, අමලෙක්, මීරියම්

### සැකිල්ල

1. මෝසෙස්ගේ පළමු දේශනාව : ඓතිහාසිකය 1:1-4

   A. ඓතිහාසික හැඳින්වීම (1:1-5)
   B. හොරෙබ් සිට මෝවබ් දක්වා ගමන පුනරීක්ෂණය (1:6-3:29)
   C. ව්‍යවස්ථාව පවත්වාගෙන යන ලෙස අලුත් පරම්පරාවගෙන් ඉල්ලා සිටීම (4:1-40)
   D. ආරක්ෂා නගර ඇති කිරීම පිළිබඳ වාර්තාව (4:41-43)
   E. මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ සාරාංශය (4:44-49)

11. මෝසෙස්ගේ දෙවන දේශනාව : නීතිමය 5:1-26:19

   A. දස පනත නැවත සඳහන් වේ (5:7-21)

B. දුෂ්චරිතය (23:17), සමගි සම්මුතිය, (7:1-5) හා හූනියම් (18:9-14) වලට එරෙහිව ඔහු අනතුරු අඟවයි.
C. මෝසෙස් කානාන් දේශය විස්තර කරයි (8:7-8)
D. සිනයි කන්දේදී ඔහු දෙවියන්වහන්සේ සමඟ ලද ඔහුගේ පෞද්ගලික අත්දැකීම පුනරීක්ෂණය කරයි (9:9-21)
E. ඔහු, දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔවුන්ගේ මූලයමය බැඳීම් මතක්කර දෙයි. (26:1-19)
F. ඇඳුම් (22:50) දික්කසාදය (24:1-4) ස්ත්‍රී අයිතිවාසිකම් (21:10-17; 22:13-20) හා යුද්ධය 20:1-20 පිළිබඳ නීති සඳහන් කරයි.
G. දෙවියන්වහන්සේගේ සැලස්ම ඔහු සාරාංශ කරයි (6:23).

111. මෝසෙස්ගේ තෙවන දේශනාව : අනාවැකිය 27:1-30:20

A. ආශිර්වාද හා සාප දේව ආඥා, ගල් කනුවල කෙටීම (27:1-26)
B. ආශිර්වාද හා දුර්විපාක අනාවැකි කීම (28:1-68)
C. ශුද්ධවන්තකම ගැන අනුශාසනා (29:1-30:20)

1V. ඓතිහාසික උපග්‍රන්ථය : 31:1-34:12

A. මෝසෙස්ගේ අවසාන වචන හා ජෝෂුවා පත් කිරීම (31:1-30)
B. මෝසෙස්ගේ ගීතය හා අනුශාසනා (32:1-47)
C. මෝසෙස්ට කී දෙවියන්වහන්සේගේ අවසාන වචන (32:48-52)
D. ඉශ්රායෙල් ගෝත්‍රවලට මෝසෙස්ගේ අවසාන ආශිර්වාද (33:1-29)
E. මෝසෙස්ගේ මරණය හා භූමදානය (34:1-12)

## ස්වයං-පරීක්ෂණය

1. ද්විතිය නිති සංග්‍රහය පොතේ කතුවරයා කවුරුන්ද?

2. ද්විතිය නිති සංග්‍රහය පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ද්විතිය නිති සංග්‍රහය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ද්විතිය නිති සංග්‍රහය පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ද්විතිය නිති සංග්‍රහය පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. සාතන් විසින් ජේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලබද්දී උන්වහන්සේ ද්විතීය නීති සංග්‍රහය පොත උපුටා දැක්වූ සේක. මතෙව් 4:4, ද්විතීය නීති සංග්‍රහය 8:3 සමඟද; මතෙව් 4:7, ද්විතීය නීති සංග්‍රහය 6:16 සමඟද; මතෙව් 4:10, ද්විතීය නීති සංග්‍රහය 6:13 සමඟද සංසන්දනය කරන්න.

2. ද්විතීය නීති සංග්‍රහය ඓතිහාසික පොතකි. එහෙත් එහි වැදගත් අනාවැකියන් හතරක් ඇත.
   - ඉශ්‍රායෙල්වරුන් ජෝෂුවා යටතේ කානාන් දේශයට ඇතුළු වීම. 7:2; 9:1-3; 31:3 ,5
   - කානාන් දේශයේ සිටියදී ඉශ්‍රායෙල්වරුන්ගේ පාපය 31:16-18, 20, 29.
   - කානාන් දේශයෙන් පිටුවහල් කිරීම 4:26-28; 7:4; 8:19-20; 28:36,41,49,50,53,64
   - කානාන් දේශයට ඉශ්‍රායෙල්වරුන් නැවත පැමිණීම 4:29; 30:1-3,10

3. "කරන්න", "පවත්වන්න" හා "පිළිපදින්න" යන ප්‍රධාන වචන අධ්‍යයනය කරන්න. ඒවා ද්විතීය නීති සංග්‍රහය පොතේ 177 වාරයක් සඳහන් වේ.

4. මෙම පොතේ සඳහන් තවත් ප්‍රධාන වචනයක් වන්නේ "සිහි කරන්න" යන්නය. පොත මුළුල්ලේම එය නැවත නැවත සඳහන් වේ. සිහි කරන ලෙස ඉශ්‍රායෙල්වරුන්ට පවසයි.

   - ව්‍යවස්ථාව දීම 4:9-10,
   - ගිවිසුම 4:23
   - ඔවුන්ගේ අතීත වහල්කම 5:15
   - ඔවුන් මුදා ගැනීම 7:18
   - දෙවියන්වහන්සේගේ නායකත්වය හා සැපයීම් 8:2-6,
   - අතීත පාප 9:7
   - දෙවියන්වහන්සේගේ විනිශ්චය 24:9,
   - පැරණි යුග : 32:7

5. පීඩා සමයේදී ගායනා කළ හැකි ගීයක් මෙම පොතේ ඇත. ද්විතීය නීති සංග්‍රහය 31:30-32:45 හා එළිදරව් 15:3-4 සමඟ සංසන්දනය කරන්න.

6. ද්විතීය නීති සංග්‍රහය පොතේ ප්‍රධාන තේමාවක් වන්නේ දේව වචනයේ ඇති වැදගත්කම වේ. 4:1,2,7,9 6:7-9, 11:18-21; 27:1-4; 30:11-14; 31:11-12; 32:46-47 බලන්න.

7. ලෙවී ව්‍යවස්ථාවේ ඓතිහාසික සන්දර්භය සඳහා ගණන් කතාව 21:21-22:1 හා ද්විතීය කථාව 1:1-5 කියවන්න.

# ඉතිහාසය පොත් සඳහා හැඳින්වීමක්

අප ඊළඟට සොයා බලන්නට යන්නේ ඉතිහාසය පොත් පිළිබඳව වේ. මේවා අතර පහත දැක්වෙන ඒවා ඇතුළත්ය.

**ජෝෂුවා :** මෝසෙස්ගේ අනුප්‍රාප්තිකයා වූ ජෝෂුවා, ඉශ්රායෙල් සෙනඟ පොරොන්දු දේශය වූ කානාන් වෙත ගිය ආකාරය විස්තර කරයි. මෙහි යුද්ධ ව්‍යාපාර හා සෙනඟ අතර දේශය බෙදූ ආකාරය වාර්තාකර ඇත.

**විරාවලිය :** ජෝෂුවාගේ මරණයෙන් පසු ඉශ්රායෙලය දෙවියන්වහන්සේ වෙතින් ඈත් විය. ඔවුන් නැවත නැවත කළ පාප පිළිබඳ කනගාටුදායක කතාව හා දෙවියන්වහන්සේ නැගිටවූ වීරයන් සතුරු බලවේගවලින් ඔවුන් මුදාගත් ආකාරය මෙම පොතේ වාර්තා වේ.

**රූත්ගේ කථාව :** රූත් ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන්වහන්සේට සේවය කිරීමට තෝරාගත් අන්‍ය ජාතිකයෙක් වූ මෝවබ් දේශිය කාන්තාවකි. ඇය දාවිත්ගේ මී මිත්තනිය වූවාය.

**1 සාමුවෙල් :** මෙම පොත පුද්ගලයන් තිදෙනෙකු පිළිබඳව වේ. ඉශ්රායෙල්හි අවසාන විරවරයා වූ සාමුවෙල්, ඉශ්රායෙල්හි පළමු රජු වූ සාවුල් හා සාවුල්ට පසු රජකමට පත් දාවිත් ඒ අය වේ.

**2 සාමුවෙල් :** දාවිත් රජුගේ අනර්ඝ අවුරුදු 40 ක පාලනය මෙම පොතෙහි වාර්තා කර ඇත.

**1 රාජාවලිය :** මෙම පොතෙහි විෂයන් වන්නේ සලමොන් රජුගේ පාලන සමය හා උතුරෙහි ආහබ් ද දකුණෙහි ජෙහෝෂාපාට් ද වශයෙන් බෙදුනු රාජ්‍යයේ පාලන පිළිබඳව වේ.

**2 රාජාවලිය :** ඉශ්රායෙල්හි හා ජුදාහි රාජ්‍යයන්ගේ වැටීම ගැන මෙම පොතෙහි සඳහන් වේ. දෙවියන්වහන්සේගේ සෙනඟ බොහෝ සේ පාපයට වැටුනෝය.

**1 වංශාවලිය :** දාවිත්ගේ පාලන සමය හා දේව මාලිගාව ගොඩනැඟීමේ සූදානම මෙම පොතේ වාර්තා කර ඇත. මෙම පොත ද 2 සාමුවෙල් යුගයම වේ.

**2 වංශාවලිය :** දකුණු රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කරමින් සලමොන්ගේ පාලන සමයේ ඉතිහාසය තවදුරටත් මෙහි වාර්තා කර ඇත. මෙය අවසන් වන්නේ බබිලෝනියේ සිට ජෙරුසලමට පැමිණීමට අවසර දීමේ සයිරස් රජුගේ ප්‍රකාශයෙනි.

**එස්රා :** ජුදෙව්වරුන් බබිලෝනියේ සිට ආපසු පැමිණීම මෙහි විස්තර කර ඇත.

**නෙහෙමියා :** නෙහෙමියාගේ මඟපෙන්වීම යටතේ ජෙරුසලමේ පවුර නැවත ගොඩනැඟීම මෙම පොතේ සඳහන් වේ. එස්රා සෙනඟ සමග ජෙරුසලමට පැමිණීමෙන් වසර 14 කට පමණ පසු මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරුණි.

**එස්තර් :** මෙම පොතෙහි විෂය වන්නේ එස්තර් හා මොර්දෙකයි මගින් දෙවියන්වහන්සේ ජුදෙව්වන් මුදාගැනීම පිළිබඳව වේ.

# දස වන පරිච්ඡේදය

## ජෝෂුවා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ජෝෂුවා පොතේ කර්තෘ නම් කිරීමට
- ජෝෂුවා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ජෝෂුවා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ජෝෂුවා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ජෝෂුවා පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ජෝෂුවා

**ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** කානාන් දේශය විජයග්‍රහණය කළ ඉතිහාසය වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :**

> **"සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කිරීමට ඔබ සතුටු නැත් නම්, ඔබ වැඳුම්පිදුම් කරන්නට කැමති කවරෙකුට ද කියා අදම තීරණය කරගන්න. ගඟින් එගොඩ සිටි ඔබේ පියවරුන් වැඳුම්පිදුම් කළ දෙවිවරුන්ට හෝ ඔබ වාසය කරන දේශයේ සිටින අමෝරීවරුන්ගේ දෙවිවරුන්ට හෝ වැඳුම්පිදුම් කරන්නට තීරණය කරගන්න. එහෙත් අපි, එනම් මාගේ පවුල ද, මම ද, සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්නෙමු." (ජෝෂුවා 24:15)**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** සටනක් නොමැතිව කිසිදු සදාචාරාත්මක හෝ ආත්මික හෝ ජයග්‍රහණයක් ලබාගත නොහැකිය.

**ප්‍රධාන චරිත :** ජෝෂුවා, රාහාබ්, කාලෙබ්, ආකාන්, බාලාම්, එලෙයාසර්

### සැකිල්ල

1. භූමියට ඇතුළු වීම 1:1-5-15

   A. ජෝෂුවා පත් කිරීම 1:1-9
   B. ජෝර්දාන් ගඟ තරණය කිරීමට සූදානම් වීම 1:10-2:24
   C. ජෝර්දාන් ගඟ තරණය කිරීම 3:1-4:24
   D. ගිල්ගාල් අත්පත්කර ගැනීම 5:1-15

11. භූමිය අත්පත් කර ගැනීම 6:1-12:24

   A. ජෙරිකෝව හා ආයි අත්පත් කරගැනීම 6:1-8:29
   B. ජෝෂුවාගේ පූජාසනය 8:30-35

C. ගිබියොන්වරුන් පිළිගැනීම 9:1-27
D. දකුණු කානාන් දේශය අත්පත් කරගැනීම 10:1-43
E. උතුරු කානාන් දේශය අත්පත් කරගැනීම 11:1-15
F. අත්පත් කරගැනීමේ සාරාංශය 11:16-12:24

111. භූමියේ පදිංචි වීම 13:1-22:34

A. ජෝෂුවාට උපදෙස් ලැබෙයි 13:1-7
B. නැගෙනහිර ගෝත්‍ර පවරයි 13:8-33
C. බටහිර ගෝත්‍ර පවරයි 14:1-19:51
D. ආරක්ෂා නගර 20:1-9
E. ලෙවීවරුන්ගේ නගර 21:1-45
F. නැගෙනහිර ගෝත්‍ර ගෙදර යවයි 22:1-34.

IV. ජෝෂුවාගේ අවසාන අනුශාසනාව හා මරණය 23:1-24:33

A. දෙවියන්වහන්සේගේ යහපත්කම ජෝෂුවා සෙනඟට මතක්කර දෙයි 23:3-10
B. අකීකරුවීම ගැන ජෝෂුවා සෙනඟට අනතුරු අඟවයි 23:11-13
C. ඔහු අතීතය පුනරීක්ෂණය කරයි 24:1-13
D. දෙවියන්වහන්සේට සේවය කිරීමට ජෝෂුවා සෙනඟට අභියෝග කරයි 24:14-18
E. තම නම දරන පොත ජෝෂුවා සම්පූර්ණ කරයි. 24:26-28
F. ජෝෂුවා මියගොස් ස්වර්ගයට යයි 24:29-33.

## ස්වයං-පරීක්ෂණය

1. ජෝෂුවා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ජෝෂුවා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ජෝෂුවා පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. ජෝෂුවා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ජෝෂුවා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

ජෝෂුවා පොත, නික්මයාම පොත සමග සංසන්දනය කළ හැකිය. නික්මයාම පොතේ දෙවියන්වහන්සේ තම සෙනඟ වහල් බවින් මුදාගෙන මිසරයෙන් ගෙන ඒමට රතු මුහුදේ ජලය දෙබෑ කළ සේක. ජෝෂුවා පොතේ දෙවියන්වහන්සේ තම සනඟ ආශිර්වාදලත් දේශයක් වූ කානාන් දේශයට ගෙන ඒමාට ජෝර්දාන් ගඟේ ජලය දෙබෑ කළ සේක. මෝසෙස් මේ පොත් 2 ම ද්විතීය නීති සංග්‍රහයේ 6:23 සාරාංශ කරයි.

"උන්වහන්සේ . . . එහි අප ඇතුල් කිරීමට . . . පිටතට අප ගෙන ආ සේක."

# එකළොස් වන පරිච්ඡේදය

## විනිශ්චයකාරයෝ

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- විනිශ්චයකාරයෝ පොතේ කර්තෘ නම් කිරීමට
- විනිශ්චයකාරයෝ පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- විනිශ්චයකාරයෝ පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- විනිශ්චයකාරයෝ පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- විනිශ්චයකාරයෝ පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** සාමුවෙල්

**ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ජෝෂුවා පොතෙන් පසු පැවති විනිශ්චයකාරයන්ගේ පාලනය සම්බන්ධ ඓතිහාසික වාර්තාව වේ.

**ප්‍රධාන පදය :**

> **"ඒ කාලයේදී ඉශ්‍රායෙල්හි රජ කෙනෙක් නොසිටියේය. එක් එක්කෙනා තම තමාට රිසි දේ කෙළේය" (විනිශ්චයකාරයෝ 17:6)**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේගේ සෙනඟ පාපයෙන් ගැළවීම වෙත ගෙන ඒම පිණිස සැලසුම් කළ දිව්‍යමය දඬුවම් රටාවක් තිබේ.

**ප්‍රධාන චරිත :** විනිශ්චයකාරයන් (පහත දැක්වෙන සැකිල්ලේ සඳහන් වේ)

### සැකිල්ල

1. විනිශ්චයකාරයන්ගේ යුගය සඳහා හැඳින්වීමක් 1:1-2:5

   A. ජෝෂුවාගේ කාලයේ සිට විනිශ්චයකාරයන්ගේ කාලය දක්වා දේශපාලනික තත්වය 1:1-36
   B. ජෝෂුවාගේ කාලයේ සිට විනිශ්චයකාරයන්ගේ කාලය දක්වා ආගමික තත්වය 2:1-5

11. විනිශ්චයකාරයන්ගේ යුගය 2:6-16:31

   A. මුළු කාලය සඳහා ආගමික තත්වයේ සාරාංශය 2:6-3:6
   B. විනිශ්චයකාරයන්ගේ ලැයිස්තුව 3:7-16:31
      1. ජුදා හි ඔත්නියෙල් 3:7-11
      2. බෙන්ජමින් හි ඒහුද් 3:12-30
      3. ෂම්ගර් 3:31
      4. එෆ්‍රායිම් හි දෙබොරා හා නප්තලි හි බාරාක් 4:1-5:31

5. මනස්සේ හි ගිඩියොන් හා අබිමෙලෙක් 6:1-9:57
6. ඉස්සාකර් හි තෝලා 10:1-2
7. ගිලියද් හි ජායීර් 10:3-5
8. ගිලියද් හි ජෙප්තා 10:6-12:7
9. බෙත්ලෙහෙම් හි ඉබ්ගාන් 12:8-10
10. සාබුලොන් හි ඒලොන් 12:11-12
11. එප්‍රායිම් හි අබ්දොන් 12:13-15
12. දාන් හි සම්සොන්

111. ඓතිහාසික උපග්‍රන්ථය 17:1-21:25

A. මීකා හා දාන්වරුන්ගේ පිළිම වන්දනය 17:1-18:31

1. මීකා සහ ඔහුගේ පෞද්ගලික පූජකයා 17:1-13
2. දාන්වරු පිළිම වන්දනාවට බැදෙති 18:1-31

B. ගිබියාහි දී බෙන්ජමින් ගෝත්‍රය කළ අපරාධය හා ඊට දඬුවම 19:1-21:25

1. ගිබියාහි නැවතීම 19:1-15
2. අපරාධය 19:16-27
3. ලෙවීවරුන්ගේ ප්‍රතිචාරය 19:28-29
4. ඉශ්රායෙල්වරුන්ගේ කෝපය 19:30-20:11
5. සටන් තුනකින් යුත් යුද්ධය 20:12-21-15

## ස්වයං පරීක්ෂණය

1. වීරාවලිය පොතේ කතුවරයා කවුරුන්ද?

2. වීරාවලිය පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. වීරාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ද?

4. වීරාවලිය පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. වීරාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. වීරාවලිය පොත සෘජුවම ජෝෂුවා පොතට පටහැණිය.
   ජෝෂුවා පොතේ අපට පවසන්නේ ජයග්‍රහණය, නිදහස, ඇදහිල්ල, දියුණුව, කීකරුකම, ආත්මික දර්ශනය, ප්‍රීතිය, ශක්තිය හා ගෝත්‍ර අතර ප්‍රබල නායකත්වයක් ඇතිව තිබූ එකමුතු බව ගැන වේ.

   වීරාවලිය විස්තර කරන්නේ පරාජය, වහල්බව, අවිශ්වාසය, බෙදීම, අකීකරුකම, ලෞකික අවධානය, කනගාටුව, දුර්වලකම හා ගෝත්‍ර අතර අසමගිය වේ.

2. ජෝෂුවා හා වීරාවලිය පොත්වල අනර්ඝ සාරාංශයක් ගලාති පොත සපයයි. ගලාති 5:22-26 ජෝෂුවා විස්තර කරන අතර 5:17-21 වීරාවලිය විස්තර කරයි.

3. වීරාවලිය පොත හොසියා 8:7 හා ගලාති 6:7 සඳහා අනර්ඝ නිදසුනකි.

4. වීරවරුන්ගේ කාලයේ ඉශ්රායෙල්හි පැවති තත්වය වීරාවලිය 17:6 න් සාරාංශ කෙරේ.

5. ඉතිහාසයේ ශක්තිමත්ම මිනිසාගේ කතාව වීරාවලිය 15 හි ඇත.

6. වචනයක් වැරදි ලෙස උච්චාරණය කිරීම නිසා මැරුම් කෑ හමුදාවක් පිළිබඳ කතාව කියවන්න. වීරාවලිය 12.

7. වීරාවලිය පොතේ, දෙවියන්වහන්සේ අසාමාන්‍ය ක්‍රම භාවිත කළ සේක. උන්වහන්සේ
   - හරක් අංකුසයක්, 3:31;
   - ඇණයක් 4:21;
   - හොරණෑ 7:20;
   - කළගෙඩි 7:20;
   - පන්දම් 7:20;
   - ඇඹරුම් ගලක් 9:53;
   - කොටළුවෙකුගේ හකු ඇටයක් 15:15

8. වීරාවලිය පොතේ පුන පුනා සඳහන් වන චක්‍ර ගැන ඉගෙන ගනිමින් පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න. නිදසුනක් ලෙස පළමු චක්‍රය පුරවා ඇත.

## විරාවලිය පොතේ චක්‍ර

| චක්‍රය | 3:7-11 | 3:12-30 | 4:1-5:31 | 6:1-8:32 | 8:33-10:5 | 10:6-12:15 | 13:1-16:31 |
|---|---|---|---|---|---|---|---|
| පාපය | පිළිම පූජාසනය | | | | | | |
| සේවය | වසර 8 ක් මෙසොපොතේමියේ රජු | | | | | | |
| යැදීම | ස්වාමීන්වහන්සේට මොර ගැසීම | | | | | | |
| ගැළවීම | ඔත්නියෙල් යුද්ධ කෙළේය | | | | | | |
| නිශ්ශබ්දතාව | 40 අවුරුද්දක් | | | | | | |

## ඉශ්රායෙල්හි වීරවරු

| නම | දින ක්‍රි.පූ. | අවුරුදු ගණන |
|---|---|---|
| ඔත්නියෙල් | 1400-1360 | 40 |
| එහුද් | 1360-1280 | 80 |
| ෂම්ගර් | 1280 | 1 |
| දෙබොරා | 1280-1240 | 40 |
| ගිඩියොන් | 1240-1200 | 40 |
| අබිමෙලෙක් | 1200-1197 | 3 |
| තෝලා | 1197-1174 | 23 |
| ජායිර් | 1174-1152 | 22 |
| ජෙප්තා | 1152-1146 | 6 |
| ඉබ්ශාන් | 1146-1138 | 8 |
| ඒලොන් | 1138-1128 | 10 |
| අබ්දොන් | 1128-1121 | 7 |
| සම්සොන් | 1121-1101 | 20 |

# දොළොස් වන පරිච්ඡේදය

## රූත්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- රූත් පොතේ කර්තෘ නම් කිරීමට
- රූත් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- රූත් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- රූත් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- රූත් පොතේ ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** නොදනී.

**ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ජෝෂුවා පොතෙන් පසු පැවති වීරවරුන්ගේ පාලනය සම්බන්ධ ඓතිහාසික වාර්තාව වේ.

**ප්‍රධාන පදය :**

**"එහෙත් රූත් උත්තර දෙමින් මෙසේ කීවාය. "මට ඔබ අත්හැර යන්නටවත්, ඔබ සමග නොඑන්නට වත් පෙරැත්ත නොකරන්න. ඔබ යන ඕනෑම තැනකට මමත් යමි. ඔබ ජීවත් වන ඕනෑම තැනක මමත් ජීවත් වෙමි. ඔබේ සෙනඟ මාගේ සෙනඟය. ඔබේ දෙවියෝ මාගේ දෙවියෝය. ඔබ මැරෙන තැනම මමත් මැරෙන්නෙමි. එතැනම වළලනු ලබමි. මරණය හැර ඔබෙන් මා වෙන් කළ හැකි වෙන කිසිවක් නැත. තිබුණොත්, සමිඳාණන් වහන්සේ මට ඉතා දරුණු ලෙස දඬුවම් කරන සේක්වා" (රූත් 1:16-17).**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේට තිත්තකම ආශිර්වාදයකට හැරවිය හැකිය.

**ප්‍රධාන චරිත :** නයෝමි (මාරා), එලිමෙලෙක්, මාලොන්, කිලියොන්, ඕර්පා, රූත්, බෝවස් හා නිර්නාමික ඥාතියෙක්

### සැකිල්ල

1. මෝවබ් 1:1-5

   A. මෝවබ් වෙත ගමන 1:1-2
      1. කතාව සිදුවන කාලය 1:1
      2. ඔවුන් මෝවබ් වෙත ගිය හේතුව 1:1
      3. පවුල පිළිබඳ හැඳින්වීමක් 1:2

B. මෝවබ් හි ඛේදවාචකය 1:3-5
   1. නයෝමිගේ ස්වාමිපුරුෂයා මිය යෑම 1:3
   2. නයෝමිගේ පුතුන්ගේ විවාහය 1:4
   3. නයෝමිගේ පුතුන් මිය යෑම 1:5

11. බෙත්ලෙහෙමට ආපසු පැමිණීම 1:6-18

A. නයෝමි ආපසු හැරී ඒමට සැලසුම් කර, තම ලේලීන් දෙදෙනාට ඔවුන්ගේ අය වෙත ආපසු යන මෙන් ඉල්ලා සිටියි 1:6-9
B. නැවතීමට ඔවුන් කරන ඉල්ලීම 1:10
C. නයෝමිගේ පිළිතුර 1:11-13
D. ඔවුන්ගේ ප්‍රතිචාරය 1:14
B. රූත්ගේ ප්‍රකාශය 1:16-18
   1. නයෝමිව අතහැර යාමට ඇයට අවශ්‍ය නැත 1:16
   2. නයෝමි යන ඕනෑම තැනකට ඇයද යනු ඇත 1:16
   3. නයෝමි ජීවත්වන තැන ඇයද ජීවත් වනු ඇත 1:16
   4. නයෝමිගේ සෙනඟ ඇගේ සෙනඟ වේ 1:16
   5. නයෝමිගේ දෙවියෝ ඇගේ දෙවියෝද වේ 1:16
   6. ඇය මරණය දක්වා විශ්වාසවන්තව සිටිනු ඇත 1:17

111. බෙත්ලෙහෙමට පැමිණීම 1:19-22
A. නගරයේ පිළිගැනීම 1:19
B. නයෝමිගේ ප්‍රතිචාරය 1:20-21
C. ආපසු පැමිණි කාලය 1:22

1V. රූත්, බෝවස්ගේ කෙතෙහි සිටීම 2:1-17
A. කෙතෙහි කරල් ඇහිදීම 2:1-3
B. බෝවස් හැඳිනගැනීම 2:4-13
C. බෝවස් සමඟ ආහාර ගැනීම 2:14
D. හොඳම කරල් අහුලා ගැනීම 2:15-17
E. කෙතේ සිට ආපසු පැමිණීම 2:18-23

V. විශේෂ සැලැස්මක් 3:1-18
A. නයෝමිගේ සැලැස්ම 3:1-5
B. එහි ප්‍රතිඵලය 3:6-15
C. නයෝමි ආපසු පැමිණීම 3:16-18

V1. මිදීම 4:1-13
A. ක්‍රියාවලිය 4:1-12
B. රූත් හා බෝවස් එක් වීම 4:13-17
C. ආශිර්වාදය 4:14-16

V. දාවිත් රජුගේ පෙළපත 4:17-22

## ස්වයං පරීක්ෂණය

1. රූත් පොතේ කතුවරයා කවුරුන්ද?

2. රූත් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. රූත් පොත ලියන ලද්දේ කවුරුන්ද?

4. රූත් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. රූත් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

**තවදුරටත් අධ්‍යයනය සඳහා**

1. රූත් පොතේ සිදු වූ කාලයේ පසුබිම ගැන තවදුරටත් දැනගැනීම සඳහා විරාවලිය පොත බලන්න.

2. මතෙව් 1 හි ඇති ක්‍රිස්තුස්වහන්සේගේ වංශාවලියේ සඳහන් ස්ත්‍රීන් හතර දෙනාගෙන් රූත් එක් කෙනෙකි. අනෙක් අය තමාර් 1:3; රාහබ් 1:5; හා බැත්-ෂෙබා 1:6 වේ.

3. කිට්ටු සබඳතා ඇති නෑදෑයන්ගේ යුතුකම් ද්විතීය කථාව 25:5-10 හි දක්වා ඇත. නම් නොකරන ලද කිට්ටු නෑදෑයා සම්බන්ධයෙන් දේපළ පිළිබඳ නීති, ලෙවී 25:23 හිදී ඇත.

   මුදවා ගැනීමට සමත් වූ කිට්ටු නෑදෑයාට මේ සුදුසුකම් තිබිය යුතුය.
   - ඔහු ඉතා කිට්ටු නෑදෑයෙක් විය යුතුය.
   - ඔහු මුදා ගැනීමට කැමති විය යුතුය.
   - ඔහුට මුදා ගැනීමේ හැකියාව තිබිය යුතුය.
   - ඔහු නිදහස් කෙනෙකු විය යුතුය.
   - ඔහුට මුදා ගැනීම සඳහා අවශ්‍ය මිලය තිබිය යුතුය.

රූත් වෙනුවෙන් බෝවස්ට මේ සියලු සුදුසුකම් තිබිණි. පාපී මනුෂ්‍ය වර්ගයාගේ මිදුම්කරු ලෙස ජේසුස්වහන්සේ මේ සියලු සුදුසුකම් සපුරා ලූ සේක.

4. රූත්ගේ චරිතය අධ්‍යයනය කරන්න.

   - ප්‍රේමයෙන් හා කැපවීමෙන් යුක්තය: 1:16-17
   - ස්ථිර අධිෂ්ඨානයක් ඇති 1:18
   - නිහතමානී 2:2
   - පමණ දැන ක්‍රියාකරන 2:14
   - ගුණන් දෙන්නාවූ 2:18-19
   - විශ්වාසවන්ත 2:23
   - කීකරු 3:5
   - යටත්වන 3:10
   - සදාතන අගයයන් කෙරෙහි අවධානය යොමු කරන 3:10
   - නපුරු ලෙස පෙනෙන කිසිවක් නොකිරීමට සැලකිලිමත් වීම 3:14
   - ඉවසීමෙන් යුක්තය 3:18

# දහතුන් වන පරිච්ඡේදය

## 1 හා 2 සාමුවෙල්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- 1 හා 2 සාමුවෙල්හි කතුවරයා නම් කිරීමට
- මෙම පොත් ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- මෙම පොත්වල පරමාර්ථය සඳහන් කිරීමට
- 1 හා 2 සාමුවෙල් පොත්වල ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- 1 හා 2 සාමුවෙල් පොත්වල ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## 1 සාමුවෙල්

### හැඳින්වීම

**කර්තෘ :** සාමුවෙල්

**සාමුවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියන්වහන්සේ තම සෙනඟ සමඟ තවදුරටත් කටයුතු කිරීම වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :**

> **"සාමුවෙල් පිළිතුරු දෙමින්, "ස්වාමීන්ට වඩා ප්‍රසන්න වන්නේ කුමක්ද? එතුමන්ගේ හඬට කීකරුවීම ද නැතහොත් දවන පූජා හා යාග පූජා ද? පූජාවට වඩා කීකරුවීම හොඳමය. බැටළු තෙල් පිදීමට වඩා අවනත වීම හොඳය. මන්ද, කැරලිකාරකම අනවින කිරීමේ පාපයට සමානය. මුරණ්ඩුකම රූප ඇදහීමට සමානය. ඔබ සමිඳාණන් වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කළ නිසා උන් වහන්සේ ඔබ රජකමෙන් ඉවත් කළ සේක"යි කීවේය (1 සාමුවෙල් 15:22-23).**

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පූජා කිරීමට වඩා දෙවියන්වහන්සේට කීකරු වීම වැදගත් වේ

**ප්‍රධාන චරිත :** සාමුවෙල්, එල්කානා, හන්නා, ඒලි, දාවිත්, ගෝලියත්, සාවුල්, ජොනතන්, මීකල්, අබිගායිල්

### සැකිල්ල

1. සාමුවෙල් : අවසාන වීරවරයා 1:1-7:17

    A. සාමුවෙල්ගේ උපත හා ළමා කාලය 1:1-2:10
    B. ඒලිගේ ප්‍රතික්ෂේපවීම හා සාමුවෙල්ගේ කැඳවීම 2:11-3:21
    C. පිලිස්තිවරු අතර ගිවිසුම් කරඬුව 4:1-7:1
    D. විනිශ්චයකාරයෙකු ලෙස සාමුවෙල්ගේ කටයුතු 7:2-17

II. සාවුල්: රජවරුන්ගේ පළමුවැන්නා 8:1-15:35

A. ඉශ්‍රායෙල්වරුන් රජෙකු ඉල්ලීම 8:1-22
B. සාවුල් තෝරා ගැනීම 9:1-11:15
C. සාමුවෙල්ගේ සමුදීමේ කතාව 12:1-25
D. පිලිස්තිවරුන්ට විරුද්ධව සාවුල්ගේ සටන 13:1-14:52
E. සාවුල්ගේ අකීකරුකම හා ප්‍රතික්ෂේප වීම 15:1-35

III. සාවුල් හා දාවිත් 16:1-31:13

A. දාවිත් අභිෂේක කරනු ලැබීම හා කැඳවීම 16:1-23
B. දාවිත් ගෝලියත් පරාජය කිරීම 17:1-58
C. දාවිත් සාවුල් වෙතින් පලා යෑම 18:1-20:42
D. දාවිත් තැනින් තැනට යෑම 2:1-30:31
F. සාවුල්ගේ මරණය 31:1-13

## 2 සාමුවෙල්

## හැඳින්වීම

**කර්තෘ :** සාමුවෙල්

**සාමුවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියන්වහන්සේ තම සෙනඟ සමඟ කළ කටයුතුවල ඓතිහාසික වාර්තාව තවදුරටත්.

**ප්‍රධාන පදය :**

**"එබැවින් දෙවි ස්වාමින් වහන්ස, ඔබ උතුම්ව සිටින සේක. ඔබ වහන්සේට සමාන කෙනෙකු ගැන අප කන්වලින් කවදාවත් අසා නැත. ඔබ හැර වෙන කිසි දෙවි කෙනෙක් ද නැත. මිහි පිට කුමන ජාතියක් ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්ට සමානද? දෙවි ස්වාමීන් වහන්ස, තමන් සෙනඟ වන පිණිස දෙවියන් වහන්සේ විසින් වහල්කමින් මුදාගන්නා ලද තවත් ජාතියක් ඇද්ද? ඔබ වහන්සේ කීර්තිය දිනාගන්න පිණිස උදාර වූ, භයානක වූ දේක කර දුන් තවත් ජාතියක් ඇද්ද? අන්‍ය ජාතීන් ද පන්නා දමා, ඔවුන්ගේ දෙවිවරුන් ද පන්නා දමා, මිසර දේශයෙන් තමන් වහන්සේ උදෙසා මුදාගත් ජාතියට සමාන අන් ජාතියක් ඇද් ද?" (2 සාමුවෙල් 7:22-23)**

**ජීවන හා දේව සේවා මුලධර්මය :** දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සලැස්ම උන්වහන්සේට කීකරු අය තුළින් ඔවුන් කෙතරම් දුර්වල වුවත්, ඉදිරියට ගෙනයන සේක.

**ප්‍රධාන චරිත :** දාවිත්, උරියා, බැත්-ෂෙබා, නාතාන්, අබ්සලොම්, අබ්නේර්, ඊෂ්-බොෂෙත්, ජෝවාබ්

## සැකිල්ල

1. දාවිත්ගේ ජයග්‍රහණය 1:1-10:19

   A. සාවුල් හා ජෙනතාන් වෙනුවෙන් දාවිත් වැලපීම 1:1-27
   B. දාවිත් ජුදාහි රජ වීම 2:1-7
   C. දාවිත් ජාතික හා ආගමික එක්සත් බව ඇති කරයි 2:8-6:23
   D. දාවිත්ගේ ගිවිසුම 7:1-29
   E. දාවිත්ගේ අත්පත් කරගැනීම් 8:1-10:19

11. දාවිත්ගේ කරදර : 11:1-24:25

   A. දාවිත්ගේ පාපය හා පසුතැවිලි වීම 11:1-12:31
   B. අම්නොන් හා අබ්සලොම්ගේ අපරාධ 13:1-18:33
   C. දාවිත් නැවත බලය ලබා ගැනීම 19:1-20:26
   D. සාගතය හා ගිබියොන්වරුන්ගේ පළිගැනීම 21:1-14
   E. පිලිස්තිවරු සමඟ පැවති යුද්ධයේ වීරයෝ 21:15-22
   F. දාවිත්ගේ ගීය හා අවසාන වචන 22:1-23:7
   G. දාවිත්ගේ වීරයෝ 23:8-39
   H. දාවිත්ගේ සංගණය හා දඬුවම 24:1-25

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 සාමුවෙල් පොත්වල කතුවරයා කවුරුන්ද?

---

2. 1 සාමුවෙල් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

---

3. 1 සාමුවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

---

4. 1 සාමුවෙල් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

---

5. 1 සාමුවෙල් පොතේ ප්‍රධාන පදය ලියන්න.

---

6. 2 සාමුවෙල් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

---

7. 2 සාමුවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

---

8. 2 සාමුවෙල් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

---

9. 2 සාමුවෙල් පොතේ ප්‍රධාන පදය ලියන්න.

---

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 1 සාමුවෙල් පොතේ වාර්තා වන්නේ ඉශ්රායෙලය පූජක තන්ත්‍රයේ (දෙවියන්වහන්සේ සෘජුවම පූජකවරුන් හා හමුදාමය නායකයන් මඟින් පාලනය කිරීම) සිට රාජාණ්ඩුවක් දක්වා ගමන් කිරීම (රජවරුන් මඟින් පාලනය කිරීම) .

2. 1 සාමුවෙල් 15:22-23 කීකරුකම පිළිබඳ ඇති ශ්‍රේෂ්ඨ කොටසකි.

3. 1 සාමුවෙල් 16:7 සැබෑ මනුෂ්‍ය වටිනාකම පිළිබඳ ඇති ශ්‍රේෂ්ඨ කොටසකි.

4. 1 සාමුවෙල් 17:4, ලෝකයේ උසම මිනිසා විස්තර කරයි.

5. 1 සාමුවෙල් 18:1 හි සඳහන් වන්නේ බයිබලයේ වාර්තාවන මිත්‍රත්වයන් අතුරින් ඉතාමත් අනර්ඝ මිත්‍රත්වයකි.

6. මරණයෙන් මෙලොව අතහැර ගිය අය සමඟ කෙරෙන සංවාද බොහොමයකින් එකක් 1 සාමුවෙල් හි වාර්තා වේ. 1 සාමුවෙල් 28, ලූක් 16:23-31; එළිදරව් 6:9-10 හා 7:9-10 බලන්න.

7. ශුද්ධ ලියවිල්ලේ වාර්තා වන පළමු බයිබල් පාසැල සාමුවෙල් ආරම්භ කළේය. මේවා ගිල්ගාල්, ජෙරිකෝ, හා බෙතෙල් හි පිහිටා තිබිණි. 1 සාමුවෙල් 10:10; 1 රාජාවලිය 18:13; 2 රාජාවලිය 2:3,5, 6:1-2 බලන්න)

8. ආත්මික ලෝකයේ වැපිරීම හා කැපීම පිළිබඳ වැදගත් නීතියක් 2 සාමුවෙල් හි වාර්තා වේ. දාවිත්ගේ පසුතැවිලි වීමේ යාච්ඤාවෙන් පසු (ගීතාවලිය 51), දෙවියන්වහන්සේ ඔහුට කාමමිථ්‍යාචාරය හා මිනී මැරීම වෙනුවෙන් සමාව දුන් සේක (2 සාමුවෙල් 11). එහෙත් දාවිත් තවදුරටත් තම ක්‍රියා තුළින් කනගාටුව නෙලා ගත්තෝය. මේ අස්වැන්න අතර ළදරු පුතෙකුගේ මරණය, දුවක් ඇගේම සහෝදරයෙකු විසින් දූෂණය කරනු ලැබීම, ඒ සහෝදරයා වෙනත් සහෝදරයෙකු විසින් මරා දමනු ලැබීම, හා තමාගේ ආදරවන්තම පුත්‍රයා කැරලි ගැසීම හා පසුව ඔහුව හමුදා නිලධාරියෙකු විසින් මරා දැමීම වේ.

9. තවත් වැදගත් මූලධර්මයක් 2 සාමුවෙල් උගන්වයි. එය, දෙවියන්වහන්සේගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ ක්‍රමයට කිරීමේ මූලධර්මය වේ. දාවිත් විසින් ශුද්ධ නගරයට ගිවිසුම් කරඬුව ගෙන ඒම දෙවියන්වහන්සේගේ කැමැත්ත විය. දෙවියන්වහන්සේගේ ක්‍රමය වූයේ පූජකවරුන් එය ගෙන ඒමය. පළමුව දාවිත් ඊට කීකරු වූයේ නැත. එහි ප්‍රතිඵලය වූයේ මරණය හා කනගාටුව වේ (6:1-7). දෙවියන්වහන්සේගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ ක්‍රමය සමඟ ඒකාබද්ධ කිරීම වැදගත්ය.

# දාහතර වන පරිච්ඡේදය

## 1 හා 2 රාජාවලිය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- 1 හා 2 රාජාවලිය පොත්වල කතුවරයා නම් කිරීමට
- මේ පොත් ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- එක් එක් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- 1 හා 2 රාජාවලිය පොත්වල ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- 1 හා 2 රාජාවලිය පොත් සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## 1 රාජාවලිය

### හැඳින්වීම

**කර්තෘ :** නොදනී, ඇතැම් විට ජෙරමියා විය හැකිය.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියන්වහන්සේ තම සෙනඟ වන ඉශ්රායෙල්වරුන් සමඟ කටයුතු කරන ආකාරය තවදුරටත් වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :**

> **"එසේ වුවත්, බාල් දේවතාවාට නොනැමූ දණ ඇති, ඔහු සිප නොගත් මුඛ ඇති සත්දහස්දෙනෙකු ඉශ්රායෙල්වරුන් අතරෙහි ඉතුරු කරගන්නෙමි"යි වදාළ සේක"** (1 රාජාවලිය 19:18)

**ජීවන හා දේව සේවා මූලධර්මය :** සම්මුතියකට පැමිණීම පහසු වුවත් ඒ සඳහා විශාල මිලයක් ගෙවීමට සිදුවේ.

**ප්‍රධාන චරිත :** දාවිත්, සලමොන්, ඉශ්රායෙල්හි හා ජුදාහි රජවරු (රාජාවලිය පොතේ සටහන බලන්න) නාබොත්, අහබ්, එලියා, එලිෂා

### සැකිල්ල

1. සලමොන් රජුගේ පාලන සමය 1:1-11:43
    - A. රජු ලෙස අභිෂේක කරනු ලැබීම 1:1-53
    - B. දාවිත් සලමොන්ට කළ අභියෝගය හා දාවිත්ගේ මරණය 2:1-46
    - C. සලමොන්ගේ විවාහය හා ප්‍රඥාව තෝරා ගැනීම 3:1-28
    - D. සලමොන්ගේ පරිපාලනය 4:1-34
    - E. සලමොන්ගේ ඉදිකිරීම් කටයුතු 5:1-8:66
    - F. සලමොන්ගේ ධනය හා තේජස 9:1-10:29
    - G. සලමොන්ගේ පාපය 11:1-43

11. ජුදා හා ඉශ්රායෙල් දේශයන්හි රජවරුන්ගේ පාලනය 12:1-22:53. 2 රාජාවලිය පොතෙහිද ඇත. (රජවරුන් පිළිබඳ සටහන බලන්න)
   A. රෙහොබෝවම් රජකමට පත් වීම 12:1-33
   B. ජුදාහි රජවරු රෙහොබෝවම් සිට ජෙහෝෂාපාට් දක්වා 13:1-22:53
   C. ඉශ්රායෙල්හි රජවරු ජෙරොබෝවම් සිට අහසියා දක්වා 13:1-22:53
   D. ඉශ්රායෙල් වෙත එලියා දිවැසිවරයාගේ සේවය 17:1-22:53

# 2 රාජාවලිය

## හැඳින්වීම

**කර්තෘ :** නොදනී, ඇතැම් විට ජෙරමියා විය හැකිය.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියන්වහන්සේ තම සෙනඟ වන ඉශ්රායෙල්වරුන් සමඟ කටයුතු කරන ආකාරය තවදුරටත් වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :**

> **"තවද ඔවුන් එගොඩවූ කල එලියා කථාකොට: ඔබ වෙතින් මා ගන්ට පළමුවෙන් ඔබට මගෙන් ඕනෑ දෙයක් ඉල්ලන්නැයි එලිෂාට කීය. එලිෂා පිළිතුරු දෙමින්, "ඔබට තිබෙන ආත්මානුභාවය මෙන් දෙගුණයක් මා කෙරෙහි පැමිණේවා"යි කී ය. ඔහුද: ඔබ අමාරු දෙයක් ඉල්ලුවෙහිය, එහෙත් ඔබ වෙතින් මා ගන්න විට ඔබ මා දුටුවොත් ඔබට එසේ වන්නේය: නැතහොත් එසේ නොවන්නේයැ යි කීය."** (2 රාජාවලිය 2:9-10)

**ජීවන හා දේව සේවා මූලධර්මය :** මෙලොව රාජ්‍යයන් තාවකාලිකය. දෙවියන්වහන්සේගේ පාලනය යටතේ ඒවා ඇතිවේ, නැතිවේ.

**ප්‍රධාන චරිත :** ඉශ්රායෙල්හි හා ජුදාහි රජවරු (රජවරුන් පිළිබඳ සටහන බලන්න) එලිෂා, එලියා

## සැකිල්ල

1. එලිෂාගේ සේවය හා ඉශ්රායෙල්හි රජවරුන් පිළිබඳව තවදුරටත් වාර්තා කිරීම.: 1:1-10:36

11. ඉශ්රායෙල්හි හා ජුදාහි රජවරුන් ගැන වාර්තාව : 11:1-17:41
1 රාජාවලියෙන් දිගටම වාර්තා වේ. (රජවරුන් ගැන සටහන බලන්න).

111. ජුදාහි රජවරුන් ගැන වාර්තාව : හෙසකියා සිට ශෙදෙකියා දක්වා 18:1-25:30
(රජවරුන් පිළිබඳ සටහන බලන්න).

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 රාජාවලිය පොත්වල කතුවරයා කවුරුන්ද?

2. 1 රාජාවලිය පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. 1 රාජාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. 1 රාජාවලිය පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. 1 රාජාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

6. 2 රාජාවලිය පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

7. 2 රාජාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

8. 2 රාජාවලිය පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. 2 රාජාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉශ්රායෙල්හි ගෝත්‍ර 12 බෙදී යෑම 1 රාජාවලිය 12 හි සඳහන් වේ. අනාගතයේ මෙම ගෝත්‍ර නැවත එක්වීම ගැන එළිදරව් 7 හි විස්තර කර ඇත. ඉශ්රායෙල් හා ජුදා ලෙස බෙදුනු රාජ්‍යයන්හි තොරතුරු මෙම කොටසේ චාට් සටහන සාරාංශ කරයි. දේශ සීමාවන් සිතියමෙහි දැක්වේ.

2. 1 රාජාවලිය පොතේ ප්‍රධාන චරිතයක් වන සලමොන් රජතුමා හිතෝපදේශ, ධර්මදේශකයා හා ප්‍රේම ගී ලිව්වේය. ඔබ මෙම පොත් ඉදිරියේදී මෙම පාඨමාලාවෙන් අධ්‍යයනය කරනු ඇත.

3. ඉශ්රායෙල්හි හා ජුදාහි රජවරුන් පිළිබඳ පහත දැක්වෙන සටහන, ඔබ රාජාවලිය හා වංශාවලිය පොත් අධ්‍යයනය කරන විට, ඔබට උපකාරී වනු ඇත.

### ඉශ්රායෙල්හි රජවරු

| රජුගේ නම | පාලන සමය අවුරුදු | දින ක්‍රි.පූ. | යොමුව |
|---|---|---|---|
| 1 ජෙරබෝවම් | 22 | 976-954 | 1 රාජාවලිය 11:26-14:20 |
| නාදාබ් | 2 | 954-953 | 1 රාජාවලිය 15:25-28 |
| බාෂා | 24 | 953-930 | 1 රාජාවලිය 15:27-16:7 |
| ඒලා | 2 | 930-929 | 1 රාජාවලිය 16:6-14 |
| සිම්රි | (දින 7) | 929 | 1 රාජාවලිය 16:9-20 |
| ඔම්රි | 12 | 929-918 | 1 රාජාවලිය 16:15-28 |
| ආහබ් | 21 | 918-898 | 1 රාජාවලිය 16:28-22:40 |
| අහසියා | 1 | 898-897 | 1 රාජාවලිය 22:40 2 රාජා. 1:18 |
| ජෙහොරාම් | 11 | 897-885 | 2 රාජාවලිය 3:1-9:25 |
| ජේහු | 28 | 885-857 | 2 රාජාවලිය 9:1-10:36 |
| ජෙහෝවාහාස් | 16 | 857-841 | 2 රාජාවලිය 13:1-9 |
| ජෙහෝවාෂ් (ජෝවාෂ්) | 16 | 841-825 | 2 රාජාවලිය 13:10-14:16 |
| 2 ජෙරොබෝවම් | 40 | 825-773 | 2 රාජාවලිය 14:23-29 |
| සෙකරියා | 1/2 | 773-772 | 2 රාජාවලිය 14:29-15:12 |
| ෂල්ලුම් | (මාස 1) | 772 | 2 රාජාවලිය 15:10-15 |
| මෙනෙහෙම් | 10 | 772-762 | 2 රාජාවලිය 15:14-22 |
| පෙකහියා | 2 | 762-760 | 2 රාජාවලිය 15:22-26 |
| පෙකා | 20 | 760-730 | 2 රාජාවලිය 15:27-31 |
| හෝෂෙයා | 9 | 730-721 | 2 රාජාවලිය 15:30-17:6 |

## ජුදාහි රජවරු

| රජුගේ නම | පාලන සමය අවුරුදු | දින ක්‍රි.පූ. | යොමුව |
|---|---|---|---|
| රෙහොබෝවම් | 17 | 976-959 | 1 රාජාවලිය 11:42-14:31 |
| අබියාම් | 3 | 959-996 | 1 රාජාවලිය 14:31-15:8 |
| ආසා | 41 | 956-915 | 1 රාජාවලිය 15:8-24 |
| ජෙහෝෂාපාට් | 25 | 915-893 | 1 රාජාවලිය 22:41-50 |
| ජෙහොරාම් | 8 | 893-886 | 2 රාජාවලිය 8:16-24 |
| අහසියා | 1 | 886-885 | 2 රාජාවලිය 8:24-9:29 |
| අතලියා | 6 | 885-879 | 2 රාජාවලිය 11:1-20 |
| ජෝවාෂ් | 40 | 879-840 | 2 රාජාවලිය 11:1-12:21 |
| අමශියා | 29 | 840-841 | 2 රාජාවලිය 14:1-20 |
| අසරියා(උශ්ශියා) | 52 | 811-759 | 2 රාජාවලිය 15:1-7 |
| ජෝතම් | 18 | 759-743 | 2 රාජාවලිය 15:32-38 |
| ආහාස් | 19 | 743-727 | 2 රාජාවලිය 16:1-20 |
| හෙසකියා | 29 | 727-698 | 2 රාජාවලිය 18:1-20:21 |
| මනස්සේ | 55 | 698-643 | 2 රාජාවලිය 21:1-18 |
| ආමොන් | 2 | 643-640 | 2 රාජාවලිය 21:19-26 |
| ජොෂියා | 31 | 640-609 | 2 රාජාවලිය 22:1-23:30 |
| ජෙහෝවාහාස් | (මාස 3යි) | 609 | 2 රාජාවලිය 23:31-33 |
| ජෙහෝයාකිම් | 11 | 609-597 | 2 රාජාවලිය 23:34-24:5 |
| ජෙහෝයාකින් | (මාස 3යි) | 597 | 2 රාජාවලිය 24:6-16 |
| ශෙදෙකියා | 11 | 597-586 | 2 රාජාවලිය 24:17-25:30 |

**බෙදුණු රාජ්‍යයේ සාරාංශ සටහන**

| **ඉශ්රායෙල් ක්‍රි.පූ. 933-722** | **ජුදා ක්‍රි.පූ. 933-856** |
|---|---|
| අනෙකුත් නම් | අනෙකුත් නම් |
| ගෝත්‍ර දහය<br>උතුරු රාජ්‍යය<br>සමාරියා/එප්‍රායිම් | ගෝත්‍ර දෙක<br>දකුණු රාජ්‍යය<br>දාවිත්ගේ නිවෙස |
| පාලනය කළ පවුල් | පාලනය කළ පවුල් |
| රජ පෙළපත් හෝ පාලන පවුල් නවයක්<br>රජවරු දහනවයක් (සියලු දෙනාම දුෂ්ටය) | එක් රජ පෙළපතක් (දාවිත්ගේ)<br>රජවරු විසි දෙනෙක් (බොහොමයක් යහපත්ය) |
| එක් දිවිනසාගැනීමක්/ඝාතන හතක් | ඝාතන පහක් |
| <u>පැවති කාලය</u> | <u>පැවති කාලය</u> |
| වසර 211 | වසර 347 |
| <u>වහල් භාවය</u> | <u>වහල් භාවය</u> |
| අසරියාවට වහල්ව සිට<br>ජාතීන් අතර විසුරවනු ලැබිය<br>නැවත නිදහස නොලැබිණි | බබිලෝනියට ගෙන යන ලදි<br>වසර 70 කට පසු ආපසු පැමිණේ<br>ජෙරුසලම හා දේවමාලිගාව<br>නැවත ගොඩනඟන ලදි |
| <u>ප්‍රදේශය</u> | <u>ප්‍රදේශය</u> |
| කානාන් දේශය 2/3 කට වැඩි ප්‍රමාණයක්<br>සශ්‍රිකම පෙදෙස් | කානාන් දේශය 1/3 කට අඩු ප්‍රමාණයක්<br>ජෙරුසලම හා දේවමාලිගාව |
| <u>ආගම</u> | <u>ආගම</u> |
| දෙවියන්වහන්සේගේ නමස්කාර ක්‍රමය අත්හරී<br>රන් වස්සාට ඉතිහාසය මුළුල්ලේම නමස්කාර කළේය.<br>ආහබ්ගේ පාලන සමයේ නමස්කාරය සඳහා බාල් හා අෂේරා එක්කර ගනු ලැබීය. | නමස්කාරයට රූප වන්දනාව තිබිණි<br>නිරන්තර ප්‍රතිසංස්කරණය විය<br>දේව බිය ඇති රජවරු සිටියහ |

# පහළොස් වන පරිච්ඡේදය

## 1 හා 2 වංශාවලිය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- 1 හා 2 වංශාවලිය පොත්වල කතුවරයා නම් කිරීමට
- මේ පොත් ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- එක් එක් පොතේ  පරමාර්ථය සඳහන් කිරීමට
- 1 හා 2 වංශාවලිය පොත්වල ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- 1 හා 2 වංශාවලිය පොත් සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## 1 වංශාවලිය

### හැඳින්වීම

**කර්තෘ :** නොදනි,  ඇතැම් විට එස්රා විය හැකිය.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ජුදාහි ආගමික ඉතිහාසය වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :** 1 වංශාවලිය 29:11

**ජීවන හා දේව සේවා මූලධර්මය** : දෙවියන්වහන්සේ මහිමයට පත්කළ විට උන්වහන්සේගේ සෙනඟ ආශිර්වාද ලබති.

**ප්‍රධාන චරිත :** දාවිත් රජු, සලමොන් රජු

### සැකිල්ල

1. ආදාම් සිට දාවිත් දක්වා පෙළපත 1:1-9:44

   A. ආදම් පටන් ජාකොබ් දක්වා 1:1-22
   B. ජාකොබ් පටන් දාවිත් දක්වා 2:2-9:44

11. දාවිත් රජුගේ ඉතිහාසය 10:1-29:30

   A. සාවුල් රජුගේ මරණය 10:1-14
   B. සියොන් අත්පත් කරගැනීම හා දාවිත්ගේ වීරයෝ 11:1-12:40
   C. දාවිත්ගේ සමෘධිමත් පාලන සමය 13:1-22:1
   D. දාවිත් ඉටුකළ ආගමික කටයුතු 22:2-29:30

# 2 වංශාවලිය

## හැඳින්වීම

**කර්තෘ :** නොදනී, ඇතැම් විට එස්රා විය හැකිය.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ජුදාහි ආගමික ඉතිහාසය වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :** 2 වංශාවලිය 7:14

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේගේ ආශිර්වාද පැමිණෙන්නේ අප නිහතමාන වීමෙන් හා උන්වහන්සේ සෙවීමෙනි.

**ප්‍රධාන චරිත :** සලමොන් රජු හා රෙහොබෝවම් සිට ශෙදකියා දක්වා ඔහුගේ අනුප්‍රාප්තිකයෝ (ජුදාහි රජවරුන් පිළිබඳ සටහන බලන්න)

## සැකිල්ල

1. සලමොන් රජුගේ ඉතිහාසය 1:1-9:31

   A. සලමොන්ගේ ධනය හා ප්‍රඥාව 1:1-17
   B. සලමොන් දේවමාලිගාව ගොඩනැගීම හා කැපකිරීම 2:1-7:22
   C. සලමොන්ගේ විවිධ කටයුතු 8:1-9:28
   D. සලමොන්ගේ මරණය 9:29-31

11. ජුදාහි රජවරුන්ගේ ඉතිහාසය 10:1-36:23
   A. රෙහොබෝවම්ගේ සිට ශෙදකියා රජු දක්වා 10:1-36:21
   (මෙම රජවරුන් පිළිබඳව විස්තර සහිතව අධ්‍යයනය කිරීමට පෙර පරිච්ජේදයේ ජුදාහි රජවරුන් පිළිබඳ සටහන බලන්න)
   B. සයිරස් රජුගේ ආඥාව 36:22-23

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 වංශාවලිය පොත්වල කතුවරයා කවුරුන්ද?

---

2. 1 වංශාවලිය පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

---

3. 1 වංශාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

---

4. 1 වංශාවලිය පොත සඳහා ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

---

5. 1 වංශාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

---

6. 2 වංශාවලිය පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

---

7. 2 වංශාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

---

8. 2 වංශාවලිය පොත සඳහා ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

---

9. 2 වංශාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

---

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 1 සාමුවෙල්, රාජාවලිය හා වංශාවලිය පොත්වල සමාන කරුණු බොහෝ තිබුණද සෑම පොතක්ම ලියන ලද්දේ විශේෂිත පරමාර්ථයක් සාක්ෂාත් කර ගැනීම සඳහා වේ.

    නිදසුනක් ලෙස, 2 සාමුවෙල් සහ 1 හා 2 රාජාවලිය පොත් ඉශ්‍රායෙල්හි හා ජුදාහි දේශපාලනික ඉතිහාසය ඉදිරිපත් කරයි. 1 හා 2 වංශාවලියේ කර ඇත්තේ ජුදාහි විස්තරාත්මක ආගමික ඉතිහාසය පමණක් වේ.

    2 සාමුවෙල් හා 1 හා 2 රාජාවලිය අවධානය යොමු කරන්නේ ඒ යුගයේ පාලකයන් හා දිවැසිවරුන් වෙත වේ. 1 හා 2 වංශාවලිය අවධානය යොමු කරන්නේ පූජකවරුන් හා දේවමාලිගාව වෙතය.

    ඔබ මෙම පොත් විස්තරාත්මකව අධ්‍යයනය කරන විට නැවත නැවත සඳහන් වී ඇති කරුණු එකිනෙකට වෙනස් වන්නේ කෙසේදැයි අවධානයෙන් බලන්න.

2. 2 වංශාවලිය පිබිදීම පිළිබඳ පොතකි. මහා පිබිදීම් ඇතිවූයේ මොවුන් යටතේය.

    - ආසා : 2 වංශාවලිය 15
    - ජෙහොෂාපාට් 2 වංශාවලිය 20
    - ජෝවාෂ් : 2 වංශාවලිය 23-24:
    - හෙසකියා 2 වංශාවලිය 29 -31
    - ජොෂියා 2 වංශාවලිය 35

3. ඔබගේ බයිබලයේ සලකුණු කිරීම සඳහා වංශාවලියේ ප්‍රධාන වචන
    - නිවෙස
    - කරඬුව
    - ගිවිසුම
    - මොරගැසීම (මොරගැසූහ)
    - සොයන්න (සෙවීය)
    - හදවත
    - යාච්ඥා කිරීම (යාච්ඥාව)
    - දිවැසිවරු (වරයා)

4. යාච්ඥාව හා දෙවියන්වහන්සේ සෙවීම පිළිබඳව බොහෝ පාඩම් මෙම පොත්වලින් ඉගෙන ගත හැකිය. ප්‍රධාන වචනය ලකුණු කිරීමෙන් ඔබ උගත් දේ පුනරීක්ෂණය කරන්න. විශේෂයෙන්ම 2 වංශාවලිය 6 අධ්‍යයනය කරන්න.

5. ජෙහොෂාපාට්, හෙසකියා හා උශ්ශියා ආදීන්ගේ සාර්ථකත්වයන් හා අසාර්ථකත්වයන් මඟින් ඉගෙන ගන්නේ කුමක්ද?

# දහසය වන පරිච්ඡේදය

## එස්රා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- එස්රා පොතේ කතුවරයා නම් කිරීමට
- එස්රා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- එස්රා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- එස්රා පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- එස්රා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** එස්රා

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** විප්‍රවාසයේ සිට ඉශ්රායෙල්වරුන් නැවත පැමිණීම හා ජෙරුසලමේ දේවමාලිගාව නැවත ගොඩනැගීම

**ප්‍රධාන පදය :** එස්රා 6:16.

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පසුතැවීමේ මූලික සිද්ධාන්ත දෙක නම් ආපසු හැරීම හා ප්‍රතිසංස්කරණය වේ.

**ප්‍රධාන චරිත :** එස්රා, ජෝෂුවා, සෙරුබ්බාබෙල්, සයිරස්, හග්ගයි, සෙකරියා, අර්තක්ෂස්තා

### සැකිල්ල

1. සෙරුබ්බාබෙල් යටතේ ප්‍රතිසංස්කරණය 1:1-6:22

    A. විප්‍රවාසයෙන් මිදී පැමිණි ප්‍රථම කණ්ඩායම 1:1-2:70
      1. සයිරස්ගේ ප්‍රකාශනය 1:1-11
        (a). ප්‍රකාශනයේ සඳහන් දේ 1:2-4
        (b). මිනිසුන්ගේ ආශාවන් 1:5-11
      2. විප්‍රවාසීන්ගේ නාම ලේඛණය 2:1-70

    B. ප්‍රසිද්ධ නමස්කාරය යළි ඇරඹීම 3:1-6:22
      1. දේව මාලිගාව නැවත ගොඩනැඟීම 3:1-6:15
        a. ජෙරුසලමේ නමස්කාරය යළි ඇරඹීම 3:1-7
        b. දේව මාලිගාවේ වැඩ 3:8-13
        c. වැඩ අවහිර කිරීමට සාතන් උත්සාහ කරයි 4:1-24
        d. දිවැසිවරු සභයට පැමිණෙති 5:1-2
        e. ආණ්ඩුකාරයාගේ ප්‍රශ්න 5:3-5
        f. දාරියුස්ට ලිපියක් යැවීම 5:6-17

g. සොයා බැලීම 6:1-12
h. තත්තෙනයිගේ ප්‍රතිචාරය 6:13-15

2. දේවමාලිගාව කැප කිරීම 6:16-22

11. එස්රා යටතේ සංශෝධන 7:1-10:44

A. විප්‍රවාසයෙන් මිදී පැමිණි දෙවන කණ්ඩායම 7:1-8:36
1. එස්රාගේ පසුබිම හා සූදානම් වීම 7:1-10
2. අර්තක්ෂස්තාගේ ලිපිය 7:11-26
3. එස්රාගේ ප්‍රතිචාරය 7:27-28

B. සමාජ දුෂ්ටකම් නිවැරදි කිරීම 9:1-10:44
1. දෙවියන්වහන්සේගේ සෙනඟ වැරදි සම්මුතියන්ට එකඟ වීම 9:1-2
2. එස්රාගේ යැදීම 9:3-15
3. සෙනඟ තමාගේ වරද ඒත්තු ගැනීම 10:1-8
4. පාපොච්චාරණය හා පසුතැවිලිවීම 10:9-16
5. වරදකරුවන්ගේ නාම ලේඛණය 10:18-44

## ස්වයං පරීක්ෂණය

1. එස්රා පොතේ කතුවරයා කවුරුන්ද?

2. එස්රා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. එස්රා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. එස්රා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. එස්රා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ගීතාවලිය 137 කියවන්න. මෙම පරිච්ඡේදයේ වාර්තා වන්නේ ජෙරුසලමේ සිට දෙවියන්වහන්සේ සෙනඟ වහල්කමට බබිලෝනියට ගෙන යන විට ඔවුන්ගේ දුක වේ. ගීතාවලිය 126 කියවන්න. වහල් බවින් මිදී ආපසු ජෙරුසලමට පැමිණෙන විට ඇති වූ ප්‍රීතිය එහි විස්තර කර ඇත.

2. ඉශ්රායෙලය හා ජුදා යන බෙදුණු රාජ්‍යයන් දෙකම සතුරන් විසින් වහල්කමට ගෙන යන ලදි. ඉශ්රායෙලය ක්‍රි. පු 721 දී අසිරියන්වරුන් විසින් අල්ලා ගන්නා ලද අතර ක්‍රි.පු. 606 දී බබිලෝනිය, ජුදාව අල්ලා ගත්තේය. දෙවියන්වහන්සේගේ සෙනඟ වහල් බවින් මිදී ආපසු ජෙරුසලමට පැමිණියේ මෙසේය :

ක්‍රි. පු. 536 සෙරුබ්බාබෙල් සමඟ ජුදෙව්වන් 42,360 ක්ද, සේවකයන් 7,337 ක්ද ගායකයන් 200 ක්ද, අශ්වයන් 736 ක්ද, කොටළුවන් 245 ක්ද, ඔටුවන් 435 ක්ද, බූරුවන් 6,720 ක්ද හා රන් රිදී භාජන 5,400 ක්ද වේ.

ක්‍රි.පු. 457 දී එස්රා සමඟ මිනිසුන් 1,754 ක්ද, රන් තලෙන්ත 100 ක්ද රිදී තලෙන්ත 750 ක්ද වේ. විප්‍රවාසයෙන් පැමිණි මේ අය අතර ස්ත්‍රීන් හා ළමයින් සිටියේදැයි සඳහන්ව නැත.

ක්‍රි.පු. 444 දී නෙහෙමියා ජෙරුසලම නැවත ගොඩනැඟීමට හා ශක්තිමත් කිරීමට හමුදා ආරක්ෂකයන් සමඟ, පැමිණියේය.

3. බබිලෝනියානු වහල් කමට ගමන් තුනක් යැවිණි. පොරොන්දු දේශයට ආපසු ගමන් තුනක් පිළිබඳව එස්රා පොතේ සඳහන් වේ.

*බබිලෝනියට ගිය ගමන් තුන:*

- දානියෙල්ගේ කාලයේ ක්‍රි.පු. 606
- එසකියෙල්ගේ කාලයේ ක්‍රි.පු 597
- ශෙදෙකියා රජුගේ කාලයේ ක්‍රි. පු. 586

*නිදහස වෙත ගිය ගමන් තුන:*

- සෙරුබ්බාබෙල් හා ජෝෂුවාගේ මඟපෙන්වීම යටතේ ක්‍රි.පු 538
- එස්රාගේ මඟපෙන්වීම යටතේ ක්‍රි.පු 456
- නෙහෙමියාගේ මඟපෙන්වීම යටතේ ක්‍රි.පු. 446

# දාහත් වන පරිච්ඡේදය

## නෙහෙමියා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- නෙහෙමියා පොතේ කතුවරයා නම් කිරීමට
- නෙහෙමියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- නෙහෙමියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- නෙහෙමියා පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- නෙහෙමියා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** නෙහෙමියා

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ඉශ්රායෙල්වරුන්ගේ ඉතිහාසය තවදුරටත් පෙන්වීම. ජෙරුසලමේ පවුර ගොඩනැගීම වාර්තා කිරීම.

**ප්‍රධාන පදය :** නෙහෙමියා 6:3

**ජීවන හා දේව සේවා මූලධර්මය :** විරුද්ධත්වයක් නොමැතිව අවස්ථාවක් නොමැත. ක්‍රියාවන් නොමැති ඇදහිල්ල නිෂ්ඵලය.

**ප්‍රධාන චරිත :** නෙහෙමියා, සන්බලාට්, ගෙෂෙම්, ෂෙමායා, ටෝබියා, හනනියා, එස්රා, අර්තක්ෂස්තා.

### සැකිල්ල

1. හැඳින්වීම 1:1-11

   A. ජෙරුසලමෙන් ලද නරක පුවත් 1:1-3
   B. නෙහෙමියාගේ ප්‍රතිචාරය 1:4-11

11. කාර්යය සඳහා සූදානම් වීම 2:1-20

   A. රජු සමඟ 2:1-8
   B. ආණ්ඩුකාරවරුන් සමඟ 2:9-10
   C. ජෙරුසලමේ දී 2:11-15
   D. සෙනඟගේ නායකයන් සමඟ 2:15-20

111. පවුරු ප්‍රතිසංස්කරණය 3:1-6:19
   A. ගොඩනඟන්නන්ගේ හා සංවිධානවල ලයිස්තුව 3:1-32
   B. බාහිර හා අභ්‍යන්තර විරෝධතා 4:6-14

1. **බාහිර විරෝධතා**
   a. සෘජු විවේචන 2:19
   b. උපහාස හා පරිභව කිරීම් 4:1-3
   c. බොරු චෝදනා 6:5-7
   d. අවදානම් සහිත අවස්ථාවල 4:6
   e. වෙන අතකට හැරවීම 6:2
   f. ජනප්‍රිය බලපෑම් 6:2
   g. තර්ජන, බියකිරීම් 6:5-9
   h. සම්මුතයන්වලට එකඟවීම 5:14-19
   i.සටන් හා බාධා කිරීම් 4:8
   j.කුමන්ත්‍රණ 4:8; 6:2
   k. තර්ජන හා බිය කිරීම් 6:5-9
2. **අභ්‍යන්තර විරෝධතා**
   a. අධෛර්යවීම 4:10-11
   b. භේදවීම 5:1-19
   c. දුර්වල ඇදහිලිවන්තයෝ 4:12
   d. ආගමික නායකයන්ගේ විරෝධතා 3:5
   e. දෙවියන් වහන්සේගේ ව්‍යාජ දිවැසිවරු 6:10-13

C. පවුර සාදා නිමකිරීම 6:15-19

1V. පාලනය හා සංගණනය 7:1-73
   A. නගර පාලනය පිහිටුවයි 7:1-4
   B. ආපසු පැමිණෙන විප්‍රවාසීන්ගේ සංගණනය 7:5-73

V. එස්රාගේ හා නෙහෙමියාගේ ආගමික ප්‍රතිසංස්කරණ 8:1-13:31
   A. ව්‍යවස්ථාව කියවීම 8:1-8:18
   B. පාපොච්චාරණය කිරීම හා යාච්ඤාව 9:1-37
   C. ගිවිසුම අලුත් කිරීම 9:38 - 10:39
   D. පදිංචිකරුවන්ගේ නම් ලයිස්තුව 11:1-12:26
   E. පවුර කැප කිරීම 12:27-47
   F. නෙහෙමියාගේ ප්‍රතිසංස්කරණය 13:1-31

## පෙලඹවීමේ සටන් පාඨ

නෙහෙමියාගේ පෙලඹවීම් පාඨ දහය

- මාගේ දෙවියන් වහන්සේගේ යහපත් හස්තය මා කෙරෙහිය 2:8
- “අපි නැගිට ගොඩනගමු” 2:18
- ස්වර්ගයේ දෙවියන් වහන්සේම අපගේ කාර්යය සාර්ථක කරනු ඇත 2:20
- වැඩ කරන්නට සෙනඟට සිතේ ධෛර්යය තිබිණි 4:6
- ශ්‍රේෂ්ඨ සමිදාණන් වහන්සේ සිහිකරමින් . . . සටන් කරන්න 4:14
- දෙවියන් වහන්සේ අප උදෙසා සටන් කරන සේක 4:20
- දෙවියන් වහන්සේ දැන් මාගේ අත් ශක්තිමත් කළ මැනව 6:9
- මේ වැඩය ඉටුවුණේ අපේ දෙවියන් වහන්සේගේ උපකාරයෙනි 6:16
- සමිදාණන් වහන්සේ කෙරෙහි ප්‍රීති වීම ඔබේ ශක්තිය වේ 8:10
- මාගේ දෙවියන් වහන්සේ මා සිහි කළ මැනව 13:29, 31

## ස්වයං පරීක්ෂණය

1. නෙහෙමියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. නෙහෙමියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. නෙහෙමියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. නෙහෙමියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. නෙහෙමියා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන් වහන්සේ වෙනුවෙන් කරන වැඩකට සෑම විටම අභ්‍යන්තරවත් බාහිරවත් මනුෂ්‍යයන්ගේ හා සාතන්ගේ විරෝධතා පැමිණේ. ඔබ නෙහෙමියාගේ පොත අධ්‍යයනය කරන අතුරතුර දෙවියන් වහන්සේගේ වැඩ නතර කිරීම සඳහා සැලසුම් කළ සතුරාගේ ප්‍රහාරවල ලයිස්තුවක් සකස් කරන්න.

2. ජෙරුසලම වටා පිහිටි පවුරේ දොරටු කිතුනු ජීවිතයට සමාන වේ. මින් අදහස් වන්නේ ඒවා සත්‍ය දොරටු වුවද ඒවා ආත්මික සත්‍යයේ සංකේතද වන බව වේ.

| දොරටුවේ නම | සංකේතවත් කරන දෙය | යොමුකිරීම | |
|---|---|---|---|
| | | නෙහෙමියා | වෙනත් |
| බැටළු දොරටුව | කුරුසිය | 3:1 | ජොහන් 10:1 |
| මත්ස්‍ය දොරටුව | ආත්ම දිනාගැනීම | 3:3 | මතෙව් 4:19 |
| පරණ දොරටුව | පැරණි ස්වභාවය | 3:6 | රෝම 6:1-23 |
| මිටියාවතේ දොරටුව | දුක්විඳීම හා පරීක්ෂාව | 3:13 | 2 කොරින්ති 1:3-5 |
| කසළ දොරටුව | මාංසයේ ක්‍රියා | 3:14 | ගලාති 5:16-21 |
| උල්පත් දොරටුව | ශුද්ධාත්මයාණන් වහන්සේ | 3:15 | ජොහන් 7:37-39 |
| වතුර දොරටුව | දේව වචනය | 3:26 | ජොහන් 4:10-14 |
| අශ්ව දොරටුව | ඇදහිලිවන්තුන්ගේ ආත්මික යුද්ධය | 3:28 | එපීස 6:10-17 |
| නැගෙනහිර දොරටුව | ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම | 3:29 | එසකියෙල් 43:1,2 |
| මල්කියා මුර දොරටුව | ජේසුස් වහන්සේගේ විනිශ්චයාසනය | 3:31 | 1 කොරින්ති 3:9-15<br>2 කොරින්ති 5:10 |

# දහ අට වන පරිච්ඡේදය

## එස්තර්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- එස්තර් පොතේ කතුවරයා නම් කිරීමට
- එස්තර් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- එස්තර් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- එස්තර් පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- එස්තර් පොත සඳහා ජිවන හා දේවසේවා මුලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** නොදනි

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** පර්සියාවේ විසිරි සිටියාවු ජුදෙව්වන් වෙතය.

**පරමාර්ථය :** ඉශ්‍රායෙල්වරුන්ගේ ඉතිහාසයේ පැවැත්ම හා දෙවියන්වහන්සේගේ සෙනඟ කෙරෙහි උන්වහන්සේගේ ආරක්ෂාව පෙන්නුම් කිරිම.

**ප්‍රධාන පදය :** එස්තර් 4:14

**ජිවන හා දේව සේවා මුලධර්මය:** ජිවිතවල අභියෝගවත් අවස්ථා සඳහා දෙවියන්වහන්සේ විසින් පිළියෙල කරන ලද මනුෂ්‍යයන් තබා ඇත.

**ප්‍රධාන චරිත :** එස්තර්, වස්ති, හාමාන්, මෝර්දෙකයි, අහෂ්වේරොෂ්

### සැකිල්ල

1. හැඳින්වීම 1:1-22
   A. මහා මංගල්‍යය භෝජනය 1:1-9
   B. නිවසේ ගැටලුවක් 1:10-12
   C. රාජකීය නියෝගයක් 1:13-22

11. අලුත් රැජිණක් 2:1-21
   A. රැජිණක් සෙවීම 2:1-4
   B. එස්තර් තරඟයට ඇතුළු වේ 2:5-11
      1. මෝර්දෙකයිගේ පසුබිම 2:5-6
      2. එස්තර්ගේ පසුබිම 2:7
   C. එස්තර් හෙගයිගේ රැකවරණයට පත්වීම 2:8-11
   D. රජු වෙතට මෙම ස්ත්‍රිය ඉදිරිපත් කිරීම 2:12-14
   E. බිසව වශයෙන් එස්තර් තෝරා ගැනීම 2:15-17
   F. එස්තර්ට උපහාර දැක්වීමේ මංගල්‍යය 2:18
   G. එස්තර්ගේ රහස 2:19

111. මිනිසුන් දෙදෙනෙක්, කුමන්ත්‍රණ දෙකක් 2:21 - 3:15

A. කුමන්ත්‍රණය මෝර්දෙකයි විසින් හෙළිකිරීම 2:22-23
   1. මෝර්දෙකයි, රජුගේ දොරටුව අසල 2:22-23
   2. මෝර්දෙකයි කුමන්ත්‍රණය අසාර්ථක කිරීම 2:21-22
   3. අපරාධකරුවෝ එල්ලා මරති. 2:23

B. හාමාන් උසස් කරනු ලැබීම හා කුමන්ත්‍රණය 3:1-15
   1. සියලු අධිපතින්ට වඩා හාමාන් උසස් කෙරේ 3:1
   2. හාමාන් හා මෝර්දෙකයි අතර ගැටලුව 3:2-6
   3. හාමාන්ගේ පළිගැනීමේ කුමන්ත්‍රණය 3:7-15

1V. බලාපොරොත්තු නැතිවීම හා මුදා ගැනීම 4:1-7:10

A. ජුදෙව්වන්ගේ බලාපොරොත්තු නැති වීම 4:1-3

B. රැජිණගේ බලාපොරොත්තු නැති වීම: 4:4-9

C. මිදීම සඳහා සැලැස්මක් 4:10-5:14
   1. සැලැස්ම 4:10-17
   2. රජු ඉදිරිපිට 5: 1-3
   3. මංගල භෝජනය සඳහා ආරාධනා 5:4-8
   4. හාමාන්ගේ උඩගුකම 5:9-14

D. මෝර්දෙකයිට ගරු සම්මාන දීම 6:1-14
   1. රජු ඉදිරියේ කියවීම 6:1-3
   2. හාමාන්ගේ උපදෙස් පැතීම 6:4-5
   3. හාමාන්ගේ උඩගු ප්‍රතිචාරය 6:6-9
   4. මෝර්දෙකයි හට ගරු සම්මාන දෙන විට හාමාන්ගේ ආත්ම දමනය 6:10-12
   5. හාමාන්ගේ පවුලේ අයගේ හා මිතුරන්ගේ ප්‍රතිචාරය 6:13-14

E. එස්තර්ගේ මංගල භෝජන උත්සවය 7:1-6

B. හමාන් දඬුවම් ලබයි 7:7-10

V. නව රාජ අණ දීම 8:1-10:13

A. රජුගෙන් අලුත් අණ දීමක් 8:1-14

B. මෝර්දෙකයිට ගරු සම්මාන ලැබීම 8:15-17

C. ජුදෙව්වන්ගේ මිදීම 9:1-11

D. හාමාන්ගේ නිවැසියන් විනාශ කිරීම 9:12-14

E. පුරිම්හි මංගල්‍යය 9:15-32

F. මෝර්දෙකයි මඟින් නියෝජනය කරනු ලැබීම 10:1-3

## ස්වයං පරීක්ෂණය

1. එස්තර් පොතේ කතුවරයා කවුරුන්ද?

2. එස්තර් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. එස්තර් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. එස්තර් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. එස්තර් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉංග්‍රිසි බයිබලයේ දිගම පදය ලෙස සැලකෙන්නේ එස්තර් 8:9 වේ. එහි වචන 90 ක් ඇත.

2. රූත් හා එස්තර් පොත් අතර වෙනස්කම් බලන්න.
   - රූත්, ජුදෙව්වන් අතර ජීවත්වූ අන්‍ය ජාතිකයෙකි.
   - එස්තර්, අන්‍ය ජාතිකයන් අතර ජීවත් වූ ජුදෙව්වෙකි.
   - රූත් ජුදෙව්වෙකු හා විවාහ වූවාය.
   - එස්තර් අන්‍ය ජාතිකයෙකු හා විවාහ වූවාය.

කතාන්දර දෙකෙහිම ප්‍රතිඵල තීරණය වූයේ මධ්‍යම රාත්‍රියේ පැවැත්වූ රැස්වීමකිනි.

- රූත් බෝවස් සමඟ කතා කළාය රූත් 3:8-13
- හාමාන් රජු සමඟ කතා කළේය එස්තර් 6:1-10

3. සාතන්ට සමාන කෙනෙකු ලෙස හාමාන්ව අධ්‍යයනය කරන්න.
   - සියලු අධිපතීන්ට වඩා උසස්ය 3:5
   - කෝපයෙන් පිරී සිටියේය 3:6
   - අවඥාවෙන් පූර්ණ කෙනෙකි 3:6
   - විනාශ කරන්නෙකි 3:6
   - සතුරෙකි 3:10
   - භෞතිකවාදියෙකි 3:8,9,11; 4:7
   - වික්ෂිප්ත වෙයි 3:15
   - ගොදුරක් සේ බදා ගනී 3:13
   - බේරෙන්නේ නැත 4:13
   - කෝපවන මිනිසෙකි 5:9
   - උඩගුය 5:11-12; 6: 6-9
   - නොවැදගත්ය 5:13; 6:12;
   - කුමන්ත්‍රණකාරයෙකි 3:1-15; 5:14; 6:4
   - විරුද්ධකාරයෙකි. සතුරෙකි 7:6
   - දුරාචාරයේ යෙදෙන්නෙකි 7:8
   - නපුරු උපක්‍රම යොදන්නෙකි 9:25
   - රජු ඉදිරියේ බිය වෙයි 7:6
   - දෙවියන්වහන්සේගේ සෙනඟ අභිමුවෙහි පිරිහෙයි 6:13

# කාව්‍යමය පොත් සඳහා හැඳින්වීමක්

කාව්‍යමය පොත් පහ ආත්මික ජීවිතයේ ප්‍රගමණයක් පෙන්නුම් කරයි

**ජෝබ් :** පැරණි ස්වයං ජීවිතය කෙරෙහි මරණය විස්තර කරයි

**ගීතාවලිය :** ප්‍රශංසාව, යාච්ඤාව, ප්‍රේමය, යැදීම, පාපොච්චාරණය හා මැදිහත් වීම යන්න පැහැදිලි කරමින් දෙවියන්වහන්සේ තුළ අලුත් ජීවිතය පෙන්නුම් කරයි. ගීතාවලිය යනු බයිබලයේ ගීතිකා පොත හා නමස්කාර අත්පොත වේ.

**හිතෝපදේශ :** මෙලොව ජීවිතය කෙරෙහි ස්වර්ගික එහෙත් ප්‍රායෝගික ප්‍රඥාව දෙයි.

**ධර්මදේශකයා :** දෙවියන්වහන්සේගෙන් වෙන්ව “මේ මිනිස් ලොවෙහි” ජීවිතය නිස්සාර බව පවසයි.

**ප්‍රේම ගී හෙවත් සලමොන්ගේ ගී :** ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඇති පෞද්ගලික සම්බන්ධතාව තුළින් තිබෙන අර්ථවත් ජීවිතය සඳහා නිදසුනක් සපයයි. බයිබලීය කාව්‍ය අනෙකුත් බොහෝ කාව්‍යයන්ට වඩා වෙනස් වේ. මන්ද එය ලියා ඇත්තේ හෙබ්‍රෙව් කාව්‍යමය ව්‍යුහයකින් බැවිනි. මේ ව්‍යුහය අවබෝධ කරගැනීම සඳහා මාර්ගයක් “හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ” - “නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම” නැමති පාඨමාලාවේ දී ඇත.

# දහනම වන පරිච්ඡේදය

## ජෝබ්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ජෝබ් පොතේ කතුවරයා නම් කිරීමට
- ජෝබ් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ජෝබ් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ජෝබ් පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- ජෝබ් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** නොදනී

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** සුවිශේෂී කිසිවෙකුට ලියා නැත. එහෙත් දුක්විඳීම අත්දකින සියලු ඇදහිලිවතුන්ට අදාළ වේ.

**පරමාර්ථය :** "ධර්මිෂ්ඨ අය දුක්විඳින්නේ මන්ද?" යන ප්‍රශ්නය සමඟ මෙම පොත ගනුදෙනු කරයි.

**ප්‍රධාන පද :** ජෝබ් 19:25-27; 23:10

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ධර්මිෂ්ඨ අය දුක්විඳීම පසුපස ආත්මික හේතුවක් ඇත. දුක් විඳීම දෙවියන්වහන්සේ අසතුට ප්‍රකාශ කිරීමක්ම නොවේ.

**ප්‍රධාන චරිත :** දෙවියන්වහන්සේ, සාතන්, ජෝබ්, ජෝබ්ගේ බිරිඳ හා මිතුරෝ, එලිපස්, බිල්දද්, ශෝපර්, එලිහු

### සැකිල්ල

1. පූර්ව කථනය 1:1 - 2:13
   A. හැඳින්වීම 1:1-5
   B. සාතන්ගේ පළමු පෙනී සිටීම හා චෝදනාව 1:6-12
   C. ජෝබ්ගේ පරීක්ෂාවන් 1:13-22
   D. සාතන්ගේ දෙවැනි පෙනී සිටීම හා චෝදනාව 2:1-6
   E. ජෝබ්ගේ පරීක්ෂාවන් 2:7-13

11. පළමු කතාවන් වටය 3:1-14:22
   A. ජෝබ්ගේ කතාව 3:1-26
   B. එලිපස්ගේ කතාව 4:1 - 5:27
   C. ජෝබ්ගේ පිළිතුර 6:1-7:21
   D. බිල්දද්ගේ කතාව 8:1-22
   E. ජෝබ්ගේ පිළිතුර 9:1-10:22

F. ශෝපර්ගේ කතාව 11:1-20
G. ජෝබ්ගේ පිළිතුර 12:1-14:22

111. දෙවන කතා වටය 15:1 - 21:34
A. එලිපස්ගේ කතාව 15:1-35
B. ජෝබ්ගේ පිළිතුර 16:1-17:16
C. බිල්දද්ගේ කතාව 18:1-21
D. ජෝබ්ගේ පිළිතුර 19:1-29
E. ශෝපර්ගේ කතාව 20:1-29
F. ජෝබ්ගේ පිළිතුර 21:1-34

1V. තෙවන කතා වටය 32:1-37
A. එලිපස්ගේ අවසාන කතාව 22:1-30
B. ජෝබ්ගේ පිළිතුර 23:1-24:25
C. බිල්දද්ගේ අවසාන කතාව 25:1-6
D. ජෝබ්ගේ පිළිතුර 26:1-31:40

V. එලිහුගේ කතාව 32:1-37:24
A. පළමු කතාව 32:1 - 33:33
B. දෙවන කතාව 34:1-37
C. තෙවන කතාව 35:1-16
D. සිව්වන කතාව 36:1-37:24

V1. දෙවියන්වහන්සේගේ පිළිතුර 38:1-42:6
A. පළමු කතාව 38:1 - 40:5
1. මැවීමේ ක්ෂේත්‍රය ගැන දෙවියන්වහන්සේ ජෝබ්ගෙන් ප්‍රශ්න කරයි 38:1-38
2. සත්වයින් ගැන දෙවියන්වහන්සේ ජෝබ්ගෙන් ප්‍රශ්න කරයි 38:39-39:30
3. දෙවියන්වහන්සේ තම ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස ජෝබ්ට බල කරයි 40:1-2
4. ජෝබ් දෙවියන්වහන්සේට දුන් පළමු පිළිතුර 40:3-5
B. දෙවන කතාව 40:6 - 42:6
1. ජෝබ්ට තමාවම ගළවා ගන්නා ලෙස දෙවියන්වහන්සේ පවසයි 40:6-14
2. දෙවියන්වහන්සේ ජෝබ්ගේ බලය බෙහෙමොත් සමඟ සසඳයි 40:15-24
3. දෙවියන්වහන්සේ ජෝබ්ගේ බලය ලෙවියාතන් සමඟ සසඳයි 41:1-34
4. ජෝබ් දෙවියන්වහන්සේට දුන් දෙවන පිළිතුර 42:1-6
a. අවබෝධ නොමැතිවීම ගැන ඔහු පාපොච්චාරණය කරයි 42:1-3
b. තම කැරලි ගැසීම ගැන ඔහු පසුතැවෙයි 42:4-6

V11. පසු වදන 42:1-17
A. ජෝබ්ගේ මිතුරන් තිදෙනා ලද දිව්‍යමය තරවටුව 42:1-9
B. ජෝබ්ගේ ප්‍රතිසංස්කරණය 42:10-17

## ස්වයං පරීක්ෂණය

1. ජෝබ් පොතේ කතුවරයා කවුරුන්ද?

2. ජෝබ් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ජෝබ් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ජෝබ් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ජෝබ් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ජෝබ් පොතේ කතාකරන සෑම චරිතයකම නම් ලයිස්තු ගත කරන්න. සෑම කෙනෙක්ම ඉදිරිපත් කළ අදහස් සාරාංශ කරන්න. දුක් විඳීමේ ගැටලුව සඳහා විසඳුම් ජෝබ්ගේ මිතුරන් විසින් විවිධ පැති කඩ වලින් පෙන්නුම් කරති. ජෝබ් පව් කර ඇති බවට ඔව්හු සියලු දෙනාම එකඟ වෙති.

   එලිපස් ගැටලුව දෙස බලන්නේ දර්ශනවාදී දැක්මකිනි.
   බිල්දද් තම උපදෙස් පදනම් කරන්නේ ඉතිහාසයේ මුල් බැස ඇති සම්ප්‍රදාය අනුවය.
   ශෝපර් තම අදහස් පදනම් කරන්නේ උපකල්පනයන් මත වන අතර එය සදාචාරාත්මක සාරධාර්මික හඬක් වේ.

   එලිහු බුද්ධිමතෙකු වන අතර ඔහු ඔහුගේ උපදෙස් අධ්‍යාපනය හා තර්කය මත පදනම් කරයි.

2. ජෝබ් 1:21 හා පිලිප්පි 4:11-12 සංසන්දනය කරන්න.

3. මිනිසාට පෙර ලෝක ඉතිහාසය ගැන අති දීර්ඝ විස්තරයක් ජෝබ් පොත සපයයි 38-39 පරිච්ඡේද බලන්න. පොළොව පිලිබඳ අනෙකුත් ප්‍රකාශවලින් හෙළි වන්නේ එය අවකාශයේ එල්ලා තබා ඇති බවය (26:7). එමෙන්ම එය ගෝලාකාර බවය ( 22:14).

4. ජෝබ්ගේ පොත වැදගත් සත්‍යයන් දෙකක් එළිදරව් කරයි.
   පළමුවැන්න, ධර්මිෂ්ඨයන්ගේ දුක්විඳීමට ආත්මික හේතුවක් ඇති බව වේ.
   ජෝබ් 1:6-12; 2:1-6
   දෙවැන්න, දෙවියන්වහන්සේගේ අවසරය නොමැතිව සාතන්ට, ඇදහිලිවන්තයෙකුට පීඩා කළ නොහැකිය. ජෝබ් 1:6-12; 2:1-6 අපට දැරිය හැකි ප්‍රමාණය දෙවියන්වහන්සේ දන්නා අතර ඊට ඔබ්බට යාමට සාතන්ට ඉඩ නොදෙන සේක
   (1 කොරින්ති 10:13).

5. ජෝබ්ගේ දුක්විඳීමට හේතු කීපයක් මෙම පොත එළිදරව් කරයි.
   - සාතන්ව නිශ්ශබ්ද කිරීම සඳහා 1:9-11; 2:4,5
   - ජෝබ්ට, ඔහු සැබවින්ම සිටි ආකාරය ඔහුටම දැකගත හැකි වීම පිණිස 40:4; 42:6
   - ජෝබ් දෙවියන්වහන්සේව දකින පිණිස 42:5
   - ජෝබ්ගේ මිතුරන් විනිශ්චය නොකිරීමට ඉගෙන ගන්නා පිණිස 42:7
   - ජෝබ්, තමා විවේචනය කරනවුන්ට විරුද්ධව වාචිකව ඇනුම් පද නොකියා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමට ඉගෙනගන්නා පිණිස 42:10
   - තම දරුවන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලැස්ම වන්නේ අවසානයේ ප්‍රීතිය ගෙනදීම බව පෙන්වීමට 42:10

# විසි වන පරිච්ඡේදය

## ගීතාවලිය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ගීතාවලිය පොතේ කතුවරයා නම් කිරීමට
- ගීතාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ගීතාවලිය පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ගීතාවලිය පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- ගීතාවලිය පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පහත ඒවා හැර අනෙක් සියලුම ගීත දාවිත් රජතුමා විසින් ලියා ඇත.

- ආසප් 50, 73-83
- හේමාන් 88
- ඒතාන් 89
- සලමොන් 127
- මෝසෙස් 90
- හෙසකියා 120, 121, 123,125,126, 128-130, 132, 134
- නොදන්නා කතුවරුන් 1, 10, 33, 43, 66, 67, 71, 91-94, 96-100, 102, 104, 106, 107, 111-119, 135,136, 137, 146-150

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට, එහෙත් යාච්ඤාවන්, ප්‍රශංසාවන් ආදිය සඳහා ඇදහිලිවතුන් මේවා දිගටම භාවිත කර ඇත.

**පරමාර්ථය :** ගීතාවලිය පොත ඉශ්‍රායෙල්වරුන්ගේ ගීතිකා පොත ලෙස හැඳින්වේ. ගීතාවලිය යන්නෙන් අදහස් වන්නේ “තත් සහිත සංගීත භාණ්ඩයන් සමඟ ගැයෙන ගී“ යන්න වේ. එය බයිබලයේ නමස්කාර හා යාච්ඤා පොත වේ.

**ප්‍රධාන පදය :** ගීතාවලිය 95:1

**ජීවන හා දේව සේවා මූලධර්මය :** යාච්ඤාව, ප්‍රශංසා කිරීම, මැදිහත් යාච්ඤා හා පසුතැවීම. මේවා සැබෑ නමස්කාරයේ කොටස් වේ.

**ප්‍රධාන චරිත :** ගීතාවලියේ බොහෝ අය ගැන සඳහන් වේ. එය ගීතය තුළ හෝ මාතෘකාවේ විය හැකිය.

- අබිමෙලෙක් (ආඛීෂ්) (1 සාමුවෙල් 21:10-15)
- අබ්සලොම් (2 සාමුවෙල් 13)
- අහිමෙලෙක් (1 සාමුවෙල් 22:9-19)
- අරම් නහරයිම් : වයඹ මෙසපොතේමියාවේ අරාමියයන්
- අරම්- ශෝබා, මධ්‍ය සිරියාවේ ආරාමියයන්
- ආසප්, ගී ගයන ලෙවී පවුලක් (2 වංශාවලිය 5:12)
- බැත්- ෂෙබා (2 සාමුවෙල් 11)
- බෙන්ජමින්වරයෙකු වූ කුෂ් (ෂිමෙල්) (2 සාමුවෙල් 16:5-14)

- ඒදොමිය දෙවෙගේ (1 සාමුවෙල් 22:9-23)
- එශ්‍රාහිය ඒතාන් (සාලමොන්ගේ කාලයේ නුවණැති මනුෂ්‍යයෙක්) : (1 රාජාවලිය 4:31)
- එශ්‍රාහිය හේමාන් (ලෙවීවරුන්ගේ පවුලේ ගායකයෝ) (2 වංශාවලිය 5:12)
- යෙදුතුන් (දේව මාලිගාවේ ප්‍රධාන වාදකයා) (1 වංශාවලිය 16:41-42)
- කෝරා (ලෙවීවයෙකි. දේවමාලිගාවේ තූර්යවාදක කණ්ඩායමේ නායකයා) (1 වංශාවලිය 6:22)
- නාතාන් (දෙවියන්වහන්සේගේ දිවැසිවරයා) (2 සාමුවෙල් 12:1-14)
- කෝරාගේ පුත්‍රයෝ (ලෙවී සංගීත පවුලක්) (1 වංශාවලිය 6:22)
- ශිප් වැසියෝ (1 සාමුවෙල් 23:19)

## සැකිල්ල

ගීතාවලියේ එක් එක් පරිච්ඡේද විවිධ විෂයයන් කෙරෙහි අවධානය යොමු කරන බැවි ඊට සැකිල්ලක් දීම අසීරු වේ. බොහෝ ගීතවලට මාතෘකාවන් දී ඇති අතර ඒවායින් එම ගීතය ලියූ අවස්ථාව හෝ ලිවීමේ පරමාර්ථය හෝ අපට පෙනේ. ඇතැම් ගීතවලට මාතෘකාවක් නොමැත. එබැවින් ඒවා ලියන ලද්දේ කවුරුන්ද හා කවදාද යන්න අප අනුමාන වශයෙන් සිතා බැලිය හැකිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම"* යන පාඨමාලාව, ගීතාවලියේ සෑම පරිච්ඡේදයකටම සැකිල්ලක් සපයන අයුරු දක්වයි. මෙම පොතේ සාමාන්‍ය සැකිල්ලෙහි ප්‍රධාන බෙදීම් පහක් අන්තර්ගත වේ.

**පළමුවන කොටස : ගීතාවලිය 1-41**

| | |
|---|---|
| ගීත සංඛ්‍යාව | 41 |
| අන්තර්ගතයේ සාරාංශය : | මිනිසා, ඔහුගේ ආශිර්වාද, වැටීම හා ප්‍රකෘතිමත් වීම ගැන වේ. |
| ප්‍රධාන වචනය : | මිනිසා |
| අවසාන ප්‍රශංසා ගායනාව : | 41:13 |

**දෙවන කොටස : ගීතාවලිය 42-72**

| | |
|---|---|
| ගීත සංඛ්‍යාව: | 31 |
| අන්තර්ගතයේ සාරාංශය : | ඉශ්‍රායෙලය, ඇගේ විනාශය, ඇගේ මිදීම |
| ප්‍රධාන වචනය : | මුදාගැනීම |
| අවසාන ප්‍රශංසා ගායනාව : | 42:18-19 |

**තෙවන කොටස : ගීතාවලිය 73-89**

| | |
|---|---|
| ගීත සංඛ්‍යාව: | 17 |
| අන්තර්ගතයේ සාරාංශය : | සිද්ධස්ථානය, එය පිහිටුවීමේ බලාපොරොත්තුව |
| ප්‍රධාන වචනය : | සිද්ධස්ථානය |
| අවසාන ප්‍රශංසා ගායනාව : | 89:52 |

**සිව්වන කොටස : ගීතාවලිය 90-106**

| | |
|---|---|
| ගීත සංඛ්‍යාව: | 17 |
| අන්තර්ගතයේ සාරාංශය : | පෘථිවිය : අවශ්‍ය, බලාපොරොත්තු වූ හා භුක්ති විඳි ආශිර්වාද |
| ප්‍රධාන වචනය : | අසහනය, සරිසැරීම (වර්තමාන ලෝකයේ ඇදහිලිවන්තයෙකුගේ තත්වය ඉන් විස්තර කෙරේ) |
| අවසාන ප්‍රශංසා ගායනාව : | 106:48 |

**පස්වන කොටස : ගීතාවලිය 107-150**

| | |
|---|---|
| ගීත සංඛ්‍යාව: | 44 |
| අන්තර්ගතයේ සාරාංශය : | දේව වචනය |
| ප්‍රධාන වචනය : | දේව වචනය |
| අවසාන ප්‍රශංසා ගායනාව : | 150:6 |

## ස්වයං පරීක්ෂණය

1. ගීතාවලිය පොතේ කතුවරයා කවුරුන්ද?

2. ගීතාවලිය පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ගීතාවලිය පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ගීතාවලිය පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ගීතාවලිය පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

**ගීතාවලියේ සඳහන් සංගීත භාණ්ඩ**

- ආලමොත් : උස් ස්වර ඇති විණාව
- පිටිත් : නූතන කාලයේ ගිටාර් එකකට සමාන වේ
- මහලත්: බටනලා
- මහලත් ලෙන්නොත් : කනගාටුදායක අවස්ථාවල භාවිත කරන විශේෂ බටනලා වර්ගයකි.
- ෂෙමිනිත් : තත් පහකින් යුත් වීනාවකි

## ගීතවර්ග

උපදෙස් සපයන ගීත: මාතෘකාවේ “අනුශාසනාව” යන වචනයෙහි තේරුම මේ ගීත හා අනෙකුත් ගීත උපදෙස් දීමට හෝ ඉගැන්වීමට භාවිත කිරීම සඳහාය යන්නය. (ගීතාවලිය 32,44, 52 හා 78 උදාහරණ වේ)

නැමදීමේ ගීත : මෙම ගීතවල තේමාව වන්නේ, දෙවියන්වහන්සේගේ මහිමය, දයාව, ප්‍රේමය හා බලය වේ. (ගීතාවලිය 8,29 බලන්න).

ඓතිහාසික ගීත : ඉශ්රායෙල් දේශයේ ඓතිහාසික සිදුවීම් මේවායින් මතක් කෙරේ. (ගීතාවලිය 78,105 හා 106 බලන්න)

යැදීමේ ගීත : දෙවියන්වහන්සේගෙන් කෙරෙන ඉල්ලීම් (ගීතාවලිය 86 මීට නිදසුනකි)

ස්තුති දීමේ ගීත : ගීතාවලිය 18 මීට නිදසුනකි.

පළිගැනීමේ ගීත : “පළිගැනීම” යන්නෙහි තේරුම සාපකිරීම වේ. මේවා පුද්ගලික පළිගැනීම සඳහා නොවේ. එමෙන්ම නරක වචන භාවිත කර නැත. දෙවියන්වහන්සේගේ දිවැසිවරයෙකු වශයෙන් ලේඛකයා පාපයට හා දෙවියන්වහන්සේගේ සතුරන්ට විරුද්ධව කතා කරයි. (ගීතාවලිය 35, 55, 58, 59, 69, 83, 109, 137 හා 140 මේ සඳහා නිදසුන් වේ).

පශ්චාතාපවීමේ ගීත : 6,32,38,51,102,130 හා 143 මේ සඳහා නිදසුන් වේ.

මෙසායනික ගීත : මේ ගීත හෝ ඒවායින් කොටසක්, මෙසියස්වහන්සේගේ, එනම් ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම හා සම්බන්ධ අනාවැකි පවසයි.

**ගීතාවලිය පොතේ ඇති ජේසුස්වහන්සේ පිළිබඳ අනාවැකි**

| ගීතාවලිය | නව ගිවිසුමේ සම්පූර්ණ වීම |
|---|---|
| 8:3-8 | හෙබ්‍රෙව් 2:5-10, 1 කොරින්ති 15:27 |
| 72:6-17 | මෙය අනාගතයේදී සම්පූර්ණවනු ඇත |
| 89:3-4,26,28-29,34-37 | ක්‍රියා 2:30 |
| 109:6-19 | ක්‍රියා 1:16-20 |
| 132:12 | ක්‍රියා 2:30 |
| 45:6-7 | හෙබ්‍රෙව් 1:8-9 |
| 102:25-27 | හෙබ්‍රෙව් 1:10-12 |
| 110:1-7 | මතෙව් 22:43-45; ක්‍රියා 2:33-35 |
| | හෙබ්‍රෙව් 1:13; 5:6-10; 6:20; 7-24 |
| 2:1-12 | ක්‍රියා 4:25-28; 13:33 හෙබ්‍රෙව් 1:5; 5:5 |
| 16:10 | ක්‍රියා 2:24-31; 13:35-37 |
| 22:1-31 | මතෙව් 27:35-46; ජොහන් 19:23-25 |
| | හෙබ්‍රෙව් 2:12 |
| 40:6-8 | හෙබ්‍රෙව් 10:5-10 |
| 69:25 | ක්‍රියා 1:16-20 |

# විසි එක් වන පරිච්ඡේදය

## හිතෝපදේශය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- හිතෝපදේශ පොතේ කතුවරයා නම් කිරීමට
- හිතෝපදේශ පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- හිතෝපදේශ පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- හිතෝපදේශ පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- හිතෝපදේශ පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** සලමොන් වේ. ඔහු දාවිත් රජුගේ පුත්‍රයා වන අතර හිතෝපදේශ බොහොමයක් ලියා ඇත්තේ ඔහු විසිනි. සලමොන් දෙවියන්වහන්සේගේ ආභාසය යටතේ හිතෝපදේශ තුන් දහසක් පැවසූ බව 1 රාජාවලිය 4:32 හි සඳහන් වේ. මේවායින් සමහරක් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අප උදෙසා හිතෝපදේශ පොතේ සුරක්ෂිත කර ඇත. හිතෝපදේශ පොතේ පරිච්ජේද දෙකක් ලියා ඇත්තේ වෙනත් නම් ඇති කතුවරුන් දෙදෙනකු විසිනි. ආගුර් 30 පරිච්ජේදයද, ලෙමුවෙල් 31 පරිච්ජේදයද ලියා ඇත. සමහර හිතෝපදේශ සලමොන් විසින්ම අනු පිළිවෙළට සකස් කර ඇත. මින් අදහස් වන්නේ ඔහු ඒවා ලිවීමට අමතරව බයිබලයේ ඒවා ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලද සැකසූ බවය. සලමොන්ගේ අනෙකුත් හිතෝපදේශ අනුපිළිවෙළට තබා ඇත්තේ හෙසකියා රජුගේ මිනිසුන් විසිනි.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග**: ඉශ්රායෙල් සෙනඟ සඳහා වුවද, ප්‍රායෝගික ජීවිතය සඳහා වූ සත්‍යයන් සියලු ඇදහිලිවතුන්ට අදාළ වේ.

**පරමාර්ථය :** මෙම පොතේ පරමාර්ථය 1:1-6 දී ඇත. එය කියවන්න. හිතෝපදේශ සඳහා හැඳින්වීමක් ධර්ම දේශක 12:8-14 හි දී ඇත. මෙම කොටසද කියවන්න.

**ප්‍රධාන පදය :** හිතෝපදේශ 3:13

**ජීවන හා දේව සේවා මූලධර්මය :** තිරස් ජීවිතය සඳහා ඉහළින් ලැබෙන ප්‍රඥාව අවශ්‍යය. හිතෝපදේශ යනු දෙවියන්වහන්සේ මිනිසාට දී ඇති ප්‍රඥාවන්ත මූලධර්මවල එකතුවකි (ඉහළින් ලැබෙන, සිරස්) ඒ, අන් අය සමඟ ජීවත්වීම සඳහාය (තිරස්).

**ප්‍රධාන චරිත :** කතෘවරුන්, සලමොන්, ලෙමුවෙල් රජු, ආගුර්, දෙවියන්වහන්සේ නොමැති ස්ත්‍රිය "අනාචාරී ස්ත්‍රිය" ලෙස හැඳින්වේ. හිතෝපදේශ අවසාන පරිච්ජේදයෙන්, ඇයට වඩා වෙනස් ස්ත්‍රියක ඉදිරිපත් කරයි. ඇය දෙවියන්වහන්සේව දන්නා "ගුණවන්ත ස්ත්‍රියක" ලෙස විස්තර කර ඇත.

## සැකිල්ල

"හිතෝපදේශ" යන වචනයෙන් අදහස් වන්නේ "වචන රාශියක් වෙනුවට යොදන කෙටි කියමනක්" යන්න වේ. හිතෝපදේශයෙහි සෑම පදයක්ම වැදගත් සත්‍යයක ලුහුඬු සාරාංශයකි. හිතෝපදේශ පොතේ සෑම පරිච්ඡේදයක්ම හා ඇතැම් විට පරිච්ඡේදයක් තුළ ඇති සෑම පදයක්ම එකිනෙකට වෙනස් විෂයයක් ගැන බැවින් පොදු සැකිල්ලක් දීම අසීරු වේ. මෙම කෙටි කියමන් හෙවත් "හිතෝපදේශ" ලිවීමට හේතුව වනුයේ, ප්‍රඥාව සාරාංශයක් ලෙස ඉදිරිපත් කිරීමෙන් ආත්මික සත්‍යයන් අපට වඩාත් හොඳින් මතක තබා ගැනීමට උපකාර කිරීම වේ. හිතෝපදේශ යනු ශ්‍රේෂ්ඨ ආත්මික සත්‍යයන්ගේ ලුහුඬු සාරාංශයකි. මෙම පොතේ සාමාන්‍ය සැකිල්ලක් පහත දැක්වේ.

1. හැඳින්වීම 1:1-6

11. ප්‍රඥාව පිළිබඳ පාඩම් 1:7-9:18
    A. ප්‍රඥාවේ කැඳවීම 1:7-33
    B. ප්‍රඥාවේ ප්‍රතිලාභ 2:1-7:27
    C. දිව්‍යමය ප්‍රඥාව ගැන ප්‍රශංසා කිරීම 8:1-9:18

111. සලමොන් විසින්ම අනුපිළිවෙළට සැකසූ නානාවිධ හිතෝපදේශ 10:1-22:16
    (මෙම පරිච්ඡේදයේ සිට 25 පරිච්ඡේදය දක්වා කිතුනු ගුණ යහපත්කම් හා ඊට ප්‍රතිවිරුද්ධ පාපී ආකල්ප හා ප්‍රතිචාර ගැන විවිධ නිරීක්ෂණ ඇත).

1V. ප්‍රඥාවන්තයන්ගේ හිතෝපදේශවල එකතුවක් 22:17-24:34

V. හෙසකියාගේ ලේඛකයන් විසින් අනුපිළිවෙළට සැකසූ සලමොන්ගේ හිතෝපදේශ 25:1-29:27.
    A. රජවරුන්, පිළිබඳ නිරීක්ෂණ, අඬ-දබර හා අන් අය සමඟ සබඳතා 25:1-28
    B. මෝඩයන්, අලසයන් හා ඕපාදූපකාරයන් පිළිබඳ අදහස් 26:1-28
    C. ස්වයං-ප්‍රේමය, සැබෑ ප්‍රේමය: අමනාපකම්: ගෙදර දොර රැකබලා ගැනීම ගැන සිතිවිලි 27:1-27
    D. නපුරන් හා ධර්මිෂ්ඨයන් අතර වෙනස 28:1-28
    E. ප්‍රසිද්ධ, රජයේ හා පෞද්ගලික දේ ගැන හිතෝපදේශ 29:1-27

V1. ආගුර්ගේ හිතෝපදේශයකි: පාපොච්චාරණය හා උපදෙස් 30:1-33

V11. ලෙමුවෙල්ගේ හිතෝපදේශයකි. පිරිසිදුභාවය හා මත්පැනින් වැළකීම ගැන පාඩමක්: යහපත් බිරිඳක් ගැන ප්‍රශංසාව: 31:1-31.

## ස්වයං පරීක්ෂණය

1. හිතෝපදේශ පොතේ කතුවරයා කවුරුන්ද?

2. හිතෝපදේශ පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. හිතෝපදේශ පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. හිතෝපදේශ පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. හිතෝපදේශ පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. හිතෝපදේශ පොතේ අධ්‍යයනය කළ යුතු ප්‍රධාන වචන අතර මේවාද වේ.
   - ප්‍රඥාව,
   - දැනුම,
   - උපදෙස්,
   - මෝඩකම,
   - බිය, ස්වාමීන්ට දක්වන බිය.
   - ජීවිතය,
   - නීතිය(ආඥා),
   - ධර්මිෂ්ඨ/දුෂ්ට/විනිශ්චය
   - මාගේ පුත්‍රය

2. හිතෝපදේශ පොතේ සඳහන් කර ඇති පහත දැක්වෙන කාණ්ඩ අධ්‍යයනය කරන්න.
   - දෙවියන්වහන්සේට නුරුස්සන කරුණු හත 6:16-19
   - කතෘ දෙවියන්වහන්සේගෙන් කරන ඉල්ලීම් දෙක 30:7-9
   - තෘප්තිමත් නොවන කරුණු හතරක් 30:15-16
   - මහ පොළවට ඉසිලිය නොහැකි කරුණු හතරක් 30:21-23
   - විස්මයජනක කරුණු හතරක් 30:18-19
   - කුඩා එහෙත් ප්‍රඥාවන්ත දෑ හතරක් 30:24-28
   - අභිමානවත් පාලකයන් හතර දෙනෙක් 30:29-31

3. හිතෝපදේශවල සඳහන් කර ඇති විවිධ මෝඩයන් අධ්‍යයනය කරන්න.
   - සරල මෝඩයා 1:4, 22: 7:7; 21:11
   - තද මෝඩයා 1:7; 10:23; 12:23; 17:10; 20:3; 27:22
   - උද්ධච්ච මෝඩයා 3:34; 21:24; 22:10; 29:8
   - කෲර මෝඩයා 17:21; 26:3; 30:22

4. පහත දැක්වෙන විෂයයන් ගැන හිතෝපදේශ පොත උගන්වන දෙය සඳහන් කරන්න.
   - යහපත් නමක් - ආත්ම දමනය, ස්වාමිවරුන්/සේවකයන්
   - තරුණයන් හා විනය, - සැර මත්පැන්, කෝපය/කලහය
   - ව්‍යාපාර කටයුතු - මිත්‍රත්වය -දුප්පත්/පොහොසත්, දුප්පත්කම/ධනය
   - විවාහය - වචන/දිව, - ස්ත්‍රීන්,
   - දුරාචාරය, - ප්‍රඥාව හා අඥානකම - පීඩාවන්
   - දුෂ්ට සහකාරයන් අලසකම/වැඩ, - පරිභව කරන්නන්
   - ප්‍රඥාව - උඩඟුකම/නිහතමානී

# විසි දෙවන පරිච්ඡේදය

## ධර්මදේශකයා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ධර්මදේශකයා පොතේ කතුවරයා නම් කිරීමට
- ධර්මදේශකයා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ධර්මදේශකයා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ධර්මදේශකයා පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- ධර්මදේශකයා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** සලමොන් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට හා පොදුවේ ඇදහිලිවතුන්ට වන අතර තරුණ අයට විශේෂ අවධානයක් දී ඇත.

**පරමාර්ථය :** දෙවියන්වහන්සේගෙන් වෙන්වූ ජීවිතයක ගවේශනය ගැන විස්තරයක්.

**ප්‍රධාන පදය :** ධර්මදේශකයා 12:13.

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේගෙන් වෙන්වූ ජීවිතයකින් පලක් නැත.

**ප්‍රධාන චරිත :** සලමොන්, වෙන කිසිදු චරිතයක් නමින් සඳහන් කර නැත.

### සැකිල්ල

1. පෞද්ගලික පරීක්ෂණ මඟින් සෙවීම 1:1-2:26
   A. ප්‍රඥාව මඟින් 1:12-18
   B. සැප සම්පත් මඟින් 2:1-11
   C. මේ දෙක සංසන්දනය කිරීම 2:12-23
   D. පළමු තාවකාලික නිගමනය 2:24-26

11. සාමාන්‍ය නිරීක්ෂණ මඟින් සෙවීම 3:1-5:20
   A. ස්වාභාවික පිළිවෙළ 3:1-22
   B. මිනිස් සමාජය 4:1-16
   C. මේ දෙක පිළිබඳ ඔහුගේ උපදේශය 5:1-17
      1. ආගම පිළිබඳව 5:1-7
      2. සමාජය පිළිබඳව 5:8
      3. වස්තුව පිළිබඳව 5:9-17
   C. දෙවැනි තාවකාලික නිගමනය 5:18-20

111. පෞද්ගලික සදාචාරය තුළින් සෙවීම 6:1-8:17

A. ආර්ථික මට්ටම 6:1-12
B. කීර්තිය 7:1-22
C. අධ්‍යාපනය 7:23-8:1
D. සමාජ තත්වය 8:2-14
E. තෙවැනි තාවකාලික නිගමනය 8:15-17

1V. සෙවීම ගැන නැවත සිතා බැලීම 9:1-12:12
දෙවියන්වහන්සේගෙන් වෙන්වූ ජිවිතයක් පිළිබඳව සලමොන් පහත දැක්වෙන නිගමනවලට එළඹෙයි. (යොමුවලින් දැක්වෙන්නේ මේ කරුණු පිළිබඳව ඔහුගේ සාකච්ජාවන් වේ)

A. එය මුළුමනින්ම නිරර්ථකය 2:11
B. එය නැවත නැවත සදහන් කිරීමෙන් යුක්තය 3:1-8
C. එය කනගාටුවෙන් පිරී ඇත 4:1
D. එය වේදනා සහිතය, බලාපොරොත්තු රහිතය 2:17
E. එය අස්ථිරය 9:11-12
F. එහි පරමාර්ථයක් නැත 4:2,3; 8:15
G. එය සුවකළ නොහැකිය 1:15
H. එය අසාධාරණය 7:15; 8:14; 9:11; 10:6-7
I. එය සත්වයින්ගේ පැවැත්මේ මට්ටමෙහි වේ 3:19

V. සෙවීම සමාප්තයි: අවසාන නිගමනය 12:13-14
A. අප කළ යුතු දෙය 12:13
   1. දෙවියන්වහන්සේට ගරුබිය දක්වන්න 12:13
   2. උන්වහන්සේගේ ආඥා පිළිපදින්න 12:13
B. අප එසේ කළ යුත්තේ මන්ද? 12:13b-14
   1. එය මනුෂ්‍යයාගේ පරම යුතුකම වේ 12:13b
   2. කෙදිනක හෝ අපව විනිශ්චය කරනු ඇත 12:14

## ස්වයං පරීක්ෂණය

1. ධර්මදේශකයා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ධර්මදේශකයා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ධර්මදේශකයා පොත ලියන ලද්දේ කවුරුන්ද?

4. ධර්මදේශකයා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ධර්මදේශකයා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නිෂ්ඵලකම් දහය අධ්‍යයනය කරන්න.
   - මනුෂ්‍ය ප්‍රඥාව 2:15-16
   - මනුෂ්‍ය ශ්‍රමය 2:19-21
   - මනුෂ්‍ය පරමාර්ථය 2:26
   - මනුෂ්‍ය තරඟය 4:4
   - මනුෂ්‍ය දැනුවත් බව 4:7
   - මනුෂ්‍ය කීර්තිය 4:16
   - මනුෂ්‍ය අසතුටු බව 5:10
   - මනුෂ්‍ය ආශාවන් 6:9
   - මනුෂ්‍ය නිසරු හැසිරීම 7:6
   - මනුෂ්‍යයාට විපාක දෙන ක්‍රම 8:10,14

2. ධර්මදේශකයා පොතේ (හදවත) "සිත" යන වචනය 40 වරක් භාවිත කර ඇත. හදවත ගැන මෙම පොත පවසන දෙය සොයාගැනීමට එය කියවන්න.

3. 2 පරිච්ඡේදය අනුව සලමොන්ට අයත් දේ හා ඔහුගේ අත්දැකීම්වල ලයිතුවක් සකසන්න. 10 පදයෙහි ඇති "මා සිතු පැතු කවර දෙයක් වුවද මම ලබා ගතිමි" යි සඳහන් වේ. 11 පදයෙහි ඇති එහි ප්‍රතිඵලය බලන්න. ඒ සියල්ල නිස්සාරය. මේ බව හැඳිනගැනීමට තුඩු දුන් පියවර බලන්න. ඔහු බැලුවේය, ඔහු හැරුනේය, ඔහු දැක්කේය, ඔහු හදවතින් පැවසීය.

4. ධර්මදේශකයා පොතේ ප්‍රධාන වචනය බලන්න. "නිස්සාරය" (නිෂ්ඵලය) එය 37 වාරයක් භාවිත කර ඇත.

5. "ඉර යට" යන වාක්‍ය ඛණ්ඩය (පැරණි අනුවාදය) බලන්න. ආත්මික අගයයන් අහකට දමා ලෞකික දේ මත යැපෙන්නන්ගේ ජීවිතය මේ වේ. මෙම වාක්‍ය ඛණ්ඩය 25 වරක් ඇත. දෙවියන්වහන්සේගෙන් වෙන්වූ ජීවිතයක් පිළිබඳ සලමොන්ගේ නිගමන, ඔබ ධර්මදේශකයා පොත අධ්‍යයනය කරන විට, සටහන් කර ගන්න (නිදසුන් 2:11). මෙවැනි ජීවිතයක් ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති ජීවිතය හා සසඳන්න.

6. ජීවිතයට තේරුමක් දීම සඳහා සලමොන් රජතුමා පහත දැක්වෙන සෑම දෙයක්ම අත්හදා බැලූ බව බයිබලයේ සඳහන් වේ.

   - මනුෂ්‍ය ප්‍රඥාව : ධර්ම 1:16-18
   - මත් පැන් : ධර්ම 2:3
   - සැප සම්පත්: ධර්ම 2:1-3
   - ඉදිකිරීම් ව්‍යාපෘති : ධර්ම 2:4
   - අලංකාර උද්‍යාන හා ගෙවතු: 2:4-6
   - තම කැමැත්තට ඉඩදීම: ධර්ම 2:7
   - ලිංගික කටයුතු: 1 රාජාවලිය 11:3
   - වස්තුව : ධර්ම 2:7-8
   - ජාත්‍යන්තර කීර්තිය: 1 රාජාවලිය 10:6-7
   - සංගීතය: ධර්ම 2:8
   - සාහිත්‍යය: 1 රාජාවලිය 4:32
   - හමුදාමය බලය: 1 රාජාවලිය 4:26 හා 9:26
   - ස්වභාවික විද්‍යාව 1 රාජාවලිය 4:33

# විසි තුන් වන පරිච්ඡේදය

## ප්‍රේම ගී

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ප්‍රේම ගීත පොතේ කතුවරයා නම් කිරීමට
- ප්‍රේම ගීත පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ප්‍රේම ගීත පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ප්‍රේම ගීත පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- ප්‍රේම ගීත පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** සලමොන් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට හා සියලු ඇදහිලිවතුන්ට

**පරමාර්ථය** : ජේසුස් වහන්සේ හා සභාව අතර සම්බන්ධතාව, විවාහ සබඳතාවෙහි දැක්වෙන්නාක් මෙන් පෙන්වීම.

**ප්‍රධාන පදය :** ප්‍රේම ගී 8:7.

**ජීවන හා දේව සේවා මූලධර්මය :** මිනිසෙකු හා ඔහුගේ බිරිඳ අතර ඇති ප්‍රේමයේ දිව්‍යමය ආකෘතිය, ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර ඇති සබඳතාවේ රටාවම වේ.

**ප්‍රධාන චරිත :** මනාලයා (ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ) නියෝජනය කරන සලමොන්, මනාලිය (සභාව) වූ ෂූලම්මිය ජාතික ගැහැණු ළමයා හා ජෙරුසලමේ දියණියෝ.

## සැකිල්ල

මෙම පොත අවබෝධ කරගැනීම සඳහා ඊට අර්ථ නිරූපණ මට්ටම් හතරක් ඇති බව වටහා ගත යුතුය.

1. එය මිනිසෙකු හා භාර්යාව අතර පවතින සම්බන්ධතාව පිළිබඳ ආකෘතියකි
2. එය, දෙවියන්වහන්සේ තම සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන් සමඟ පවත්වන සම්බන්ධතාවයට නිදසුනකි.
3. එය, ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර පවතින සම්බන්ධතාවට නිදසුනකි.
4. එය, ක්‍රිස්තුස්වහන්සේ හා ඇදහිලිවතෙකු අතර පවතින පෞද්ගලික සම්බන්ධතාව සඳහා නිදසුනකි.

මෙම පොත සංවාදයක (දෙබසක) ආකාරයෙන් ලියා ඇත. අධ්‍යයනය සඳහා උචිතම සැකිල්ල වන්නේ මෙම සංවාදය වේ. චරිත හා ඔවුන් කතාකරන අනුපිළිවෙළ මෙසේය:

| **චරිතය** | **යොමුව** |
|---|---|
| මනාලිය | 1:2-7 |
| මනාලයා | 1:8-11 |
| මනාලිය | 1:12-14 |
| මනාලයා | 1:15 |
| මනාලිය | 1:16-17:2:1 |
| මනාලයා | 2:2 |
| මනාලිය | 2:3-6 |
| මනාලයා | 2:7 |
| මනාලිය | 2:8 සිට 2:10 “මට” දක්වා |
| මනාලයා | 2:10 “නැගිට” සිට 15 පදය දක්වා |
| මනාලිය | 2:16-17; 3:1-4 |
| මනාලයා | 3:5 |
| මනාලිය | 3:6-11 |
| මනාලයා | 4:1-5 |
| මනාලිය | 4:6 |
| මනාලයා | 4:7 සිට 16 පදයේ “හමා යන්න” දක්වා |
| මනාලිය | 4:16 “මාගේ” සිට |
| මනාලයා | 5:1 |
| මනාලිය | 5:2-8 |
| ජෙරුසලමේ දියණියන් | 5:9 |
| මනාලිය | 5:10-16 |
| ජෙරුසලමේ දියණියන් | 6:1 |
| මනාලිය | 6:2-3 |
| මනාලයා | 6:4-9 |
| ජෙරුසලමේ දියණියන් | 6:10 |
| මනාලයා | 6:11-12 |
| ජෙරුසලමේ දියණියන් | 6:13 |
| මනාලයා | 7:1-9 |
| මනාලිය | 7:10-13; 8:1-3 |
| මනාලයා | 8:4 |
| ජෙරුසලමේ දියණියන් | 8:5 “ප්‍රේමවන්තයා” යන්න දක්වා |
| මනාලයා | 8:5 “මම” සිට |
| මනාලිය | 8:6-8 |
| මනාලයා | 8:9 |
| මනාලිය | 8:10-12 |
| මනාලයා | 8:13 |
| මනාලිය | 8:14 |

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රේම ගී පොතේ කතුවරයා කවුරුන්ද?

2. ප්‍රේම ගී පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ප්‍රේම ගී පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ප්‍රේම ගී පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ප්‍රේම ගී පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මනාලියගේ විස්තරය අනුව මනාලයාගේ ලක්ෂණ අධ්‍යයනය කරන්න. මේවා ස්වාභාවික සමාන්තර හෙවත් අපගේ මනාලයාගේ එනම් අපගේ ස්වාමීන්වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික ගුණාංග වල විස්තර වේ.

    - කඳුවල පැන නගිමින් එන . . . මුවෙකු වැනිය 2:8,9
    - කඩවසම්, දස දහසක් අතරේ සොයාගත හැකි උත්තමයෙකි 5:10
    - ඔහුගේ හිස පිවිතුරු රත්රන් මෙන්ය. රැළි සහිතය. කාලවර්ණය 5:11
    - ඔහුගේ ඇස් දිය දොළවල් ළඟ ඉන්න පරවියන් වැනිය 5:12
    - ඔහුගේ තොල් මානෙල් වැනිය. දියර ගන්ධරය එයින් වැස්සෙන්නේය 5:13
    - ඔහුගේ කම්මුල් සුවඳ ගස් පාත්තියක් මෙන්ය 5:13
    - ඔහුගේ ගත නිල්මිණියෙන් සැරසුණු ඇත්දත් වැනිය 5:14
    - ඔහුගේ දෑත පුෂ්ටිමත්ය, ලශූණීය මැණිකේ ඇල්ලූ රන්මුදු වැනිය 5:14
    - ඔහුගේ කෙණ්ඩ අම්ශ්‍ර රන් අඩි පිට පිහිටා තිබෙන සුදු ගල්කණු වැනිය කිහිරි ගස් මෙන් අසමසමය 5:15

2. මනාලයාගේ විස්තරය අනුව මනාලියගේ ස්වාභාවික ලක්ෂණ අධ්‍යයනය කරන්න. මේවා ආත්මික සත්‍යයන්වල සංකේතාත්මක සමාන්තර බව මතක තබාගන්න. “ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය” ලෙස මේවා ඔබට ආත්මිකව සම්බන්ධ වන්නේ කෙසේද?

    - ඇය කාන්තාවන්ගේ ඉතා රුවැති තැනැත්තිය වේ 1:8
    - ඇය උයන්වල වැවුණ . . . මල් පොකුරක් වැනිය 1:14
    - ඇගේ ඇස් පරෙවියන් හා සමානය 1:15
    - ඇය කටුගස් අතරේ මානෙල් මලක් වැනිය 2:2
    - ඇගේ වලස ගිලියද් කඳු බවුමෙහි ලැග සිටින එළු රැළක් වැනිය 4:1
    - ඇගේ දත් බැටළුවන්ගේ ලොම් මෙන් සුදුය 4:2
    - ඇගේ දෙතොල් රතු නූල් මෙන්ය 4:3
    - ඇගේ තොල් මී පැණි මෙන්ය 4:11
    - ඇගේ තොල් දාවිත්ගේ කොත මෙන්ය 4:4
    - ඇගේ දෙතන මානෙල් අතරේ ගොදුරු කන මුවදෙනෙකුගේ නිඹුල් පැටවුන් දෙදෙනෙකු මෙන් 4:5
    - ඇය අගනා එල දරන උයනක් වැනිය 4:13
    - ඇය උයනක උල්පතක්ය, ලෙබනොන් කඳුවලින් ගලා බසින දොළක් මෙන් නැවුම් ය 4:15
    - ඇගේ කලවා දක්ෂ කම්කරුවෙකුගේ අතින් කළ ආභරණ මෙන්ය 7:1
    - ඇගේ උදය මානෙල් මලින් වටවූ තිරිඟු ගොඩක් වැනිය 7:2
    - ඇගේ නාභිය මිදියුෂ පිරුණු වටකුරු පාත්‍රයක් වැනිය 7:2
    - ඇගේ නාසය දමස්කය මුර කරන ලෙබනොන් කොත වැනිය 7:4
    - ඇගේ නෙතග එක් බැල්මකින් ඔහු ඇගේ සිත දිනාගත්තේය 4:9

# දිවැසිවර පොත් සඳහා හැඳින්වීමක්

පැරණි ගිවිසුමේ අවසාන පොත් කාණ්ඩයට දිවැසිවරුන්ගේ ලියවිලි ඇතුළත් වේ.

දෙවියන්වහන්සේ ඉශ්රායෙල් සෙනඟ මිසරයේ වහල්බවින් මුදාගෙන ඔවුන්ගේම දේශයට ගෙන ආ අතර ඔව්හු ජාතියක් බවට පත් වූහ. ජීවත් විය යුතු ආකාරය පිළිබඳව ඔවුන්ට ව්‍යවස්ථාවක් දුන් නුමුත් නිරන්තරයෙන්ම දෙවියන්වහන්සේට තිබූ කැපවීම ගැන ඔව්හු අසාර්ථක වූහ.

රූප වන්දනාව, අභ්‍යන්තර යුද්ධ, දුරාචාරය, හා නොසැලකිල්ල නිසා නිතර නිතර ඉශ්රායෙල්වරුන්ව, ඔවුන්ගේ පැවැත්මේ පරමාර්ථය උදෙසා කැඳවීමට සිදුවිය. දිවැසිවරුන් යනු සෙනඟ නැවතත් දෙවියන්වහන්සේ වෙතට ගෙන ඒමට දෙවියන්වහන්සේ විසින් නැගිටවූ මනුෂ්‍යයෝ වෙති. මෙම පොත් බොහොමයක් ලියා ඇත්තේ ඉශ්රායෙල් ජාතිය ඉශ්රායෙලය හා ජුදා ලෙස රාජ්‍යයන් දෙකකට බෙදී තිබූ අවස්ථාවේය.

දිවැසිවරුන්ගේ පොත් අතර පහත දැක්වෙන ඒවා වේ :

**යෙසායා :** ජුදා දේශය වෙත, දෙවියන්වහන්සේට එරෙහිව කරන පව් නිසා, පැමිණෙන්නට නියමිත විනිශ්චය ගැන අනතුරු හඟවයි.

**ජෙරමියා :** ජුදා දේශයේ පිරිහීම හා වැටීම සිදුවූ කාලයේ ලියන ලද්දකි. පැමිණීමට නියමිත විනිශ්චය ගැන පවසන අතර නෙබුකද්නෙසර්ට යටත්වන ලෙස ඉල්ලාසිටී.

**විලාප ගී** බබිලෝනිවරුන් විසින් කරනු ලබන ජෙරුසලමේ විනාශය පිළිබඳව ජෙරමියාගේ වැලපීමය.

**එසකියෙල්** ඉදිරියේදී සිදුවන ජෙරුසලමේ වැටීම ගැන අනතුරු අඟවන අතර අනාගතයේදී සිදුවන ප්‍රතිසංස්කරණය ගැන අනාවැකි කියයි.

**දානියෙල්** ජුදා දේශය වැටලූ මුල් අවදියේ දිවැසිවර දානියෙල් අල්ලා ගෙන බබිලෝනියට ගෙනයන ලදී. බයිබල් අනාවැකි අවබෝධ කරගැනීමට වැදගත් වන ඓතිහාසික හා අනාවැකි පිළිබඳ ඉගැන්වීම් මෙම පොත සපයයි.

**හොසියා** මෙම පොතේ තේමාව වන්නේ ඉශ්රායෙල්වරුන්ගේ ද්‍රෝහි වීම, දඬුවම හා පුනරුත්ථාපනය පිළිබඳවය.

**ජොවෙල්** අනාගත විනිශ්චය පිළිබඳ පූර්ව නිමිති ගෙන එන වසංගත ගැන පවසයි.

**ආමෝස්** ද්‍රව්‍යමය සමෘධිය පැවතුනද සදාචාරය පිරිහුනු අවදියක ආමොස්, ඉශ්රායෙලයට හා අවට ජාතීන්ට, ඔවුන්ගේ පාපය වෙනුවෙන් පැමිණෙන දෙවියන්වහන්සේගේ අනාගත විනිශ්චය ගැන අනතුරු අඟවයි.

**ඔබදියා** මළ මුහුදට දකුණින් පිහිටි දුෂ්ට ජාතියක් වන ඒදොම් වෙත පැමිණීමට නියමිත දෙවියන්වහන්සේගේ විනිශ්චය ගැන පවසයි.

**ජෝනා** අසරියන් අධිරාජ්‍යයේ අගනුවර වූ නිනිවාහි දී පශ්චාතාවවීම ගැන දේශනා කළ දිවැසිවර ජෝනා පිළිබඳ කතාව වේ. අන්‍ය ජාතීන් වෙනුවෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා පසුතැවීමේ සැලැස්ම මෙම පොත එළිදරව් කරයි.

**මීකා** ඉශ්රායෙල්හි පාපය පිලිබඳ තවත් අනාවැකියකි. ජේසුස්වහන්සේ උපදින ස්ථානය ගැන, ඊට අවුරුදු 700 කට පෙර පවසයි.

**නාහුම් :**ජෝනාගේ දේශනාවන් නිසා අවුරුදු 150 කට පමණ පෙර විනාශයෙන් බේරී තිබූ නිනිවයේ ඉදිරි විනාශය ගැන පවසයි.

**හබකුක්** පාපි දේශයකට, ඊටත් වඩා පාපි දේශයක් මඟින් දඬුවම් කිරීමට, දෙවියන්වහන්සේගේ ඇති සැලැස්ම එළිදරව් කරයි. "ධර්මිෂ්ඨයෝ ඇදහිල්ලෙන් ජීවත් වෙති" යන්න ඔහු උගන්වයි.

**ශෙපනියා** ජුදාහි විනිශ්චය හා පුනරුත්ථාපනය

**හග්ගයි** සතුරු උවදුරු නිසා දේවමාලිගාව නැවත ගොඩනැගීම වසර 15 ක් පමණ ප්‍රමාද වී තිබූ බැවින් එය නැවත ආරම්භ කිරීමට ජුදෙව්වන්ගෙන් ඉල්ලා සිටී.

**සෙකරියා :** දේවමාලිගාව සම්පූර්ණ කරන ලෙස හා ආත්මික කැපවීම අලුත් කරන ලෙස ඉල්ලා සිටී. ජේසුස්වහන්සේගේ පළමු හා දෙවන පැමිණීම පිළිබඳ අනාවැකි පළ කරයි.

**මලාකි :** ආත්මික නොගැඹුරු බව ගැන අනතුරු අඟවන අතර ස්නාවක ජොහන්ගේ හා ජේසුස්වහන්සේගේ පැමිණීමට ගැන අනාවැකි පවසයි.

**දිවැසිවරුන්** සේවය කළ වකවානුව හා කවුරුන්ටද යන්න පහත සටහනේ දැක්වේ.

## පරණ ගිවිසුමේ දිවැසිවරු

| දිවසිවරයා | කවුරුන්ටද | දිනයයන් |
|---|---|---|
| ජෝනා | අසරියාවට | අල්ලා ගැනීමට පෙර (800-650) |
| නාහුම් | අසරියාවට | අල්ලා ගැනීමට පෙර (800-650) |
| ඔබදියා | ඒදොම්ට | අල්ලා ගැනීමට පෙර (800) |
| හොසියා | ඉශ්රායෙලයට | අල්ලා ගැනීමට පෙර (750) |
| ආමොස් | ඉශ්රායෙලයට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| යෙසායා | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| ජෙමියා/විලාප ගී | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| ජෝවෙල් | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| මීකා | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| හබක්කුක් | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| ශෙපනියා | ජුදාට | අල්ලා ගැනීමට පෙර (800-606) |
| එසකියෙල් | ජුදාට | අල්ලා ගත් කාලයේ (606-536) |
| දානියෙල් | ජුදාට | අල්ලා ගත් කාලයේ (606-536) |
| හග්ගයි | ජුදාට | අල්ලා ගත් පසු (536-400) |
| සෙකරියා | ජුදාට | අල්ලා ගත් පසු (536-400) |
| මලාකි | ජුදාට | අල්ලා ගත් පසු (536-400) |

# විසි හතර වන පරිච්ඡේදය

## යෙසායා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- යෙසායා පොතේ කතුවරයා නම් කිරීමට
- යෙසායා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- යෙසායා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- යෙසායා පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- යෙසායා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** යෙසායා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ජුදා දේශය

**පරමාර්ථය :** තරවටුව නිවැරදි කර ගැනීමට

**ප්‍රධාන පදය :** යෙසායා 53:6

**ජීවන හා දේව සේවා මූලධර්මය :** කැරලි ගැසීමට ප්‍රතිවිපාක ඇත. පසුතැවිලිවීම නැවත පිහිටුවනු ලැබීමට මඟපෙන්වයි.

**ප්‍රධාන චරිත :** යෙසායා, හෙසකියා

## සැකිල්ල

### පළමුවන කොටස

1. ජුදා හා ජෙරුසලම පිළිබඳ අනාවැකි : 1:1-12:6

   A. පොදු හැඳින්වීම 1:1-31
   B. පවිත්‍රවීම තුළින් සහශ්‍රවසරක ආශිර්වාද 2:1 - 4:6
   C. ඉශ්රායෙල්හි පාප සඳහා දඬුවම 5:1-30
   D. දිව්‍යසිවරයා කැඳවනු ලැබීම හා බලය පැවරීම 6:1-13
   E. එම්මානුවෙල් පිළිබඳ අනාවැකිය 7:1-25
   F. අසරියා ආක්‍රමණය පිළිබඳ අනාවැකිය 8:1-22
   G. මෙසයනික අනාවැකිය හා අනතුරු ඇඟවීම 9:1-21
   H. අසරියාව මඟින් දඬුවම් දීම 10:1-34
   I. නැවත පිහිටුවනු ලැබීම හා ආශිර්වාද 11:1-16
   J. නමස්කාරය 12:1-6

11. විදේශ ජාතීන්ට එරෙහි අනාවැකි 13:1- 23:18

A. බබිලෝනිය 13:1-14:23
B. අසරියාව 14:24-27
C. පිලිස්තිය 14:28-32
D. මෝවබ් 15:1-16:14
E. දමස්කය 17:1-14
F. එතියෝපියාවේ ගංගාවලට එගොඩ භූමි 18:1-7
G. මිසරය 19:1-25
H. මිසරය හා එතියෝපියාව 20:1-6
I. දුමා 21:11-12
J. අරාබිය 21:13-17
K. දර්ශනයේ මිටියාවත 22:1-25
L. තීර් 23:1-18

111. රාජ්‍යය පිහිටුවීම පිළිබඳ අනාවැකිය 24:1-27:13

A. පීඩා සමය 24:1-23
B. රාජ්‍යයේ ලක්ෂණ 25:1-12
C. නැවත පිහිටුවනු ලැබ ඉශ්‍රායෙලය පිළිබඳ සාක්ෂිය 26:1-27:13

1V. අසරියාව හා සම්බන්ධව ජුදාව පිළිබඳ අනාවැකිය : 28:1-35:1-10

A. සමාරියේ වැටීම 28:1-13
B. ජුදාවට අනතුරු ඇඟවීමක් 28:14-29
C. සියොන්ට පහර දීම 29:1-4
D. පහර දෙන්නා පරාජය වේ 29:5-8
E. පරීක්ෂාව සඳහා හේතු 29:9-16
F. අවසාන මිදීමේ ආශිර්වාද 29:17-24
G. මිසරය සමඟ සන්ධානගතවීම ගැන අනතුරු ඇඟවීම 30:1-14
H. උපකාරය සඳහා දෙවියන්වහන්සේ මත යැපීමට උපදෙස් 30:15-31:9
I. ස්වාමීන්වහන්සේගේ දවස 34:1-17
J. රාජ්‍යයේ ආශිර්වාද 35:1-10

## සම්බන්ධවන පුරුක

36 සිට 39 පරිච්ඡේදය දක්වා සඳහන් වන්නේ අසරියන්වරුන්ගෙන් බබිලෝනියන්වරුන් වෙතට සංක්‍රමණය වීම පිළිබඳව වේ.

1. සෙනකාරිබ්ගේ ආක්‍රමණය 36:1-37:38
11. හෙසකියාගේ රෝගය සහ සුවය ලැබීම 38:1-22
111. බබිලෝනියේ දූතයන් පැමිණීම හා අත්පත් කරගැනීම 39:1-8

## දෙවන කොටස

1. නැවත පිහිටුවනු ලැබීම පොරොන්දුව තුළ ඇති සැනසිල්ල 40:1-66:24

A. නැවත පිහිටුවනු ලැබීම පිළිබඳ පොරොන්දුව 40: 1-11
B. සැනසිල්ලේ පදනම : දෙවියන්වහන්සේගේ චරිත ලක්ෂණ 40:12-31
C. සැනසිල්ල සඳහා හේතුව 41:1-29

D. සැසිලිදායකයාණෝ 42:1-25

E. සැනසිල්ලේ ප්‍රතිඵල 43:1 - 47:15

    1. ජාතීන් නැවත පිහිටුවනු ලැබීම 43:1-45:25
    2. බබිලෝනියාවේ පිළිමවල පිරිහීම 46:1-13
    3. බබිලෝනියාවේ වැටීම 47:1-15

F. වහල් බවින් මුදාගත් අයගේ සැනසිල්ල සඳහා අනුශාසනා 48:1-22

11. ජේසුස්වහන්සේ නැමති මිදුම්කරු පිළිබඳ අනාවැකි මඟින් විප්‍රවාසීන්ට සැනසිල්ල 49:1-57:21

A. කැඳවීම හා කාර්යය 49:1-26
B. කීකරුකම හා ඇදහිලිවන්තකම 50:1-11
C. ඉශ්රායෙල්හි මිදීම 51:1-52:12
D. පව් නසන පූජාව හා මහේශාක්‍යබව 52:13-53:12
E. ඉශ්රායෙල්හි නැවත පිහිටුවනු ලැබීම 54:1-17
F. ලෝක ව්‍යාප්ත ගැළවීම 55:1-13
G. උන්වහන්සේගේ අනතුරු ඇඟවීම් හා පොරොන්දු 56:1-57:21

111. ඉශ්රායෙල්හි අනාගත මහිමය ගැන අනාවැකි මඟින් විප්‍රවාසීන්ට සැනසිල්ල 58:1-66:24

A. නැවත පිහිටුවනු ලැබීම සඳහා බාධක හා ඒවා ඉවත්කිරීම 58:1-59:21
B. මෙසායනික යුගයේ ජෙරුසලමේ මහිමය 60 :1-22
C. ඉශ්රායෙලයට හා ලෝකයට මෙසියස්වහන්සේගේ ආශිර්වාද 61:1-11
D. ජෙරුසලම කෙරෙහි දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා එහි ප්‍රතිඵල 62:1-12
E. ඉශ්රායෙල්හි සතුරන්ව ක්‍රිස්තුස්වහන්සේ පරාජය කිරීම නිසා සිදුවූ ප්‍රතිඵලය වන්නේ අතීතයේදී ජාතියේ මිදීම පිළිගැනීම වේ 63:1-14
F. ඉතිරිවූවන් සඳහා යාච්ඤාව 63:15-64:12
G. දෙවියන්වහන්සේගේ පිළිතුර 65:1-25
Hl. මෙසායනික රාජ්‍යයේ ආශිර්වාද 66:1-24

## ස්වයං පරීක්ෂණය

1. යෙසායා පොතේ කතුවරයා කවුරුන්ද?

2. යෙසායා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. යෙසායා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. යෙසායා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. යෙසායා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යෙසායා පොත බයිබලයට සමාන කළ හැකිය.

   - බයිබලයෙහි පොත් 66 කි. යෙසායා පොතෙහි පරිච්ඡේද 66 කි.

   - පැරණි ගිවිසුමේ, ඉශ්රායෙල්හි ඉතිහාසය හා පාපය ගැන සඳහන් පොත් 39 ක් තිබේ. යෙසායා පොතේ පළමුවන කොටසේ මේ විෂය ගැනම පරිච්ඡේද 39 ක් ඇත.

   - අලුත් ගිවිසුම ජේසුස් වහන්සේගේ සේවය ගැන සඳහන් පොත් 27 ක් තිබේ. යෙසායා පොතේ දෙවැනි කොටසේ මේ සේවය ගැන අවධානය යොමු කරන පරිච්ඡේද 27 ක් ඇත.

   - අලුත් ගිවිසුම ආරම්භවන්නේ යොහාන් බෞතිස්තගේ සේවය මඟිනි. යෙසායා පොතේ දෙවැනි කොටස ආරම්භවන්නේ ඔහුගේ සේවය ගැන අනවැකි කීමෙනි.

   - අලුත් ගිවිසුම අවසන් කර ඇත්තේ අලුත් අහසක් හා අලුත් පොළොවක් විස්තර කිරීමෙනි. යෙසායා අවසන් වන්නේද මේවා විස්තර කිරීමෙනි.

2. යෙසායාහි වැදගත් කොටස් බොහොමයක් අන්තර්ගතය.
   - ජේසුස්වහන්සේගේ කන්‍යා උපත පිළිබඳව පැරණි ගිවිසුමේ සඳහන් එකම අනාවැකිය යෙසායා 7:14
   - ත්‍රිත්වය පිළිබඳ පැහැදිලි ප්‍රකාශ අතුරින් එකක් 48:16
   - මුළු පැරණි ගිවිසුමෙහිම ඉතාමත් වැදගත් පරිච්ඡේදය 53

3. යෙසායා පොතෙහි "ගැළවීම" යන වචනය භාවිතය අධ්‍යයනය කරන්න. එය මෙම පොතේ 33 වාරයක් සඳහන්ව ඇත.

4. යෙසායාහි අධ්‍යයනය කිරීමට ඇති වැදගත් විෂයයන්

   - දෙවියන්වහන්සේගේ චරිත ගුනාංග පිළිබඳව පොත එළිදරව් කරන දේ
   - ජේසුස්වහන්සේගේ සේවය පිළිබඳව පොත එළිදරව් කරන දේ.
   - පීඩා සමය
   - ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහස්‍ර පාලනය.

5. යෙසායාගේ සේවය සඳහා ආත්මික යතුරු
   - ඒත්තු ගැනීම : 6:5
   - පාපොච්ඡාරණය : 6:5
   - පවිත්‍ර කිරීම : 6:7
   - කැපකිරීම : 6:8
   - පැවරීම : 6:9

# විසි පස් වන පරිච්ඡේදය

## ජෙරෙමියා

**අරමුණු :**

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ජෙරෙමියා පොතේ කතුවරයා නම් කිරීමට
- ජෙරෙමියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ජෙරෙමියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ජෙරෙමියා පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- ජෙරෙමියා පොත සඳහා ජිවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** ජෙරෙමියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ජුදාවරුන්ට

**පරමාර්ථය :** වහල් බාවයට යෑමේ විනිශ්චය ගැන අනතුරු ඇඟවීමට හා පශ්චාතාපවීමට කැඳවීම

**ප්‍රධාන පදය :** ජෙරෙමියා 33:3, ජෙරෙමියා 1:7-8

**ජිවන හා දේව සේවා මූලධර්මය :** ස්වාභාවික ආපදාවන් හා විනාශවීම්වලට ප්‍රධාන හේතුව වන්නේ දෙවියන්වහන්සේට අකීකරුවීම වේ.

**ප්‍රධාන චරිත** : ජෙරෙමියා

## සැකිල්ල

1. හැඳින්වීම : දිවැසිවරයාගේ කැඳවීම 1:1-19

11. ජුදා හා ජෙරුසලමට විරුද්ධ අනාවැකි 2:1-45:5

    A. ජොෂියා හා ජෙහෝයාකීම්ගේ පාලන සමයේ අනාවැකි 1:1-20:18
    1. පළමු අනාවැකිය : ජාතියේ පාප හා අකෘතඥතාව 2:1-3:5
    2. දෙවැනි අනාවැකිය : උතුරින් සිදුවන විනාශය 3:6-6:30
    3. තෙවැනි අනාවකිය : විප්‍රවාසය පිළිබඳ තරවටුව 7:10:25
    4. සිව්වැනි අනාවැකිය : කඩන ලද ගිවිසුම හා බඳපටියේ ලකුණු 11:1-13:27
    5. පස්වන අනාවැකිය 14:1-17:27
        a. නියඟය 14:1-15:21
        b. අවිවාහක දිවැසිවරයා 16:1-17:18
        c. සබත පිළිබඳ අනතුරු ඇඟවීම 17:19-27

6. හයවන අනාවැකිය කුම්භකාරයාගේ සලකුන: 18:1-20:18

B. ජෙරුසලමේ වැටීමට පෙර විවිධ කාලවල පැවසූ අනාවැකි 21:1-39:18

1. ශෙදෙකියා හා සෙනඟ වෙත පැමිණෙන දඬුවම 21:1-29:32
2. අනාගත මෙසායනික රාජ්‍යය 30:1-33:26
3. ශෙදෙකියාගේ පාපය හා රේකාබ්වරුන්ගේ පක්ෂපාතිත්වය 34:1-35:19
4. ජෙහෝයාකිම්ගේ විරුද්ධත්වය 36:1-32
5. වටලෑම් සිදුවූ කාලයේ ජෙරමියාගේ අත්දැකීම් 37:1-39:18

C. ජෙරුසලම වැටීමෙන් පසු අනාවැකි 40:1-45:5

1. ඉතිරි වූ අය අතර ජෙරෙමියාගේ සේවය 40:1-42:22
2. මිසරයේ ජෙරෙමියාගේ සේවය 43:1-44:30
3. ජෙරෙමියා බාරුක්ට දුන් පණිවුඩය 45:1-5

111. ජාතීන්ට විරුද්ධ අනාවැකි 46:1-51:64

A. මිසරයට විරුද්ධව 46:1-28
B. පිලිස්තියාවට විරුද්ධව 47:1-7
C. මෝවබ්ට විරුද්ධව 48:1-47
D. අම්මොන්ට විරුද්ධව 49:1-6
E. ඒදොම්ට විරුද්ධව 49:7-22
F. දමස්කයට විරුද්ධව 49:23-27
G. අරාබියට විරුද්ධව 49:28-33
H. ඒලම්ට විරුද්ධව 49:34-39
I. බබිලෝනියට විරුද්ධව 50: 1-51:64

1V. උප ග්‍රන්ථය : වැටීම හා මුදාගැනීම 52:1-52:34

A. වැටීම හා ජුදාව අල්ලා ගැනීම 52:1-30
B. මුදා ගැනීම 52:31-34

## ස්වයං පරීක්ෂණය

1. ජෙරෙමියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ජෙරෙමියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ජෙරෙමියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ජෙරෙමියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ජෙරෙමියා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. වස්තුන් හා බැඳි පාඩම් බොහොමයක් ජෙරෙමියා විසින් කරන ලදි. වස්තුන් හා බැඳි පාඩමක් යනු ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීම සඳහා දෘෂ්‍යමාන වස්තුවක් යොදාගන්න අවස්ථාවකි. ජෙරෙමියා පොතේ ඇති වස්තුන් හා බැඳි පාඩම් මෙහි දක්වා ඇති පරිච්ඡේද ඇසුරෙන් අධ්‍යයනය කරන්න.

- කොට්ටාම්බා දණ්ඩ 1,
- උතුරන හැළිය 1,
- හණ බද පටිය 13,
- පිරවූ භාජන 13;
- නියඟය 14,
- කුම්භකාරයාගේ බඳුන 18,
- බිඳුනු බඳුන 19;
- අත්තික්කා කූඩ දෙක; 24
- වියබාන් හා වියගස් 27
- සැඟවූ ගල් 43
- ගඟේ ගිල්වූ පොතක් 51

2. තමාගේ ජාතිය වෙනුවෙන් යාච්ඤා කිරීම තහනම් කරනු ලැබූ එකම බයිබලීය දිවැසිවරයා ජෙරෙමියා වේ. 7:16; 11:14; 14:11; 16:5

3. ජෙරෙමියාගේ දුක් විඳීම ජේසුස්වහන්සේගේ දුක්විඳීමට සමානය.

- දෙදෙනාගේම පවුලේ අය ඔවුන්ට සලකුවේ නැත. ජෙරෙමියා 12:6, ජොහන් 7:5

- ඔවුන්ගේම නගරයේ වැසියෝ ඔවුන්ට විරුද්ධව කුමන්ත්‍රණය කළහ. ජෙරෙමියා 11:21 ලූක් 4:28-30

- ආගමික ලෝකය දෙදෙනාටම වෛර කළහ. ජෙරෙමියා 26:7-8; ජොහන් 11:47-53

- ධර්මශාලා නායකයෝ දෙදෙනාවම හෙළාදැක්කෝය. ජෙරෙමියා 20:1 ජොහන් 18:13,24

- දෙදෙනාටම රජ කෙනෙකුගේ සහාය ලැබිණි. ජෙරෙමියා 38:16; ලූක් 23:4

- දෙදෙනාවම එකම ආකාරයෙන් විස්තර කර ඇත . ජෙරෙමියා 11:19; යෙසායා 53:7

- දෙදෙනාම ජෙරුසලම උදෙසා හැඬුවෝය ජෙරෙමියා. 9:1; ලූක් 19:42

- දෙදෙනාම දේව මාලිගාවේ විනාශ කිරීම ගැන අනාවැකි කීහ. ජෙරෙමියා 7:11-15 මතෙව් 24:1-2

# විසි හය වන පරිච්ඡේදය

## විලාප ගී

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- විලාප ගී පොතේ කතුවරයා නම් කිරීමට
- විලාප ගී පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- විලාප ගී පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- විලාප ගී පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- විලාප ගී පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ජෙරෙමියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** බබිලෝනියේ වහල්බවේ සිටි ජුදෙව්වන් වෙත

**පරමාර්ථය :** ආත්මික ගොඩනැංවීම සඳහා අවශ්‍ය පසුතැවිලිවීම ඇති කිරීමට

**ප්‍රධාන පදය :** විලාප ගී 3:22-23

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේ විනිශ්චයේදීද කරුණාවේදී විශ්වාසවන්ත වන සේක.

**ප්‍රධාන චරිත :** ජෙරෙමියා

### සැකිල්ල

1. ජෙරුසලමේ තත්වය 1:1-22
   පහත දක්වෙන දෝෂාරෝපණ පද බලන්න 1:1,3,8,9,17

11. දෙවියන්වහන්සේගෙන් දඬුවම් හා එහි ප්‍රතිඵල විස්තර කර ඇත. 2:1-22

    A. ජුදාහි සියලු නිවෙස් දෙවියන්වහන්සේ විනාශ කර ඇත. 2:1-2
    B. සියලු බල කොටු හා පවුරු බිඳ හෙළූ සේක. 2:2
    C. උන්වහන්සේගේ විනිශ්චයේ දුන්න දේශ මුළුල්ලේම නැවූ සේක. 2:4
    D. දේවමාලිගාව වැටී ඇත. 2:6
    E. ජුදාගේ සතුරන්ට විනාශකිරීමේ නිදහස දී ඇත 2:15-16
    F. ජෙරුසලමේ විදිවල සෙනඟගේ ශරීර බිම වැතිර තිබුණේය. 2:21-22

111. දෙවියන්වහන්සේගේ දිවැසිවරයා 3:1-66
    A. සෙනඟගේ පීඩාවන් 3:1-19
    B. දිවැසිවරයාගේ සහතිකය 3:21-27, 31-33
    C. දිවැසිවරයාගේ අවවාදය 3:40-66

IV. තත්වය විස්තර කිරීම තවදුරටත් : 4:1-22

A. දරුවන්ට පිපාසය ඇත 4:4

B. තරුණයෝ අසාධාරණ ලෙස සැලකිලි ලබති 5:13

C. ධනවත් අය වීදිවල හිගා කති 4:5

D. බලවත්ව සිටි වංශාධිපතීහු දැන් කෙට්ටුවී, මුහුණු කළු වී සිටිති 4:7-8

E. ස්ත්‍රීහු සිය දරුවන් පිස ආහාරයට ගත්හ 4:10

F. ව්‍යාජ දිවැසිවරු හා පූජකවරු අන්ධයන් මෙන් වීදිවල ඔබ මොබ යති 4:14

G. ශෙදෙකියා රජුව අල්ලාගෙන, අන්ධකර වහල් භාවයට ගෙන යනු ලැබීය 4:20

V. දිවැසිවරයාගේ යාච්ඤාව 5:1-18

එය :

A. සිහි කිරීමේ 5:1

B. පසුතැවිලි වීමේ 5:16

C. දෙවියන්වහන්සේ හැඳිනගැනීමේ 5:19

D. අලුත් කිරීමේ 5:21

යාච්ඤාවකි.

## ස්වයං පරීක්ෂණය

1. විලාප ගී පොතේ කතුවරයා කවුරුන්ද?

2. විලාප ගී පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. විලාප ගී පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. විලාප ගී පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. විලාප ගී පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම පිළිබඳ ශ්‍රේෂ්ඨ පාඨයක් විලාප ගී 3:21-33 හි ඇත. මෙය 2 තිමෝති 2:13 සමඟ සංසන්දනය කරන්න.

2. එළිදරව් පොතේ 18 පරිච්ඡේදය විලප ගී හා සසඳා බලන්න. විලාප ගීවල දිවැසිවරයා මෙසායනික නගරය වන ජෙරුසලමෙහි විනාශය ගැන හඬා වැලපෙයි. එළිදරව්ව 18 හි වෙළෙන්දෝ ලෞකික නගරයක් වන බබිලෝනියේ විනාශය ගැන හඬා වැලපෙති.

3. විලාප ගී 5:16 කියවන්න. දෙවියන්වහන්සේගේ විනිශ්චයට හේතුව එම පදයේ සාරාංශ කර ඇත. ක්‍රි.පූ 1000 දී පමණ දාවිත් රජතුමා ජෙරුසලමෙහි තම අගනුවර පිහිටුවීය. දෙවියන්වහන්සේ අවුරුදු 400 ක් පමණ මෙම නගරයට ආශිර්වාද කළ අතර ක්‍රි.පූ 721 දී උතුරු රාජ්‍යය අසිරියන්වරුන් විසින් අල්ලා ගැනිමට ඉඩදුන් අවස්ථාවේත් මෙම නගරය බේරු සේක. කෙසේවුවද උන්වහන්සේගේ දයාවෙන් පලක් නොවීය. මන්ද ජුදා සෙනඟ දිගටම පව් කළ බැවිනි. විනිශ්චය දැන් පැමිණියේය.

4. ක්‍රි.පූ 586 දී පළමු දේව මාලිගාවද ක්‍රි. ව. 70 දී දෙවන දේවමාලිගාවද විනාශ කිරීම සැමරීම උදෙසා, ජුදාවරුන් ශතවර්ෂ ගණනාවක් සෑම වසරකම අබ්බ් යන නව වන මාසයේ ප්‍රසිද්ධියේ විලාප ගී කියවා තිබේ.

5. ජෙරමියා, ජෙරුසලමේ උතුරු පවුරට පිටතින්, ජේසුස්වහන්සේ පසු කලෙක මියගිය, ගොල්ගොතා නමැති කන්ද පාමුල හිදගෙන හඬා වැලපුනු බව පැවසේ.

6. ජෙරුසලම ස්ත්‍රියක් ලෙස පුද්ගලයනය කර ඇත. ජෙරුසලමට සිදුවූ දෙය හා ඊට හේතුව ලැයිස්තු ගත කරන්න. ඇගේ හැඟිම්ද, සිය දරුවන් නිසා ඇති වූ වේදනාවද ඈ කටයුතු කළ යුතු සිතිවිලි හා මතකයන්ද සැලකිල්ලට ගන්න.

7. ඔබ දෙවියන්වහන්සේ පිළිබඳව මෙම පොතින් උගත් දෑ සඳහන් කරන්න. උන්වහන්සේගේ ගති ලක්ෂණ, විනිශ්චයයන් හා උන්වහන්සේ ක්‍රියා කළ ආකාරයෙන් ක්‍රියා කළේ මන්ද යන්න ගැන කරුණු ඇතුළත් විය යුතුය. නිදසුනක් ලෙස දෙවියන්වහන්සේ ජුදා දේශය ශෝකයට පත් කළේ ඇගේ පාපය නිසා බවද ඈ වහල්බවට ගෙන ගියේ ඇගේ අපරාධ නිසා බවද විලාප ගී 1:5 හි සඳහන් වේ.

8. දෙවියන්වහන්සේ පව් පිළිබඳව උන්වහන්සේ ක්‍රියා කරන ආකාරයෙන් ක්‍රියා කරන්නේ මන්ද යයි ඔබ සිතන්නේද? අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? ඔබගේ "නැටුම" "විලාපයක්" නොවන පිණිස 3 පරිච්ඡේදය කියවන්න.

# විසි හත් වන පරිච්ඡේදය

## එසකියෙල්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- එසකියෙල් පොතේ කතුවරයා නම් කිරීමට
- එසකියෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- එසකියෙල් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- එසකියෙල් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- එසකියෙල් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** එසකියෙල් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ජුදාවරුන්ට

**පරමාර්ථය :** පැමිණීමට නියමිත වහල් බාවය ගැන අනතුරු ඇඟවූ අතර ඉන්පසු වහල් භාවයට ගියවලුන්ට අනාවැකි පැවසීය.

**ප්‍රධාන පදය :** එසකියෙල් 22:30

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ජාතීන් උන්වහන්සේ දෙවියන්වහන්සේ බව දැනගැනීම පිණිස ස්වාමීන්වහන්සේ ඓතිහාසික සිදුවීම්වලට අණ දෙන සේක.

**ප්‍රධාන චරිත :** එසකියෙල්

### සැකිල්ල

**පළමුවන කොටස : ජෙරුසලම වටලෑමට පෙර අනාවැකි -1-24 පරිච්ඡේද**

ජෙරුසලම විනාශ වීමට සය අවුරුද්දකට පෙර එසකියෙල්, ජුදා දේශයට අනතුරු ඇඟවීමට අනාවැකි කීම පටන් ගත්තේය.

1. දිව්‍යසිවරයාගේ කැඳවීම හා බලය පැවරීම 1:1-3:27
   - A. දර්ශනය 1:1-28
   - B. කැඳවීම 2:1-3:27

11. ජුදාවට හා ජෙරුසලමට එරෙහි අනාවැකි 4:1-24:27
   - A. විනාශය ගැන පෙර කීම 4:1-7-:27
     1. ලකුණු හා සංකේත මඟින් 4:1-5:17
     2. අනාවැකි මඟින් 6:1-7:27

   - B. ජෙරුසලමේ පාපය හා දඬුවම 8:1-11:25
     1. පාපය පිළිබඳ දර්ශනය 8:1-18
     2. දඬුවම 9:1-11:25

C. දඬුවම් දීමේ අවශ්‍යතාව 12:1-19:14
D. වැටීමට පෙර අවසාන අනතුරු ඇඟවීම 20:1-24:27

**දෙවන කොටස : ජෙරුසලම වටලන කාලයේ අනාවැකි - 25-32 පරිච්ජේද**

**මෙම අනාවැකි කියන ලද්දේ ජුදාහි සතුරන්ට වේ**

1. වටපිටාවේ සිටින දේශයන්ට විරුද්ධ අනාවැකි 25:1-32:32

A. අම්මොන්ට විරුද්ධව 25:1-7
B. මෝවබ්ට විරුද්ධව 25:8-11
C. ඒදොම්ට විරුද්ධව 25:12-14
D. පිලිස්තියට විරුද්ධව 25:15-17
E. තීර්ට විරුද්ධව 26:1-28:19
F. සීදොන්ට විරුද්ධව 28:20-26
G. මිසරයට විරුද්ධව 29:1-32:32

**තෙවන කොටස :ජෙරුසලම වැටලූ පසු අනාවැකි - 33-48 පරිච්ජේද**

මෙම අනාවැකි ජුදා දේශය නැවත පිහිටු විම පිළිබඳ වේ.

1. රාජ්‍යය පිහිටුවීමට පෙර සිදුවීම් 33:1-39:29
A. දුෂ්ටයන් පවිත්‍ර කෙරෙනි 33:1-33
B. ව්‍යාජ එඬේරු සබෑ එඬේරුන්ට ඉඩ දෙති 34:1-31
C. භූමිය ප්‍රකෘතිමත් කිරීම 36:1-15
D. සෙනඟ නැවත ගොඩ නැගිම 36:16-37:28
E. ඉශ්රායෙල්හි සතුරන් විනිශ්චය කිරීම 38:1-39:24
F. නැවත ගොඩ නගන ලද දේශය 39:25-29

11. සහශ්‍ර රාජ්‍යය 40:1-48:35
A. දේව මාලිගාව 40:1-43:27
B. නමස්කාරය 44:1-46:24
C. භූමිය 47:1-48:35

## ස්වයං පරීක්ෂණය

1. එසකියෙල් පොතේ කතුවරයා කවුරුන්ද?

2. එසකියෙල් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. එසකියෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. එසකියෙල් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. එසකියෙල් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. එසකියෙල් 16 පරිච්ඡේදය හා හොසියා පොත සමග සංසන්දනය කරන්න.

2. එසකියෙල් 37 හි සඳහන් වියළි ඇටකටු ඇති මිටියාවත පැරණි ගිවිසුමේ ඇති විචිත්‍රතම දර්ශනය වේ. මෙම පරිච්ඡේදය අධ්‍යයනය කරන්න.

3. මෙම පොත, බයිබලයේ සඳහන් දේව මාලිගා හතෙන් එකක් වන අනාගත දේව මාලිගාව විස්තර කරයි. එසකියෙල් 40 -48 පරිච්ඡේද බලන්න. මෙම පරිච්ඡේදවල ඇති අනිත් බයිබලීය දේවමාලිගා ගැන කියවන්න.
   - මෝසෙස්ගේ කූඩාරම : නික්මයාම 40
   - ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නැමැති දේව මාලිගාව: ජොහන් 2
   - සලමොන්ගේ දේවමාලිගාව: 1 රාජාවලිය 6
   - ආත්මික දේවමාලිගාව: සභාව : ක්‍රියා 2
   - සෙරුබ්බාබෙල්ගේ /හෙරොද්ගේ දේවමාලිගාව එස්රා/ජොහන් 2
   - පීඩා සමයේ දේවමාලිගාව : එළිදරව් 11

4. දෙවියන්වහන්සේ ඉතිහාසයේ සිදුවීම් තීරණය කරන්නේ එක් පරමාර්ථයක් සිත්හි තබාගෙන බව තේරුම් ගැනීම වැදගත් වේ. එනම් උන්වහන්සේ සැබෑ දෙවියන්වහන්සේ බව ජාතීන් දැනගන්නා පිණිසය. "මා ජෙහෝව බව ඔවුන් දැනගත යුතුය" යන්න මෙම පොතේ 70 වාරයක් පමණ සඳහන් වේ. දෙවියන්වහන්සේගේ ක්‍රියාවල දිව්‍යමය පරමාර්ථය දැනගැනීමට, ඔබ එසකියෙල් අධ්‍යයනය කරන විට, එම කොටස් ලකුණු කරගන්න.

5. එසකියෙල් දර්ශන පිළිබඳ දිවැසිවරයෙකි. ඔහු අල්ලාගත් අය අතරේ සිටින විට "... අහස විවෘත වී දේව දර්ශන මට පෙනුණේය" යි ලිවේය (එසකියෙල් 1:1)

   ඔහු දුටු දර්ශන මෙසේය :
   - කෙරුබ්වරු පිළිබඳ දර්ශනය 1:1-3:13
   - තේජස හා දුෂ්ට බව පිළිබඳ දර්ශනය 8:1-11:25
   - දැවෙන මිදිවැල පිළිබඳ දර්ශනය 15 : 18
   - වියළි ඇටකටු පිළිබඳ දර්ශනය 37:1-28

6. එසකියෙල් පොතේ ඇති උපමා හා ලකුණු

   - රාජාලියන් පිළිබඳ උපමාවෙන් එළිදරව් වන්නේ බබිලෝනියේ රජු හා මිසරයේ රජුය. මුදුන් අත්තෙන් පිළිඹිබු වන්නේ ජෙහෝයාකින් වේ: භූමියේ බීජය ශෙදෙකියාය. ළපටි රිකිලිවලින් මෙසියස්වහන්සේ පෙන්නුම් කෙරේ. එසකියෙල් 17 පරිච්ඡේදය.

   - 20-23 පරිච්ඡේදවල උපමා බොහොමයක් අන්තර්ගත වේ. මේවා අතුරින් ඉතාමත් වැදගත්වන්නේ ඔහොලා හා ඔහොලිබා යන සොහොයුරියන් දෙදෙනා පිළිබඳ උපමාවය. ඔව්හු ඉශ්රායෙලය හා ජුදාව රූප වන්දනාව වෙත පිරිහෙන ආකාරය නියෝජනය කරති.

   - උතුරන කල්දේරම උපමාව සංකේතවත් කරන්නේ බබිලෝනිවරුන් ආක්‍රමණය කරන විට ජෙරුසලමේ තත්වය වේ. එසකියෙල් 11:1-13

   - ජුදා හා ඉශ්රායෙලය සඳහා වූ ලී දෙක, පෙන්වා ඇත්තේ අන්තිමේදී එඬේර රජු යටතේ මේවායේ එක්සත් වීම වේ. එසකියෙල් 37:1-28.

# විසි අට වන පරිච්ඡේදය

## දානියෙල්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- දානියෙල් පොතේ කතුවරයා නම් කිරීමට
- දානියෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- දානියෙල් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- දානියෙල් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දානියෙල් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** දානියෙල් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** වහල් භාවයට ගෙන යන ලද ජුදෙව් සිරකරුවන් වෙත.

**පරමාර්ථය :** මනුෂ්‍යයන්ගේ කටයුතු දෙවියන්වහන්සේ පාලනය කරන ආකාරය පෙන්වීම

**ප්‍රධාන පදය :** දානියෙල් 12:3

**ජීවන හා දේව සේවා මූලධර්මය :** දෙවියන්වහන්සේ සර්වබලධාරී වන අතර උන්වහන්සේට ගෞරව කරන්නන්ට උන්වහන්සේ ගෞරව කරන සේක.

**ප්‍රධාන චරිත :** දානියෙල්

### සැකිල්ල

1. මූලික පසුබිම : දානියෙල්ගේ සමෘධියට හේතු 1:1-21

11. නෙබුකද්නෙසර් යටතේ දර්ශන හා සිදුවීම් 2:1-6:28
    A. ප්‍රතිරූපය හා අර්ථ නිරූපණය 2:1-49
    රාජ්‍යයන් සතර හෙවත් ලෝක අධිරාජ්‍යයන්
        1. බබිලෝනිය : ක්‍රි.පූ. 606
        2. මෙදෝ-පර්සියානු ක්‍රි.පූ 538
        3. ග්‍රීසියානු ක්‍රි.පූ 330
        4. රෝම ක්‍රි.පූ 63

    B. ඇවිලෙන ගිනි උදුන 3:1-30
        1. රාජාඥාව 3:1-7
        2. දෙවියන්වහන්සේගේ මිනිසුන්ගේ ස්ථාවරත්වය 3:8-23
        3. විනිශ්චය හා මුදාගැනීම 3:24-30

C. නෙබුකද්නෙසර්ගේ ගහ පිළිබඳ ස්වප්නය හා එහි තේරුම 4:1-37
    1. ස්වප්නය 4:1-18
    2. අර්ථ නිරූපණය 4:19-27
    3. ස්වප්නය සැබෑ වීම 4:28-37

D. බෙල්ෂසර්ගේ මංගල්‍යය 5:1-31
    1. මංගල භෝජනය 5:1-4
    2. විනිශ්චය 5:5-9
    3. පහදා දීමට කෙනෙකු සෙවීම 5:10-16
    4. පහදා දීම 5:17-29
    5. ස්වප්නය සැබෑ වීම 5:30-31

E. සිංහ ගුහාවෙන් දානියෙල් ගළවනු ලැබීම 6:1-28
    1. දුෂ්ට සැලැස්මක් 6:1-9:
    2. දානියෙල්ගේ ප්‍රතිචාරය 6:10-20
    3. ගුහාවෙන් ගළවනු ලැබීම 6:21-28

111. බෙල්ෂෙසර්, දාරියුස් හා සයිරස්ගේ ස්වප්න 7:1-12:13

A. මෘගයන් සතර දෙනා හා එහි තේරුම 7:1-28
    1. මෘගයන් මහ මුහුදෙන් නැගී ආහ 7:1-3
        (a). සිංහයෙකු වැනි මෘගයා : බබිලෝනිය : 1:4
        (b). වලසෙකු වැනි මෘගයා : මෙදෝ-පර්සියාව : 7:5
        (c). දිවියෙකු වැනි මෘගයා : ග්‍රීසිය : 7:6
        (d). අති භයානක මෘගයා : රෝමය : 7:7
    2. කුඩා අඟ (ක්‍රිස්තු විරෝධි) : 7:8
    3. දේව රාජ්‍යය : 7:9-14
    4. දර්ශනවල තේරුම : 7:15-28

B. බැටළුවා සහ එළුවා හා එහි තේරුම 8:1-27
    1. හැඳින්වීම 8:1-2
    2. දර්ශනය 8:3-14
        (a). බැටළුවා, මොදෝ-පර්සියාව වේ 8:3-4
        (a). එළුවා ග්‍රීසිය වේ 8:5-14
    3. අන්තියෝකස් එපිෆානේස් හා ක්‍රිස්තු විරෝධීන් එළිදරව්වීම 8:15-27

C. සති සැත්තෑව 9:1-27
    1. හැඳින්වීම 9:1-2:
    2. යාච්ඤාව 9:3-19:
    3. සති සැත්තෑව 9:20-27

D. අවසාන එළිදරව්ව සඳහා සූදානම 10:1-21
    1. හැඳින්වීම 10:1-3:
    2. සිනිඳු හණ හැඳගත් මිනිසා 10:4-6
    3. දානියෙල්ගේ ප්‍රතිචාරය 10:10-12
    4. ගාබ්‍රියෙල් හා පර්සියා රාජ්‍යයේ අධිපතියා අතර ගැටුම 10:13
    5. දේවදූතයා පැමිණීමට හේතුව 10:14-21

E. දාරියස්ගේ සිට යුගය අවසානය තෙක් සිද්ධීන් පිළිබඳ දර්ශනය 11:1-12:13
    1. පැමිණීමට නියමිත සිද්ධීන් එළිදරව් කිරීම 11:1-12:3
    2. පොත මුද්‍රා කිරීම සඳහා ආඥාව 12:4
    3. පණිවුඩකරු සමඟ අවසාන සංවාදය 12:5-13

## ස්වයං පරීක්ෂණය

1. දානියෙල් පොතේ කතුවරයා කවුරුන්ද?

2. දානියෙල් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. දානියෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. දානියෙල් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. දානියෙල් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. එසකියෙල්, දානියෙල් ගැන සඳහන් කර ඇත. ඔහු දානියෙල් නෝවාට හා ජෝබ්ට සමාන කරයි. එසකියෙල් 14:14 බලන්න. ඔහු දානියෙල්ගේ ප්‍රඥාව ගැනද සඳහන් කරයි. එසකියෙල් 28:3. ජේසුස්වහන්සේද දානියෙල් උපුටා දැක්වූ සේක. මතෙව් 24:15.

2. පෞද්ගලික පාපොච්චාරණය පිළිබඳ අනර්ඝ යාච්ඤාවක් දානියෙල්හි තිබේ 9:3-19.

3. දානියෙල්හි ඇති වැදගත් දේවල් :
   - බයිබලයේ සඳහන් මහත් විස්මය ජනක මංගල භෝජනය : 5

   - පැරණි ගිවිසුමේ සඳහන් පියාණන්වහන්සේ පිළිබඳ එකම විස්තරය 7:9-14

   - ගාබ්‍රියෙල් හා මිකායෙල් යන දෙදෙනාම ගැන සඳහන් කරන එකම පොත (ස්වර්ගික අග්‍ර දේවදූතයන් දෙදෙනා) 9:21; 10:13; 12:1

   - යාච්ඤා ඇතැම්විට බාධාවක් වන්නේ මන්දැයි පැහැදිලි කිරීමක් 10:10-13

   - ක්‍රිස්තු විරෝධියා පිළිබඳ ඉතාමත්ම සම්පූර්ණ විස්තරය : 7:7-27; 8:23-25; 9:26; 11:36-45

4. 9:24-27 හි විස්තර කර ඇති දානියෙල්ගේ සති සැත්තෑවෙහි "සති" යන්නෙන් අදහස් වන්නේ 70 අවුරුද්දක කාලයක් වේ. සත් අවුරුදු කාල ජේද 70 ක් තිබිණි නම් එය අවුරුදු 490 කට සමානය. මෙම අවුරුදු බෙදා ඇත්තේ පහත දැක්වෙන පරිදි වේ.

   - සති 7 ක් හෙවත් 49 අවුරුද්දක් ආරම්භ වූයේ එස්රා හා නෙහෙමියා යටතේ ජෙරුසලම ගොඩනැඟීමට දුන් ආඥාවෙනි.

   - සති 62 ක් හෙවත් අවුරුදු 434 ආරම්භ වූයේ ජෙරුසලමේ පවුර ගොඩ නැගීම ආරම්භ වූ විටය. එය ජේසුස්වහන්සේ "කපා දැමූ" කුරුසිපත් කිරීම තෙක් පැවතිණි.

   - විදේශීය පාලනය, 69 සතියෙන් පසු නොදන්නා වසර ගණනාවක් වේ. අප දැන් සිටින්නේ ජේසුස්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටින මේ කාලයේ වේ.

   - 70 වෙනි සතිය, වසර 7 තවමත් ආරම්භ වී නැත. මේ කාලය දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය සමඟ කටයුතු කරන කාලය වේ. ක්‍රිස්තු විරෝධියා බලය අතට ගෙන පීඩා සමය ආරම්භ වූ විට මෙම කාලය පටන් ගැනේ. මෙය, එළිදරව්ව පොතේ විස්තර කර ඇති මහා පීඩා සමය වූ දානියෙල් 12:1 සඳහන් කරදරකාරී කාලය ළඟා කරයි.

5. දානියෙල් 2, 7 හා 8 හි විස්තර කර ඇති අධිරාජ්‍යවල නැගීම හා වැටීම පහත සාරාංශ කර ඇත.

**මහා බලවතුන්ගේ දර්ශන**

| අධිරාජ්‍යය | ප්‍රතිමාව | ලෝහය | දානියෙල් 2 | සත්වයා/පුද්ගලයා | දානියෙල් 7 |
|---|---|---|---|---|---|
| බබිලෝනිය | හිස | රන් | 37-38 පද | රාජාලියෙකුගේ තටු සහිත සිංහයා | 4 පදය |
| මෙදෝ -පර්සියාව | පපුව/අත් | රිදී | 39 පදය | ඉල ඇට 3 ක් සහිත මෘගයා | 5 පදය |
| ග්‍රීක | උදරය/ කලවා | ලෝකඩ | 39 පදය | පියාපත් 4 ක් ඇති දිවියා | 6 පදය |
| රෝම | කකුල් | යකඩ | 40 පදය | භයානක මෘගයා | 7 පදය |
| අලුත් රෝමය | පාද/ පා ඇඟිලි | යකඩ/මැටි | 41-43 පද | අං දසය | 7 පදය |
| දේව රාජ්‍යය | ගලක් | | 44-45 පද | මනුෂ්‍ය පුත්‍රයා | 13,14,27 පද |

# විසි නව වන පරිච්ඡේදය

## හොසියා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- හොසියා පොතේ කතුවරයා නම් කිරීමට
- හොසියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- හොසියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- හොසියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- හොසියා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** හොසියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්හි උතුරු රාජ්‍යය

**පරමාර්ථය :** සිය පාපි තත්වය පිළිබඳව ඉශ්රායෙලය අවදිකර නැවතත් ඇය දෙවියන්වහන්සේ වෙතට ගෙන්වා ගැනීමට

**ප්‍රධාන පදය :** හොසියා 4:1

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පිහිට වන්නන්ගේ අවබෝධය හා දයාව අත්දැකීම

**ප්‍රධාන චරිත :** හොසියා, ගෝමර්, ජෙශ්‍රෙයෙල්, ලෝ-රුහාමා, ලො-අම්මී

## සැකිල්ල

1. හැඳින්වීම 1:1

11. සංකේතාත්මක නිදර්ශනය 1:1-2:23

A. ඉශ්රායෙල් ප්‍රතික්ෂේප කිරීම. හොසියාගේ විවාහය හා දරුවන් ඉපදීම
1. වේශ්‍යාකමේ යෙදෙන බිරිඳක් ගැනීමට අණ කිරීම 1:2-3
2. ජේහුගේ රජපෙළපත පෙරළා දැමීම ජෙශ්‍රෙයෙල් සංකේතවත් කරයි 1:4-5
3. ලෝ-රුහාමා: දෙවියන්වහන්සේ නැවත කිසි කලෙක ඉශ්රායෙලයට කරුණාව දක්වන්නේ නැත 1:6-7
4. ලෝ-අම්මී : ඉශ්රායෙලය මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම 1:8-9

B. ඉශ්රායෙලය සනසයි :1-10-11

C. ඉශ්රායෙලයට දඬුවම් කරයි 2:1-13
1 පාපි හැසිරීම හෙළා දැකීම 2:1-7
2. දඬුවම වඩාත් හොඳින් පැහැදිලි කෙරේ 2:8-13

D. ඉශ්රායෙලය නැවත පිහිට වීම 2:14-23
1. හැරීමේ පොරොන්දුව 2:14-17

2. ගිවිසුම අලුත් කිරීම 2:18-23

111. කාමමිථ්‍යාචාරය කරන බිරිඳ මුදා ගැනීම 3:1-5
A. හොසියාගේ අත්දැකීම 3:1-3
B. ඉශ්රායෙල්හි මේ හා සමාන අත්දැකීම 3:4-5

1V. පශ්චාතාපවන ජාතියක් නැවත පිහිට විමේදී දිව්‍ය ප්‍රේමයේ ජයග්‍රහණය 4:1-14:9
A. ඉශ්රායෙල්හි වරදකාරීත්වය 4:1-19
1. පොදු චෝදනාව 4:1-5
2. ඕනෑකමින්ම නොදැන සිටීම 4:6-11
3. පිළිම වන්දනාව 4:12-19
B. දිව්‍යමය අමනාපය 5:1-15
1. පූජකවරුන්ගේ, සෙනඟගේ හා අධිපතීන්ගේ වරදකාරීත්වය 5:1-7
2. විනිශ්චය පැමිණෙනු ඇත : 5:8-15

C. පසුතැවුනාවූ ඉතිරි සෙනඟ 6:1-3
1. ආපසු පැමිණීම, එහෙත් හදවතට දැණුනු පසුතැවීමක් නොමැතිවය 6:1-3

D. දෙවියන්වහන්සේගේ ප්‍රතිචාරය 6:4-13:8
1. දෙවියන්වහන්සේ රැවටී නැත 6:4-11

E. ජාතික ප්‍රධානියයන්ගේ දූෂිතය 7:1-7
F. විදේශ ප්‍රතිපත්තිය දූෂිතය 7:8-16
G. ජාතික දූෂිත බවෙහි ප්‍රතිවිපාක 8:1-14
H. භක්තිය හැර යාම හා එහි දඬුවම 9:1-9
I. දෙවියන්වහන්සේ ඉශ්රායෙලය සොයාගත් ආකාරයෙන්ම ඔව්හු 9:10-17
J. රුකඩ රජවරු හා දෙවිවරු 10:1-3
K. ධර්මිෂ්ඨකම විෂ වේ 10:4-5
L. විනිශ්චයේදී අසරියාව යොදා ගනී 10:6-7
M. විනිශ්චයේ භීතිය 10:8
N. නොනවත්වා කැරලි ගැසීම 10:9-15
O. දෙවියන්වහන්සේගේ ප්‍රේමයට දැක්වූ අකෘතඥාව 11:1-7
P. ඉශ්රායෙල්හි කානානි ක්‍රම 11:12-12:14
Q. විනාශය සඳහා පදනම රූප වන්දනාවය 13:1-8

V. අවසාන නැවත පිහිට විම 13:9-14:9
A. දෙවියන්වහන්සේ කෙරෙහි අවිශ්වාසය 13:9-11
B. පසුතැවීමට කැඳවීම 14:1-3
C. සුව කිරීමේ පොරොන්දුව හා පසු වදන - ඉශ්රායෙලය පසුතැවේ, දෙවියන්වහන්සේ සවන් දෙයි 14:4-9

## ස්වයං පරීක්ෂණය

1. හොසියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. හොසියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. හොසියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. හොසියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. හොසියා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 2 රාජාවලිය 14:23-17:41 දක්වා කියවන්න. මෙම පාඨයෙන් විස්තර කෙරෙන්නේ හොසියා අනාවැකි පැවසූ යුගය වේ.

2. පාපය සඳහා පහත දැක්වෙන උදාහරණ දෙවියන්වහන්සේ හොසියා පොතේ භාවිත කර ඇත.
   - කාමමිථ්‍යාචාරය කරන ස්ත්‍රියක් 3:1;
   - සුරා පානය කරන්නෙකු 4:11
   - මුරණ්ඩු එළදෙනෙක් 4:16;
   - සොර මුළක් 6:9
   - අනාචාරයේ හැසිරෙන්නන් 7:4
   - දැවෙන ගිනි උදුනක් 7:7
   - අඩක් පිලිස්සූ රොටියක් 7:8
   - බොළඳ පරෙවියෙකු 7:11
   - හොර දුන්නක් 7:16
   - ගිල ගනු ලැබූවෙකු 8:8
   - පලක් නැති බඳුනක් 8:8
   - වල් කොටළුවෙකු 8:9

3. වෙසඟනක විවාහ කරගන්නා ලෙස දෙවියන්වහන්සේ මිනිසෙකුට පවසන්නේ මන්ද? ඊට හේතු බොහෝ තිබිණි.

   පළමුව, තමාට විශ්වාසවන්ත නොවූ භාර්යාවක් විවාහ විමෙන් හොසියා අත්දැකීමෙන් එම වේදනාව දැනගත්තේය. දෙවියන්වහන්සේගේ සෙනඟ ආත්මික කාමමිථ්‍යාචාරයෙහි යෙදිනි. දෙවනුව, හොසියාගේ විවාහය, දෙවියන්වහන්සේ ඉශ්රායෙලයට දෙන පණිවුඩය ජීවමාන දෘෂ්‍ය පැහැදිලි කිරීමක් විය. තෙවනුව, දෙවියන්වහන්සේ හොසියාට අණ කළේ අනාගතයේදී ඉශ්රායෙලයට දෙනු ලබන දඬුවම් හා අවසානයේ ඉශ්රායෙලය නැවත පිහිට වීම විස්තර කෙරෙන මාතෘකා අනුව තම දරුවන් නම් කරන ලෙසය.

4. හොසියාවල වාර්තා කර ඇති ඉශ්රායෙල්හි පාප මෙසේය: - අසත්‍යය 4:1; - සොරකම 7:1; - මිනී මැරුම් 5:2; - පීඩාවන් 12:7; අනාචාරකම් (නීතියෙන් හෝ සදාචාරාත්මක බවින් වැළැක්වීමක් නොමැතිව) : 11

5. දෙවියන්වහන්සේ තමාට දුන් පණිවුඩය පහදා දීම සඳහා හොසියා තද භාෂාවක් භාවිත කළේය. වෙශ්‍යාකම(ම්) යන වචනය දහහතර වරක්ද; පෙම්වතුන් සය වරක්ද; වෛශ්‍යාවන් සතර වරක්ද; කාමමිථ්‍යාචාරය යන අදහස ඇති වචන සය වරක්ද; සල්ලාල යන්න දෙවරක්ද භාවිත කර ඇත.

6. දෙවියන්වහන්සේ තම සෙනඟ සමඟ පවත්වන සබඳතාව අවධාරණය කිරීම සඳහා හොසියා වාක්‍යාලංකාර තුනක් භාවිත කර ඇත. පිය-පුත් නිදර්ශනය (11:1; සැමියා හා බිරිඳ (2:16), හා රජු හා ඔහුගේ වැසියෝ (13:10)

# තිස් වන පරිච්ඡේදය

## ජොවෙල්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ජොවෙල් පොතේ කතුවරයා නම් කිරීමට
- ජොවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ජොවෙල් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ජොවෙල් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ජොවෙල් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ජොවෙල් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ජුදා දේශයට

**පරමාර්ථය :** ජුදා දේශයට ඔවුන්ගේ පාප හා පසුතැවීමට ඇති අවශ්‍යතාව ගැන අනතුරු හඟවා ජාතිය සඳහා ඇති දෙවියන්වහන්සේගේ ඉදිරි සැලැස්ම දැන්වීම. පැමිණෙන්නාවූ මහා විනිශ්චයකට (2:18 - 3:21) පෙර මුල් විනිශ්චයක් පැමිණේ (1:2-2:17).

**ප්‍රධාන පදය** : ජෝවෙල් 2:28-29

**ජීවන හා දේව සේවා මූලධර්මය** : නිවැරදි කිරීම සඳහා දෙන විනිශ්චයක් මධ්‍යයේ වුවද දෙවියන්වහන්සේ තම සෙනඟ වෙනුවෙන් අනාගත ආශිර්වාද සලසන සේක.

**ප්‍රධාන චරිත :** ජොවෙල්

### සැකිල්ල

1. දිවැසිවරයා ඉදිරිපත් කෙරේ 1:1

11. "ස්වාමීන්වහන්සේගේ දවස" වැන්නක් 1:2-20
    A. පළගැටි වසංගතය 1:2-7
    B. පසුතැවිලිවීමට සෙනඟට අවවාද කෙරේ 1:8-20
        1. වැඩි මහල්ලන් (නායකයන්) 1:2
        2. තරුණ හා මහලු අය 1:2-3
        3. බේබද්දන් 1:5-7
        4. මුළු ජාතියම 1:8-12
        5. පූජකවරුන් (දේවගැතිවරුන්) 1:9
        6. ගොවියන් : කම්කරුවන් 1:10-12
    C. පසුතැවීමට අවවාද 1:13-14
    D. "ජෙහෝවා ඃ වහන්සේගේ දවස" : දයාව සඳහා යාච්ඥා කිරීම 1:15-20ඃ අප
        1. සවන් දිය යුතුයඃ 1:1
        2. පිබිද සිටිය යුතුය 1:5
        3. වැලපිය යුතය 1:8

4. ලජ්ජා විය යුතුය 1:11
5. ගෝනි රෙදි පොරවා ගත යුතුය 1:13
6. පසුතැවීම සඳහා රැස්වීමක් කැඳවිය යුතුය 1:15
7. ස්වාමීන්වහන්සේට මොරගැසිය යුතුය 1:14,19

111. "සමිඳාණන්ගේ දවස" 2:1-32

A. ආක්‍රමණය කරන උතුරු හමුදාව 2:1-10

B. ආර්මගිදොන්හි දෙවියන්වහන්සේගේ හමුදාව 2:11

C. පසුතැවුනාවූ ඉතිරි සෙනඟ 2:12-17

1. වස්ත්‍ර නොව සිත ඉරා ගන්න 2:12-14
2. අවංකකම පසුතැවෙන්න, නොකඩවා යාච්ඤා කරන්න 2:15-17

D. පසුතැවුනාවූ ඉතිරි සෙනඟට දෙවියන්වහන්සේගේ ප්‍රතිචාරය 2:18-29

1. පසුතැවීම 2:18
2. නැවත පිහිටුවීම 2:19-27
3. ආත්මය වැගිරවීම 2:28-29
4. දුෂ්ට අය කෙරෙහි විනිශ්චය 2:20,30-31
5. සියොන්හි පසුතැවුනාවූ ඉතිරි සෙනඟගේ මිදීම 2:32

E. "සමිඳුන්ගේ දවස" ට පෙර ලකුණු 2:30-32

1V. ජාතීන් විනිශ්චය කරනු ලැබීම : 3: 1-16

A. ඉශ්‍රායෙලය නැවත පිහිටුවීම 3:1
B. ජාතීන් විනිශ්චය කෙරේ 3:2-3
C. විශේෂයෙන්ම පිනිසිවරුන් හා පිලිස්තිවරුන් හෙළා දකිනු ලැබේ 3:4-8
D. යුද්ධය හා විනිශ්චය සඳහා ජාතීන්ට අභියෝග කෙරේ 3:9-16

V. රාජ්‍යයට ආශිර්වාද කිරීමේ අනාවැකිය 3:17-21

A. ජෙරුසලම මහිමයට පත් කිරීම 3:17
B. ජුදාහි සමෘධිය 3:18
C. මිසරය හා ඒදොම් පාළුකරයක් වීම 3:19
D. ජෙරුසලම මහිමයට පත්කිරීම පැහැදිලි කෙරේ 3:20-21

## ස්වයං පරීක්ෂණය

1. ජොවෙල් පොතේ කතුවරයා කවුරුන්ද?

2. ජොවෙල් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ජොවෙල් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ජොවෙල් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ජොවෙල් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

**තවදුරටත් අධ්‍යයනය සඳහා**

1. “සමිඳුන්ගේ දවස” යන්න ප්‍රථමයෙන් භාවිතා කළ දිවැසිවරයා ජෝවෙල් වේ. මෙම නමින් විස්තර කෙරෙන්නේ දෙවියන්වහන්සේගේ අවසාන විනිශ්චය කාලයේ පොළොව වෙත පැමිණෙන සත් අවුරුදු පීඩා සමය වේ. “සමිඳුන්ගේ දවස” ගැන ජෝවෙල් 1:15, 2:1,11 31፡ හා 3:14 කියවන්න.

2. ජොවෙල් විස්තර කර ඇති ජුදාහි තත්වය පිළිබඳ සාරාංශයක් මෙසේය :
   - සතුරන් විසින් විනාශ කෙරෙනි ፡ 1:4, 6-7
   - අලුත් මිදිවැල් කපා ඇත 1:6,10
   ( මිදිවැල ජේසුස්වහන්සේය. මිනිසුන් මිදි වැලෙන් (ජීව ප්‍රභවයෙන්) කපා දැමිණි)
   - අස්වැන්න විනාශ වේ 1:11-12
   - ප්‍රථම ප්‍රේමය බිඳ වැටේ 1:8
   - පූජාවන් කපා හැරේ 1:9
   - පූජකවරු වැලපෙති 1:9
   - ප්‍රීතිය නොමැත 1:12,16
   - ආත්මික කුසගන්න 1:17-20

3. ජෝවෙල් මඟින් දෙවියන්වහන්සේ දෙන ප්‍රතිකර්මය මෙසේය
   - පසුතැවිලි වීම 2:12-13
   - දෙවියන්වහන්සේ හදුනාගැනීම 2:26
   - සබඳතාව (දෙවියන්වහන්සේ දැනගැනීම) 2:27
   - දෙවියන්වහන්සේට දක්වන ගෞරවය 2:27 (“මම ස්වාමීන් වෙමි. අන් කෙනෙකු නුඹලාට නැත)

4. ජුදා පසුතැවිලි වුවහොත් සිදුවන්නේ
   - නැවත ගොඩනැංවීම 2:25፡
   - පිබිදීම හා අලුත් වීම 2:23
   - එළිදරව්වීම 2:28-31
   - මිදීම (ගැළවීම) හා නිදහස් කිරීම ( මිදීම) 2:32
   - සුදානම (සූදානම්ව සිටී, ලජ්ජාවක් නැත) 3:13-14

# තිස් එක් වන පරිච්ඡේදය

## ආමොස්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ආමොස් පොතේ කතුවරයා නම් කිරීමට
- ආමොස් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ආමොස් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ආමොස් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආමොස් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ආමොස් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ඉශ්රායෙල් නැවතත් දෙවියන්වහන්සේ වෙතට කැඳවීම

**ප්‍රධාන පදය :** ආමොස් 4:12

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ජාතියට කෙරෙන කැඳවීම "ඔබගේ දෙවියන්වහන්සේ මුණ ගැසීමට සූදානම් වන්න" යන්න වේ.

**ප්‍රධාන චරිත** : ආමොස්

### සැකිල්ල

1. හැඳින්වීම 1: 1-2

11. ඉශ්රායෙලය අවට ජාතීන් කෙරෙහි පැමිණෙන විනිශ්චය 1:3-23
    A. දමස්කය 1:3-5;
    B. පිලිස්තිය 1:6-8;
    C. පිනිසියාව 1:9-10;
    D. ඒදොම් 1: 11--12
    E අම්මොන් 1:13-15;
    F. මෝවබ් 2:1-3;

111. ජුදා හා ඉශ්රායෙල් කෙරෙහි විනිශ්චය 2:4-16
    A. ජුදා කෙරෙහි 2:4-5;
    B. ඉශ්රායෙල් කෙරෙහි 2:6-16

1V. ජාකොබ්ගේ පවුල කෙරෙහි දෙවියන්වහන්සේගේ අධිචෝදනා 3:1-9:10

    A. හෙළා දැකීමේ කතා තුන

1. විනිශ්චය සුදුසුය 3:1-10;
   විනිශ්චය නියෝග කර ඇත 3:11-15
2. විනිශ්චය සුදුසුය 4:1-11;
   විනිශ්චය නියෝග කර ඇත 4:12-13
3. විනිශ්චය සුදුසුය 5:1-15;
   විනිශ්චය නියෝග කර ඇත 5:16-6:14

B. දඬුවමේහි සංකේත දර්ශන පහ 7:1-9:10
   1. පළගැටියන් 7:1-3;
   2. නියඟය 7:4-6;
   3. ඓතිහාසික යොමුව ඇතිව ලඹ ලණුව 7:7-17;
   4. පලතුරු කූඩය 8:1-14
   5. ස්වාමීන්වහන්සේ පූජාසනය මත වැඩ සිටීම 9:1-10

V. දීප්තිමත් අනාගතයක් සඳහා බලාපොරොත්තුව 9:11-15
   A. ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනය හා මෙසායනික රාජ්‍යය පිහිටුවීම 9:11-12
   B. සහස්‍ර සමෘද්ධිය 9:13;
   C. ඉශ්රායෙලයේ පුනරුත්ථාපනය 9:14-15

## ස්වයං පරීක්ෂණය

1. ආමොස් පොතේ කතුවරයා කවුරුන්ද?

2. ආමොස් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ආමොස් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ආමොස් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ආමොස් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

**තවදුරටත් අධ්‍යයනය සඳහා**

1. දෙවියන්වහන්සේගේ සුපරීක්ෂාකාරී ඇසට මේවා පෙනේ :
   - අතීත පාප 1:3·
   - පුද්ගලික ක්‍රියා 1:6·
   - කඩවුණු පොරොන්දු 1:9
   - සිතෙහි සැඟවුණු වෛරයන්·1:11
   - හැඟීම් හා බලාපොරොත්තු 1:13
   - මතකය හා එහි ඇති අගය කරන පාප 2:1

2. සමිඳුන්ගේ දවසේ ලක්ෂණ පහක් ගැන ආමොස් සඳහන් කරයි.
   - රජතුමා 9:11, ජාතීන් 9:12, පෘථිවිය 9:13, සෙනඟ 9:14, භූමිය 9:15

3. ආමොස් පොතේ පළමු කොටස 1:2 හා 3:8 හි සඳහන් ගර්ජනා කරන සිංහයෙකු වෙත කරන ලද යොමුවීම් දෙකක් අතර මැදි වී තිබේ. සිංහයා පළමුව විජාතීන්ගේ පවිද (1:3-2:3), ඉන්පසු ඉශ්‍රායෙල් ලෝකයේ ඒවා ද (දකුණු රාජ්‍යය හා ජුදා දේශයද 2:4-5 හා උතුරු රාජ්‍යය වන ඉශ්‍රායෙල්ද 2:6 ,16) හෙළා දකී . මෙම කොටස අවසන් කරන්නේ ඉහත දේශයන් දිව්‍ය ප්‍රකාශයකින් එකට බැඳීමෙනි (3:1-2).

4. ආමොස් පොතේ සඳහන් සියලුම ජාතීන්ද, ඔවුන්ට දඬුවම් කිරීමට හේතුවද, පැමිණෙන විනිශ්චයද ලයිස්තුගත කරන්න.

| ජාතිය | දඬුවම් දීමට හේතුව | පැමිනීමට නියමිත විනිශ්චය |
|---|---|---|

# තිස් දෙවන පරිච්ඡේදය

## ඔබදියා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ඔබදියා පොතේ කතුවරයා නම් කිරීමට
- ඔබදියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ඔබදියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ඔබදියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඔබදියා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ඔබදියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඒදොම් ජාතිය වෙත.

**පරමාර්ථය :** පාපය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ දඬුවම් ගැන අනතුරු ඇඟවීමට

**ප්‍රධාන පදය :** ඔබදියා 1:4

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පාපී ලෙස මහිමයට පත් කරන ලද දේ දෙවියන්වහන්සේ පහත් කරනු ලැබේ.

**ප්‍රධාන චරිතය :** ඔබදියා

### සැකිල්ල

1. ඒදොම්හි ඉරණම ගැන අනාවැකි පලකරයි 1:1-9
    A. මෙම පණිවුඩය ඒදොම් පිළබඳව ස්වාමින්වහන්සේගෙන් ඔබදියාට වේ 1:1
    B. පරාජය කළ නොහැකි ඒදොම් පරාජය කරනු ඇත 1:2-4
        1. ඒදොම් ජාතින් අතර සුළු වී ද්වේෂයට ලක්වන්නේය 1:2
        2. අහංකාරය නිසා රැවටෙන්නේය 1:3
        3. දෙවියන්වහන්සේ විසින් පහතට හෙළා දමනු ලබන්නේය 1:4

    C. ඒදොම් සම්පූර්ණයෙන්ම කොල්ලකා විනාශ කරනු ලබන්නේය 1:5-9
        1. සොරු හා කොල්ලකරුවෝ 1:5
        2. සැඟවු වස්තුව සොයයි 1:6
        3. ඒදොම් රවටා, උගුලකට අසු කෙරේ 1:7
        4. ප්‍රඥාවන්තයන් විනාශ කෙරේ 1:8
        5. ප්‍රබල මිනිසුන් භීතියට පත්වන අතර ඒදොම් තනි වේ 1:9

11. මීට හේතුව 1:10-14
    A. සැහැසිකම් 1:10:
    B. සතුරු ආකල්පය: 1:11
    C. අන් අයගේ විපත්ති ගැන ප්‍රීතිවීම: 1:12

D. අන් අයගේ විපතේදී උඩඟුකමින් පුරසාරම් දෙඩීම 1:12
E. දෙවියන්වහන්සේගේ සෙනඟ දූෂ්‍ය කිරීම 1:13
F. පලා යන්නන්ට පලා යාමට ඉඩ නොදීම 1:14
G. පාවාදීම 1:14

111. "සමිඳුන්ගේ දවස" ඒදොම් වෙත පමණක් නොව අනෙකුත් සියලු මිථ්‍යාදෘෂ්ටික ජාතීන් වෙත විනිශ්වය පැමිණේ. 1:15-21

A. ඒදොම් හා සියලු ජාතීන් වෙත විනිශ්වය 1:15-16
   1. නුඹ කර තිබෙන හැටියට නුඹටත් කරනු ලැබේ 1:15
   2. ඔවුන් කළ ලෙස ඔවුන්ටද කරනු ලැබේ 1:16

B. ජාකොබ්ගේ වංශයට ගැළවීම ලැබේ 1:17-20
   1. සියොන් කන්දේදී මිදීම හා ශුද්ධත්වය 1:17
   2. ජාකොබ්, ජෝසෙප් හා ඒසව්ගේ වංශ 1:18
   3. අයත් දේ 1:19-20

C. ජේසුස්වහන්සේගේ සහස්‍ර රාජ්‍යය 1:21

## ස්වයං පරීක්ෂණය

1. ඔබදියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ඔබදියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ඔබදියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ඔබදියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ඔබදියා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඒදොම්ට විරුද්ධව අනෙකුත් අනාවැකි සදහා පහත දැක්වෙන ඒවා කියවන්න.
   - යෙසායා 34:5-15;
   - ජෙරෙමියා 49:7-22;
   - එසකියෙල් 25:12-14,35:1-5;
   - ආමොස් 1:11-12

2. "ඒදොම්" යන්නෙහි තේරුම රතු වේ. ඒදොම්වරුන් පැමිණියේ ඒසව්ගෙන්ය. ඔවුන්ගේ ඉතිහාසය ගැන කියවීමට උත්පත්ති 36; නික්මයාම 15:15; ගණන් කථාව 20:14; 20-21 හා ද්විතිය නීති සංග්‍රහය 23:7-8 කියවන්න.

3. ඔබදියා හි පහත දක්වා ඇති පදවල සුවිශේෂී පාප ගැන සඳහන් වේ.
   - හිංසාව : 10;
   - සතුරු ආකල්ප 11;
   - අනෙක් අයගේ විපත්තිවලදී ප්‍රීති වීම 12
   - අන් අයගේ උඩඟුකමින් පුරසාරම් දෙඩීම 12;
   - දෙවියන්වහන්සේගේ සෙනඟ දූෂ්‍ය කිරීම 13
   - පලා යන්නන්ට පලා යෑමට ඉඩ නොදීම 14;
   - පාවාදීම 14

4. ඔබදියා හි ඇති වැදගත් කියුම් :
   - ස්වාමීන්වහන්සේ මෙසේ වදාරන සේක.
   - නුඹට කරනවා ඇත.
   - ස්වාමීන්වහන්සේ ඒක කියන සේක.
   - ස්වාමීන්වහන්සේ වෙතින් ලැබුසේක.

# තිස් තුන් වන පරිච්ඡේදය

## ජෝනා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ජෝනා පොතේ කතුවරයා නම් කිරීමට
- ජෝනා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ජෝනා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ජෝනා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ජෝනා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** ජෝනා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** නිනිවයට, දෙවියන්වහන්සේට අකීකරු වීමේ පල විපාක ගැන අනතුරු ඇඟවීමය.

**පරමාර්ථය** : නිනිවයේ සෙනඟට ගැලවීම ලබා දීම පමණක්ම නොවේ. ගැළවීම ජුදෙව්වරුන්ට පමණක් නොවන බව ඉශ්රායෙල්වරුන්ට වාර්තා කිරීමට.

**ප්‍රධාන පදය** : ජෝනා 3:1-2

**ජීවන හා දේව සේවා මූලධර්මය** : ජාන වර්ගය, සංස්කෘතිය හෝ වෙනත් බාධාවන් මඟින් ගැළවීමට සීමා පනවා නැත. “මක්නිසාද ස්වාමින්වහන්සේගේ නාමයට යාච්ඤා කරන කවුරු නමුත් ගළවනු ලබන්නේය” (රෝම 10:13)

**ප්‍රධාන චරිත** : ජෝනා

## සැකිල්ල

1. පළමු පැවරුම 1:1-2:10

   A. දිව්‍ය කැඳවීම: නැගිට, ගොස් මොරගසන්න 1:1-2

   B. ජෝනා අකීකරු වීම : ඔහු නැගිට පලා ගියේය 1:3

   C. අකීකරුකමේ ප්‍රතිඵල 1:4-17
      1. මහා කුණාටුවකට අසුවීම 1:4-6
      2. වරදකරු වීම 1:7
      3. නැවෙන් පිටතට විසි කිරීම 1:8-16
      4. මහා මත්ස්‍යයෙකු විසින් ගිල ගැනීම 1:17

   D. ජෝනාගේ යාච්ඤාව 2:1-9
      1. ජීවිතයේ විපත්ති මතක් වේ 2:3, 5-6
      2. දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම වටහාගනී 2:3
      3. ස්වාමින්වහන්සේගේ කැමැත්ත යාච්ඤාවට පිළිතුරු දීම බව හඳුනා ගනී 2:2,7

4. නැවත කැපවීම හා පසුතැවීම අවශ්‍යය 2:9
5. ප්‍රතිඵලය මුදා ගැනීමය 2:10

E. ජෝනාගේ මිදීම 2:10

11. දෙවැනි පැවරුම නැගිට ගොස් ප්‍රකාශ කරන්න 3:1-10
   A. කීකරුවීම, ඔහු නැගිට ගොස් මොරගැසුවේය 3:1-4
   B. කීකරු වීමේ ප්‍රතිඵල 3:5-10
      1. සෙනඟ පනිවිඩය විශ්වාස කලහ 3:5
      2. ඔව්හු පසුතැවිලි වූහ. මිනිසා හා මෘගයා උපවාස කරයි. ගෝණි රෙදි අඳියි, අළු පිට හිඳී 3:5-9
      3. නගරය ආරක්ෂා විය 3:10

111. දිවැසිවරයාගේ ගැටලුව 4:1-11
   A. දිවැසිවරයාගේ කෝපය 4:1-5
   B. දෙවියන්වහන්සේ තරවටු කිරීම 4:6-11

## ස්වයං පරීක්ෂණය

1. ජෝනා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ජෝනා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ජෝනා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ජෝනා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ජෝනා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේ "පසු තැවුනු" විට, වරද කිරීමෙන් පසු තැවීම ලෙසම ඉන් අදහස් නොවේ (3:10). දෙවියන්වහන්සේ දයාවෙන් යුතුව, කලින් සැලසුම් කළ විනිශ්චය නිනිවයට නොඑවීමට තීරණය කළසේක. ඊට හේතුව නිනිවයේ සෙනඟ ජෝනාගේ පණිවුඩය විශ්වාස කර ඒ අනුව ක්‍රියා කළ බැවිනි. ආමොස් 7:3; ලූක් 11:30; මතෙව් 12:39 බලන්න.

2. ජෝනා, ඉශ්රායෙල් ජාතිය මෙන් වේ.
   - සාක්ෂි දැරීම සඳහා තෝරා ගත්තේය. ද්විතීය නීති සංග්‍රහය 14:2; එසකියෙල් 20:5
   - දෙවියන්වහන්සේගේ අධිකාරිය ලැබිණි. යෙසායා 43:10-12 හා 44:8
   - දෙවියන්වහන්සේගේ කැමැත්තට අකීකරු වීම. නික්මයාම 32:1-4; විනිශ්චයකාරයෝ 2:11-19; එසකියෙල් 6:1-5; මාක් 7:6-9
   - විවිධ ජාතීන් අතර: ද්විතීය නීති සංග්‍රහය 4:27; එසකියෙල් 12:15
   - මිථ්‍යාදෘෂ්ටීන් අතර සිටින විට ඔව්හු දෙවියන්වහන්සේ දැනගත්හ. රෝම 11:11
   - ආශ්චර්යවත් ලෙස ආරක්ෂා වීම : හොසියා 3:3; ජෙරෙමියා 30:11; 31:35-37

3. ජෝනා, දෙවියන්වහන්සේ සමඟ අමනාප වීමට හේතු බලන්න. ඊට හේතුව උන්වහන්සේ දයාවන්තය. අනුකම්පා සහගතය, වහා නොකිපෙන සුලුය, කරුණාවෙන් පිරී ඇත. එමෙන්ම විනිශ්චය ගැන පසුතැවේ.

4. ජෝනා, තම හැඟීම්වලින් පාලනය කෙරෙනි. නිදසුනක් ලෙස, 4 වන පරිච්ඡේදයේ පළමුව ඔහු කෝප විය, ඉන් පසු සතුටු විය, ඉන්පසු නැවතත් කෝප විය. ඔහු තම කැමැත්තෙන් ක්‍රියා කෙරුවාවූ කෙනෙක්ය (1 පරිච්ඡේදය). උඩඟු ගතිගුණ ඇත (4:2). නැතිවූ ආත්ම ගැන නොව ඔහු වඩාත් සැලකිලිමත් වූයේ තමාගේම සතුට හා සැපත ගැන වේ (4 පරිච්ඡේදය).

5. දෙවියන්වහන්සේ වෙතින් පලා යන විට
   - උන්වහන්සේගේ නියෝග නොතකයි 1:2-3
   - උන්වහන්සේගෙන් සැඟවෙන්නට නොහැකිය 1:4,17
   - අනාගතය අනාරක්ෂිතය 1:15
   - තමාටම උපකාර කරගැනීමට නොහැකිය 1:4-6

6. ජෝනා ක්‍රිස්තුස්වහන්සේ ආකාරයේ වේ. දෙදෙනාටම විශේෂ පණිවුඩ තිබිණි - ජෝනාට විනිශ්චය ගැන හා ජේසුස්වහන්සේට ගැළවීම ගැනය. දෙදෙනාම කුණාටුවකට අසුවිය. ජෝනා මුහුදට විසිකරනු ලැබීය. ජේසුස්වහන්සේ කුණාටුව නිශ්චල කළ සේක. ජෝනා මත්ස්‍යයා තුළ සිට මොරගැසූ අතර ජේසුස්වහන්සේ කුරුසිය මත සිට මොරදුන් සේක. දෙදෙනාම තෙවැනි දින නැගිට්ටෝය (ජෝනා මත්ස්‍යයාගෙන් හා ජේසුස්වහන්සේ සොහොනෙන්). එමෙන්ම දෙදෙනාම නැගිටීමෙන් පසු දේශනා කළෝය.

# තිස් හතර වන පරිච්ඡේදය

## මීකා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- මීකා පොතේ කතුවරයා නම් කිරීමට
- මීකා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- මීකා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- මීකා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මීකා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මීකා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට හා ජුදාවරුන්ට

**පරමාර්ථය :** විනිශ්චය මගහැරීම සඳහා පසුතැවීමට කැඳවීම

**ප්‍රධාන පදය :** මීකා 6:8

**ජීවන හා දේව සේවා මූලධර්මය :** සිය සෙනඟට පීඩා ගෙන දෙන්නන්ව දෙවියන්වහන්සේ විනිශ්චය කරන සේක.

**ප්‍රධාන චරිත** : මීකා.

### සැකිල්ල

1. හැඳින්වීම 1:1

11. විනිශ්චය පිළිබඳ පොදු අනාවැකිය 1:2 - 2:13
    A. සමාරියට විරුද්ධ විනිශ්චය 1:2-8
        1. විනිශ්චය දැන්වීම 1:2-4
        2. සමාරියේ විනාශය 1:2-8
    B. ජුදාවට විරුද්ධ විනිශ්චය 1:9-16
    C. පීඩාකරුවන් වෙත විනිශ්චය 2:1-11
        1. පොහොසතුන්ගේ උඩඟුකම හා ප්‍රචණ්ඩත්වය 2:1-5
        2. සැබෑ දිවැසිවරුන් නිහඬ කරවන ව්‍යාජ දිවැසිවරු 2:6-11

    D. ඉතිරිවූ සෙනඟ කෙරෙහි දයාව 2:12-13

111. මෙසායනික රාජ්‍යය පිහිටුවීම 3:1-5:15
    A. දුෂ්ට පාලකයින්, ව්‍යාජ දිවැසිවරුන් හා ජාතීන් කෙරෙහි විනිශ්චය 3:1-12
        1. සිවිල් පාලකයන්ගේ පාප 3:1-4
        2. ව්‍යාජ දිවැසිවරුන්ගේ පාප 3:5-8
        3. පාලකයින්, දිවැසිවරුන් හා පූජකයන් 3:9-11

B. රාජ්‍යයේ ලක්ෂණ 4:1-5

C. රාජ්‍යය පිහිටුවීම 4:6-13

1. මුල් ආධිපත්‍යය නැවත ඇති කෙරේ 4:6-8
2. නැවත ගොඩනැඟීමට පෙර බබිලෝනියට 4:9-10
3. සියොන් මුදාගැනීම හා සතුරා විනාශ කිරීම 4:11-5:1

D. පළමු ආගමනය හා රජු ප්‍රතික්ෂේප කිරීම 5:1-2

E. රජුගේ ප්‍රතික්ෂේප කිරීම හා ආපසු පැමිණීම අතර කාලය 5:3

F. උන්වහන්සේගේ ආපසු පැමිණීමෙන් පසු සිද්ධීන් 5:4-15

1. උන්වහන්සේ සිය සෙනඟ පෝෂණය කරනු ඇත 5:4
2. උන්වහන්සේ සිය සෙනඟගේ සාමය වන සේක 5:5-6
3. උන්වහන්සේ සිය සෙනඟට බලය දෙන සේක 5:7-9
   (a). ඉතිරිවූ සෙනඟ පින්න ලෙස 5:7
   (b). ඉතිරිවූ සෙනඟ සිංහයෙකු ලෙස 5:8
   (c). ඉතිරිවූ සෙනඟ හොරණෑවක් ලෙස 5:9-15

1V. සිය සෙනඟ සමඟ ස්වාමීන්වහන්සේට ඇති ගැටලුව හා උන්වහන්සේගේ අවසාන දයාව 6:1-7:20

A. මිනිසුන්ගේ අකෘතඥතාව හා දුෂ්ටකම 6:1-7:6

1. ආශිර්වාද සඳහා අකෘතඥතාව 6:1-5
2. දෙවියන්වහන්සේගේ අවශ්‍යතා වන්නේ ධර්මිෂ්ඨ හැසිරීම මිස බාහිර පුද පූජාවන් නොවේ 6:6-8
3. විනිශ්චය පිළිබඳ දෙවියන්වහන්සේගේ තර්ජන 6:9-14

B. දිවැසිවරයාගේ මැදිහත් වීමේ යාඥා 7:7-20

1. ජාතියේ වරද පිළිබඳව පසුතැවිලි වීම 7:1-6
2. ඇදහිල්ල පිළිබඳ පසුතැවිලි වීම 7:7-13
3. දයාව අලුත් කරන ලෙස යාච්ඥා කිරීම 7:14
4. ස්වාමීන්වහන්සේගේ පිළිතුර 7:15-17
5. ප්‍රශංසා ගායනාව 7:18-20

## ස්වයං පරීක්ෂණය

1. මීකා පොතේ කතුවරයා කවුරුන්ද?

2. මීකා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. මීකා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. මීකා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. මීකා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. අවුරුදු ගණනාවකට පසු මීකා පොතෙන් උපුටා දැක්වීමක් ඇතැම් විට දිවැසිවර ජෙරෙමියාගේ ජීවිතය බේරන්නට ඇත. ජෙරෙමියා 26:16-18 කියවා එය මීකා 3:12 සමඟ සංසන්දනය කරන්න.

2. මුළු බයිබලයේම සහස්‍රය පිළිබඳ ඉතාමත් අලංකාර විස්තරයක් ගෙන එන්නේ මීකා 4:1-5 වේ.

3. මීකා පොත මතක තබා ගැනීමට ඔබට වචන තුනක් උපකාරී විය හැකිය.
   - <u>පිටතට :</u> ඔහුගේ ප්‍රසිද්ධ දේශන වලින් 1-6 පරිච්ඡේද සමන්විත වේ.
   - <u>ඇතුළට :</u> ඔහුගේ පෞද්ගලික සිතිවිලි 7:1-6 හි වාර්තා කර ඇත.
   - <u>ඉහළට :</u> දෙවියන්වහන්සේට ඔහු කළ යාච්ඤාව 7:7-20 හි ඔසවා ඇත.

4. මීකා 1:1 හි සඳහන් ජුදාහි රජුවරුන්ගේ ඓතිහාසික පසුබිම සඳහා 2 රාජාවලිය 15:32-20: 21 හා 2 වංශාවලිය 27:1-33:20 කියවන්න.

5. මීකාගේ අනාවැකි උතුරු රාජ්‍යය වූ සමාරිය හා දකුණු රාජ්‍යය වූ ජුදාව පිළිබඳව වේ. සමාරිය ගැන සඳහන් තැන්වල කෙළවරේ (උරා) ද ජුදා සඳහන් තැන්වල කෙළවරේ ( දරා) ද යොදන්න.

6. තමාට දෙවියන්වහන්සේට ළඟාවිය හැකි ආකාරය හා උන්වහන්සේට අවශ්‍ය දේ මීකා 6:6-8 න් පවසයි. මෙම කොටස හොඳින් අධ්‍යයනය කරන්න.

# තිස් පස් වන පරිච්ඡේදය

## නාහුම්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- නාහුම් පොතේ කතුවරයා නම් කිරීමට
- නාහුම් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- නාහුම් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- නාහුම් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නාහුම් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** නාහුම් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** නිනිවය නගරයට

**පරමාර්ථය :** දෙවියන්වහන්සේගේ සෙනඟ වහල්කමට ගෙනගිය අසිරියන් අධිරාජ්‍යයේ අගනුවර වන නිනිවය කෙරෙහි ඇති විනිශ්චය ගැන අනතුරු ඇඟවීම.

**ප්‍රධාන පදය :** නාහුම් 1:2

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පරෙස්සම් වන්න, දෙවියන්වහන්සේ නපුරට දඬුවම් කරන සේක.

**ප්‍රධාන චරිත :** නාහුම්

## සැකිල්ල

1. විනාශය පිළිබඳ අනාවැකිය : පළමු කොටස 1:1-14
   A. හැඳින්වීම 1:1

   B. විනාශකිරීමේ ප්‍රභවය : දෙවියන්වහන්සේම වේ 1:2-9
      1. උදහස හා දෙවියන්වහන්සේගේ දයාව 1:2-3
      2. පාපයට එරෙහි උන්වහන්සේගේ බලවත් කෝපය 1:4-6
      3. උන්වහන්සේගේ කරුණාවේ ශ්‍රේෂ්ඨත්වය 1:7
      4. තම සතුරන් ලුහු බැඳ යන සේක 1:8

   C. විනාශකිරීමට හේතුව : පාපය 1:9-14
      1. වර්තමාන අර්භුදයේ දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම 1:9-11
      2. අසිරියාවේ විනාශය 1:12-14
      3. සියොන්හි ප්‍රීති ප්‍රමෝදය 1:15

11. ජුදාවට පොරොන්දුව : මේ කෲර ජාතියට ඔවුන් තවදුරටත් බිය විය යුතු නැත 1:15

111. විනාශය පිළිබඳ අනාවැකිය : දෙවන කොටස 2:1-3:19
   A. නගරය වටලෑම හා විනාශය 2:3-13

1. නිනිවයට පහර දීම : නගරයේ ඉරණම 2:1-7
    (a). යුද්ධය සඳහා සූදානම 2:1-4
    (b). විරුද්ධ වීමේ නිෂ්ඵලත්වය 2:5-6
    (c). රැපිණක් අල්ලාගන්නා සේ නගර අල්ලාගැනීම 2:7

2. සෙනඟ පලා යෑම හා නගරය කොල්ලකෑම 2:8-13
    (a). වාසය කරන්නෝ පලා යති 2:8-10
    (b). විනාශය සම්පූර්ණය 2:11-13

B. නිනිවය වැටීමට හේතුව 3:1-9
1. සටනෙහි විස්තරය 3:1-3
2. හේතුය : පාපය වේ 3:1-6, 16,19
3. ඇගේ ලජ්ජාව අනාවරණය කරන්නේ දෙවියන්වහන්සේය 3:5-7

C. ආමොන්හි ඉරණම, නිනිවයෙහි ඉරණමද වන්නේය 3:8-11 (යෙරෙමියා 46:25; එසකියෙල් 30:14 බලන්න)

D. නගරය බේරාගැනීමට නිනිවයට ඇති නොහැකියාව 3:12-19
1. පිටතින් ඇති බලකොටු බිඳ වැටීම 3:12-13
2. නගරය වටලෑම් හා විනාශ කිරීම 3:14-19අ
3. නිනිවය වැටීම පිළිබඳ සියල්ලන්ගේ ප්‍රීතිය 3:19ආ

## ස්වයං පරීක්ෂණය

1. නාහුම් පොතේ කතුවරයා කවුරුන්ද?

2. නාහුම් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. නාහුම් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. නාහුම් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. නාහුම් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නිනිවය පිළිබඳව දෙවියන්වහන්සේගේ විනිශ්චයට හේතු සඳහන් කරන්න.

2. නිනිවය පිළිබඳව දිවැස්වැකි කියූ, ඔබ කලින් උගත්, අනෙක් දිවැසිවරයා ඔබට මතකද? කලින් දිවැස්වැකියට නගරය ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (ජෝනා පොත බලන්න)

3. මේ පද සංසන්දනය කරන්න.
   යෙසායා 8:8; 10:23 නාහුම් 1:8-9
   යෙසායා 24:1 නාහුම් 2:10
   යෙසායා 21:3 නාහුම් 2:10
   යෙසායා 52:7 නාහුම් 1:15

4. නිනිවය වැටීමට හේතු සමහක් මෙසේ වේ.
   - ලේ වැගිරවීම 3:1;
   - බොරු කීම 3:1;
   - සොරකම 3:1;
   - අහිංසකයන් මැරීම 3:3-4;
   - වේශ්‍යාකම 3:4;
   - මායම් 3:4;
   - දුරාචාරය 3:5;
   - සැඟවුණු ප්‍රචණ්ඩත්වය 3:6
   - විනාශ කරන වෙළෙන්දෝ (කුලී සේවායෝ) 3:16
   - තුවාළය කෙතරම් අසාධ්‍යයද යත් එය සුව කළ නොහැකිය 3:19
   - නොනවත්වා කෙරෙන දුෂ්ටකම් 3:19

# තිස් හය වන පරිච්ඡේදය

## හබක්කුක්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- හබක්කුක් පොතේ කතුවරයා නම් කිරීමට
- හබක්කුක් පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- හබක්කුක් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- හබක්කුක් පොතේ ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- හබක්කුක් පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** හබක්කුක් වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ජුදා දේශයට

**පරමාර්ථය :** ආත්මික අවශ්‍යතාවන් ගැන ජුදා අවදිකරවීම හා දෙවියන්වහන්සේගෙන් පැමිණීමට නියමිත විනිශ්චය ගැන අනතුරු ඇඟවීම.

**ප්‍රධාන පදය :** හබක්කුක්ගේ 3:2

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ධර්මිෂ්ඨයන් ඇදහිල්ලෙන් ජීවත් වනු ඇත.

**ප්‍රධාන චරිත** : හබක්කුක්

## සැකිල්ල

මෙම පොත පරිච්ඡේද අනුව පහසුවෙන්ම කොටස් තුනකට බෙදේ. හබක්කුක්, ආත්මික බරක් (1 පරිච්ඡේදය), දර්ශනයක් (2 පරිච්ඡේදය) හා යාච්ඤාවක් (3 පරිච්ඡේදය) සඳහන් කරයි. මේ සියල්ල දෙවියන්වහන්සේ කල්දිවරුන් ජාතිය මඟින් ජුදා කෙරෙහි ගෙනෙන විනිශ්චය හා සම්බන්ධවය.

1. මාතෘකා වගන්තිය 1:1

11. හබක්කුක්ගේ පළමු පැමිණිල්ල 1:2-4
    A. දිවැසිවරයාගේ ප්‍රශ්න : 1:2-3අ
    B. ජුදාහි සදාචාරාත්මක හා සමාජ තත්වය 1:3 ආ
    C. දිවැසිවරයාගේ නිගමනය 1:4

111. ස්වාමීන්වහන්සේගේ පිළිතුර 1:5-11
    A. අනර්ඝ වැඩ ප්‍රකාශ කෙරේ 1:5
    B. කල්දිවරුන් හා ඔවුන්ගේ බලය 1:6-11

1V. ස්වාමීන්වහන්සේ කෙරෙහි ඇති හබක්කුක්ගේ විශ්වාසය 1:12

V. හබක්කුක්ගේ දෙවන පැමිණිල්ල 1:13-17

V1. බලා සිටින දිවැසිවරයා 2:1

V11. ස්වාමීන්වහන්සේගේ පිළිතුර 2:2-4

A. දර්ශනය පැහැදිලිව ලිවිය යුතුය 2:2

B. දර්ශනය නොවරදවාම පැමිණෙන්නේය 2:3

C. දර්ශනය 2:4

V111. විපත් පහ 2:5-19

A. හැඳින්වීම 2:5-6අ

B. කල්දිවරුන් වෙත පැමිණෙන විපත් පහ 2:6ආ-19

1. පළමු විපත 2:6ආ-8
2. දෙවන විපත 2:9-11
3. තෙවන විපත 2:12-13

(ස්වාමීන්වහන්සේ පිළිබඳ දැනගැන්මෙන් පොළොව පිරී යන්නේය 2:14)

4. සිවුවන විපත 2:15-18
5. පස්වන විපත 2:19

1X. හබක්කුක්ගේ ගීතය 3:1-19

A. මාතෘකාව 3:1 :

B. යැදීම 3:2:

C. ස්වාමීන්වහන්සේගේ පිළිතුර 3:3-15

D. හබක්කුක්ගේ ප්‍රතිචාරය 3:16-19 අ

E. සංගීතය 3:19ආ

## ස්වයං පරීක්ෂණය

1. හබක්කුක් පොතේ කතුවරයා කවුරුන්ද?

2. හබක්කුක් පොතේ පරමාර්ථය සඳහන් කරන්න..

3. හබක්කුක් පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. හබක්කුක් පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. හබක්කුක් පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. “දැමිටු අය දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ලෙන් ජීවත් වන්නෝය” යන හබක්කුක්ගේ ප්‍රකාශය අලුත් ගිවිසුමේ තෙවරක් උපුටා දක්වා ඇත. රෝම 1:17, ගලාති 3:11 හා හෙබ්‍රෙව් 10:38 බලන්න.

2. ක්‍රියා 13:40-41 ද පිලිප්පි 4:4, 10:19 ද බලන්න.

3. දිව්‍ය වාක්‍යයක් “බරක්” ලෙසද පරිවර්තනය කළ හැකිය. හබක්කුක්ගේ “බර” කුමක්ද? ඔහුට වද දෙන්නේ කුමක්ද?

4. දෙවියන්වහන්සේ, ශුද්ධ තැනැන්වහන්සේ, ස්වාමීන්වහන්සේ හා දෙවියන්වහන්සේ ගැන සඳහන් කරන සර්ව නාමයක්ම ලකුණු කරන්න. ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ මෙම පොතින් උගත් දේ සාරාංශ කරන්න.

5. “අහංකාර හෝ උඩඟු අය” ගැන කෙරෙන සියලු යොමුවීම් ලකුණු කරන්න. ඔහු කුමන ආකාරයේ කෙනෙක්ද යන්න හා ඔහුගේ වෙනස සසඳා ඇත්තේ කා සමඟද යන්න සාරාංශ කරන්න. දෙවියන්වහන්සේ උඩඟු අයට විරෝධය දක්වන බව ජාකොබ් 4 හි සඳහන් වේ.

6. “විපත” යන වචනය භාවිතා කර ඇති සෑම තැනක්ම ලකුණු කරන්න. ඉන්පසු විපත පැමිණෙන්නේ කාටද යන්න, එය පැමිණීමට හේතුව, එය පැමිණි විට සිදුවන දෙය බලන්න. ඔබගේ ජීවිත පැවැත්ම නිසා මේවායින් යමක් ඔබට අදාළ වේද? එසේනම් ඒ ගැන පසුතැවිලි වන්න.

# තිස් හත් වන පරිච්ඡේදය

## ශෙපනියා

**අරමුණු :**

මෙම පරිච්ජේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ශෙපනියා පොතේ කතුවරයා නම් කිරීමට
- ශෙපනියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- ශෙපනියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ශෙපනියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශෙපනියා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** ශෙපනියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්‍රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දෙවියවන්වහන්සේගේ විනිශ්චය පිළිබඳව ඉශ්‍රායෙලයට හා අනෙකුත් සියලු ජාතීන්ට අනතුරු ඇඟවීමට

**ප්‍රධාන පදය :** ශෙපනියා 3:17

**ජීවන හා දේව සේවා මූලධර්මය :** ගැළවීම ලබාදීම සඳහා දෙවියන්වහන්සේ බලවත්ය.

**ප්‍රධාන චරිත :** ශෙපනියා

## සැකිල්ල

1. හැඳින්වීම 1:1-3
   A. පණිවුඩකරු 1:1
   B. පණිවුඩයේ සාරාංශය 1:2-3

11. ඇතුළතින් බැලීමක් 1:4 - 2:3
   A. විනිශ්චය සඳහා කාරණා 1:4-14
      1. නමස්කාර කරන කණ්ඩායම් හතරක් පිළිබඳ විනිශ්චය 1:4-7
      2. සෑම තරාතිරකම පව්කරුවන් වෙත විනිශ්චය 1:8-13

   B. විනිශ්චයේ ස්වභාවය හා ප්‍රතිඵල 1:14-18
      1. එය ආසන්නය 1:14
      2. බලවත් අය පවා පහත් කෙරේ 1:14
      3. එය විපතේ, නාස්තියේ හා විනාශයේ අඳුරු දවසක්ය 1:15-16
      4. විපත්ති, ලේ, කසළ මෙන් මාංසය 1:17
      5. මිදීමක් නැත 1:18
      6. ස්වාමීන්වහන්සේගේ කෝපයේ දවස 2:1-3

   C. විනිශ්චයේ නම : ස්වාමීන්වහන්සේගේ දවස 2:1-3

D. විනිශ්චය තුළ බලාපොරොත්තුව 2:3

111. වට පිට බලන්න : සියලු ජාතීන් කෙරෙහි විනිශ්චය පැමිණේ 2:4-3:7

A. පිලිස්තිවරුන්ගේ නගර 2:4-7
B. මෝවබ් හා අම්මොන් 2:8-11
C. එතියෝපියාව 2:12
D. අසරියාව හා එහි අගනුවර වන නිනිවය 2:13-15
E. ජෙරුසලම කෙරෙහි විනිශ්චය 3:1-7
   1. ජෙරුසලමේ තත්වය බලන්න.
      (a) කැරලිකාර, දූෂ්‍ය හා පීඩා කරන 3:1
      (b) අකීකරු 3:2
      (c) දුෂ්ට, ලෞකික නායකයන් 3:3
      (d) දුෂ්ට, ආත්මික නායකයන් 3:4
   2. දෙවියන්වහන්සේගේ කරුණාව බලන්න 3:5-7

1V. පිටතට බලන්න, විනිශ්චයෙන් පසු සුවවීම ලැබෙනු ඇත 3:8-20

A. දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටුවිය 3:8
B. මිත්‍යාදෘෂ්ටීන් අතුරින් දෙවියන්වහන්සේගේ ඉතිරි වන්නාවූ සෙනඟ පැමිණෙනු ඇත 3:9-10, 12-13
C. වරක් දෙවියන්වහන්සේගේ සතුරන්ව සිටි අය වෙත විනිශ්චය පැමිණෙන්නේය 3:9-13
D. ඉශ්රායෙල්හි මෙසියස්වහන්සේ රජ කෙනෙකු ලෙස විද්‍යමාන වේ 3:14-20

## ස්වයං පරීක්ෂණය

1. ශෙපනියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. ශෙපනියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ශෙපනියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. ශෙපනියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. ශෙපනියා පොතේ ප්‍රධාන පදය ලියන්න.

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේ සඳහා "ඉශ්රායෙල්හි රජු" යන්න බයිබලයේ භාවිත කර ඇත්තේ දෙවරක් පමණි. ශෙපනියා එය පැරණි ගිවිසුමේ භාවිත කරයි (3:15). ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ නතානියෙල් එය නව ගිවිසුමේ භාවිත කරයි (ජොහන් 1:49).

2. ශෙපනියා ඔහු විස්තර කරන විනිශ්චය "සමිඳුන්ගේ දවස" ලෙස හඳුන්වයි. ඔහු මෙය සත්වරක් භාවිත කර ඇත (1:7,8,14 ,18: 2:2-3 බලන්න).
   - එය ආසන්නය 1:4,7,14:
   - බලවත් අය පවා පහත් කෙරෙනු ඇත 1:14
   - එය අඳුරේ, උදහසේ, විපත්ති හා විනාශයේ දවසක්ය 1:15
   - එය තැති ගන්වන කාලයක්ය 1:16:
   - පාපය කෙරෙහි විනිශ්චය පැමිණේ 1:17
   - එය හා සමඟ ස්වභාව ධර්මයේ මහා ලකුණු පැමිණේ 1:15
   - එය ස්වාමීන්වහන්සේගේ උදහසේ දවසය 1:2-3
   - එය සියලු මැවිල්ල කෙරෙහි බලපායි 2:1-15: 3:8

# තිස් අට වන පරිච්ඡේදය

## හග්ගයි

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- හග්ගයි පොතේ කතුවරයා නම් කිරීමට
- හග්ගයි පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- හග්ගයි පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- හග්ගයි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- හග්ගයි පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** හග්ගයි වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට, පිටුවහල් කිරීමෙන් පසු විශේෂයෙන්ම ආපසු පැමිණීම ජුදෙව්වන්ට

**පරමාර්ථය :** ඉශ්රායෙල්වරුන් නව උද්යෝගයක් ඇතිව දෙවියන්වහන්සේ වෙතට පැමිණීමට හා නායකයන්ට දේව මාලිගාව නැවත ගොඩනැගීම සඳහා වගකීමක් ඇති බව පෙන්වීම.

**ප්‍රධාන පදය :** හග්ගයි 1:5

**ජීවන හා දේව සේවා මූලධර්මය :** සැබෑ ඇදහිලිවතුන් ප්‍රමුඛස්ථානයක් දිය යුත්තේ දේව රාජ්‍යය ගොඩනැංවීමට වේ.

**ප්‍රධාන චරිත :** හග්ගයි.

## සැකිල්ල

1. පළමු පණිවුඩය : දේව මාලිගාව නැවත ගොඩනැගීම සඳහා කැඳවීම (සයවන මාසයේ පළමුවන දින දෙන ලදි) 1:1-15
   - A. දිනය 1:1
   - B. පණිවුඩය 1:2-11
     1. සෙනඟගේ කල් දැමීම 1:2-4
     2. එහි පල විපාක 1:5-11
   - C. සෙනඟගේ ප්‍රතිචාරය 1:12-15
     1. කීකරු වීම හා ස්වාමීන්වහන්සේට ගරුබිය දැක්වීම 1:12
     2. දිරිගැන්වීමේ ක්‍රියා 1:13
     3. වැඩ පටන් ගැනීම 1:14
     4. දිනය 1:15

11. දෙවන පණිවුඩය : සහස්‍ර වාර්ෂික දේව මාලිගාව පිළිබඳ අනාවැකිය. එය ඔවුන් දැන් ගොඩනගන දේවමාලිගාවට වඩා අනර්ඝ වනු ඇත (සත්වන මාසයේ 21 වැනි දින දෙන ලදී) 2:1-9.

A. දිනය 2:1

A. පණිවුඩය 2:2-9

1. දේවමාලිගා සංසන්දනය කෙරේ 2:2-3
2. අධෛර්යවත්වීමට පිළිතුර 2:4-5
3. විශ්වීය සෙලවීම හා පසුව දේවමාලිගාවේ මහිමය 2:6-9

111. තෙවන පණිවුඩය : දේව මාලිගාව නැවත ගොඩනැගීමේදී වර්තමාන ආශිර්වාද දීමට පොරොන්දුව 2:10-19 (නව වන මාසයේ 24 දින දෙන ලදී)

A. දිනය 2:10

B. පණිවුඩය : පාපය බෝවෙන සුලුය 2:11-19

1. පූජකවරයාගෙන් ප්‍රශ්න කෙරේ 2:11-13
2. ප්‍රායෝගික යෙදවීම 2:14-19

1V. සිවුවන පණිවුඩය : අනාගතයේදී සිදුවන විජාතික ලෝක බලයන්ගේ විනාශය ගැන අනාවැකි (නව වන මාසයේ 24 වන දින දෙන ලදී) 2:20-23

A. දිනය 2:20

A. පණිවුඩය 2:21-23

1. භූමික බලයන් පෙරළා දැමීම 2:21-22
2. ජේරුස් මුද්ද සෙරුබ්බාබෙල්ට දීම 2:23

## ස්වයං පරීක්ෂණය

1. හග්ගයි පොතේ කතුවරයා කවුරුන්ද?

______________________________

2. හග්ගයි පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

______________________________

______________________________

3. හග්ගයි පොත ලියන ලද්දේ කවුරුන්ටද?

______________________________

______________________________

______________________________

4. හග්ගයි පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

______________________________

______________________________

______________________________

5. හග්ගයි පොතේ ප්‍රධාන පදය ලියන්න.

______________________________

______________________________

______________________________

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉශ්‍රායෙලයට දෙවියන්වහන්සේ ආශිර්වාද නොකිරීමට හේතුව සොයා ගැනීමට හග්ගයි 1:9 කියවන්න.

2. හග්ගයිහි ඇති ආත්මික සත්‍යයන්
   - සියල්ලටම වඩා ස්වාමීන්වහන්සේගේ කටයුතු ප්‍රමුඛස්ථානයක් ගනී.
   - දෙවියන්වහන්සේගේ කටයුතු සඳහා පිරිසිදු උපකරණ අවශ්‍ය වේ.
   - ස්වාමීන්වහන්සේගේ කටයුතු සියලු ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම හා බැඳී ඇත.
   - යහපත බෝවෙන්නේ නැත, එහෙත් නපුර එසේ වේ.

3. ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව වේ. හග්ගයි පොතේ සත්‍යයන් පෞද්ගලිකවම ඔබට යොදා ගන්න. ශුභාරංචිය පැතිරවීමට හා දෙවියන්වහන්සේගේ කටයුතු ඉදිරියට ගෙන යෑමට වැදගත් වන දේ නොසලකා හැර ඔබගේ පෞද්ගලික කටයුතු සඳහා ඔබ කාලය හා අවධානය වැඩිපුර යෙදෙවුවෙහිද?

4. “සමිඳාණන්වහන්සේ දිවැසිවර හග්ගයි මඟින් කතා කළ සේක” යන අදහස ගෙන දෙන සියලුම යෙදුම් ලකුණු කරන්න. මේ සෑම වැකියකින්ම පණිවුඩයක් ආරම්භ කරයි. හග්ගයි පොතේ ව්‍යුහය අවබෝධ කරගැනීමට එය ඔබට උපකාරී වනු ඇත.

5. හග්ගයි හි ඓතිහාසික පසුබිම සඳහා එස්රා 4:24-6:22 ට කියවන්න.

6. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට මෙසේ කී සේක. “මම නුඹ මාගේ පේරුස් මුද්ද මෙන් කරන්නෙමි” (හග්ගයි 2:23). බොහෝ විට පේරුස් මුද්ද ගිවිසුමක මුද්‍රාව විය. එය ගරු කිරීම පෙන්වීමටත් රාජ්‍ය අධිකාරිත්වයේ සලකුණක් ලෙසත් භාවිත කෙරිනි. ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ “පේරුස් මුද්ද” වූ අතර එමඟින් උන්වහන්සේ සියලු ඇදහිලිවතුන් මත උන්වහන්සේගේ ස්වරූපය මුද්‍රා කර උන්වහන්සේගේ ආධිපත්‍යය අප වෙත පැවරූ සේක.

7. ශුභාරංචිය ලෝකයා වෙත ගෙන යෑමේ අවසන් නොවූ කාර්යයට සම්බන්ධව වැඩ පිළිබඳ හග්ගයිගේ ඉගැන්වීම් යොදන්න. මේවා ගැනද සිතන්න.

   - අනෙකුත් බැඳීම්වලට වඩා මේ කාර්යය ප්‍රමුඛස්ථානයක් ගත යුතුය.
   - මෙම සේවය පවිත්‍ර උපකරණ ඉල්ලයි.
   - මෙම කාර්යය, මිනිසුන් හා ජාතීන් වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම හා බැඳේ.

8. ඔබ ශ්‍රේෂ්ඨ පැවරුම සාක්ෂාත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව හග්ගයි ඔබට පෞද්ගලිකවම ලියන්නේ නම් ඔහු ඔබට කුමක් පවසනු ඇද්ද?

# තිස් නව වන පරිච්ඡේදය

## සෙකරියා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- සෙකරියා පොතේ කතුවරයා නම් කිරීමට
- සෙකරියා පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- සෙකරියා පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- සෙකරියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සෙකරියා පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** සෙකරියා වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** දේව මාලිගාව සාදා නිම කිරීමට ඉශ්රායෙලය උනන්දු කරවීම

**ප්‍රධාන පදය :** සෙකරියා 13:1

**ජීවන හා දේව සේවා මූලධර්මය :** මිනිසුන්ගේ හා ජාතීන්ගේ කටයුතු දෙවියන්වහන්සේ පාලනය කරන සේක.

**ප්‍රධාන චරිත :** සෙකරියා.

## සැකිල්ල

1. පසුතැවීම සඳහා ප්‍රාරම්භක කැඳවීම 1:1-6

11. දර්ශන මඟින් අනාවැකි 1:7-6:8
    A. රටමරද ගස් අතර සිටි මිනිසා 1:7-17
    (ඉශ්රායෙලය පිටමන් කරන ලද වුවත් දෙවියන්වහන්සේ අමතක කර නැත)

    B. අං සතර 1:18-21 (ඉශ්රායෙලය සතුරන් විසින් පෙරළා දැමීම)
    C. මනින ලණුව සහිත මිනිසා 2:1-13 (ජෙරුසලමට පැමිණීමට නියමිත සමෘද්ධිය)
    D. උත්තම පූජක ජෝෂුවා 3:1-10
    (ජේසුස්වහන්සේ නම් අත්ත විසින් ඉශ්රායෙල්හි පාපය ඉවත් කර ඇත)

    E. පහන් රුක හා ගස් දෙක 4:1-14
    (දෙවියන්වහන්සේගේ අනාගත ආලෝකය ගෙන යන්නා ඉශ්රායෙලය වේ)
        1. පළමු ප්‍රශ්නය හා පහදා දීම 4: 1-10
        2. දෙවන ප්‍රශ්නය හා පහදා දීම 4: 11-14
    F. පියාඹන පොත 5:1-4 (දුෂ්ට රාජ්‍යයන් දෙවියන්වහන්සේ විසින් සාප කර ඇත )
    G. එළුවා තුළ වූ ස්ත්‍රිය 5:5-11 (දිව්‍යමය පියාපත් මඟින් දුෂ්ටකම ඉවත් කර ඇත)

H. රථ සතර 6:1-8 (දෙවියන්වහන්සේගේ විනිශ්චය)

111. පැහැදිලි කෙරෙන අනාවැකි (6:9-8:23)

A. ආපසු පැමිණෙන ජුදෙව්වෝ 6:9-15

B. සෙනඟගේ නිස්සාරත්වය 7:1-8:23

1. ඉශ්රායෙල්හි නිරාහාර දවස් හා වචනයට කීකරු වීම 7:1-17
   (a). අනාවැකියේ අවස්ථාව 7:1-3
   (b). උපවාස කිරීම අවශ්‍යම නැත, එහෙත් සවන් දීම අවශ්‍යය 7:4-7

2. උපවාස කිරීම පිළිබඳ ප්‍රශ්නයට ස්වාමීන්වහන්සේගේ පිළිතුරෙහි පළමු කොටස
   (a). පියවරුන්ගෙන් දෙවියන්වහන්සේට අවශ්‍ය දේ 7:8-10
   (b). පියවරුන් සවන් දීමට ප්‍රතික්ෂේප කිරීම 7:11-14

3. ස්වාමීන්වහන්සේගේ පිළිතුරෙහි දෙවන කොටස 8:1-23
   (a). මිදවීමේ කාලය 8:1-8
   (b). දිරිමත් කිරීමේ පණිවුඩය 8:9-17
   (c). උපවාසය, ප්‍රීති ප්‍රමෝදය බවට වෙනස් වේ 8:18-23

1V. සෘජු අනාවැකි 9:1-14:21

A. පළමු අනාවැකිය ජේසුස්වහන්සේගේ පළමු පැමිනිම හා ප්‍රතික්ෂේප කිරීම 9:1-11:17

1. මිත්‍යාදෘෂ්ටි ලෝකයේ වැටීම හා සියොන් මුදා ගැනීම 9-10
2. යහපත් හා මෝඩ බැටළු එඬේරු 11:1-17
   (a). අවමානයට පාත්‍රවූ භූමිය 11:1-3
   (b). යහපත් බැටළු එඬේරා 11:4-14
   (c). මෝඩ බැටළු එඬේරා 11:15-17

B. දෙවන අනාවැකිය : ජේසුස්වහන්සේගේ දෙවන පැමිණීම හා පිළිගැනීම 12:1-14:21

1. අනාගත මිදීම හා ඉශ්රායෙලයේ හැරීම 12:1-13:9
   (a). ජුදා හා ජෙරුසලම මුදා ගැනීම 12:1-9
   (a). කරුණාවේ ආත්මය හා වැලපීම 12:10-14
   (a). ගැළවීම උදෙසා කරුණාවේ උල්පතක් 13:1-6

2. ජේසුස්වහන්සේගේ නැවත පැමිණීම 14:1-21
   (a). විනිශ්චය හා මිදීම 14:1-5
   (b). පූර්ණ ගැළවීම 14:6-11
   (c). සතුරු ජාතීන් විනාශ කිරීම 14:12-15
   (d). මිථ්‍යාදෘෂ්ටි ජාතීන් හරවා ගැනීම 14:16-19
   (e). අභක්තික සියලු දේ ඉවත් කෙරේ 14:20-21

## ස්වයං පරීක්ෂණය

1. සෙකරියා පොතේ කතුවරයා කවුරුන්ද?

2. සෙකරියා පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. සෙකරියා පොත ලියන ලද්දේ කවුරුන්ටද?

4. සෙකරියා පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

5. සෙකරියා පොතෙහි ප්‍රධාන පදය කුමක්ද?

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දේවදූතයන්ගේ සේවය පිළිබඳ බොහෝ තොරතුරු සෙකරියා පොත සපයයි. 1 හා 2 පරිච්ඡේද බලන්න.

2. ජෝබ්ගේ පොත මෙන් සෙකරියාගේ පොතෙහිද දෙවියන්වහන්සේ හා සාතන් අතර මුණ ගැසීම දැක ගැනීම සඳහා ස්වර්ගයේ ඡායා මාත්‍රයක් දක්වයි. ජෝබ් 1 හා 2 ද සෙකරියා 3:1-5 ද බලන්න.

3. ජේසුස්වහන්සේ පිළිබඳ කරුණු බොහෝමයක් සෙකරියා ඉදිරිපත් කරයි.

   - උන්වහන්සේගේ පැවරුම 2:8-11
   - උන්වහන්සේගේ වර්තමාන කාර්යය 3:1-2
   - ජෙරුසලම පිළිබඳ උන්වහන්සේගේ සැලකිල්ල 1:12;
   - උන්වහන්සේගේ පදවිය 6:12
   - උන්වහන්සේගේ මාලිගාව 6:13;
   - උන්වහන්සේ විජයශ්‍රීයෙන් ජෙරුසලමට පැමිණීම 9:9
   - උන්වහන්සේ පාවාදීම 11:12;
   - උන්වහන්සේව කුරුසිපත් කිරීම 12:10; 13:7
   - ඉශ්රායෙලය විසින් උන්වහන්සේ අවසානයේ හඳුනාගැනීම 12:1
   - සියොන් කන්දෙහි උන්වහන්සේ පෙනී සිටීම 14:4
   - සියලු ජාතීන් උන්වහන්සේට නමස්කාර කිරීම 14:16
   - ආර්මගිදොන් හි උන්වහන්සේගේ ජයග්‍රහණය 14:3

4. දෙවියන්වහන්සේගේ නගරය පිළිබඳ කරුණු බොහොමයක් සෙකරියා පොතේ ඇත.
   - සත්‍යයේ නගරයක් 8:3;
   - දෙවියන්වහන්සේගේ තේජසින් වට වී ඇත 2:5
   - දරුවන්ගෙන් පිරී පවතී 8:5;
   - සියලු ජාතිහු පැමිණෙති 8:20-23
   - සතුරන් විසින් නැවත වරක් වටලන් ලැබේ : 12:2; 14:2
   - එහි සතුරෝ වැනසෙති 12:9; 14:12-14
   - එහි පුරවැසියෝ මෙසියස්වහන්සේ හඳුනාගනිති 12:10
   - දෙවියන්වහන්සේගේ ශුද්ධත්වයෙන් පිරී පවතී 14:21

# හතලිස් වන පරිච්ඡේදය

## මලාකි

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- මලාකි පොතේ කතුවරයා නම් කිරීමට
- මලාකි පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න හැඳින ගැනීමට
- මලාකි පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- මලාකි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මලාකි පොත සඳහා ජීවන හා දේවසේවා මූලධර්ම සඳහන් කිරීමට

හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මලාකි වේ.

**පොත ලියන ලද්දේ කවුරුන්ටද යන වග:** ඉශ්රායෙල්වරුන්ට

**පරමාර්ථය :** ජාතිය පසුතැවිලි වීමට හා නැවත ධර්මිෂ්ඨවීමට කැඳවීම

**ප්‍රධාන පදය :** මලාකි 2:2

**ජීවන හා දේව සේවා මූලධර්මය :** පසු තැවීම (ආකල්පය) + ආපසු හැරීම = නැවත පිහිටුවීම
කමාව (දෙවියන්වහන්සේ අබිමුවෙහි ධර්මිෂ්ඨකමට පැමිණවීම) සඳහා ආකල්පයද (පාපයට පසු තැවීම) ක්‍රියාවද (දෙවියන්වහන්සේ වෙතට නැවත පැමිණීම) යන දෙකම අවශ්‍ය වේ.

**ප්‍රධාන චරිත :** මලාකි

### සැකිල්ල

1. හැඳින්වීම 1:1-5
    - A. පණිවුඩ කරු 1:1:
    - B. පණිවුඩය 1:1
    - C. පණිවුඩය ලබන්නා : ඉශ්රායෙල්වරුන් 1:1
    - D. ඉශ්රායෙල්වරුන් කෙරෙහි දෙවියන්වහන්සේගේ ප්‍රේමය 1:2-5
        1. ඒසව් හා ජාකොබ් 1:2-3
        2. දෙවියන්වහන්සේ හා ඒදොම් 1:4-5

11. පූජකවරුන්ට පණිවුඩයක් 1:6-2:9
    - A. ආගමික යුතුකම් ඔවුන් පැහැර හැරීම 1:6-2:4
        1. පූජාවල නොවටිනාකම 1:6-2:4
        2. වටිනාකමක් නැති නමස්කාරයේ යෙදෙනවාට වඩා දේව මාලිගාව වසා තැබීම යහපත්ය 1:9-10
        3. විජාතීන් අතර අනර්ඝ සේවය 1:11

4. නමස්කාරයේ ඇති වෙහෙස 1:12-13 හි 1:11 හි ඇති අත්‍යාලංකාර නමස්කාරයට පටහැණි වේ.
5. දෙවියන්වහන්සේගේ ශාපය 1:14-2:4

B. ව්‍යවස්ථාව පිළිබඳ ඔවුන්ගේ ව්‍යාජ ඉගැන්වීම් 2:5-9
1. පරමාදර්ශී පූජකයෙකු වූ ලෙවී සමඟ ගිවිසුම 2:5-7
2. භක්තිය හැරගිය පූජකවරුන් හා ඔවුන්ගේ අපකීර්තිය 2:8-9

111. ජුදෙව් ගිහියන්ට පණිවුඩයක් 2:10-4:3
A. ද්‍රෝහිකම ගැන චෝදනාවක් 2:10-16
B. විනිශ්චය ගැන අනතුරු ඇඟවීමක් 2:17-3:6
1. ඔවුන්ගේ ප්‍රශ්න 2:17
2. දෙවියන්වහන්සේගේ පවිත්‍ර කෙරෙන ගින්න 3:1-3
3. පූජකවරයා හා සෙනඟ පවිත්‍ර කිරීම 3:3-5
4. දෙවියන්වහන්සේ වෙනස් නොවේ 3:6

C. පසුතැවීම සඳහා කැඳවීමක් 3:7-12
1. සෙනඟගේ ද්‍රෝහිකම හා දෙවියන්වහන්සේගේ සාපය 3:7-9
2. ඔවුන්ගේ ගෞරවයට හා විශ්වාසවන්තකමට දෙවියන්වහන්සේගේ ත්‍යාගය 3:10-12

D. පාපය සඳහා දිව්‍යමය දෝෂාරෝපණය 3:13-4:3
1. පැමිණිල්ල 3:13-15
2. ධර්මිෂ්ඨයන් දුෂ්ටයන්ගෙන් වෙන් කිරීම 3:16-18
3. දුෂ්ටයන් සම්පූර්ණයෙන්ම විනාශ කරනු ලැබීම 4:1
4. ධර්මිෂ්ඨයන් මහිමයට පත් කිරීම හා උසස් කිරීම 4:2-3

1V. සමාප්තිය අනතුරු ඇඟවීම 4:4-6
A. මෝසෙස්ගේ ව්‍යවස්ථාව පවත්වන්න 4:4
B. ජේසුස්වහන්සේගේ දෙවැනි ගමන බලා සිටින්න 4:5-6

## ස්වයං පරීක්ෂණය

1. මලාකි පොතේ කතුවරයා කවුරුන්ද?

---

2. මලාකි පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

---

---

---

3. මලාකි පොත ලියන ලද්දේ කවුරුන්ටද?

---

---

4. මලාකි පොතේ ජීවන හා දේව සේවා මූලධර්ම සඳහන් කරන්න.

---

---

---

5. මලාකි පොතේ ප්‍රධාන පදය ලියන්න.

---

---

---

(මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු මෙම පරීක්ෂණවලට පිළිතුරු සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මලාකි පොතේ වැදගත් පාඨ කිපයක් ඇත.
   - දීමනාව පිළිබඳ පැරණි ගිවිසුමේ ඇති ජනප්‍රියතම පාඨය 3:8-10
   - සියලු කාලයන් සඳහා ඇති විස්මිත දින පොත 3:16
   - ඇදහිලිවතුන් මැණික් ලෙස හඳුන්වන එකම පාඨය 3:17
   - පීඩා සමයේදී සේවය කිරීම පිණිස එලියා නැවත එවන බවට පෙරැයුම් කරන එකම පැරණි ගිවිසුම් ජේදය 4:15.

2. තමා පව්කර ඇති බව පිළිගැනීමට මිනිසෙකුට අසීරුය. දෙවියන්වහන්සේගේ විනිශ්චය ගැන මිනිසුන් වාද කරන ආකාරය මලාකි පොතේ බලන්න. "එහෙත්" යන වචනය සෙනඟ සමග කරන සෑම තර්කයකටම ඉදිරියෙන් තිබේ. 1:2, 6,7; 2:17; 3:7,8,13

3. පූජකවරුන් පරීක්ෂාවට ලක්වන ප්‍රධාන ක්ෂේත්‍ර බලන්න 1:6-2:9.

4. මෙම පොතේ "බලව" යන්න කිප තැනක සඳහන් වේ.
   - බලව මම නුඹලා නිසා බීජ වලක්වමි 2:3
   - බලව ස්වාමින්වහන්සේගේ මහත් වූ භයානක වූ දවස . . . 4:5

5. "මතක තබා ගැනීමේ දෙවියන්වහන්සේගේ පොත". නික්මයාම 32:32, ගීතාවලිය 56:8, 69:28; 139:16, එසකියෙල් 13:9, දානියෙල් 7:10, 11:1; පිලිප්පි 4:3, එළිදරව් 20:12 බලන්න.

6. බොහෝ දිවැසිවරුන් ජීවත් වුයේ හා අනාවැකි පැවසුවේ දේශපාලනික වෙනස් වීම් හා කැළඹිලි තිබූ අවස්ථාවලදී වුවද මලාකි ජීවත් වුයේ දෙවියන්වහන්සේට මිනිසුන් අමතක වුවා සේ පෙනෙන උන්වහන්සේගේ සෙනඟ දුප්පත් කමින් පෙළෙමින් හා පුදාහි විදේශීය ආධිපත්‍යයක් පැවති යුගයකදී වේ. භාස්කම් සිදු වූ කාලය එලියා හා එලිෂා සමඟ නැති වී ගොස් සේය. දේව මාලිගාව සාදා නිමකළ නොතිබූ අතර එසකියෙල්ගේ අනාවැකිය පරිදි (එසකියෙල් 43:4) දෙවියන්වහන්සේගේ තේජාලංකාරය දේව මාලිගාවට පැමිණ ඇති බව පෙනෙන කිසිදු සැලකිය යුතු දෙයක් සිදු නොවුනි. සෙනඟ කිසිදු උද්යෝගයක් නොමැතිව සිය ආගමික කටයුතු කරගන ගියහ. එය නම්, දී ඇති පොරොන්දු කොන්දේසි සහිත ඒවා වූ අතර ඒවා ලබා ගැනීමට දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවන් මිනිසුන් සම්පූර්ණ කළේ නැත. මලාකිගේ අනාවැකිවලින් අපට දැනගත හැක්කේ බලාසිටීමේ කාලය තුළ ඇතිවන පරීක්ෂාවන් හා ආතති වේ. මෙහිදී වඩාත් වැදගත් වන්නේ, වෙනස් නොවන (3:6); උන්වහන්සේ වෙතට හැරී ඒමට ආරාධනා කරන (3:7); හා ප්‍රතිචාර දක්වන අය කවදාවත් අමතක නොකරන (3:16) දෙවියන්වහන්සේ කෙරෙහි නිර්ව්‍යාජ ඇදහිල්ල නැවත ඇතිකර ගන්නා මාර්ගයද ඔහු පෙන්වීම වේ.

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල, ඉගැන්වීමට ද දුර්මත දුරු කිරීමට ද හික්මවීමට ද ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි. දෙවියන් වහන්සේට කැප වූ පුද්ගලයා සම්පූර්ණ වශයෙන් පුහුණු වී, ඕනෑම යහපත් සේවයකට සූදානම් ව සිටින්නේ එසේය (2 තිමෝති 3:16-17).

2. "බයිබලය" යන වචනයෙහි තේරුම "පොත්" වේ.

3. "ශුද්ධ ලියවිල්ල" යන්නෙහි තේරුම "දේව වචනය" යන්නය.

4. පැරණි ගිවිසුම හා නව ගිවිසුම

5. 66

6. ව්‍යවස්ථාව , ඉතිහාසය, කාව්‍ය, හා අනාවැකි වශයෙනි.

7. ශුභාරංචි, ඉතිහාසය, ලිපි හා අනාවැකි

8. "Testament" යන වචනයෙහි තේරුම "ගිවිසුම" වේ.

9. ඉගැන්වීමට, තරවටුවට, නිවැරදි කිරීමට, ධර්මිෂ්ඨකමේ උපදෙස්වලටද වේ.

10. බයිබලයේ පරස්පර විරෝධී දේ නැති අතර ප්‍රධාන තේමාව තුළ එය එක්සත්ය.

11. බයිබලයේ විවිධත්වයක් ඇත.

12. a. සඃ b. සඃ c. අඃ d. අඃ e. අ

13. ජේසුස්වහන්සේ, ලූක් 24:44-48

## දෙවන පරිච්ඡේදය

1. සමිඳුනි, මාගේ මොරගැසීම ඔබ ඉදිරියට පැමිණේවා! ඔබේ පොරොන්දුව අනුව මට නැණනුවණ දුන මැනව (ගීතාවලිය 119:169).

2. 39

3. 27

4. එහි අන්තර්ගතය අවබෝධ කරගැනීමට ඔබ එය ක්‍රමානුකූලව කියවිය යුතුය.

5. දිනපතාම කියවන්න, තෝරාගෙන කියවන්න, යාච්ඤාවෙන් යුතුව කියවන්න, ක්‍රමානුකූලව කියවන්න.

## තෙවන පරිච්ඡේදය

1. සමිඳාණෝ අණ දුන් සේක. බොහෝ දූතයෝ ආරංචිය පතුරුවා හළහ (ගීතාවලිය 68:11)

2. අනුවාදයක් යනු, දේව වචනය මුලින් භාෂාවලට වඩා වෙනස් භාෂාවකින් ලියන ලද බයිබලයකි.

3. පරිවර්තනයක් යනු, ග්‍රීක, හෙබ්‍රෙව් හා අරාමීය වචන, වචනයෙන් වචනයට කරන ලද පරිවර්තනයකි. අර්ථෝද්ධාරයක් යනු වචනයෙන් වචනයට කරන ලද පරිවර්තනයක් නොව අදහසින් අදහසට කරන ලද පරිවර්තනයකි.

4. King James අනුවාදය

5. භාෂාවන් දෙකක් සෑම අතින්ම එක හා සමාන නොවන බැවින් පරිවර්තනයක් කළ විට වෙනස්කම් ඇතිවේ.

6. හෙබ්‍රෙව්, අරාමීය හා ග්‍රීක

## සිව්වන පරිච්ඡේදය

1. තවද, උන් වහන්සේ මට කතා කොට, "මනුෂ්‍ය පුත්‍රය, නුඹට කියන මාගේ සියලුම වචනවලට හොඳින් සවන් දී, නුඹේ සිතේ ඒවා නිදන් කරගන්න (එසකියෙල් 3:10).

2. සැකිල්ලක් යනු අධ්‍යයනය සටහන් සංවිධානය කරගන්නා ක්‍රමයකි. එය දේව සේවය හා අධ්‍යයනය සඳහා අනාගතයේදී භාවිත කිරීමට තොරතුරු සාරාංශ ආකාරයෙන් දක්වයි.

3. සැකිල්ලක් අවබෝධ කරගැනීමට අපහසු නම්, මෙම පරිච්ඡේදයේ සැකිල්ලක සැකසීම සඳහා
දී තිබෙන උපදෙස් නැවත බලන්න.

4. සැකිල්ලක ප්‍රධාන කරුණු රෝම ඉලක්කම්වලින් දක්වා ඇත.

5. ප්‍රධාන කරුණු යටතේ ඇති උප කරුණු ඉංග්‍රීසි හෝඩියේ කැපිටල් අකුරුවලින් දක්වා ඇත.

## පස්වන පරිච්ඡේදය

1. මෝසෙස්

2. ඉශ්රායෙල්හි ඓතිහාසික පසුබිම හා මැවීම, පාපය, මිදීම හා මිනිසා සමඟ දෙවියන්වහන්සේ කටයුතු කළ මුල් ආකාරය සුරක්ෂිත කිරීම සඳහා

3. ඉශ්රායෙලය

4. ආරම්භයේ සිටම දෙවියන්වහන්සේගේ සැලැස්මට සියලු ජාතීන් අයත් විය. දෙවියන්වහන්සේ අලුත් දේ මිනිසුන්ගෙන් ආරම්භ කරන සේක.

5. තා සහ ස්ත්‍රිය අතර ද තාගේ වංශය සහ ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තාගේ හිස පොඩි කරන්නේය. තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහිය. (උත්පත්ති 3:15)

## හයවන පරිච්ඡේදය

1. මෝසෙස්

2. වහල් භාවයෙන් ඉශ්රායෙල්වරුන් මුදා ගැනීම වාර්තා කිරීමට හා ජාතියක් ලෙස ඔවුන්ගේ පැවැත්මේ පරමාර්ථය දැක්වීමට

3. ඉශ්රායෙලය

4. ගැළවීම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගේ බැටළු පෝතකයාගේ, එනම් ජේසුස්වහන්සේගේ රුධිරයෙන් පමණි.

5. නුඹලා සිටින ගෙවල් මත තවරා ඇති ලේ නුඹලා ඒවායේ සිටින බවට ලකුණක් වන්නේය. මම ලේ දකින විට නුඹලා පසු කර යන්නෙමි. මිසර දේශයට මා පහර දෙන විට, ඒ මාරක දඬුවම නුඹලා වෙත නොපැමිණෙනු ඇත. (නික්මයාම 12:13)

## සත්වන පරිච්ජේදය

1. මෝසෙස්

2. දෙවියන්වහන්සේ සමඟ සහභාගිත්වයෙන් යුක්තව ශුද්ධවූ ජාතියක් ලෙස ජීවත් වන ආකාරය පෙන්වීමට හා දෙවියන්වහන්සේගේ මිදීමේ සැලැස්ම සියලු ජාතීන් වෙත ගෙන යෑම සඳහා ඔවුන් සූදානම් කිරීමට.

3. ඉශ්රායෙලය

4. දෙවියන්වහන්සේට තම සෙනඟගේ ශුද්ධභාවය අවශ්‍යය

5. එබැවින් නුඹලා දෙවියන් වහන්සේට කැප වීමෙන් ශුද්ධ වන්න. නුඹලාගේ දෙවි සමිඳුණන් වහන්සේ මම වෙමි. (ලෙවී කථාව 20:7)

## අටවන පරිච්ජේදය

1. මෝසෙස්

2. පාළුකරයේ ගිය ගමනේ අත්දැකීම් වාර්තා කරයි. ඒවා පරාජය වූ කිතුනුවන්ගේ අත්දැකීම්වලට සමානය

3. ඉශ්රායෙලය

4. සම්පූර්ණ කැපවීම හැර, ඊට වඩා අඩු දෙයකට දෙවියන්වහන්සේ කැමති නැත.

5. "එහෙත්, ඔබ එලෙස නොකරන්නහු නම්, සමිඳාණන් වහන්සේට විරුද්ධ ව ඔබ හැම පව් කරන්නහු ය. ඔබේ පාපය ද ඔබ පිට පැවෙනෙ බව දැනගන්න"(ගණන් කථාව 32:23)

## නවවන පරිච්ජේදය

1. මෝසෙස්

2. සීනයි කන්දේදී දෙන ලද ව්‍යවස්ථාව නව පරම්පරාවනට නැවත සඳහන් කිරීම සඳහා

3. ඉශ්රායෙලය

4. කීකරුකම ආශිර්වාද ගෙන එයි. අකීකරුකම විනිශ්චය ගෙන එයි.

5. "ඉශ්රායෙල්වරුනි, සවන් දෙන්න, අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳුණන් වහන්සේය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතු ය." (ද්විතීය කථාව 6:4-5)

## දසවන පරිච්ඡේදය

1. ජෝෂුවා

2. කානාන් දේශය අල්ලා ගැනීමේ ඉතිහාසය වාර්තා කරයි.

3. ඉශ්රායෙලය

4. යුද්ධ නොමැතිව කිසිදු සදාචාරාත්මක හෝ ජයග්‍රහණ නොලැබෙයි

5. "සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කිරීමට ඔබ සතුටු නැත් නම්, ඔබ වැඳුම්පිදුම් කරන්නට කැමැති කවරෙකුට ද කියා අද ම තීරණය කරගන්න. ගඟින් එගොඩ සිටි ඔබේ පියවරුන් වැඳුම්පිදුම් කළ දෙවිවරුන්ට හෝ ඔබ වාසය කරන දේශයේ සිටින අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට හෝ වැඳුම්පිදුම් කරන්නට තීරණය කරගන්න. එහෙත් අපි, එනම්, මාගේ පවුල ද, මම ද සමිඳාණන් වහන්සේට වැඳුම්පිදුම් කරන්නෙමු" (ජෝෂුවා 24:15)

## එකොළොස්වන පරිච්ඡේදය

1. සාමුවෙල්

2. ජෝෂුවාගේ පොත අවසාන කිරීමෙන් පසු සිදුවූ වීරවරයන්ගේ පාලනයේ ඓතිහාසික වාර්තාව

3. ඉශ්රායෙලය

4. පාපයෙන්, ගැළවීම කරා දෙවියන්වහන්සේගේ සෙනඟ ගෙන ඒමට දඬුවම් කිරීමේ දිව්‍යමය සැලැස්මක් තිබේ.

5. "ඒ කාලයේ දී ඉශ්රායෙල්හි රජ කෙනෙක් නොසිටියේ ය. එක් එක්කෙනා තම තමාට රිසි දේ කෙළේය" (විරාවලිය 17:6)

## දොළොස්වන පරිච්ඡේදය

1. කතෘ නිර්ණාමිකය

2. සියලු සෙනඟ වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලකිල්ල පෙන්නුම් කිරීම සඳහා ඉශ්රායෙල්හි ඓතිහාසික වාර්තාවේ කොටසක් ලෙස ලියන ලද්දකි.

3. ඉශ්රායෙලය

4. දෙවියන්වහන්සේ තිත්තකම, ආශිර්වාදයකට හැරවිය හැකිය.

5. "එහෙත්, රූත් උත්තර දෙමින් මෙසේ කීවා ය: "මට ඔබ අත්හැර යන්නට වත්, ඔබ සමඟ නොඑන්නට වත් පෙරැත්ත නොකරන්න. ඔබ යන ඕනෑ ම තැනකට මමත් යමි. ඔබ ජීවත් වන ඕනෑ ම තැනක මමත් ජීවත් වෙමි. ඔබේ සෙනඟ මාගේ සෙනඟ ය. ඔබේ දෙවියෝ මාගේ දෙවියෝ ය. ඔබ මැරෙන තැන ම මමත් මැරෙන්නෙමි, එතැන ම වළලනු ලබමි. මරණය හැර ඔබෙන් මා වෙන් කළ හැකි වෙන කිසිවක් නැත: තිබුණොත්, සමිඳාණන් වහන්ස මට ඉතා දරුණු ලෙස දඬුවම් කරන සේක් වා!"(රූත් 1:16-17)

## දහතුන්වන පරිච්ඡේදය

1. සාමුවෙල්

2. දෙවියන්වහන්සේ තම සෙනඟ සමග කරන කටයුතු තවදුරටත් වාර්තා කිරීම සඳහා.

3. ඉශ්රායෙලය

4. පූජාවනට වඩා දෙවියන්වහන්සේට කීකරුවීම වැදගත් වේ.

5. සාමුවෙල් පිළිතුරු දෙමින්, "හිමිතුමන්ට වඩා ප්‍රසන්න වන්නේ කුමක්ද? එතුමන්ගේ හඬට කීකරුවීම ද නැතහොත් දවන පූජා හා යාග පූජාද? පූජාවට වඩා කීකරුවීම හොඳය. (1 සාමුවෙල් 15:22-23)

6. දෙවියන්වහන්සේ තම සෙනඟ සමඟ කරන කටයුතුවල ඓතිහාසික වාර්තාව තවදුරටත්

7. ඉශ්රායෙලය

8. දෙවියන්වහන්සේ තම සැලැස්ම තමාට කීකරු අය තුළින්, ඔවුන්ගේ දුර්වලකම් තිබුණද, ක්‍රියාත්මක කරන සේක.

9. "එබැවින් දෙවි ස්වාමීන් වහන්ස, ඔබ උතුම් ව සිටින සේක. ඔබ වහන්සේට සමාන කෙනෙකු ගැන අප කන්වලින් කවදාවත් අසා නැත: මිහි පිට කුමන ජාතියක් ඔබේ සෙනඟ වන ඉශ්රායෙල්ට සමාන ද? දෙවි ස්වාමීන් වහන්ස, තමන් සෙනඟ වන පිණිස දෙවියන් වහන්සේ විසින් වහල්කමින් මුදාගන්න ලද තවත් ජාතියක් ඇද් ද? ඔබ වහන්සේ කීර්තිය දිනාගන්නා පිණිස උදාර වූ, භයානක වූ දේ කර දුන් තවත් ජාතියක් ඇද් ද? අන්‍ය ජාතින් ද පන්නා දමා, ඔවුන්ගේ දෙවිවරුන් ද පන්නා දමා, මිසර දේශයෙන් තමන් වහන්සේ උදෙසා මුදාගත් ජාතියට සමාන අන් ජාතියක් ඇද් ද?" (2 සාමුවෙල් 7:22-23)

## දහහතරවන පරිච්ඡේදය

1. කර්තෘ නොදනී. ජෙරෙමියා වන්නට හැකිය.

2. තම සෙනඟ වූ ඉශ්රායෙල්වරුන් සමඟ දෙවියන්වහන්සේගේ කටයුතු තවදුරටත් වාර්තා කිරීම

3. ඉශ්රායෙලය

4. සම්මුතියකට පැමිණීම පහසු දෙයක් ලෙස පෙනීමට ඉඩ තිබේ. එහෙත් පසුව ඊට අධික මිලක් ගෙවීමට සිදුවනු ඇත.

5. එසේ වුවත්, බාල් දේවතාවාට නොනැමූ දණ ඇති, ඔහු සිප නොගත් මුඛ ඇති සත්දහස්දෙනෙකු ඉශ්රායෙල්වරුන් අතරෙහි ඉතුරු කරගන්නෙමියි වදාළ සේක. 1 රාජාවලිය 19:18

6. තම සෙනඟ වූ ඉශ්රායෙල්වරුන් සමඟ දෙවියන්වහන්සේගේ කටයුතු තවදුරටත් වාර්තා කිරීම

7. ඉශ්රායෙලය

8. මේ ලෝකයේ රාජ්‍යයන් තාවකාලිකය. ඒවා දෙවියන්වහන්සේගේ පාලනය යටතේ ඇති වේ. නැති වේ.

9. "තවද, ඔවුන් එගොඩ වූ කල එලියා කතා කොට, "ඔබ වෙතින් මා ගන්න පළමුවෙන් ඔබට මාගෙන් ඕනෑ දෙයක් ඉල්ලන්නැ"යි එලිෂාට කීය, එලිෂා පිළිතුරු දෙමින්, "ඔබට තිබෙන ආත්මානුභාවය මෙන් දෙගුණයක් මා කෙරෙහි පැමිණේ වා"යි කීය. ඔහු ද, "ඔබ අමාරු දෙයක් ඉල්ලුවෙහි ය, එහෙත්, ඔබ වෙතින් මා ගන්න විට ඔබ මා දුටුවොත් ඔබට එසේ වන්නේ ය: නැතහොත්, එසේ නොවන්නේ යැ"යි කීය" (2 රාජාවලිය 2:9-10)

## පහළොස්වන පරිච්ඡේදය

1. කර්තෘ නොදනී, එස්රා විය හැකිය.

2. ජුදා හි ආගමික ඉතිහාසය වාර්තා කිරීම

3. ඉශ්රායෙලය

4. දෙවියන්වහන්සේ මහිමයට පත් කළ, උන්වහන්සේගේ සෙනඟ ආශිර්වාද ලබති.

5. සමිඳුණන් වහන්ස, ශ්‍රේෂ්ඨත්වය ද බලපරාක්‍රමය ද තේජස ද වික්‍රමය ද මහිමය ද අයත් ඔබටය. මන්ද, ස්වර්ගයෙහිත්, පොළොවෙහිත් ඇති සියල්ල ඔබේය. සමිඳුණන් වහන්ස, රාජ්‍යයත් ඔබට අයිතිය. ඔබ සියල්ල කෙරෙහි විශිෂ්ට ලෙස උසස්ව සිටින සේක. (1 වංශාවලිය 29:11)

6. ජුදාහි ආගමික ඉතිහාසය වාර්තා කිරීමට

7. ඉශ්රායෙලය

8. දෙවියන්වහන්සේගේ ආශිර්වාද පැමිණෙන්නේ අප නිහතමානී වීමෙන් හා උන්වහන්සේව සෙවීමෙනි.

9. "මාගේ නාමය දරන මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි" (2 වංශාවලිය 7:14)

## දහසය වන පරිච්ඡේදය

1. එස්රා

2. දෙවියන්වහන්සේගේ සෙනඟ බබිලෝනියේ වහල්කමේ සිට ආපසු පැමිණීම හා ජෙරුසලමේ දේවමාලිගාව නැවත ගොඩ නැගීම පිළිබඳව එස්රා පවසයි.

3. ඉශ්රායෙලය

4. පසුතැවිලිවීමේ මූලික මූලධර්ම වනුයේ නැවත පැමිණීම හා පුනරුත්ථාපනය වේ.

5. "ඉශ්රායෙල් සෙනඟ වන පූජකවරු ද ලෙවීවරු ද විප්‍රවාසයෙන් මිදී පැමිණි සෙසු අය ද දෙවියන් වහන්සේගේ මාලිගාව කැප කිරීමේ උත්සවය මහා හරසරින් පැවැත්වූ හ" (එස්රා 6:16)

## දාහත්වන පරිච්ඡේදය

1. නෙහෙමියා

2. ඉශ්රායෙල්හි ඉතිහාසය තවදුරටත් පැවසීම. ජෙරුසලමේ පවුරු නැවත ගොඩනැගීම පිළිබඳ වාර්තාව වේ.

3. ඉශ්රායෙලය

4. විරුද්ධත්වයක් නොමැතිව අවස්ථාවක් නොමැත. ක්‍රියාවන් නොමැති ඇදහිල්ල නිෂ්ඵලය.

5. "මම ඔවුන් ළඟට පණිවුඩකාරයන් යවමින්, "මම වැදගත් වැඩක යෙදී සිටිමි. ඒ නිසා එන්නට නොහැකි ය. ඔබ වෙත පැමිණෙන පිණිස මා මේ වැඩ අත්හැරියොත් වැඩය නවතිනු ඇත"යි කියා යැව්වෙමි" (නෙහෙමියා 6:3)

## දහ අටවන පරිච්ඡේදය

1. නොදනී

2. ඉශ්රායෙල්හි ඉතිහාසය තවදුරටත් පැවසීම. එමෙන්ම දෙවියන්වහන්සේ තම සෙනඟ වෙනුවෙන් දක්වන දිව්‍යමය රැකබලා ගැනීම නැවත මතක් කිරීම

3. පර්සියාව මුළුල්ලේම පැතිරී සිටින ජුදෙව්වන්

4. දෙවියන්වහන්සේ, ජීවිතයේ අර්භුද උන්වහන්සේ විසින් සූදානම් කර ඇති මනුෂ්‍ය බඳුන්වලින් විසඳන සේක.

5. "මන්ද, මේ අවස්ථාවේ දී ඔබ නිශ්ශබ්ද ව ම සිටියොත් වෙනතකින් ජුදෙව්වරුන්ට නිදහසත් ගැළවීමත් පැමිණෙනු ඇත. එහෙත්, ඔබ සහ ඔබේ පිය වංශය නැති වනු ඇත.
ඔබ රාජ්‍යයට පැමුණුණේ මෙවැනි අවස්ථාවක් නිසා ම නොවේ ද කියා දන්නේ කවුරු දෑ"යි කියන්නට අණ කෙළේය" (එස්තර් 4:14)

## දහ නවවන පරිච්ඡේදය

1. නොදනී

2. "ධර්මිෂ්ඨයන් දුක් විඳින්නේ මන්ද?" යන ප්‍රශන්ය සමඟ මෙම පොත පොර බදයි.

3. මෙම පොත සුවිශේෂීව කිසිවෙකු අමතන්නේ නැත, එහෙත් දුක් විඳීම අත්දකින ඕනෑම කෙනෙකුට මෙම පොත අදාළ වේ.

4. ධර්මිෂ්ටයන්ගේ දුක්විඳීම සඳහා ආත්මික හේතුවක් ඇත. දුක් විඳීම්, දෙවියන්වහන්සේගේ අසතුට නිසාම සිදුවන්නක් නොවේ.

5. එනම්, මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද අන්තිමේදී මා වෙනුවෙන් කතා කරන බව
ද මම දනිමි. කුෂ්ඨයක් මාගේ හමට කා වැඳී, මාගේ මාංසය දිරා ගිය පසුත් මම මාගේ දෙනෙතින් දෙවිඳුන් දකින්නෙමි. මම ම එතුමාණන් දකිමි. අන්‍යයෙකු නොව මම ම මාගේ දෙනෙතින් ම එතුමාණන් දකිමි. (ජෝබ් 19:25-27)

"එහෙත්, මා ගන්න හැම පියවරම එතුමාණෝ දන්න සේක: මා පරීක්ෂණයකට භාජන කළොත් මා තනි රත්රන් බව දැනගනු ඇත" (ජෝබ් 23:10)

## විසි වන පරිච්ඡේදය

1. බොහෝ ගීතිකාවල කතුවරයා දාවිත් රජතුමා වේ.

2. ගීතාවලිය පොත, ඉශ්රායෙල්වරුන්ගේ ගීතිකා පොත ලෙස හැඳින්විණි. එය බයිබලයේ යාච්ඤා හා ප්‍රශංසා පොත වේ.

3. ඉශ්රායෙලය, එහෙත් මෙම පොත ශතවර්ෂ ගණනාවක් කැපවීම, යාච්ඤාව, හා ඇදහිලිවතුන්ගේ ප්‍රශංසාකිරීම් සඳහා භාවිතා කර ඇත.

4. යාච්ඤාව, ප්‍රශංසා කිරීම, මැදිහත් යාච්ඤ හා පසුතැවිලිවීම යන සියල්ල සැබෑ නමස්කාරයේ කොටස් වේ.

5. "එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු: අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නඟා තුති ගී ගයමු" (ගීතාවලිය 95:1)

## විසි එක් වන පරිච්ඡේදය

1. සලමොන්

2. මේවා හිතෝපදේශ 1:1-6 හි ලයිස්තු ගතකර ඇත.

3. ඉශ්‍රායෙලය, එහෙත් ප්‍රායෝගික ජීවිතය සඳහා වන සත්‍යයන් සියලු ඇදහිලිවතුන්ට අදාළ වේ.

4. තිරස් ජීවිතයට සිරස් ප්‍රඥාව අවශ්‍ය වේ. හිතෝපදේශ යනු දෙවියන්වහන්සේ විසින් මිනිසාට දෙන ලද (සිරස්) ප්‍රඥාවන්ත මූලධර්මවල එකතුවකි. ඒවා අන් අය සමඟ ජීවත්වීම සඳහා උපකාරී වේ (තිරස්)

5. "ප්‍රඥා සම්පත සොයාගන්නා, ඥාන සම්පත හිමි කරගන්නා, මිනිසාගේ වාසනාවක මහත !" (හිතෝපදේශ 3:13)

## විසි දෙවන පරිච්ඡේදය

1. සලමොන්

2. දෙවියන්වහන්සේ නොමැති ජීවිතයක් සෙවීම පිළිබඳ විස්තරයක්

3. ඉශ්‍රායෙල්වරුන් හා සියලු ඇදහිලිවතුන් වෙත වේ. තරුණයන් වෙත වැඩි අවධානයක් යාමු කර ඇත.

4. දෙවියන්වහන්සේගෙන් වෙන් වූ ජීවිතයක් ඵල රහිතය

5. "මේ සියල්ල විමසා බැලීමෙන් පසු, අවසාන වචනයක් කිව යුතු ව ඇත: දෙවියන්ට ගරුබිය දක්වා, එතුමන්ගේ ආඥා පිළිපදින්න. මිනිසා මවන ලද්දේ ඒ සඳහා ය." (ධර්මදේශකයා 12:13)

## විසි තුන්වන පරිච්ඡේදය

1. සලමොන්

2. විවාහ සබඳතාව මඟින් පෙන්වන පරිදි, ජේසුස්වහන්සේ හා සභාව අතර සබඳතාව පෙන්වීම සඳහා

3. ඉශ්‍රායෙල්වරුන් හා සියලුම ඇදහිලිවතුන්

4. මිනිසෙකු හා ඔහුගේ බිරිඳ අතර ඇති ප්‍රේමයේ දිව්‍යමය ආකෘතිය, ක්‍රිස්තුස්වහන්සේ හා සභාව අතර ඇති සබඳතාවේ රටාව වේ.

5. "මහා දිය දහරින් ප්‍රේමය නිවිය නොහැකි යඃ මහා ගංවතුරට එය යට කළ නොහැකිය. මිනිසෙකු ප්‍රේමය දිනාගන්නට තමාගේ ගෙයි සියලු සම්පත දුන්නත්, ඔහුට ලැබෙන්නේ අවමානය පමණකි" (ප්‍රේම ගී 8:7)

## විසි හතර වන පරිච්ඡේදය

1. යෙසායා

2. නිවැරදි කිරීම හා තරවටු කිරීම

3. ජුදා

4. කැරලි ගැසීම විපාකය ගෙන දෙයි, පසුතැවිලිවීම පුනරුත්ථාපනයට මග පාදයි.

5. "අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළා වී තම තමා සිතු මඟට හැරී ගියෙමු. සමිඳාණෝ අප සියල්ලන්ගේ පව් එතුමන් පිට තැබූ සේක" (යෙසායා 53:6).

## විසි පස් වන පරිච්ඡේදය

1. ජෙරෙමියා

2. දාසභාවයට ගැනීමේ විනිශ්චය පිළිබඳව අනතුරු ඇඟවීම හා පසුතැවිලි වීමට කැඳවයි.

3. ජුදා

4. ජාතික විපත් හා පිරිහීම් බොහෝ විට දෙවියන්වහන්සේට අකීකරු වීම නිසා සිදුවේ.

5. මට යාච්ඤා කරන්න, එවිට මම නුඹල පිළිතුරු දී නුඹ නොදන්න, සැඟවී ඇති, වැදගත් සත්‍යයන් නුඹට දන්වන්නෙමි. (ජෙරෙමියා 33:3)

   "එහෙත් සමිඳාණන් වහන්සේ මට මෙසේ වදාළ සේක: "නුඹ බාලයෙක් යයි නොකියන්න. මා නුඹ යවන සියල්ලන් වෙත යන්න. මා නුඹට අණ කරන සියල්ල පවසන්න. ඔවුන්ට බිය නොවන්න. මන්ද, නුඹ ගළවන්නට මම නුඹ සමඟ සිටිමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මම ය" (ජෙරෙමියා 1:7-8)

## විසිහය වන පරිච්ඡේදය

1. ජෙරෙමියා

2. ආත්මිකව නැවත ගොඩ නැංවීම සඳහා අවශ්‍ය පසුතැවිලිවීම ඇති කිරීම සඳහා

3. බබිලෝනියේ දාසභාවයේ සිටින ජුදෙව්වන්

4. දෙවියන්වහන්සේ විනිශ්චයෙන්ද දයාවෙන්ද විශ්වාසී වන සේක.

5. "සමිඳුන්ගේ තිර පෙම කිසි කලෙක පහ නොවන්නේය: එතුමන්ගේ දයාව කෙළවර නොවන්නේ ය. ඒවා උදයෙන් උදය අලුත් වී තිබ්: ඔබේ විශ්වාසවන්තකම ඉමහත් ය" (විලාප ගී 3:22-23)

## විසිහත් වන පරිච්ඡේදය

1. එසකියෙල්

2. පැමිණීමට නියමිත වහල්භාවය ගැන එසකියෙල් අනතුරු ඇඟවීය. එය සිදු වූ පසු ඔවුන්ට අනාවැකි කීවේය.

3. ජුදා

4. ස්වාමීන්වහන්සේ ඓතිහාසික සිද්ධීන් නියම කරන සේක. ඊට හේතුව උන්වහන්සේ දෙවියන්වහන්සේ බව සියලු ජාතීන් දැනගන්නා පිණිසය.

5. "දේශය නාස්ති නොකරන පිණිස පවුරක් ගොඩනඟා දේශය ආරක්ෂා කරන පිණිස කපොලුවල සිටිය හැකි මිනිසෙකු මම ඔවුන් අතරේ සෙව්මි. එහෙත්, කිසිවෙක් මට සම්බ නොවිය" (එසකියෙල් 22:30)

## විසි අටවන පරිච්ඡේදය

1. දානියෙල්

2. මිනිසුන්ගේ කටයුතු දෙවියන්වහන්සේ පාලනය කරන බව පෙන්වීම සඳහා

3. ජුදෙව් වහලුන්

4. දෙවියන්වහන්සේ සර්වබලධාරී වන අතර උන්වහන්සේට ගෞරව කරන අයට උන්වහන්සේ ගෞරව කරන සේක.

5. "නුවණැති ජාතියේ නායකයෝ ආකාශයේ දීප්තිය මෙන් ද සෙනඟ හරි මඟ ගෙන ගිය අය තාරකාවන් මෙන් ද සදාකාලයට ම බැබළෙන්නෝය" (දානියෙල් 12:3)

## විසි නව වන පරිච්ඡේදය

1. හොසියා

2. ඉශ්රායෙල්වරුන්ට, ඔවුන්ගේ පාපී තත්වය ගැන අවදි කිරීමට හා ඔවුන් ආපසු දෙවියන්වහන්සේ වෙතට ගෙන ඒමට

3. ඉශ්රායෙල්හි උතුරු රාජ්‍යය

4. පෞද්ගලික අත්දැකීම්, නිර්ව්‍යාජ අවබෝධය හා කරුණාව පෝෂණය කරයි.

5. "ඉශ්රායෙල් ජනයෙනි, සමිඳාණන් වහන්සේගේ පණිවුඩයට සවන් දෙන්න. මේ දේශයේ වැසියන්ට විරුද්ධ ව සමිඳාණන් වහන්සේගේ චෝදනාවක් ඇත. "විශ්වාසකමවත්, කරුණාව වත්, දෙවියන් වහන්සේ පිළිබඳ දැනුමක් වත් දේශයේ නැත" (හොසියා 4:1)

## තිස් වන පරිච්ඡේදය

1. ජෝවෙල්

2. ජුදා දේශයට, ඔවුන්ගේ පාප හා පසුතැවිලිවීමට ඇති අවශ්‍යතාව ගැන අනතුරු ඇඟවීම හා ඔවුන්ගේ දේශය වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ අනාගත සැලැස්ම දැන්වීමට

3. ජුදා

4. නිවැරදි කිරීමේ විනිශ්චය මධ්‍යයේ වුවද, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් ආශිර්වාද සැලසුම් කරන සේක.

5. "ඉන්පසු, සකල මනුෂ්‍යයන් කෙරෙහි මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි. එවිට, නුඹලාගේ දූ පුත්තු දිවැස් වැකි කියති. මහල්ලෝ ස්වප්න දකිති: තරුණයෝ දර්ශන දකිති. ඒ කාලයේ දී, දැසි දසුන් කෙරෙහි වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නෙමි" (ජෝවෙල් 2:28-29)

## තිස් එක් වන පරිච්ඡේදය

1. ආමොස්

2. ඉශ්රායෙල්වරුන් නැවත දෙවියන්වහන්සේ වෙතට කැඳවීම

3. ඉශ්රායෙලය

4. අද ජාතින්ට ඇති කැඳවීම වන්නේ "දෙවියන්වහන්සේව මුණ ගැසීමට සූදානම් වන්න" යන්න වේ.

5. "එබැවින් ඉශ්රායෙල් ජනයෙනි, මේ දේ මම නුඹලාට කරන්නට යමි: ඒ දේ මා කරන්නට යන බැවින් දෙවියන් වහන්සේගේ විනිශ්චයට මුණපාන්නට සූදානම්වන්න" (ආමොස් 4:12)

## තිස් දෙවන පරිච්ඡේදය

1. ඔබදියා

2. පව් වෙනුවෙන් දෙන දෙවියන්හන්සේගේ දඬුවම ගැන අනතුරු ඇඟවීමට

3. ඒදොම්

4. පාප සහිතව මහිමයට පත් කළ දේ දෙවියන්වහන්සේ පහතට හෙලන සේක.

5. "නුඹ, රාජාලියෙකු මෙන් ඉහළට පියාඹා, නුඹේ කැදැල්ල තාරකා අතරේ පිහිටුවා ගත්තත් එතැනින් වුව ද මම නුඹ පහතට හෙළාදමන්නෙමි යි පවසන්නේ, සමිඳාණන් වහන්සේ වන මම ය" (ඔබදියා 1:4)

## තිස් තුන්වන පරිච්ඡේදය

1. ජෝනා

2. මෙහි පරමාර්ථය නිනිවය වැසියන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීම පමණක් නොව ගැළවීම ජුදෙව්වන්ට පමණක් නොවේය යන්න ඉශ්රායෙල්වරුන්ට දැන්වීම

3. නිනිවය

4. ගැළවීම ජාතිය, සංස්කෘතිය හෝ වෙනත් බාධක මඟින් සීමා කර නැත. රෝම 10:13 බලන්න.

5. "සමිඳාණන් වහන්සේගේ පණිවුඩය දෙවන වරට ජෝනා වෙත පැමිණියේ ය. නුඹ නැඟිට නිනිවය නම් ශ්‍රේෂ්ඨ නගරයට ගොස් මා නුඹට කියන පණිවුඩය එහි ප්‍රකාශ කරන්නැ"යි සමිඳාණන් වහන්සේ වදාළ සේක" (ජෝනා 3:1-2)

## තිස් හතරවන පරිච්ඡේදය

1. මීකා

2. විනිශ්චය මඟහැරීම පිණිස පසුතැවිලිවීම සඳහා කැඳවීම

3. ඉශ්රායෙලය හා ජුදාව

4. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට පීඩා ගෙන දෙන්නන් විනිශ්චය කරන සේක.

5. "එම්බා මනුෂ්‍යය ! යහපත් දේ කුමක්දැ යි සමිඳාණන් ඔබට පෙන්වා දී ඇත. එතුමාණන් ඔබෙන් ඉල්ලන්නේ කුමක්ද? යුක්තිය ඉටු කිරීමත්, දයා පෙම දැක්වීමත්, යටහත් ලෙස ඔබේ සමිඳුන් සමඟ හැසිරීමත් පමණකි" (මීකා 6:8)

## තිස් පස් වන පරිච්ඡේදය

1. නාහුම්

2. දෙවියන්වහන්සේගේ සෙනඟ වහල් භාවයට ගත් අසිරියානු අධිරාජ්‍යයේ අගනුවර වන නිනිවය කෙරෙහි ඇති විනිශ්වය ගැන අනතුරු ඇඟවීමට

3. නිනිවය

4. පරෙස්සම් වන්න, දෙවියන්වහන්සේ නපුරෙන් පළිගන්නා සේක.

5. "සමිඳාණන් වහන්සේ ප්‍රතිවාදීන් නොඉවසන දෙවි කෙනෙකි: උන් වහන්සේට විරුද්ධ වන්නන්ට උන් වහන්සේ දඬුවම් කරන සේක: උදහසින් ඔවුන්ට දඬුවම් දෙන සේක. උන් වහන්සේ තම එදිරිකාරයන්ට දඬුවම් කරන සේක: උන් වහන්සේ තම සතුරන් කෙරෙහි උදහසින් සිටින සේක" (නාහුම් 1:2)

## තිස්හය වන පරිච්ඡේදය

1. හබක්කුක්

2. ජුදාවරුන්, ඔවුන්ගේ ආත්මික අවශයතාවන් කෙරෙහි අවදි කරවීමට හා දෙවියන්වහන්සේගෙන් පැමිණීමට නියමිත විනිශ්වය ගැන ඔවුන්ට අනතුරු ඇඟවීමට

3. ජුදා

4. ධර්මිෂ්ඨයෝ ඇදහිල්ලෙන් ජීවත් වන්නාහුය.

5. "සමිඳාණන් වහන්ස, ඔබ කර ඇති සියලු දේ ගැන මා අසා ඇත. සමිඳාණන් වහන්ස, ඔබේ ක්‍රියා මා තුළ ගරුබිය දනවයි. ඔබ වහන්සේ පෙර කළ බලවත් ක්‍රියා මේ කාලයේදීත් කළ මැනව: පෙන්නුව මැනව: උදහසසේ දී ඔවුන්ට දයාව දැක්වුව මැනව " (හබක්කුක්ගේ 3:2)

## තිස් හත්වන පරිච්ඡේදය

1. ශෙපනියා

2. දෙවියන්වහන්සේගේ විනිශ්වය ඉශ්රායෙල්වරුන්ට හා සියලු ජාතීන්ට අනතුරු ඇඟවීම උදෙසා

3. ඉශ්රායෙලය

4. දෙවියන්වහන්සේ ගැළවීම දෙන්නට බලවත් වූ තැනන්වහන්සේය.

5. "ඔබේ දෙවි සමිඳාණෝ ඔබ සමඟ ය: ඔබට ජය අත් කර දෙන සෙබළාණෝ ය. එතුමාණෝ ඔබ ගැන ප්‍රිය මනාප වන සේක: සිය පෙමින් ඔබට නව ජීවනයක් දෙන සේක: ඔබ ගැන සොම්නස් සිතින් ගී ගයන සේක:" (ශෙපනියා 3:17)

## තිස් අට වන පරිච්ඡේදය

1. හග්ගයි

2. දෙවියන්වහන්සේ කෙරෙහි අලුත් උනන්දුවක් ඉශ්රායෙල්වරුන් වෙත ඇති කිරීම හා නමස්කාරයේ මාලිගාව නැවත ගොඩනැගීමේ වගකීම ගැන නායකයන් උනන්දු කිරීම.

3. ඉශ්රායෙලය

4. සැබෑ ඇදහිලිවන්තයෙකුට ප්‍රමුඛස්ථානය විය යුත්තේ දේව රාජ්‍යය ගොඩ නැගීම වේ.

5. "නුඹලාගේ ජීවිත පිළිවෙළ ගැන සිතා බලන්න" (හග්ගයි 1:5)

## තිස් නව වන පරිච්ඡේදය

1. සෙකරියා

2. දේව මාලිගාව සාදා නිම කිරීමට ඉශ්රායෙල්වරුන් උද්යෝගිමත් කිරීම

3. ඉශ්රායෙලය

4. මනුෂ්‍යයන්ගේ හා ජාතීන්ගේ කටයුතු දෙවියන්වහන්සේ පාලනය කරන සේක.

5. "සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: "ඒ කාලයේ දී පාපය හා රූප වන්දනාවෙන් දාවිත්ගේ ගෝත්‍රය ද ජෙරුසලමේ වැසියන් ද පවිත්‍ර කරන පිණිස උල්පතක් ඇරෙන්නේ ය" (සෙකරියා 13:1)

## හතළිස්වන පරිච්ඡේදය

1. මලාකි

2. ඉශ්රායෙල් ජාතියට පසුතැවිලි වීමට හා නැවත ධර්මිෂ්ඨවීමට කැඳවීම සඳහා

3. ඉශ්රායෙලය

4. පසුතැවිලිවීම හා නැවත පැමිණීම, පුනරුත්ථාපනයට සමාන වේ. කමාව සඳහා ආකල්පය මෙන්ම ක්‍රියාවද අවශ්‍යය.

5. "නුඹලාගේ ක්‍රියාවලින් මට ගෞරව නොකරන්නාහු නම්, මා වදාරන දේට නුඹලා සවන් නොදෙන්නහු නම්, එය හොඳින් සිතට නොගන්නහු නම්, නුඹලා පිට මම සාපයක් පමුණුවන්නෙමි. නුඹලා ලබන ආශිර්වාදය සාපයට හරවමි. ඇත්ත වශයෙන් නුඹලා මාගේ ආඥා තදින් සිතට නොගත් නිසා දැනටමත් මා ඒවාට සාප කර ඇත" (මලාකි 2:2)